# දේශගුණ විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුම යටතේ යාවත්කාලීන කරන ලද ජාතිකව නිර්ණය කළ දෘයකත්ව ශ්‍රී ලංකාව

2021 ජූලි

**පරිසර අමාත්‍යාංශය**

# දේශගුණ විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුම යටතේ යාවත්කාලීන කරන ලද ජාතිකව නිර්ණය කළ දායකත්ව
# ශ්‍රී ලංකාව

2021 ජූලි

**පරිසර අමාත්‍යාංශය**

**දේශගුණ විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුම යටතේ යාවත්කාලීන කරන ලද ජාතිකව නිර්ණය කළ දයකත්ව ශ්‍රී ලංකාව**

©පරිසර අමාත්‍යාංශය. සියලුම හිමිකම් ඇවිරිණි


| | | |
|---|---|---|
| පළමු මුද්‍රණය | : | නොවැම්බර් 2021 |
| ප්‍රකාශනය | : | දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය<br>පරිසර අමාත්‍යාංශය<br>සොබාදම් පියස, අංක 416/C/1,<br>රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල<br>www.climatechange.lk |
| ISBN | : | 978-624-5817-13-9 |
| මූල්‍ය දායකත්වය | : | Climate Promise Project- UNDP, Sri Lanka |
| මුද්‍රණය | : | ඩිජිටල් ඩ්‍රීම්ස් |


දේශගුණ විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුම යටතේ යාවත්කාලීන කරන ලද ජාතිකව නිර්ණය කළ දයකත්ව ශ්‍රී ලංකාව කැබිනට් අමාත්‍ය මණ්ඩලයේ දී 2021 ජූලි 12 වන දින අනුමත කරන ලදී.

(කැබිනට් පත්‍රිකා අංක 21/1259/321/012)

# පටුන


**විධායක සාරාංශය ......................................................................................................iii**

**1 පරිච්ඡේදය .......................................................................................................1**

**හැඳින්වීම .......................................................................................................1**

1.1 ශ්‍රී ලංකාවේ පසුබිම .......................................................................................................2

**2 පරිච්ඡේදයඃ දේශගුණ විපර්යාස සම්බන්ධ ජාතික දැක්ම සහ ප්‍රතිචාර ..........................................4**

**3 පරිච්ඡේදයඃ ජාතිකව නිර්ණය කළ දයකත්ව සමාලෝචන ක්‍රියාවලිය..........................................5**

**4 පරිච්ඡේදය : හරිතාගාර වායු අවම කිරීම සඳහා වූ ජාතිකව නිර්ණය කළ දායකත්ව ..........................6**

4.1 ශ්‍රී ලංකාවේ හරිතාගාර වායු විමෝචනය අවමකිරීම..........................................6

4.2 කොන්දේසි රහිත හා කොන්දේසි සහිත ප්‍රතිපත්ති ප්‍රතිචාර..........................................7

4.3 හරිතාගාර වායු විමෝචනය අවම කිරීමේ NDC ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය ..........................7

4.4 ආංශික හරිතාගාර වායු විමෝචනය අවම කිරීමේ ජාතිකව නිර්ණය කළ දායකත්ව ..........................8

4.4.1 විදුලිබල (බලශක්තිය) අංශය ..........................................8

4.4.2 ප්‍රවාහන අංශය ..........................................11

4.4.3 කර්මාන්ත අංශය.......................................... 14

4.4.5 අපද්‍රව්‍ය කළමනාකරණය.......................................... 17

4.4.2 වනාන්තර අංශය ..........................................20

4.4.1 කෘෂිකර්ම අංශය ..........................................23

**5 පරිච්ඡේදය : අනුහුරුවීමේ ජාතිකව නිර්ණය කළ දයකත්ව.......................................... 25**

5.1 ආංශික අනුහුරුවීමේ ජාතිකව නිර්ණය කළ දායකත්ව..........................................27

5.1.1 කෘෂිකර්ම අංශය..........................................27

5.1.2 ධීවර අංශය ..........................................30

5.1.3 පශුසම්පත් අංශය ..........................................33

5.1.6 ජල අංශය ..........................................35

5.1.5 ජෛව විවිධත්ව අංශය ..........................................40

5.1.3 වෙරළබඩ සහ සමුද්‍ර අංශය ..........................................43

5.1.5 සෞඛ්‍ය අංශය ..........................................45

5.1.8 නාගරික සැලසුම්කරණ සහ මානව ජනාවාස අංශය ..........................................48

5.1.9 සංචාරක සහ විනෝදස්වාද අංශය ..........................................50

**6 පරිච්ඡේදයඃ අලාභ සහ හානි ජාතිකව නිර්ණය කළ දායකත්ව .......................................... 52**

හැඳින්වීම..........................................52

2020 අලාභ සහ හානි සංශෝධන ..........................................52

**7 පරිච්ඡේදයඃ තිරසර සංවර්ධන අරමුණු සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය ජාතිකව නිර්ණය කළ දායකත්ව සමඟ ඒකාබද්ධ කිරීම.......................................... 55**

ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ තිරසර සංවර්ධන අභිමතාර්ථ (SDG) අතර ඇති අන්තර්සබඳතා.........55

**8 පරිච්ඡේදයඃ ක්‍රියාත්මක කරන උපක්‍රමය .......................................... 59**

ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණ ..........................................59

**කෙටි යෙදුම්.......................................... 64**

# රූපය


3.1 රූපය: ජාතිකව නිර්ණය කළ දායකත්ව සමාලෝචන ක්‍රියාවලිය ........................................ 5
4.4.1 රූපය: හරිතාගාර වායු විමෝචනය අඩුවීම ප්‍රක්ෂේපණය - බලශක්තිය ........................................10
4.4.2 රූපය: විමෝචන අඩුවීම ප්‍රක්ෂේපණය - ප්‍රවාහනය ........................................13
4.4.3 රූපය: විමෝචන අඩුවීම ප්‍රක්ෂේපණය - කර්මාන්ත ........................................16
4.4.4 රූපය: විමෝචනය අඩුවීම ප්‍රක්ෂේපණය - අපද්‍රව්‍ය ........................................19
4.4.5 රූපය: කාබන් තිරකිරීමේ ධාරිතාවයේ ප්‍රක්ෂේපණ - වනාන්තර අංශය) ........................................22
4.4.6 රූපය: විමෝචන අඩුවීම ප්‍රක්ෂේපණය (කෘෂිකර්මය හා පශුසම්පත්) ........................................ 24
5.1 රූපය: අනුහුරුවීමේ ක්‍රියාකාරකම්වලට ඇති දේශගුණ බලපෑම්, අනුහුරුවීමේ ධාරිතා සහ අවදානම ........................................25
6.1 රූපය: දේශගුණ සහ ආපදා අවදානම කළමනාකරණය කරගැනීම සඳහා වන මෙහෙයුම් රාමුවක් ........................................ 53
7.1 රූපය: ස්ත්‍රීපුරුෂ සමාජභාව ප්‍රතිචාරී ක්‍රියාත්මක කිරීමක් සඳහා වන ප්‍රවේශය
7.2 රූපය: ප්‍රධාන අංශ සහ ඒවායේ හානි අවමකරන ක්‍රියා සහ තිරසර සංවර්ධන අභිමතාර්ථ අතර ඇති අන්තර්ක්‍රියා සාරාංශය ........................................ 57
8.1 රූපය: දේශගුණ ප්‍රතිචාරය සඳහා වන ආයතනික ව්‍යුහය ........................................ 63


# වගුව


4.4.1 වගුව: විදුලිය (බලශක්ති) අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව ........................................ 9
4.4.2 වගුව: ප්‍රවාහන අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව ........................................12
4.4.3 වගුව: කර්මාන්ත අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව ........................................14
4.4.4 වගුව: අපද්‍රව්‍ය අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව ........................................18
4.4.5 වගුව: වනාන්තර අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව ........................................21
4.4.6 වගුව: කෘෂිකර්ම අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව ........................................ 23
5.1.1 වගුව: කෘෂිකර්ම අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව ........................................ 28
5.1.2 වගුව: ධීවර අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව ........................................31
5.1.3 වගුව: සත්ව පාලන අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව ........................................ 34
5.1.4 වගුව: ජල අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව ........................................ 36
5.1.5 වගුව: ජෛව විවිධත්ව අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව ........................................41
5.1.6 වගුව: වෙරළබඩ සහ සමුද්‍රීය අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව ........................................ 44
5.1.7 වගුව: සෞඛ්‍ය අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව ........................................ 46
5.1.8 වගුව: නාගරික සැලසුම් සහ මානව ජනාවාස අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව ........................................ 49
5.1.9 වගුව: සංචාරක අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව ........................................51
6.1 වගුව: අලාභ සහ හානි අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව ........................................ 54
7.1 වගුව: ප්‍රධාන අංශ සහ ඒවායේ ක්‍රියාමාර්ග සහ තිරසර සංවර්ධන අභිමතාර්ථ අතර සම්බන්ධතා ප්‍රතිශත වශයෙන් දැක්වීම .. 57
7.2 වගුව: තිරසර සංවර්ධන අභිමතාර්ථ සහ අනුහුරුවීමේ ජාතිකව නිර්ණය කළ දායකත්ව අතර සම්බන්ධතා ........................................ 58
8.1 වගුව: අවමකිරීමේ සහ අනුහුරුවීමේ ක්‍රියාමාර්ග සඳහා නොපමාව සපුරාලිය යුතු ධාරිතාමය අවශ්‍යතා කිහිපයක් .......... 60

# විධායක සාරාංශය

පැරිස් එකඟතාවයේ පාර්ශ්වකරුවකු වශයෙන් ශ්‍රී ලංකාව, දේශගුණ ක්‍රියාකාරිත්වය පිළිබඳ සිය ප්‍රගතිශීලී හා ඉහළම අපේක්ෂාව නිරූපණය කරන මෙම ලේඛනය මගින් සමාලෝචිත සහ යාවත්කාලීන කරන ලද ජාතිකව නිර්ණය කළ දායකත්ව (NDC) දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය (UNFCCC) වෙත ඉදිරිපත් කරනු ලැබේ

ශ්‍රී ලංකාව, දේශගුණ විපර්යාස හේතුවෙන් වඩාත් අවදානමට ලක්විය හැකි රටවල් අතරට ශ්‍රේණිගත වී ඇති රටකි, ඉන්දියානු සාගරයේ නිවර්තන දූපතක් වශයෙන් ශ්‍රී ලංකාව, ගෝලීය දේශගුණ අවදානම් දර්ශකයට අනුව ආන්තික කාලගුණ තත්ත්ව මගින් ඉහළ අවදානමට ලක්ව ඇති රටවල් දහය අතර දිගින් දිගටම ස්ථානගත වී ඇත.[1] ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් සපයන අංශ වන සංචාරක, ධීවර, වැවිලි හා කෘෂිකර්ම යන අංශ දේශගුණයට සංවේදී වන අතර මෝසම් වැසි සහ වර්ෂාපතන රටා වෙනස්වීම හේතුවෙන් මෙම අංශ බලපෑමට ලක් වේ. 2016 සහ 2017 දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය සංකෝචනය වීමට හේතු වූයේ දීර්ඝකාලීනව නියගයට ද පුළුල්ව ව්‍යාප්ත වූ ගංවතුරට ද අනුපිළිවෙලින් ලක්වීම හේතුවෙනි. දේශගුණ විපර්යාස පිළිබඳ ප්‍රක්ශේපණ මගින් මෝසම් රටාවේ දීර්ඝ-කාලීන වෙනස්වීම් සහ පාරිසරික කලාප මාරුවීම් පුරෝකථනය කර තිබේ.

අඩු කාබන් විමෝචනයක් සහිත ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල විමෝචන මට්ටම එක් පුද්ගලයකු සඳහා ටොන් 1.02ක් පමණ[2] වන අතර, ශ්‍රී ලංකාවේ සංවර්ධන ගමන්මග අඩු කාබන් පරිභෝජන මාර්ගයක් ඔස්සේ ගමන් කර තිබේ. ඒක පුද්ගල විමෝචනය සහ මානව සංවර්ධනය සම්බන්ධයෙන් මෑතකාලීනව සිදුකළ විශ්ලේෂණයකින්, ගෝලීය උෂ්ණත්වය ඉහළයාම පාලනය කිරීම සඳහා දීර්ඝකාලීනව අවශ්‍ය යැයි පැරිස් ගිවිසුමේ සඳහන්වන සාමාන්‍යයට වඩා සෑහෙන පහළ මට්ටමක කාබන් ඩයොක්සයිඩ් විමෝචනයක් තබාගැනීම සහ ඉහළ මානව සංවර්ධනයක් අත්පත්කරගැනීම යන දෙකම සාක්ෂාත් කරගත් රටක් සඳහා උදාහරණයක් වශයෙන් ශ්‍රී ලංකාව හඳුනාගෙන ඇත.[3]

වසර පහකින් ඉහළ මැදි ආදායම් මට්ටමක් කරා ළඟා වීමේ අභිලාෂය සහ ස්වකීය මානව සංවර්ධන ප්‍රතිඵල තවදුරටත් වර්ධනය කරගැනීමේ අරමුණ සහිතව ශ්‍රී ලංකාව තවදුරටත් ඉහළට දිශානත වූ සංවර්ධන ගමන්පථයක ගමන් කරයි. ග්‍රාමීය සහ නාගරික යන ජනකොටස් දෙකෙන් ම බලශක්තිය, පිරිසිදු ජලය, කාර්යක්ෂම ප්‍රවාහනය, වඩාත් හොඳ සම්බන්ධතා සහ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ඇති ඉල්ලුම වර්ධනය වෙමින් පවතියි. ග්‍රාමීය සංවර්ධනය කඩිනම් කිරීමටත් වර්ධනය වන නගර, නගරබද ප්‍රදේශ සහ ගම්මාන සඳහා වඩාත් හොඳ යටිතල පහසුකම් සපයාදීමටත් රජය පොරොන්දු වී තිබේ. මේ සම්බන්ධයෙන් සඳහන් කරමින්, රජයේ පොදු ප්‍රතිපත්ති රාමුව වන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ *'සෞභාග්‍යයේ දැක්ම'* ප්‍රතිපත්ති ප්‍රකාශයේ, සංස්කෘතිකමය වශයෙන් සංවේදී සහ පාරිසරික වශයෙන් තිරසර රාමුවක් වටා මෙම සංවර්ධනය සිදුකෙරෙන බව සඳහන් කර ඇත.

තම ගමනේ දී ශ්‍රී ලංකාව මුහුණ දෙන සුවිශේෂ වාසි සහ අභියෝග ගණනාවක් වේ. ඓතිහාසිකව, ශ්‍රී ලංකාවේ ඉඩම් පරිහරණය, කෘෂිකර්මය, ජල කළමනාකරණය සහ අනෙකුත් ආර්ථික පිළිවෙත් තුළ තිරසරභාවයේ මූලධර්ම අන්තර්ගත වී තිබේ. රටේ ආගමික සහ සංස්කෘතික ව්‍යවහාර තුළ සරළ බව, ද්‍රව්‍යවාදී නොවීම සහ තිරසර පරිභෝජනය අගය කරයි. සෞඛ්‍ය හා අධ්‍යාපන අංශවල සිදුකළ රාජ්‍ය ආයෝජන හේතුවෙන් පුරවැසියන්ට ඉහළ සාක්ෂරතාවයක් සහ දීර්ඝායුෂ උරුම වී ඇති අතර ඒ හේතුවෙන් ඉහළ මානව සංවර්ධනයක් සහ සහශ්‍ර සංවර්ධන අභිමථාර්ථ (MDGs) කලින්ම සාක්ෂාත් කරගැනීමට හැකි වී තිබේ. කෙසේ නමුත්, මෑතකාලීනව ගංවතුර, නියගය සහ නායයෑම් හේතුවෙන් සංවර්ධන ආයෝජන අඩු වී ඇති අතර ආපදා සහන දරන්නට සිදුවීම රටේ ආර්ථිකයට සැලකිය යුතු බරක් වී තිබේ. මෙම ප්‍රවණතාවය පිළිබිඹු කරමින් ශ්‍රී ලංකාවේ ජාතික දේශගුණ විපර්යාස ප්‍රතිපත්තිය යනු බෙහෙවින් අනුහුරුවීමට නැඹුරු වූ, පහසුවෙන් බලපෑමට ලක්විය හැකි රටේ පරිසර පද්ධති සහ ආර්ථිකය මත දේශගුණ විපර්යාසවලින් ඇතිවන බලපෑම් අවමකරගැනීමට යොමු වූ දැක්මක් සහිත ප්‍රතිපත්තියක් වේ.

අඩු කාබන් පියසටහනක් සහ දේශගුණ විපර්යාසවලට ලක් වීමේ ඉහළ අවදානමක් තිබියදීත්, ශ්‍රී ලංකාව සිය හරිතාගාර වායු විමෝචන අඩු කිරීමට කැපවී සිටියි. මෙම ජාතිකව නිර්ණය කළ දායකත්ව තුළ, ශ්‍රී ලංකාව දැනට පවතින තත්ත්ව වෙනස් නොවන (BAU) තත්ත්වයකට සාපේක්ෂව, කොන්දේසි රහිතව 4%කින් ද කොන්දේසි සහිතව 10.5%කින් ද විමෝචන අඩුකිරීම සඳහා වූ කැපවීමක් සහිත ඉහළ අභිලාෂයක් ඉදිරිපත් කරයි. ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස අවම කිරීමේ බැඳීම් සහ අනුහුරුවීමේ අවශ්‍යතා, අලාභ සහ හානි, සහ ක්‍රියාත්මක කිරීමේ උපක්‍රම යන අංශ අනුව විස්තර සපයමින් මෙම ලේඛනය සංවිධානය කර ඇති එය ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලිය සහ ආයතනික ව්‍යුහය ද මෙහි දක්වා තිබේ; මෙම බැඳීම් සම්පූර්ණයෙන් සාක්ෂාත් කර ගැනීම සඳහා මූල්‍ය, තාක්ෂණික හුවමාරුව සහ ධාරිතා සංවර්ධනය යන බාහිර සහාය සඳහා වන තීරණාත්මක අවශ්‍යතාව මෙහි සාකච්ඡා කරයි. එවැනි කාලෝචිත සහයෝගයක් ඇතිව, කාබන් අධික පරිභෝජනය සහ නිෂ්පාදනයෙන් මානව සංවර්ධනය සහ ආර්ථික සමෘද්ධිය වෙන්කරන සංවර්ධන ගමන්මාර්ගයක් සාර්ථකව නිරූපණය කළ හැකි අන්දමින් ශ්‍රී ලංකාව ස්ථානගත වී සිටියි.

1 www.germanwatch.org

2 Calculated on the basis of total emissions in the 2010 GHG Inventory of the Third National Communication including LULUCF.

3 https://www.researchgate.net/publication/341053906_The_rise_of_subnations_Subnational_human_development_climate_targets_and_carbon_dioxide_emissions_in_163_countries/link/5ec6326a458515626cbbff24/download

## ශ්‍රී ලංකාවේ ජාතිකව නිර්ණය කළ දායකත්ව සම්බන්ධයෙන් විශේෂිත කරුණු සහ අඩු කාබන් අනාගතයක් සඳහා දැක්ම

දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම් හේතුවෙන් ශ්‍රී ලංකාව දැඩි අවදානමට ලක්ව ඇත. **කෘෂිකර්මය, ධීවර, පශුසම්පත්, සෞඛ්‍ය, ජලය, ජෛව විවිධත්වය, වෙරළ සහ සාගර, සංචාරක, නාගරික සැලසුම් සහ මානව ජනාවාස** යන අංශවල ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම කෙරෙහි රටේ අවධානය යොමු වී ඇත.

2010 දී ලංකාවේ ඒක පුද්ගල හරිතාගාර වායු විමෝචනය ටොන් 1.02 ක් වූ අතර 2019 දී එහි ගෝලීය සමුච්චිත දායකත්වය 0.03%කි.

මෙම අඩු කාබන් පියසටහන සහ දැඩි අවදානමකට ලක්විය හැකි තත්ත්වය තිබියදීත්, 2030 වන විට වන ආවරණය 32% කින් වැඩි කිරීමට සහ 2021-2030 කාලයේ **බලශක්ති (විදුලිබල ජනනය), ප්‍රවාහන, කර්මාන්ත, අපද්‍රව්‍ය, වනාන්තර (වන විනාශය හා හායනය)** සහ **කෘෂිකර්මයෙන්** සිදුවන හරිතාගාර වායු විමෝචනය 14.5% කින් අඩු කිරීමට ශ්‍රී ලංකාව කැප වේ.

මෙම අභිලාෂකාමී ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා, ශ්‍රී ලංකාව තවදුරටත්

- 2030 වන විට විදුලිබල ජනනයෙන් 70% ක පුනර්ජනනීය බලශක්තියෙන් ලබා ගැනීමට
- 2050 වන විට විදුලි ජනනයේදී කාබන් උදාසීනභාවය සාක්ෂාත් කර ගැනීමට
- ගල් අඟුරු බලාගාරවල ධාරිතාව ඉහළ නොනැංවීමට කැපවී සිටී.

ශ්‍රී ලංකාව මේ වන විටත් ප්‍රධාන පියවර කිහිපයක් ආරම්භ කර තිබේ;

- 2030 වන විට නයිට්‍රජන් අපද්‍රව්‍ය අඩකින් අඩු කිරීමේ අභිලාෂයක් ඇතිව 'තිරසර නයිට්‍රජන් කළමනාකරණය පිළිබඳ කොළඹ ප්‍රකාශය' සම්මත කර ගැනීම
- කෘෂි රසායනික හා රසායනික පොහොර තහනම් කිරීම
- කාබනික පොහොර හා ගොවිතැන ප්‍රවර්ධනය කිරීම
- එක් වරක් භාවිතා කරන ප්ලාස්ටික් තහනම් කිරීම
  - ඊ-සචලතාව ප්‍රවර්ධනය කිරීම
  - චක්‍රීය ආර්ථිකය ප්‍රවර්ධනය කිරීම

2050 වන විට **කාබන් උදාසීනභාවය** අත්පත් කරගැනීමට ශ්‍රී ලංකාව අපේක්ෂා කරයි.

# 1 පරිච්ඡේදය

## හැඳින්වීම

පැරිස් ගිවිසුම අපරානුමත කළ රටක් වශයෙන් ශ්‍රී ලංකාව 2016 සැප්තැම්බර් මාසයේ දී ස්වකීය ජාතිකව නිර්ණය කළ දායකත්ව (NDC) ඉදිරිපත් කරන ලදි. 26වැනි පාර්ශ්වකාර රැස්වීමට (COP26) පෙර එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය (UNFCCC) වෙත ඉදිරිපත් කිරීම සඳහා, ශ්‍රී ලංකාවේ NDC යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය 2020 දී දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය මගින් ආරම්භ කරන ලදි.

ඉදිරි දශකයේ (2021-2030) හරිතාගාර වායු විමෝචනය අවමකරගැනීමට ඇති විභවය සහ අනුහුරුවීමේ ක්‍රියාමාර්ග පිළිබඳව වඩාත් ඉහළ අපේක්ෂා සහිත වුත්, ප්‍රමාණාත්මකව හා ශක්තිමත් ඇගැයීමක් මෙම යාවත්කාලීන කළ NDC මගින් ඉදිරිපත් කරයි. ඒ නවතම විශ්ලේෂණ, වැඩිදියුණු කළ තොරතුරු හා දත්ත, සහ පාර්ශ්වකරුවන්ගෙන් විස්තීර්ණ ලෙස අදහස් විමසීම හරහාය. මෑතකාලීන විශ්ලේෂණයක් මත පදනම් වෙමින් ශ්‍රී ලංකාවේ දේශගුණ අවදානම පිළිබඳ නව සාක්ෂි මෙම NDC හරහා ඉදිරිපත් කරයි. තවද, විදුලිය, ප්‍රවාහනය, කර්මාන්ත, අපද්‍රව්‍ය, කෘෂිකර්මය සහ වනාන්තර වැනි ප්‍රධාන අංශවල අඩු-කාබන් සංවර්ධන ගමන්මාර්ග කරා යොමුවීම සඳහා සංවර්ධන හවුල්කරුවන්ගේ උපකාර සහිත මුලපිරීම් හරහා උදව් ඇති අවස්ථා ද මෙම NDC හරහා ඉදිරිපත් කර ඇත. ඉහළ මැදි ආදායම් තත්ත්වය කරා ළඟාවීමට ප්‍රත්‍යස්ථ සහ අඩු-කාබන් ගමන්මගක් ගැනීම සඳහා පැරිස් ගිවිසුමේ දෙවන වගන්තිය අනුව යමින් කඩිනමින් සපුරාලිය යුතු මූල්‍ය, තාක්ෂණ හුවමාරු සහ ධාරිතා වර්ධන අවශ්‍යතා ඒවායින් දක්වා තිබේ.

රටේ තිරසර සංවර්ධන දැක්මට පූර්ණ වශයෙන්ම ඒකාබද්ධ කර ඇති මෙම NDC සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ *'සෞභාග්‍යයේ දැක්ම'* ජාතික ප්‍රතිපත්ති රාමුවේ දැක්වෙන ප්‍රතිපත්ති ඉලක්ක මගින් පදනම සපයනු ලැබේ. *'තිරසර සංවර්ධන රාමුව තුළ දේශගුණ විපර්යාසවල බලපෑම් සඳහා අනුහුරුවීම සහ බලපෑම් අවම කිරීම'* සඳහා වන ජාතික කැපවීම පිළිබඳව ශ්‍රී ලංකාවේ ජාතික දේශගුණ විපර්යාස ප්‍රතිපත්තියේ (2012) විස්තර කර ඇත. මෑතකාලීනව සම්පාදිත තිරසර සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රමෝපායෙහි (කෙටුම්පත) *'දේශගුණ විපර්යාසවල බලපෑම් සඳහා අනුහුරුවීම සහ බලපෑම් අවමකිරීම සහතික කරන අතරේම, දේශගුණ විපර්යාස සම්බන්ධයෙන් වන ජාතික කැපවීම්'* සාක්ෂාත් කරගැනීම ප්‍රතිපත්තිමය අරමුණක් ලෙස පිළිගෙන තිබේ.

2016 දී, NDC ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය සඳහා සහය වනු පිණිස, ශ්‍රී ලංකාව 2016-2019 සූදානම් සැලසුම (Readiness Plan) සම්පාදනය කරන ලදි. එහි NDC සාක්ෂාත් කරගැනීමට සඳහා අවශ්‍ය වන පූර්ව අවශ්‍යතා පහසුකම් සැලසීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග එහි සවිස්තරාත්මකව දක්වා තිබුණි. දේශගුණ විපර්යාස අවම කිරීම, අනුහුරුවීම සහ අලාභ හා හානි සඳහා දායක වන ප්‍රධාන අංශ කැඳවා පවත්වන ලද වාර්ෂික මෙහෙයුම් කමිටු රැස්වීම්වලදී මෙම සැලසුම සමාලෝචනය කරන ලදි. මෙම NDC සාක්ෂාත් කරගැනීම සඳහා, ජාතික සහ උප ජාතික මට්ටම්වලින් අදාළ අංශවල ක්‍රියාත්මක වන ආයතන තමන්ගේ සාමාන්‍ය සංවර්ධන සැලසුම් සම්පාදන රාමුව තුළට NDC ඇතුළත් කරගනු ඇතැයි අපේක්ෂා කෙරේ. එම ආයතනවල කාර්ය සැලසුම්වල, වාර්ෂික අයවැයෙහි, සහ ආධාර ලබාදෙන්නන් වෙත යවන යෝජනා තුළ, දේශගුණ විපර්යාස අවම කිරීමේ සහ අනුහුරුවීමේ ප්‍රමුඛතා පිළිබිඹු වන බව මෙයින් සහතික කරනු ඇත.

බාහිර ආධාර, රජයේ මුදල් සහ පෞද්ගලික අංශයේ ආයෝජන මගින් ශ්‍රී ලංකාවේ NDC සඳහා සහය ලබාදෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෘෂිකර්මය, පශුසම්පත්, ධීවර කර්මාන්තය, ජලය, සෞඛ්‍ය, ජෛව විවිධත්වය, වෙරළබඩ හා සමුද්‍රය, නාගරික සැලසුම හා මානව ජනාවාස, සංචාරක කර්මාන්තය සහ යන ප්‍රධාන අංශ කෙරෙහි අවධානය යොමු කරමින් අනුහුරුවීමේ අවශ්‍යතා සහ ප්‍රත්‍යස්ථතාවය ගොඩනැංවීමේ ක්‍රියාකාරකම් කෙරෙහි ශ්‍රී ලංකාව ප්‍රමුඛතාවය දෙනු ඇත. සංවර්ධනය සඳහා සිදුකළ ආයෝජන නොකඩවා පවතින අන්ත දේශගුණ තත්වයන්ට නිරාවරණය හේතුවෙන් හායනය නොවන බවත් ආර්ථික වර්ධනය හා මානව සමෘද්ධිය පිළිබඳ තමන්ගේ අභිලාෂ නිසි ලෙස සාක්ෂාත් කරගන්නා බවත් සහතික කරගැනීම සඳහා, අනුහුරුවීම කෙරෙහි අවධානය යොමුකිරීම ශ්‍රී ලංකාවට වැදගත් වේ. හරිතාගාර වායු විමෝචන තීව්‍රතාවයන් සහ එම ක්‍රියාවන්ගෙන් පැනනගින ආර්ථික, සමාජ හා පාරිසරික සම-ප්‍රතිලාභ මත පදනම් වෙමින් දේශගුණ විපර්යාස අවමකිරීම සඳහා ආයෝජනය කිරීමට ප්‍රමුඛතාවය ලබාදෙනු ඇත.

ගෝලීය පුරවැසියකු වශයෙන් ශ්‍රී ලංකාව, පැරිස් ගිවිසුමේ අරමුණ වන ගෝලීය උණුසුම සීමා කිරීම සම්බන්ධයෙන් ස්වකීය වගකීම පිළිගනියි. එළඹෙන දශකය තුළ, ඉහළ ආදායම් සහ මානව සංවර්ධනයක් සාක්ෂාත් කරගැනීමට දැඩි අවධානයක් යොමු කරමින්, දේශගුණ විපර්යාස අවම කරන සහ ඊට අනුහුරුවන අඩු-විමෝචන ගමන්පථයක තම සංවර්ධනය, විශේෂයෙන් පශ්චාත් - COVID-19 ආර්ථිකය යථා තත්වයට පත් කිරීම සහ ජීවනෝපාය අවශ්‍යතා සපුරාලීම, මෙහෙයවීමට ශ්‍රී ලංකාව ප්‍රයත්න දරනු ඇත. එබැවින්, NDC ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමටත් ස්වකීය ජනතාව වෙනුවෙන් ඉහළ ආර්ථික සහ සමාජ සුබසෙතක් ළඟාකරගැනීමට දරන වෑයම අඩු කාබන් ගමන්පථයක පවත්වාගෙන යාමටත් අවශ්‍ය කර තිබෙන, 9 වැනි පරිච්ඡේදයේ සැකෙවින් දක්වා ඇති තාක්ෂණික, මූල්‍ය සහ අමතර ධාරිතා වර්ධන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රජාව යොමුවෙයි.

## 1.1 ශ්‍රී ලංකාවේ පසුබිම

වර්ග කිලෝමීටර 65,610ක වපසරියකින් සහ මිලියන 21.8ක[4] ජනගහණයකින් යුත් දූපත් රාජ්‍යයක් වන ශ්‍රී ලංකාව තරමක ජනඝනත්වයකික් යුක්ත, විශේෂයෙන් ම රටේ නාගරිකකරණය වූ හා කාර්මිකරණය වූ නිරිතදිග වෙරළ තීරය ජනාකීර්ණ වූ රටක් වේ. සමකයට අංශක 7ක් උතුරින් තෙත් නිවර්තන කලාපයේ පිහිටා ඇති ශ්‍රී ලංකාවට වාර්ෂිකව පතිත වන සාමාන්‍ය වර්ෂාපතනය මිලිමීටර 1860ක් වන අතර, එය දළ වශයෙන් ජලය කියුබික් මීටර බිලියන 122කට සමාන වේ. කෙසේනමුත්, ඒ වර්ෂාපතනය කලාපයෙන් කලාපයට වෙනස්වන අතර මධ්‍යම කඳුකරයේ දී මිලිමීටර 5500ක් පමණ වන අතර, වයඹ සහ ගිනිකොනදිග වෙරළබඩ තැනිතලාවල එය මිලිමීටර 950ක් පමණ වේ. රටේ තැනිතලා ප්‍රදේශවල මධ්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙල්සියස් අංශක 24ත් 31ත් අතර වන අතර කඳුකර ප්‍රදේශවලදී මෙය සෙල්සියස් අංශක 18 ත් 27ත් අතර අගයක් ගනියි. වාර්ෂික වර්ෂාපතනය ප්‍රධාන වශයෙන්ම මෝසම් කාල දෙකක් සහ අන්තර්-මෝසම් කාල දෙකක් යනුවෙන් ඍතු හතරක් ලෙස ව්‍යාප්තව පතිත වේ.

මෙවැනි විශාලත්වයකින් යුත් රටක් වුවද ශ්‍රී ලංකාවේ සංකීර්ණ දේශගුණයක් ඇති අතර, ඒ හේතුවෙන් කෘෂි-දේශගුණවිද්‍යාත්මක කලාප 45 ඉක්මවන සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවේ දැකගත හැක. කෙසේනමුත්, සාමාන්‍යයෙන් වර්ෂාපතනය අනුව රටට වැඩි වර්ෂාපතනයක් ලැබෙන නිරිතදිග ප්‍රදේශයේ තෙත් කලාපය හා උතුරු, උතුරු-මැද හා නැගෙනහිර තැනිතලා ප්‍රදේශයේ අධික ලෙස වියළි කලාපයෙන් එය වෙන් කරන අන්තර්මාධ්‍ය කලාපය යන ප්‍රධාන දේශගුණික කලාප තුනකට වෙන්කරනු ලැබේ. රටේ වෙරළබඩ ප්‍රදේශයේ පවතින තැනිතලාබිම් රට මධ්‍යයට එන විට මුහුදු මට්ටමේ සිට මීටර් 2000කට වැඩි උසකින් යුත් මධ්‍යම කඳුකරයක් දක්වා වර්ධනය වේ. රටේ භූමි ප්‍රදේශය මෙන් විසි ගුණයකට ආසන්න විශාලත්වයක සමුද්‍රීය ආර්ථික කලාපයකට ශ්‍රී ලංකාව හිමිකම් කියන නමුත් ආර්ථික වශයෙන් අඩුවෙන්ම භාවිතා කර ඇත්තේ මෙම සම්පතයි.

විවිධත්වයෙන් සපිරි භූ ලක්ෂණ සහ විවිධ වූ නිවර්තන දේශගුණ තත්ත්ව පැවතීම හේතුවෙන් රට තුළ ශාක සහ සත්ත්ව විවිධත්වය අතිශයින්ම ඉහළ මට්ටමක පවතින අතර, ඒවායේ ආවේණිකත්වය ද ඉහළ අනුපාතයක් ගනියි. රටේ භූමියෙන් 30%ක් පමණ අභයභූමි, රක්ෂිත සහ ජාතික උද්‍යාන වශයෙන් රටේ නීතියෙන් ආරක්ෂා වී තිබේ. සංචාරක කර්මාන්තය, ධීවර කර්මාන්තය හා සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව හරහා සැලකිය යුතු ආර්ථික ප්‍රතිලාභ රටට හිමිකරදීමට මෙම ජෛව විවිධත්වය උපකාරී වී ඇති අතර, ජලය, පරිසර සුන්දරත්වය, දේශගුණ බලපෑම් සමනය සහ පස තත්වාරෝපණය වැනි ගණනය නොකළ විවිධ පරිසර පද්ධති සේවා සලසා දෙයි. වෙනස්වන දේශගුණයෙන් ජෛව විවිධත්වයට ඇතිව තිබෙන බලපෑම ප්‍රමාණවත් තරමින් අධ්‍යයනයකට පාත්‍ර කර නොමැති නමුත් මත්ස්‍යයින්, උභයජීවීන් හා උරගයින් වැනි ආවේණික සත්ත්ව කාණ්ඩ මත සහ කොරල්, මුහුදු තෘණ හා කලපු වැනි වෙරළබඩ වාසස්ථාන මත ඉන් සැලකිය යුතු බලපෑමක් ඇතිකරන බව මූලිකව සිදුකර ඇති අධ්‍යයනවලින් පෙනී ගොස් තිබේ.

පහළ-මැදි-ආදයම් ලබන රටක් වශයෙන් වර්ගීකරණය වී ඇති ශ්‍රී ලංකාවේ ආර්ථිකය ප්‍රධාන වශයෙන්ම නැව් කටයුතු, සංචාරක කර්මාන්තය, ගුවන්සේවා යනාදී සේවා මත බෙහෙවින් රඳා පවතියි. 2010 දී ශ්‍රී ලංකා ආර්ථිකයෙන් 54.6%කට දායක වූ සේවා අංශය, 2019 වනවිට 58.2% දක්වා ඉහළ යද්දී කර්මාන්ත අංශය දශකයකට පෙර පැවති 26.4% සිට 27.4% දක්වා ඉහළ නැග තිබෙන අතර, කෘෂිකර්ම අංශයේ දායකත්වය 7.4% වී තිබේ. විශේෂයෙන්ම තේ සහ කුළුබඩු සඳහා තරඟකාරී අපනයන කෘෂිකර්ම අංශයක් පැවතිය ද, රටේ ශ්‍රම බලකායෙන් 30%ක් තවමත් එම ක්ෂේත්‍රයේ සේවා නියුක්තව සිටිය ද, කෘෂිකර්මාන්තයේ ආර්ථික වැදගත්කම ක්‍රමයෙන් පහළ බැස ඇත. රටේ මිලියන 2ක පමණ ගොවි ජනතාවක් සිටින අතර, ඉන් බහුතරයක් හෙක්ටාර 1ට වඩා අඩු භූමි ප්‍රමාණයක් වගා කරන සුළු පරිමාණ ගොවීන් වේ. බලයට පත් වූ විවිධ රජයයන් කෘෂිකර්මය සඳහා සහ වාරිමාර්ග ව්‍යාප්ත කිරීම සඳහා ආයෝජන සිදුකර ඇතත්, රටේ ආහාර සුරක්ෂිතතාවයට හා ජීවනෝපායට ද, අපනයන ආදයමට ද දේශගුණ විපර්යාස දැනටමත් අහිතකර බලපෑම් ඇතිකරමින් පවතියි. තේ වගාකරන දිස්ත්‍රික්කවල දීර්ඝ කාලයක් පැවති නියගය හේතුවෙන් 2020 තේ එලදාව මෑත 30 වසරක් තුළ ලැබුණු අඩුම අස්වැන්න බවට පත් වී තිබේ. 2016 සහ 2017 වර්ෂවල ඇතිවූ ගංවතුරින් මිලියනයකට වැඩි ගොවීන් සංඛ්‍යාවක් බලපෑමට පත්විය. ගෝලීය ආහාර සුරක්ෂිතතා දර්ශකයේ (2019) ශ්‍රී ලංකා ශ්‍රේණිගතකිරීම 66/113 වන අතර, රටේ මිලියන 21ක ජනගහණයෙන් මිලියන 4.1කට (සමස්ථ ජනගහණයෙන් 25%කට වැඩි ප්‍රමාණයකට) සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගතකිරීමට අවශ්‍ය පෝෂ්‍යදායී ආහාර නොලැබෙන බව ආහාර හා කෘෂිකර්ම සංවිධානය ඇස්තමේන්තු කර තිබේ. ළමයින් කුරුවීමේ හා කෘෂවීමේ ඉහළ අනුපාත මගින් පෙන්නුම් කරන ළමා මන්දපෝෂණය සංවර්ධනයට අභියෝගයක් වේ. පුරෝකථනය කර ඇති දේශගුණ විපර්යාස මගින් මෙම තත්ත්ව තවදුරටත් උග්‍ර කරවනු ඇත.

දරිද්‍රතාවය තුරන් කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට අදළව ශ්‍රී ලංකාව විශිෂ්ට තත්ත්වයක් වාර්තා කර තිබේ. මීට විසි වසරකට පෙර තිබූ තත්ත්වයේ (2000 දී 28.8%ක්) සිට ප්‍රශංසනීය ප්‍රගතියක් පෙන්නුම් කරමින් සමස්ථ දුගීබවේ අනුපාතය 4.1%ක් වී තිබේ.[5] කෙසේනමුත්, දුගීබව පැතිරීමේ ප්‍රමාණය ගත්කළ එහි පුළුල් අසමානතා පවතියි - විශේෂයෙන්ම ජනගහන ඝනත්වය අඩු, සේවා ලැබීම අඩු සහ ප්‍රධාන වශයෙන්ම කෘෂිකර්මය මත යැපෙන දිස්ත්‍රික්කවල වඩාත් ඉහළ දරිද්‍රතා

4 ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාලේඛන 2020, ශ්‍රී ලංකා මහ බැංකුව

5 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, කුටුම්භ ආදායම් හා වියදම් සමීක්ෂණය, 2016

අනුපාතයක් පවතියි (මොණරාගල, මුලතිව්, නුවරඑළිය සහ මඩකලපුව). මේ සාධක හේතුවෙන් මෙම දිස්ත්‍රික්ක දේශගුණ පරාමිතීන්ට වඩාත් සංවේදී වන අතර දේශගුණ ආපදාවලට මුහුණදීමට ඒවාට ඇත්තේ අඩු ධාරිතාවයක් බැවින් දේශගුණ විපර්යාසවලින් වැඩි අවදානමකට ලක් විය හැකි බවක් පෙන්වයි. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් දරිද්‍රතා රේඛාවට මදක් ඉහළින් වාසය කරයි. රටේ සෑම සිවුදෙනෙකුගෙන්ම එක් අයෙක් දිනකට ඩොලර් 2.50ට අඩු මුදලකින් ජීවත් වන බව 2015 දී ලෝක බැංකුවෙන් ගණනය කර තිබුණි. මෙම ජනතාව ආර්ථික හෝ දේශගුණික කම්පන මගින් අහිතකර ලෙස බලපෑමට ලක්වන අතර, තමන් වෙනුවෙන් වන රැකවරණ ජාලයක් හෝ ඉතුරුම් නොමැති ඔවුන්ට එවැනි තත්ත්වයකට මුහුණ දී නැවතත් යථාතත්ත්වයට පත්ව තමන්ගේ ජීවනෝපාය නැවතත් කරගෙනයෑමට ඇති හැකියාව අඩපණ වී තිබේ.

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් බහුතරයක් තවමත් වාසය කරන්නේ ග්‍රාමීය ප්‍රදේශවල වීමත්, ඔවුන් තවදුරටත් කුඩා පරිමාණ ගොවිතැනේ හෝ ධීවර කර්මාන්තයේ හෝ කෘෂිකාර්මික අගය දාමයේ සේවයේ නිරත වී සිටීමත් යන කරුණු ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස අවදානම තවදුරටත් උග්‍ර කරවයි. කෙසේනමුත්, ශ්‍රී ලංකාව පවත්වාගෙන ඇති සමස්ථ-වශයෙන්-අඩු-විමෝචන සහිත වර්ධන ගමන්පථය සඳහා, ශ්‍රී ලංකාවේ නාගරිකකරණය අඩුවීම සෑහෙන තරමකින් දයක වී තිබේ. එහෙත්, ආන්තික දේශගුණ සිදුවීම් සහ ග්‍රාමීය ආර්ථිකයට පදනම සලසන සාමාන්‍ය මෝසම් රටාවේ ඇතිව තිබෙන අක්‍රමවත්බව හේතුවෙන් මෙම ග්‍රාමීය ජීවන රටාව වැඩි වැඩියෙන් තර්ජනයට ලක්වෙමින් පවතියි.

ශ්‍රී ලංකාවේ විරැකියා අනුපාතය පහළ මට්ටමක පවතියි. එහෙත්, ශ්‍රම බලකා සහභාගීත්වය (52.3%) සහ විධිමත් ශ්‍රම බලකායට කාන්තාවන්ගේ දායකත්වය (34%) අතින් මැදි ආදායම් රටක් වශයෙන් ශ්‍රී ලංකාව සිටින්නේ පහළ මට්ටමක ය. වඩා උගත් තරුණ පිරිස් අතර ඉහළ මට්ටමක (2019 දී 11%) පවතින විරැකියාව අධ්‍යාපන ලබාගැනීම සහ සේවා නියුක්ති කුසලතා අතර පුළුල්වෙමින් පවතින පරතරයක් පෙන්නුම් කරයි. කාන්තාවන් අධ්‍යාපනය ලබාගැනීම ඉහළ මට්ටමක පවතින අතර, ඔවුන් විධිමත් පාසල් අධ්‍යාපනයේ වසර 13ම සම්පූර්ණ කිරීමට ඇති ඉඩ වඩාත් වැඩි ය. නොමිලේ පාසල් අධ්‍යාපනය ලබාදීමටත් වෘත්තීය සහ තෘතියික අධ්‍යාපනය ලබාදීමෙන් මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීමටත් සිදුකර ඇති ආයෝජන හේතුවෙන් තාක්ෂණයෙන් උසස්, හරිත රැකියාවලින් ප්‍රතිලාභ ලැබියහැකි උගත්, තරුණ ශ්‍රම බලකායක් නිර්මාණය වී තිබේ. විශේෂයෙන්ම, දුරස්ථ ග්‍රාමීය ප්‍රදේශවල වාසය කරන තරුණ තරුණියන්ට වඩාත් වාසිදායකවූත් පරිසර හිතකාමීවූත් ජීවනෝපාය අවස්ථා ළඟාකරදීම සඳහා ශ්‍රී ලංකාවේ තොරතුරු සන්නිවේදන තාක්ෂණය පුළුල් ලෙස ව්‍යාප්ත වී පැවතීම සහ බහුල ලෙස ජංගම දුරකථන භාවිතය මගින් සෑහෙන ප්‍රගමනයක් ලබාදෙයි.

COVID-19 වසංගතය ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සැලකිය යුතු ලෙස බලපා ඇත. බරපතළබව සහ මරණ අනුපාතය වැඩිකරවමින් ඇතිවන රෝග ව්‍යාප්ති රැළි කළමනාකරණය කිරීම සඳහා අගුලු දැමීම, සංචරණ සීමා පැනවීම සහ දේශසීමා වසා දැමීම සඳහා ගන්නා පියවර සමගින් ආර්ථිකය අවපාතයට පත් කර ඇති අතර අත්‍යවශ්‍ය අංශ අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා උදවු ලබාදීමට රජයට සිදුව තිබේ. සංචාරක, නිෂ්පාදන, ප්‍රවාහන සහ විදේශගත ශ්‍රමිකයින්ගෙන් ලැබෙන මුදල් ඊට ඇතුළත්ය. වසංගත සමයේ ගෝලීය වශයෙන් හොඳ ඉල්ලුමක් තිබූ නිෂ්පාදන වන තේ සහ පොල් වැනි නිෂ්පාදන, නියඟය සහ අඩු නිෂ්පාදනය හේතුවෙන් බලපෑමට ලක් විය. 2020 වර්ෂයේ සෘණාත්මක ආර්ථික වර්ධනයක් වාර්තා වූ අතර, දේශීය නිෂ්පාදනයේ වර්ධනය හා දිරිගැන්වීම් සඳහා බලවත් උනන්දුවක් ඇති වී තිබේ. ශ්‍රී ලංකාවට බලපාන ප්‍රධාන පාරිසරික ගැටලු පිළිබඳව හරිත සංවර්ධන රාමුවක් සඳහා රජය කැප වී තිබේ. එවැනි ප්‍රතිපත්තිවලට මූල්‍යමය දිරි දීමනා හා තාක්ෂණික ආධාර ලැබෙන්නේ නම්, වැඩි තිරසරභාවයක් සඳහා ප්‍රතිසාධන උත්සාහයන් යොමු කළ හැකිය. COVID-19 තත්ත්වයෙන් පසු නැවතත් යථාතත්ත්වයට පත්වීමේදී ශ්‍රී ලංකාවට සලකා බැලිය හැකි නිශ්චිත ආයෝජන අංශ කිහිපයක් තිබෙන අතර, NDC සංශෝධන ක්‍රියාවලියේදී ඒවා සාකච්ඡාවට ගෙන ඇත. ඒවා නම්:

- දේශීය ආහාර නිෂ්පාදන පද්ධති- කෘෂිකර්මය සහ ධීවර කර්මාන්තය - දේශගුණ සංවේදී හා පාරිසරිකව තිරසර බව සහතික කිරීම
- කෘෂිකාර්මික ඵලදායිතාව සහ ආහාර සුරක්ෂිතතාව සඳහා කාන්තාවන්ට දිරි ගැන්වීම් ලබාදීම;
- කාර්යක්ෂම ලෙස ජල කළමනාකරණය සහ වාරිමාර්ග පද්ධති ප්‍රවර්ධනය කිරීම;
- සේවා ඩිජිටල්කරණය සහ තිරසර සෞඛ්‍ය/රෝහල් අපද්‍රව්‍ය කළමනාකරණය ඇතුළු සෞඛ්‍ය අංශයේ ධාරිතාවය ඉහළ නැංවීම;
- පුනර්ජනනීය බලශක්තිය, බලශක්ති කාර්යක්ෂමතාව, අපද්‍රව්‍ය කළමනාකරණය, හරිත කර්මාන්ත සහ ප්‍රවාහන මූලාරම්භයන් යනාදියේ හරිතාගාර වායු විමෝචන අවම කිරීම සඳහා ප්‍රතිපත්ති සහ දිරිගැන්වීම් සක්‍රීය කිරීම;
- COVID-19 මගින් ජීවනෝපාය කෙරෙහි, විශේෂයෙන් සංචාරක ක්ෂේත්‍රයට ඇති කරන දැඩි අහිතකර බලපෑම් විසඳීම සඳහා බහු-ප්‍රතිලාභ උපදවන පරිදි ආර්ථිකය විවිධාංගීකරණය කිරීම.

# 2 පරිච්ඡේදය

## දේශගුණ විපර්යාස සම්බන්ධ ජාතික දැක්ම සහ ප්‍රතිචාර

දේශගුණ විපර්යාස මගින් එල්ලවන අභියෝග සඳහා ප්‍රතිචාර දැක්වීමට, ශ්‍රී ලංකා ජාතික දේශගුණ විපර්යාස ප්‍රතිපත්තිය (2012), ශ්‍රී ලංකාව සඳහා වන ජාතික දේශගුණ විපර්යාසවලට අනුහුරුවීමේ ක්‍රමෝපාය - 2010, දේශගුණ විපර්යාසවල බලපෑම් සඳහා ජාතික අනුහුරුවීමේ සැලසුම (NAP) (2016), දේශගුණ විපර්යාසවලට අනුහුරුවීම සහ අවමකිරීම සඳහා වන තාක්ෂණ අවශ්‍යතා ඇගැයුම හා තාක්ෂණ ක්‍රියාකාරී සැලසුම 2014, ජාතික වශයෙන් උචිත අවමකිරීමේ ක්‍රියාමාර්ග (NAMA), සහ දේශගුණ විපර්යාස පිළිබඳ ආංශික අවදානම් පැතිකඩ (2010) වැනි ජාතික ප්‍රතිපත්ති, ක්‍රමෝපාය සහ ක්‍රියමාර්ග හඳුන්වාදීම ඔස්සේ ශ්‍රී ලංකාව පියවර කිහිපයක් ම ගෙන තිබේ.

බලශක්තිය, නාගරික සැලසුම්කරණය, අපද්‍රව්‍ය, ප්‍රවාහනය, කර්මාන්ත, වෙරළ සහ සමුද්‍රය, වනාන්තර, ජලය, සෞඛ්‍ය, සංචාරක කර්මාන්තය සහ විනෝදස්වාදය, ජෛව විවිධත්වය, කෘෂිකර්මය, පශුසම්පත් සහ ධීවර කර්මාන්තය වැනි සංවර්ධනයේ ප්‍රධාන අංශවල දේශගුණ විපර්යාස මුඛ්‍යධාරාගත කිරීමට ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස සහ ජාතික තිරසර සංවර්ධන ප්‍රතිපත්ති මගින් උත්සාහ දරනු ලැබේ. මේ අතරින් ඇතැම් අංශවලට දැනටමත් දේශගුණ විපර්යාස අවදානම් සහ කැපවීම් ඒකාබද්ධ කර තිබේ. විශේෂයෙන් ම, ශ්‍රී ලංකා ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ ක්‍රමෝපායයන් (2019) හා දීර්ඝ කාලීන විදුලි ජනන ව්‍යාප්ති සැලසුම 2018-2037, ජාතික අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය (2019), ශ්‍රී ලංකාව සඳහා වන ජාතික තිරසර පරිභෝජන හා නිෂ්පාදන ප්‍රතිපත්තිය (2019), ජාතික වෙරළබඩ කළාපය සහ වෙරළබඩ සම්පත් කළමනාකරණ සැලසුම (2018), ජාතික REDD+ අයෝජන රාමුව සහ ක්‍රියාකාරී සැලසුම (NRIFAP), 2018 දේශගුණික විපර්යාස සඳහා වාරිමාර්ග හා ජල සම්පත් අංශය අනුහුරුවීම කිරීම සඳහා වූ උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම, ස්වාභාවික ගෑස් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2019), ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2013), ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ සැලැස්ම 2018-2030, කෘෂිකාර්මික ප්‍රතිපත්තිය (සමාලෝචනය කෙරෙමින් පවතියි) යටතේ දේශගුණික විපර්යාසවල බලපෑම් සහ අවම කිරීමේ ක්‍රියාමාර්ග ඒකාබද්ධ කර ඇති අතර, අඩු විමෝචනයක් සහිත සංවර්ධන ක්‍රමෝපාය සවිස්තරාත්මකව දක්වා ඇත. මෑතකාලීනව, පුනර්ජනනීය බලශක්ති ව්‍යාප්තිය සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන එක් රැස්කර මෙහෙයවීම සම්බන්ධයෙන් බලශක්ති අංශය සැලකිය යුතු සංවර්ධනයක් වාර්තා කර තිබේ. ආකර්ෂණීය පෝෂක අයක්‍රම (feed-in tariffs), සූර්ය බලශක්ති ශුද්ධ මණුකරණය (net-metering) සහ ශුද්ධ ගණනය (net-accounting), පියැසි මත සූර්ය බලශක්ති ජනන ව්‍යාප්තිය සඳහා ආකර්ෂණීය මූල්‍යකරණ ක්‍රම, ඇතැම් විදුලි උපකරණ සඳහා බලශක්ති කාර්යක්ෂමතාවය දැක්වෙන ලේබල් ලබාදීම, සහ තාපදීප්ත විදුලිබුබුළු ක්‍රමයෙන් ඉවත් කිරීම වැනි පියවර ජාතික විදුලි සැපයුමට පුනර්ජනනීය බලශක්තිය ඇතුළත් කිරීමටත් බලශක්ති ඉල්ලුම අඩුකිරීමටත් හේතු වී තිබේ.

හරිතාගාර වායු අවම කිරීම සඳහා වූ ශ්‍රී ලංකාවේ කොන්දේසි සහිත NDC සාක්ෂාත් කරගැනීමට නම්, ඒ සඳහා පුළුල් මට්ටමක ජාත්‍යන්තර සහයෝගයක් අවශ්‍ය වේ. පුනර්ජනනීය බලශක්ති සම්පත් වැඩි වශයෙන් භාවිත කිරීම, බලශක්ති ගබඩාකරණ පද්ධති පුළුල් කිරීම හා විදුලි බල බෙදාහැරීමේ ජාලය වඩාත් දියුණුකිරීම, කාර්යක්ෂම සහ ඵලදායී ලෙස අපද්‍රව්‍යවලින් බලශක්තිය උත්පාදනය, පොදු ප්‍රවාහනය නවීකරණය, මහාමාර්ග සහ දුම්රිය මාර්ග පද්ධතිය වඩාත් දියුණුකිරීම වැනි කටයුතු සඳහා දේශගුණ මූල්‍යකරණය සහ තාක්ෂණික පැවරුම් උපකාර ලබාගැනීමට එළඹෙන දස වසර තුළ ශ්‍රී ලංකාව වෑයම් දරනු ඇත. ඒ අතර ම, දේශගුණ අවදානම සහ ජීවිත හා ජීවනෝපාය මත කාලගුණ ආපදා මගින් ඇතිවන බලපෑම් ආමන්ත්‍රණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය බහුවිධ ක්‍රියාමාර්ග ගෙන තිබේ. ඛාදනය වන වෙරළ තීරය සංවර්ධනය/ ශක්තිමත් කිරීම, නියගය සමනය කිරීම සඳහා වාරිමාර්ග සහ ගංගාද්‍රෝණිවලින් ඔබ්බට ජලය හැරවීම ව්‍යාප්ත කිරීම, කාලගුණවිද්‍යා ධාරිතාවය සහ ගංවතුර/ නායයෑම් පිළිබඳව පූර්ව අනතුරු ඇඟවීමේ ධාරිතාවය වැඩිදියුණු කිරීම ඒ අතරට ඇතුලත් වේ. මාර්ග, ජලාශ සහ නව ජනාවාස වැනි සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමේදී ඒවා ආපදාවලට නිරාවරණයවීමත් ඒ හරහා ඇතිවිය හැකි දේශගුණය හා සම්බන්ධ අවදානම පිළිබඳව වැඩි වැඩියෙන් සලකාබැලීමට ගෙන ඇතත්, සංවර්ධනය වෙමින් පවතින රටකට මේවා සම්පූර්ණයෙන් අවම කිරීමේ පියවර පරාසයකට යෑම මූල්‍යමය හා තාක්ෂණික වශයෙන් අභියෝගාත්මක ය.

# 3 පරිච්ඡේදය

## ජාතිකව නිර්ණය කළ දයකත්ව සමාලෝචන ක්‍රියාවලිය

ජාතිකව නිර්ණය කළ දයකත්ව (NDC) සමාලෝචන ක්‍රියාවලිය 2020 දී පරිසර අමාත්‍යාංශයේ දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය හරහා දියත් කරන ලදි. 2020 පැවැත්වෙන COP 26 සමුළුවට පෙර ලෝකයේ රටවල් සියයකට තමන්ගේ දේශගුණ විපර්යාස අභිලාෂයන් වඩාත් උසස් තත්වයකට ගෙනඒමට සහයදීම අරමුණු කරගෙන දියත් කළ දේශගුණ පොරොන්දුව (Climate Promise) නැමැති ගෝලීය ව්‍යාපෘතියක් හරහා, 2019 අගභාගයේ දී මෙම ක්‍රියාවලිය සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) සහාය ලැබුණි. ඒ අනුව 2020 පෙබරවාරි මාසයේ දී මෙම සහාය දියත් කරන ලදි. හරිතාගාර වායු අවමකිරීම සහ අනුහුරුවීම යන මාතෘකා යටතේ එක් එක් අංශයට අදළව විද්වතුන් සහ වෘත්තිකයින්ගෙන් සමන්විත වන ක්‍රියාකාරී කණ්ඩායම් පිහිටුවන ලද අතර, අලාභ සහ හානි පිළිබඳව සාකච්ඡාව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහ දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලයේ සම-නායකත්වය යටතේ මෙහෙයවන ලදි.

මූලික පියවරක් වශයෙන් ජාතික උපදේශකවරුන් විසින් 2016 NDC පිළිබඳ ලේඛන සමාලෝචනයක් (desk review) සිදුකළ අතර ජාතික ප්‍රතිපත්ති ලේඛන, ආංශික මහ සැලසුම්, දේශගුණ විපර්යාස සම්බන්ධයෙන් වන ජාතික අනුහුරුවීමේ සැලසුම (2016-2025), දේශගුණ විපර්යාසවලට අනුහුරුවීම සහ හරිතාගාර වායු අවම කිරීම සඳහා වන තාක්ෂණික අවශ්‍යතා ඇගයුම, සහ තෙවන ජාතික සන්නිවේදනය (TNC) සඳහා සූදනම් කළ හරිතාගාර වායු ඉන්වෙන්ටරිය ඇතුළුව තෙවන ජාතික සන්නිවේදන කෙටුම්පත යනාදී පවතින ලිපිලේඛන ඒ සඳහා පදනම් කරගනු ලැබීය. ඉන් සොයාගත් කරුණු, එක් එක් අංශයට අදළව පිහිටුවන ලද තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම් සමගින් සිදුකළ සාකච්ඡා ඔස්සේ තහවුරු කරගන්නා ලදි. තෙවන ජාතික සන්නිවේදනය (කෙටුම්පත) හා ශ්‍රී ලංකාවේ දේශගුණ අවදානම - ආංශික අවදානම් පැතිකඩ (කෙටුම්පත), බලශක්තිය පිළිබඳ ආන්තික අවම පිරිවැය වක්‍රතා විශ්ලේෂණය, අඩු-කාබන් සංවර්ධන උපායමාර්ගය (කෙටුම්පත), ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම (කෙටුම්පත) හා ජාතික REDD+ ආයෝජන රාමුව හා ක්‍රියාකාරී සැලැස්ම වැනි දේශගුණ අවදානම හා අවදානමට ලක් විය හැකිබව පිළිබඳ මෑතකාලීන සාකච්ඡා හා විශ්ලේෂණ මත NDC වර්ධනය කර ඇත.

2020 මාර්තු-මැයි කාලය තුළ COVID-19 ව්‍යාප්තිය පාලනය පිණිස පැනවූ සීමාකිරීම් හේතුවෙන්, සියලුම ක්‍රියාකාරී කණ්ඩායම් සමගින් සහ ප්‍රධාන NDC කණ්ඩායම සමගින් අන්තර්ජාලය හරහා රැස්වීම් හා සාකච්ඡා පවත්වන ලදි. ඉන් සැකසූ NDC කෙටුම්පත, මුහුණට මුහුණලා හමුවී රැස්වීම් සහ සාකච්ඡා පැවැත්වීමට හැකියාව ලබාදෙමින් සීමා කිරීම් ලිහිල් කළ පසුව, 2020 ජූලි මාසයේ සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ, (එක් එක් අංශය අනුව) වඩා පුළුල් පාර්ශ්වකාර කණ්ඩායම් වෙත ඉදිරිපත් කරන ලදි.

එක් එක් අංශයේ NDC සඳහා වන සංවර්ධන ප්‍රමුඛතා, ආයතනික ව්‍යුහ, රාජ්‍ය මුදල් තිබේද යනවග, සහ මූල්‍යකරණ හා ධාරිතා අවශ්‍යතා කවරේද යන්න අවබෝධ කරගැනීම පිණිස ආංශික ආයතන/ අමාත්‍යාංශ සමග වෙනම සාකච්ඡා පවත්වන ලදි. ක්‍රියා/ උප ක්‍රියා, ඉලක්ක, සහ වගකිවයුතු ආයතන පැහැදිලිව දැක්වෙන සවිස්තරාත්මක ක්‍රියාත්මක කිරීමේ සැලසුම් මේ එක් එක් අංශයට අදළව සම්පාදනය කෙරෙනු ඇත. ගැටලුවකින් තොරව ක්‍රියාත්මක වන බව සහතික කරගනිමින් ඒවා, එම එක් එක් අංශවල ප්‍රතිපත්ති ප්‍රමුඛතා සහ පවතින වැඩසටහන් තුළට හැකිතාක් දුරකට පූර්ණ වශයෙන් ඒකාබද්ධ කෙරෙනු ඇත. අවසාන වශයෙන්, NDC ක්‍රියාත්මක කරගැනීමේ පිරිවැය තක්සේරුවක් කිරීම අනුමත කර ඇත. මූල්‍යකරණ උපායමාර්ග ඉදිරියේ දී NDC සඳහා අතිරේකයක් ලෙස ජාත්‍යන්තර මට්ටමින් සන්නිවේදනය කරනු ඇත.




*3.1 රූපය: ජාතිකව නිර්ණය කළ දායකත්ව සමාලෝචන ක්‍රියාවලිය*

# 4 පරිච්ඡේදය

## හරිතාගාර වායු අවම කිරීම සඳහා වූ ජාතිකව නිර්ණය කළ දායකත්ව

### 4.1 ශ්‍රී ලංකාවේ හරිතාගාර වායු විමෝචනය අවමකිරීම

1 වැනි හා 2 වැනි පරිච්ඡේදවල විස්තර කළ පරිදි ශ්‍රී ලංකාවේ ආර්ථික හා මානව සංවර්ධනය බොහෝදුරට 'අඩු කාබන්' සංවර්ධනයකි. ඒ සඳහා දශක ගණනාවක් පුරා සෞඛ්‍යය හා අධ්‍යාපනය සඳහා කළ පොදු ආයෝජන, බලශක්තිය අධිකව පරිභෝජනය කරන විශාල කර්මාන්ත මත ආර්ථික වර්ධනය රඳා නොපැවතීම සහ සුළං, ජල, සූර්ය සහ ජෛව ස්කන්ධ වැනි දේශීය බලශක්ති ප්‍රභව අඛණ්ඩය භාවිතය යන සාධක මගින් ලැබූ පිටුවහල දායකව ඇත. මානව යහපැවැත්ම සහ ආර්ථික සමෘද්ධිය, කාබන් අධිකව පරිභෝජනය කරන සංවර්ධනයෙන් සහ එවැනි ජීවන රටාවකින් වෙන්කරන්නේ කෙසේද යන්න සඳහා කලාතුරකින් දක්නට හැකි උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාව පිළිගනු ලැබේ.[6] කෙසේනමුත්, මානව යහපැවැත්ම සහ ආර්ථික ප්‍රගතිය කෙරෙහි අවධානය පවත්වාගන්නා අතරේ ම මෙය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා අවකාශ පවතියි. එබැවින්, විදුලිය (බලශක්තිය; විදුලි උත්පාදනය සහ අවසානයේ පරිභෝජනය), ප්‍රවාහනය, කර්මාන්ත, අපද්‍රව්‍ය, වනාන්තර, සහ කෘෂිකර්මය (පශුසම්පත් ඇතුළුව) යන අංශ හයට අදාළව ඉලක්ක ඇතිකිරීම මගින් එම අංශ හරහා වැඩිවශයෙන් උත්පාදනය වන හරිතාගාර වායු අඩුකිරීම (2016 මුල් NDC හා සාපේක්ෂව) සඳහා වර්ධනය වූ අභිලාෂයක් මෙම NDC හරහා ඉදිරිපත් කෙරේ. රටේ තිරසර සංවර්ධන අභිමතාර්ථ සහ හරිතාගාර වායු අඩුකිරීම සම්බන්ධයෙන් පවතින ඉහළ විභවය සමඟ සමපාත වන අන්දමින් සම්පාදිත හරිතාගාර වායු අවම කරගැනීමේ ක්‍රියාමාර්ග, 2021 සිට 2030 දක්වා කාල සීමාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමුඛතාගත කර තිබේ.

මෙම NDC සම්පාදනය කිරීම සඳහා, ජාතික පරිසර ප්‍රතිපත්තිය, ජාතික දේශගුණ විපර්යාස ප්‍රතිපත්තිය, තිරසර සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය (කෙටුම්පත), සහ තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සමඟ ඉහත කී අංශ හයට අදාළව ශ්‍රී ලංකාවේ පවතින ප්‍රතිපත්ති සහ උපායමාර්ග අධ්‍යයනය කරන ලදි. පොදුවේ ගත් කල, අඩු-කාබන් හා බලශක්ති කාර්යක්ෂම පරිචයන්, චක්‍රිය ආර්ථික සංකල්ප, සහ වනාන්තර/ ශාක ආවරණය වැඩිදියුණු කිරීම ඔස්සේ හරිතාගාර වායු අඩුකිරීම ප්‍රවර්ධනය සඳහා ඉහත සඳහන් ප්‍රතිපත්ති දිශානතිය ඔස්සේ සහය ලබාදී ඇත. ගෙවීගිය පස් වසර තුළ, ප්‍රෝත්සාහී පියවර කිහිපයක් ම ගැනීමට ශ්‍රී ලංකාව කටයුතු කර ඇති අතර, අඩු-කාබන් ගමන්මගක් සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති මෙවලම් සහ මූල්‍ය දිරිගැන්වීම් හඳුන්වා දී තිබේ.

උදාහරණ වශයෙන් බලශක්ති ක්ෂේත්‍රය තුළ පෝෂක අයක්‍රම (feed-in tariffs), ශුද්ධ මණුකරණය (net-metering) සහ ශුද්ධ ගණනය (net-accounting) වැනි වූ උපකාරක ප්‍රතිපත්ති මෙවලම් හරහා පුනර්ජනනීය බලශක්තිය සඳහා පෞද්ගලික ආයෝජන සිදුකිරීමේ හැකියාව ඇතිකර දී තිබේ. ඉහළ බලශක්ති ගාස්තු මගින් සාධාරණ පරිභෝජනයක් ඇති කිරීම, භාවිත කරන වේලාව අනුව අය කිරීම (TOU) යනාදිය හරහා බලශක්ති කාර්යක්ෂමතාවය දිරිගන්වා ඇති අතර, කෙටි කාලීන වශයෙන් තාපදීප්ත විදුලිබුබුළු වෙනුවට LED විදුලිබුබුළු භාවිතය සඳහා මූල්‍යමය දිරිදීමනා ලබාදීම හරහා ඊට සහය ලබාදී තිබේ. ප්‍රධාන නාගරික ප්‍රදේශවල අපද්‍රව්‍යවලින් බලශක්ති උත්පාදන කටයුතු සඳහා ආයෝජනය සහ අපද්‍රව්‍යවලින් කොම්පෝස්ට් සෑදීම හේතුවෙන් නාගරික ප්‍රදේශවල කසළ කළමනාකරණය සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගොස් තිබේ. නියාමනය සීමාකිරීම් සහ පාරිසරික සලකාබැලීම් හේතුවෙන්, සත්ත්ව ගොවිපොළ හා හෝටල් වැනි විශාල පරිමාණ කසළ නිෂ්පාදකයින් ස්වකීය පරිශ්‍ර තුළම කසළ ප්‍රතිකාරක හා කළමනාකරණ ක්‍රමවේද සඳහා ආයෝජනය කර තිබේ.

බලශක්ති කාර්යක්ෂමතාව, චක්‍රිය ආර්ථික සංකල්ප සහ පිවිතුරු නිෂ්පාදනය යනාදී සංකල්ප කර්මාන්ත විසින් ඇතුළත් කරගෙන තිබේ. අලෙවිකරණ වාසි සහ තිරසරභාවය හේතුවෙන් බොහෝ විශාල කාර්මික නිෂ්පාදකයින් වර්තමානයේදී 'කාබන් උදාසීන' තත්ත්වය කරා යොමු වී තිබේ. නව කර්මාන්ත උද්‍යාන සංවර්ධනයේ දී 'හරිත හෝ පාරිසරික' සංකල්ප සඳහා යොමුවීමට මෙම අංශය පොරොන්දු වී තිබේ.

ප්‍රවාහන ක්ෂේත්‍රය රාජ්‍ය අංශයේ සිට පෞද්ගලික අංශය දක්වා වූ මාදිලිමය වෙනසකට ලක්වී ඇති අතර, එය මධ්‍ය ආදායම් සංවර්ධන අපේක්ෂාවන් සමග සමපාත වේ. කලක සිට අර්බුදයකට ලක්ව පවත්නා දුම්රිය සහ අධිවේගී මාර්ග ජාලය ඇතුළුව මගී ප්‍රවාහන පද්ධතිය දියුණු කිරීම, තදබදය අධික නාගරික කේන්ද්‍රවලට නූතන ප්‍රවාහන ක්‍රමවේද හඳුන්වාදීම සහ පෞද්ගලිකව භාවිතය සඳහා දෙමුහුන් හෙවත් හයිබ්‍රිඩ් වර්ගයේ වාහන ප්‍රවර්ධනයට සැලකියයුතු ආයෝජන ප්‍රමාණයක් සූදානම්ව තිබේ.

---

6 https://iopscience.iop.org/article/10.1088/1748-9326/9/1/014011/pdf

## 4.2 කොන්දේසි රහිත හා කොන්දේසි සහිත ප්‍රතිපත්ති ප්‍රතිචාර

දේශීය වශයෙන් (රාජ්‍ය සහ පෞද්ගලික) ආයෝජන කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදෙමින්, ජාතික සැලසුම් හා වැඩසටහන්වල හඳුනාගෙන ඇති ප්‍රතිපත්ති ප්‍රතිචාර, ***කොන්දේසි රහිත*** ප්‍රතිපත්ති ප්‍රතිචාර වශයෙන් ශ්‍රී ලංකාව හඳුනාගෙන තිබේ. 2021-2030 කාල පරිච්ඡේදය සඳහා, පවතින තත්ත්ව යටතේ හරිතාගාර වායු විමෝචන **4%කින්**[7] අඩුකිරීමට මෙම ක්‍රියාමාර්ග හේතුවේ.

***කොන්දේසි සහිත*** ප්‍රතිපත්ති ප්‍රතිචාර සඳහා මූල්‍යකරණය, තාක්ෂණ හුවමාරුව සහ ධාරිතා වර්ධනය ඇතුළු බාහිර උපකාර අවශ්‍ය වේ. බොහෝ කොන්දේසි සහිත NDC, වෙළඳපොළට සූදානම නොමැතිවීම (ඒවායෙහි ආර්ථික ශක්‍යතාව ඔප්පු වී නොතිබීම) සහ තාක්ෂණික වශයෙන් දියුණු නොවීම හේතුවෙන් සීමාකිරීමට ලක්ව තිබේ. පහත දැක්වෙන අංශවලට අදාළව විස්තර කර ඇති ක්‍රියාමාර්ගවලින් බහුතරයක් මෙම කොන්දේසි සහිත NDC වලින් සමන්විත වේ. ඒ අංශවල දිගුකාලීන වෙනස්කම් ඇති කිරීමට මේ ක්‍රියාමාර්ග වැදගත්ය - බලශක්ති, ප්‍රවාහන, කර්මාන්ත, අපද්‍රව්‍ය, වනාන්තර, කෘෂිකර්මය හා පශුසම්පත් යන ප්‍රධාන අංශ අඩු-කාබන් ගමන්මගක ගෙනයාම සඳහාය. ග්‍රාමීය සේවා වඩාත් හොඳින් ලබාදීමේ හැකියාව ඇතිකිරීම, නාගරික ප්‍රදේශවල ජීවත්විය හැකි බව සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ සේවා හා නිෂ්පාදනයේ වර්ධනය, විශේෂයෙන්ම අගය එකතුකළ කෘෂි නිෂ්පාදනවල වර්ධනය හරහා ඉහළ මැදි ආදායම් රටක තත්ත්වයට පත්වීමට ස්වකීය වර්ධනය වේගයෙන් ඉදිරියට ගෙන යාම සඳහා ශ්‍රී ලංකාවේ දැඩි උනන්දුවක් ඇත. එවන් පසුබිමක් තුළ, ජාත්‍යන්තර මූල්‍ය සහ තාක්ෂණික සහාය ඇතිව තවදුරටත් තම අඩු-විමෝචන වර්ධන ගමන්මාර්ග යේ අඛණ්ඩව ඉදිරියට යාම සඳහා මෙරටට ඇති කැපවීම විද්‍යාමාන කෙරෙන විශ්ලේෂණයක් වටා කොන්දේසි සහිත NDC රාමුගත කර තිබේ. 2021-2030 කාල පරිච්ඡේදය සඳහා, පවතින තත්ව යටතේ හරිතාගාර වායු විමෝචන **10.5%**කින් අඩුකිරීමට මෙම කොන්දේසි සහිත ක්‍රියාමාර්ග හේතු වේ.

## 4.3 හරිතාගාර වායු විමෝචනය අවම කිරීමේ NDC ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය

මෙම NDC, අරමුදල් ලබාදිය හැකි ක්‍රියාමාර්ග බවට 'ව්‍යාපෘතිකරණය' කරනු ඇති අතර, පෞද්ගලික අංශයේ ආයෝජන සඳහා, රජයේ අයවැය හරහා රාජ්‍ය මුදල් ලබාගැනීම සඳහා හෝ ජාත්‍යන්තර අරමුදල් ආයතනවලින් මුදල් ලබාගැනීම සඳහා දේශගුණ මූල්‍යකරණය යටතේ මුදල් ලබාගැනීමට ඒවා සංවර්ධනය කිරීම හෝ සිදුකරනු ඇත. එහිදී, අදාළ ක්‍රියාමාර්ග පිළිබඳ සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යයන සිදුකිරීම, තිරසර සංවර්ධනය සමගින් වන සම-ප්‍රතිලාභ සහ මූල්‍යකරණ විකල්ප කවරේදැයි ගැඹුරින් විශ්ලේෂණය කිරීම ඊට ඇතුළත් වනු ඇත. එවන් ක්‍රියාවලියක් ඔස්සේ මෙම ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සවිස්තරාත්මකව ස්ත්‍රීපුරුෂ සමාජභාව හා සමාජ විශ්ලේෂණයක් සිදුකිරීමටත් අවදානම් ජයගැනීම සඳහා උචිත අවම කිරීමේ පියවර යෝජනා කිරීමටත් අවස්ථාව සැලසෙනු ඇත. ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රමසම්පාදන ව්‍යාපෘති ආකෘතිය තුළ, එසේ ස්ත්‍රීපුරුෂ සමාජභාවය සහ තිරසර සංවර්ධන සම-ප්‍රතිලාභ විශ්ලේෂණ සිදුකිරීම අනිවාර්ය බව නියම කර ඇත.[8] තවද, ඉඩම් පරිවර්තනය හෝ යටිතලපහසුකම් සම්බන්ධ වන වඩාත් විශාල ව්‍යාපෘති සඳහා අවශ්‍ය පරිදි පාරිසරික සහ සමාජ බලපෑම් තක්සේරු සිදුකිරීමට ද කටයුතු කරනු ඇත.

ශ්‍රී ලංකාවේ සමස්ථ හරිතාගාර වායු විමෝචනය අඩුකරගැනීමේ ඉලක්කය සාක්ෂාත් කරගැනීමට දායකත්වය ලබාදෙන ක්‍රියාමාර්ග 40 ක් පමණ, එක් එක් අංශයට අදාළව පහත සඳහන් කර තිබේ. ගණනය කරන ලද හරිතාගාර වායු විමෝචන අඩුකිරීමේ ඉලක්කයට දායකවන අංශ හයක් වේ. ඒවා නම්, කෘෂිකර්මය (පශුසම්පත් ද ඇතුළුව), වනාන්තර, කර්මාන්ත, බලශක්තිය (විදුලිය), ප්‍රවාහන සහ අපද්‍රව්‍ය කළමනාකරණය වේ. කෙසේනමුත්, දැනට මූලික දත්ත සහ විමෝචන අඩුකරගැනීමේ විභවය සම්බන්ධ තොරතුරු නොමැතිකම හේතුවෙන් ප්‍රමාණාත්මක වශයෙන් දැක්විය නොහැකි, අවම කිරීමේ ක්‍රියාමාර්ග ඔස්සේ හරිතාගාර වායු විමෝචන තවදුරටත් අඩු කෙරෙනු ඇත. අවශ්‍ය අභ්‍යන්තර හා බාහිර සහාය ඇතිව මූලික දත්ත සහ ආංශික මැනීම, වාර්තාකරණය හා සත්‍යාපනය (MRV) යාන්ත්‍රණ ස්ථාපිත කළ පසුව, හරිතාගාර වායු විමෝචන අඩුකරගැනීමේ විභවය හා සත්‍ය ප්‍රතිඵල අනාගතයේ දී වාර්තා කරනු ලැබේ. තවද, හරිතාගාර වායු විමෝචන අඩුකරගැනීම සඳහා දායකවන යම් යම් අනුහුරු වීමේ ක්‍රියාමාර්ග (adaptation actions) මෙහි 5වැනි පරිච්ඡේදයේ විස්තර කර තිබේ. පශුසම්පත්, සංචාරක කර්මාන්තය, සහ නාගරික ජනාවාස වැනි අංශවල මෙකී ක්‍රියාමාර්ග හරහා සිදුවන විමෝචන අඩුකිරීම් ඉහත ඉදිරිපත් කළ සමස්ථ හරිතාගාර වායු විමෝචන අඩුකිරීම සඳහා ඇතුළත් වී නොමැත. එබැවින් මෙම හරිතාගාර වායු විමෝචන අඩුකිරීමේ වෑයම්, ශ්‍රී ලංකාවේ සමස්ථ අවමකිරීමේ ඉලක්කයට අමතරව එක්වන ඒවා වනු ඇත.

---

7 මෙම සංශෝධනයට අයත් අංශ හය සඳහා (බලශක්තිය, ප්‍රවාහන, කර්මාන්ත, අපද්‍රව්‍ය, කෘෂිකර්ම සහ පශුසම්පත්, වන වගාව). ඉඩම් පරිහරණයේ ඇතැම් කාණ්ඩ වැනි සමහර උප අංශවල විමෝචන හා විමෝචන අඩු කිරීමේ ක්‍රියාකාරකම් හැර විශ්ලේෂණය කර තිබේ.

8 http://www.npd.gov.lk/index.php/en/2017-03-02-07-02-41/project-submission-format.html

### 4.4 ආංශික හරිතාගාර වායු විමෝචනය අවම කිරීමේ ජාතිකව නිර්ණය කළ දායකත්ව

#### 4.4.1 විදුලිබල (බලශක්තිය) අංශය

හුදෙකලා ප්‍රජාවන් කිහිපයක් හැරුණුවිට රටේ විදුලි පරිභෝජනය කළ හැකි සියලුම පරිශීලකයින්ට පාහේ විදුලිය සපයමින් 100% කට ආසන්නව විදුලිබලය ලබාදීමට ශ්‍රී ලංකාව සමත් වී තිබේ. 2019 දී සමස්ත ස්ථාපිත විදුලි ජනන ධාරිතාව මෙගාවොට් 4,217ක් වූ අතර ඉන් 50%ක් මහාපරිමාණ ජලවිදුලිය, කුඩා පරිමාණ ජලවිදුලිය, සුළං, සූර්ය සහ ජෛවස්කන්ධ ඇතුළු පුනර්ජනනීය බලශක්තිය විය. ඉතිරිය ගල් අඟුරු සහ ඛනිජ තෙල් පාදක කරගත් තාප බලශක්තිය වේ. 2019 දී ශ්‍රී ලංකාවේ වාර්ෂික බලශක්ති ඉල්ලුම ගිගාවොට් 14,611ක් පමණ විය. මෙම ඉල්ලුමෙන් 35%ක් පමණ 2019 දී සපුරාලනු ලැබුවේ පුනර්ජනනීය බලශක්තියෙනි. විදුලිය සඳහා ඇති ඉල්ලුම වාර්ෂිකව 5% වේගයෙන් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරන අතර, අනාගත විදුලි උත්පාදන ව්‍යාප්ති වැඩසටහන් ඔස්සේ මෙම ඉල්ලුම සපුරාලීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

තිරසර බලශක්ති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මෑතකාලීනව ශ්‍රී ලංකාව මුලපිරීම් කිහිපයක්ම ගෙන තිබේ. රටේ බලශක්ති ප්‍රතිපත්තියේ (2019) ප්‍රධාන මූලධර්ම මගින් දේශීය පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර ප්‍රශස්ත මට්ටම දක්වා සංවර්ධනය කිරීම, විදුලි ජනන මුසුව විවිධාංගීකරණය කිරීම සහ ආනයනිත ෆොසිල ඉන්ධන මත යැපීම අඩුකරගැනීම සඳහා මගපෙන්වයි. සම්පත් විභවය, ආර්ථික කරුණු, තාක්ෂණයේ පරිණතභාවය, සහ සැපයුමේ ගුණාත්මක බව සලකා බලමින් පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර සංවර්ධනය කළයුතු බව එහි ප්‍රකාශ වේ. මෙම මුලපිරීම් ඔස්සේ පුනර්ජනනීය බලශක්ති උත්පාදනය පාදක කරගත් බලශක්ති උත්පාදනය දියුණුවට පත්ව 2030 වන විට එය සැපයුමෙන් 70%ක් සඳහා වගකියනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**විදුලිබල (බලශක්ති) අංශයේ අනාගත දැක්ම සහ හරිතාගාර වායු විමෝචනය අඩුකරගැනීමට ඇති විභවය:** ජාතික බලශක්ති ප්‍රතිපත්තියෙන් (2019) ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කර ඇත්තේ බලශක්ති සැපයුමේ සුරක්ෂිතබව, සධාරණතාවය සහ තිරසරභාවය සහතික කිරීමටයි. ප්‍රායෝගික හා සමබර බලශක්ති මුසුවකින් යුතු නිත්‍ය බලශක්ති සැපයුමක් පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වන අතර, ද්‍රවමය ස්වාභාවික වායු හෝ දේශීය ස්වාභාවික වායු, අධි-කාර්යක්ෂම ගල්අඟුරු බලශක්තිය, මහා පරිමාණ ජලවිදුලිය, ජාතික පිරිපහදුවෙන් පිරිපහදු කළ දැවිතෙල් සහ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයක්[9] යන මූලික බලශක්ති අවශ්‍යතාවය සපුරාලිය හැකි මූලාශ්‍ර ඇසුරින් මූලික ධාරිතාවය පවත්වාගෙන යා යුතු වේ. 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති හා සමගින් ගැලපෙන ලෙස රටේ සුළං, සූර්ය, ජල, සහ ජෛව ස්කන්ධ බලශක්ති උත්පාදනයේ සැලකියයුතු වර්ධනයක් සිදුවෙතැයි අපේක්ෂා කෙරේ. තවද, ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ (DSM) ක්‍රියාකාරකම්, සහ සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ හානි අඩුකරගැනීමේ ක්‍රියාකාරකම් විමෝචනය අඩුකරගැනීමට උපකාරක වනු ඇත. එසේම, දැනට පවතින ඉන්ධන තෙල් මත ක්‍රියාත්මක විදුලි බලාගාර ස්වාභාවික වායු බලාගාර බවට පරිවර්තනය කිරීම මෙන්ම ස්වාභාවික වායු භාවිත කරන නව බලාගාර හඳුන්වාදීම ද විමෝචන අඩුකරගැනීමේ වෑයමට සහාය දෙමින් NDC සඳහා දයක වනු ඇත.

තවද, අනාගතයේ දී නව ගල්අඟුරු බලාගාර එකතු කිරීමක් අපේක්ෂා නොකරන අතර, දැනට පවතින ඉන්ධන තෙල් පදනම් කරගත් ඒකාබද්ධ චක්‍රීය බලාගාර ස්වාභාවික වායු බලාගාර බවට පත් කිරීම සහ නව ස්වාභාවික වායු පදනම් කරගත් බලාගාර හඳුන්වා දීම තුළින් හරිතාගාර වායු විමෝචනය අඩු කිරීමේ උත්සාහයන්ට සහාය දැක්වීම මගින් NDC සඳහා දායක වනු ඇත. ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ග සකස් කර ඇත්තේ 2050 දී බලශක්ති ක්ෂේත්‍රයේ කාබන් උදාසීනභාවය අත්පත් කර ගැනීමේ දිගුකාලීන ඉලක්කය ඇතිවයි.

2030 දක්වා හරිතාගාර වායු විමෝචන අඩුකරගැනීම සඳහා සිදුකිරීමට අපේක්ෂිත ප්‍රධානතම මැදිහත්වීම් නම්:

- මෙගාවොට් 300ක විශාල සහ කුඩා පරිමාණ නව බලාගාර ඇතිකිරීම හරහා ජලවිදුලි ජනනයේ උපරිම විභවය දක්වා එය සංවර්ධනය කිරීම
- දිවයිනේ උතුරු හා බස්නාහිර වෙරළබඩ තීරයේ දළ වශයෙන් මෙගාවොට් 800ක සුළං බලශක්තියක් උත්පාදනය සංවර්ධනය කිරීම
- පියැසි මත සූර්ය බලශක්තිය නිපදවීම, කුඩා පරිමාණ සූර්ය බලාගාර සහ මහා පරිමාණ සූර්ය PV බලාගාර වැනි විවිධ ක්‍රම ඔස්සේ දළ වශයෙන් මෙගාවොට් 2,000ක සූර්ය බලශක්ති ධාරිතාවයක් සංවර්ධනය
- ජෛවස්කන්ධ සහ නාගරික ඝන අපද්‍රව්‍ය හරහා උත්පාදනය කරන බලශක්තිය ද මීට එකතු කරනු ලබන අතර, එමගින් බලශක්ති උත්පාදනයට සෑහෙන දයකත්වයක් ලැබෙනු ඇතැයි අපේක්ෂිත ය.
- වාණිජ වශයෙන් දියුණු වී නොමැති නව පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර සහ පුනර්ජනනීය බලශක්තිය වැඩි වශයෙන් ඒකාබද්ධ කරගැනීමට උපකාරී වන පාරිභෝගික පාර්ශවයේ (BtM) සහ විදුලි සැපයුමේ බලශක්ති ගබඩාකරණ විසඳුම් ඇතුළු විදුලි සැපයුමට සහය ලබාදෙන යටිතල පහසුකම් යොදාගනිමින් සිදුකරන නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම.

9 කුඩාපරිමාන ජලවිදුලිය, සූර්ය බලශක්තිය, සුළං, ජෛව ස්කන්ධ හා අනෙක් කෘෂි අපද්‍රව්‍ය බලාගාර

- බලශක්ති උත්පාදන පද්ධතියට කඩින්කඩ සහ කාලගුණය මත යැපෙන පුනර්ජනනීය බලශක්තිය වඩාත් වැඩි මට්ටමකින් ලබාදීමට පහසුකම් සැලසීම සඳහා ජනන ගබඩා ජල විදුලි බලාගාර සංවර්ධනයට යොමුවීම
- සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාලයේ සිදුවන හානි අඩුකරගැනීමට ගන්නා මුලපිරීම් අඛණ්ඩව සිදුකිරීම
- තෙල් ඉන්ධන යොදාගන්නා, දැනට පවතින බලාගාර ස්වාභාවික වායු භාවිතා කළහැකි පරිදි පරිවර්තනය කිරීම සහ සැලසුම් කළ ගල්අඟුරු බලාගාර වෙනුවට විකල්පයක් වශයෙන් (ස්වාභාවික වායු සඳහා යටිතල පහසුකම් පැවතිම අනුව) නව ස්වාභාවික වායු බලාගාර ඇති කිරීම
- පංච-වාර්ෂික බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ හා සංරක්ෂණය කිරීමේ (EEI&C) වැඩසටහනක් හරහා ඉල්ලුම් පාර්ශ්වය කළමනාකරණ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම
- පුනර්ජනනීය බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සඳහා බදු ප්‍රතිලාභ, අඩු පොළී මූල්‍යකරණය වැනි උපකාරක ක්‍රියාමාර්ග හඳුන්වාදීම
- පිවිතුරු බලශක්ති මූලාශ්‍ර කරා මාරුවීම ප්‍රවර්ධනය සඳහා ශක්‍යතා සම්පන්න කාබන් අලෙවි යාන්ත්‍රණ සමග සම්බන්ධවීම

NDC සාක්ෂාත් කරගැනීම සඳහා ක්‍රියාකාරකම් හඳුනාගෙන ඇති අතර (4.4.1 වගුව), ඉන් ඇතැම් ඒවා ගණනය කළ හැකිය. තවත් ඒවා ගණනය කළ නොහැකි වුවත් ඵලදායී ලෙස ක්‍රියාත්මකකිරීම සඳහා ඒවා උපකාරී වන බැවින් අත්‍යාවශ්‍ය වේ.[10]

*4.4.1 වගුව: විදුලිබල (බලශක්ති) අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව*

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | | ඉලක්ක වර්ෂය |
|---|---|---|---|
| **NDC 1** | **සූර්ය, සුළං, ජල සහ තිරසර ජෛව ස්කන්ධ පදනම් කරගත් විදුලිබල උත්පාදනය වැඩිකිරීම හරහා ජාතික විදුලි ජනන මුසුවට පුනර්ජනනීය බලශක්තියෙන් ලැබෙන දායකත්වය වැඩිදියුණු කිරීම (ඉලක්කය: පුනර්ජනනීය බලශක්තිය මෙගාවොට් 3,867ක අමතර ධාරිතාවයක් පවතින තත්ව යටතේ සංවර්ධනය, ඉන් මෙගාවොට් 950ක් කොන්දේසි රහිත පදනමින් ද මෙගාවොඩ් 2,917ක් කොන්දේසි සහිත පදනමින් ද වනු ඇත)[12]** | | **2021-2030** |
| | 1.1 | සුළං, සූර්ය (පියැසි මත, කුඩා පරිමාණ සහ මහා පරිමාණ සූර්ය PV), ජෛව ස්කන්ධ[13], විශාල සහ කුඩා පරිමාණ ජලවිදුලි බලාගාර | 2021-2030 |
| | 1.2 | පුනර්ජනනීය බලශක්තිය ඒකාබද්ධ කිරීම සඳහා හැකියාව ඇති කරන්නට අවශ්‍ය කරන සම්ප්‍රේෂණ ජාල යටිතලපහසුකම් සංවර්ධනය | 2021-2030 |
| **NDC 2** | **ජාතික බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ සහ සංරක්ෂණය කිරීමේ වැඩසටහනක් (EEI&C) තුළ බලශක්ති කාර්යක්ෂම උපකරණ, තාක්ෂණය සහ පද්ධතියේ වැඩිදියුණුකිරීම් ප්‍රවර්ධනය කිරීම හරහා ඉල්ලුම් පාර්ශ්වය කළමනාකරණ (DSM) ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම** | | **2021-2030** |
| | 2.1 | කොන්දේසි සහිත ක්‍රියාමාර්ගයක් වශයෙන්, තාපදීප්ත විදුලි බුබුළු භාවිතය ක්‍රමක්‍රමයෙන් ඉවත් කිරීම ඔස්සේ ගිගාවොට් 2,603ක බලශක්ති ඉතුරුවක් අත්පත් කරගැනීම | 2021-2025 |
| | 2.2 | කොන්දේසි සහිත ක්‍රියාමාර්ගයක් වශයෙන්, කාර්යක්ෂම ආලෝකකරණය, විදුලි පංකා, ශීතකරණ, සහ සිසිලන හඳුන්වාදීම ඔස්සේ ගිගාවොට් 5,189ක බලශක්ති ඉතුරුවක් සාක්ෂාත් කරගැනීම | 2021-2030 |
| | 2.3 | බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි නීති සංග්‍රහයක් අනිවාර්ය කොට ක්‍රියාත්මක කිරීම | 2021-2022 |
| | 2.4 | අධිකාර්යක්ෂම මෝටර (HEM), විචල්‍ය සංඛ්‍යාත ධාවක (VFD), ත්‍රිත්ව-ජනනය, සහ අනෙකුත් බලශක්ති කාර්යක්ෂම ක්‍රියාමාර්ග කර්මාන්ත අංශයේ ප්‍රවර්ධනය කිරීම | 2021-2030 |
| **NDC 3** | **ඉන්ධන තෙල් භාවිතයෙන් ක්‍රියාත්මක වන, දැනට පවතින සංයුක්ත චක්‍රිය විදුලි බලාගාර ස්වාභාවික වායු භාවිතා කරන බලාගාර බවට පරිවර්තනය කිරීම සහ කොන්දේසි සහිත ක්‍රියාමාර්ග වශයෙන් නව ස්වාභාවික වායු බලාගාර ඇති කිරීම (අවශ්‍ය යටිතලපහසුකම් ඇති වූ පසුව)** | | **2021-2030** |

10 NDC ක්‍රියාකාරකම් තීරණය කිරීමේදී කොන්දේසි රහිත ඉලක්ක ප්‍රකාශ කර ඇත්තේ රටේ දැනටමත් පවතින තාක්ෂණික සහ මූල්‍ය හැකියාවන් මත පදනම්ව ය. දේශීය හැකියාවට අමතර වශයෙන් බාහිර මූල්‍ය සහ තාක්ෂණික උදවු අවශ්‍ය කෙරෙන ඉලක්ක කොන්දේසි සහිත ඉලක්ක වශයෙන් ප්‍රකාශ කර තිබේ. එම ඉලක්ක ක්‍රියාත්මක කිරීමට නම් බාහිර තාක්ෂණික සහ මූල්‍ය සහය අනිවාර්යයෙන්ම අවශ්‍ය වේ.

11 ඉහත සඳහන් 1 වැනි NDC ක්‍රියාමාර්ගය පදනම් වී ඇත්තේ දැනට සිදු කෙරෙමින් පවතින ජාතික සැලසුම්කරණ අභ්‍යාස මත පදනම් වී බව අවධානයට ගත යුතු වේ. මෙහෙයුම් නම්‍යශීලීත්වය, පද්ධතියේ ස්ථායිතාවය වැනි විදුලි සැපයුම් පද්ධතියේ සීමාකිරීම්වලට යටත්ව මෙය තහවුරු කරනු ඇත. මෙම කොන්දේසි සහිත ඉලක්කය සාක්ෂාත් කරගැනීමේ දී විදුලි බල සැපයුම් පද්ධතිය ශක්තිමත් කිරීමේ ක්‍රියාමාර්ග සහ බලශක්තිය ගබඩාකිරීමේ තාක්ෂණය වැනි බලාත්මක කරන තාක්ෂණය අවශ්‍ය වනු ඇත.

12 තිරසර ජෛවස්කන්ධ සම්පත් හරහා උත්පාදනය කරන බලශක්තිය

| NDC අංකය | | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | ඉලක්ක වර්ෂය |
|---|---|---|---|
| | 3.1 | ඉන්ධන තෙල් භාවිතයෙන් බලශක්තිය නිපදවන, මෙගාවොට් 600ක දැනට පවතින සංයුක්ත චක්‍රිය විදුලි බලාගාර ස්වාභාවික වායු බලාගාර බවට පරිවර්තනය කිරීම | 2021-2026 |
| | 3.2 | පවතින තත්ව යටතේ ගල්අඟුරු බලශක්තිය නිපදවීමට ඇතිකිරීම සඳහා බලාපොරොත්තු වන බලාගාර වෙනුවට නව සංයුක්ත චක්‍රිය බලාගාර ඇතිකිරීම සහ ස්වාභාවික වායුවලින් ක්‍රියාත්මක වන මෙගාවොට් 700ක පමණ ගෑස් ටර්බයින ඇතිකිරීම | 2021-2027 |
| **NDC 4** | | **කොන්දේසි රහිත ක්‍රියාමාර්ගයක් වශයෙන්, සම්ප්‍රේෂණයේ සහ බෙදාහැරීමේ ජාලයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම (පවතින තත්ත්වයට සාපේක්ෂව 2030 වනවිට 0.5%ක හානි අඩුකරගැනීමක්) (ඉලක්කයః දළ වශයෙන් ගිගාවොට් 1,848ක බලශක්ති ඉතුරුවක්)** | **2021-2030** |
| | 4.1 | සම්ප්‍රේෂණ ජාලය වැඩිදියුණු කිරීම, පවතින සම්ප්‍රේෂණ මාර්ග නැවත-සන්නයනය, සහ ප්‍රතික්‍රියක බලශක්ති අනුපූරක ක්‍රියාකාරකම් සිදුකිරීම | 2021-2030 |
| | 4.2 | කේවල සන්නායකවල සිට කළඹ සන්නායක දක්වා පරිවර්තනය සිදුකිරීම සහ බෙදුහැරීමේ ජාලයේ ඉදිකිරීම් හා නඩත්තු කටයුතු වැඩිදියුණු කිරීම | 2021-2030 |
| **NDC 5** | | **කොන්දේසි සහිත ක්‍රියාමාර්ගයක් වශයෙන්, තවමත් වාණිජමය වශයෙන් ඵලදායීබවට පත්ව නැති සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) මූලාශ්‍ර සඳහා නියමු මට්ටමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත් විදුලි පද්ධතියට සහාය ලබාදෙන අනෙකුත් යටිතලපහසුකම් සංවර්ධනය කිරීම සඳහා පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදුකිරීම** | **2021-2030** |
| | 5.1 | වාණිජ පරිමාණයෙන් ඵලදායී තත්ත්වයට තවමත් ළඟා වී නොමැති නව පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර සඳහා නියමු පරිමාණයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සිදුකිරීම | 2021-2030 |
| | 5.2 | පද්ධතියේ නම්‍යශීලීබව වැඩිදියුණු කිරීම මගින් පද්ධතියට පුනර්ජනනීය බලශක්තිය ඒකාබද්ධ කිරීම සඳහා සහාය ලබාදීම පිණිස පාරිභෝගික (BtM) මට්ටමේ සහ විදුලි පද්ධති පරිමාණයේ බලශක්ති ගබඩාකරණ විසඳුම් වැනි නියමු මට්ටමේ ගබඩාකරණ පද්ධති සහ ජනන ගබඩා විදුලි බලාගාර සංවර්ධනය කිරීම | 2021-2030 |
| | 5.3 | පද්ධතියට කඩින් කඩ පුනර්ජනනීය බලශක්තිය ඒකාබද්ධ කිරීම සඳහා සහාය ලබාදෙන සුහුරු විදුලි සැපයුම් පද්ධති තාක්ෂණය වැනි තොරතුරු සන්නිවේදන තාක්ෂණ මැදිහත්වීම් හඳුන්වා දීම | 2021-2030 |

විදුලිබල අංශයේ යාවත්කාලීන කළ NDC ක්‍රියාත්මක කිරීම තුළින්, මෙතෙක් පැවති තත්වයට අනුව **25%ක (5%ක් කොන්දේසි රහිතව සහ 20%ක් කොන්දේසි සහිතව)** හරිතාගාර වායු අඩුකරගැනීමක් 2021-2030 කාලසීමාව තුළ අත්පත් කරගත හැකි වෙතැයි අපේක්ෂිතය. මෙය, ඇස්තමේන්තු කළ කාබන් ඩයොක්සයිඩ් හා අනෙකුත් හරිතාගාර වායු මෙට්‍රික් ටොන් 9,819,000ක් කොන්දේසි රහිතව ද මෙට්‍රික් ටොන් 39,274,000 කොන්දේසි සහිතව ද (එකතුව මෙට්‍රික් ටොන් 49,093,000කි) අවමකිරීමේ මට්ටමකට සමාන වනු ඇත (4.4.1 රූපය).[13]




*4.4.1 රූපය: හරිතාගාර වායු විමෝචනය අඩුවීම ප්‍රක්ෂේපණය - බලශක්තිය*

13 2013 ඔක්තෝබරයේ පල කළ ලංකා විදුලිබල මණ්ඩලයේ 2013-2032 දීර්ඝ කාලීන උත්පාදන ව්‍යාප්ති සැලසුමෙහි, මෙතෙක් පැවති තත්ත්වයට අනුව 2021-2023 කාල පරිච්ඡේදය සඳහා සමස්ථ විමෝචනය අඩුවීම මෙට්‍රික් ටොන් 196,373,000ක් වනු ඇති බව පුරෝකථනය කර තිබේ

### 4.4.2 ප්‍රවාහන අංශය

ශ්‍රී ලංකාවේ දුම්රිය, ගුවන් හා මුහුදු ගමනාගමනයට වඩා ප්‍රමුඛස්ථානයක් ගන්නේ මහාමාර්ග ප්‍රවාහනයයි. වර්තමානයේ දී ශ්‍රී ලංකාවේ සක්‍රිය වාහන සංචිතය මිලියන 6.7 ක් පමණ[14] වන අතර ඉන් 54%ක් යතුරුපැදි ද 16%ක් ත්‍රිරෝද රථ ද, 11% ක් මෝටර් කාර් ද, 1%ක් බස්රථ ද වේ. පොදු ප්‍රවාහනය වැඩිදියුණු කිරීමට ගත් විවිධ ප්‍රයත්න සහ දිගින් දිගටම සිදු කළ ආයෝජන තිබියදී පවා පොදු ප්‍රවාහනයේ ගුණාත්මක බව ලබාගත හැකිවීම තවමත් අපේක්ෂිත මට්ටමට වඩා පහළින් පවතී. මෙය සහ වැඩිවන ඒකපුද්ගල ආදායම හේතුවෙන් පොදු ප්‍රවාහනය භාවිත කරන පුද්ගල සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු වී ඇති අතර පෞද්ගලික වාහන සංඛ්‍යාව වැඩිවීමත් සමග රථවාහන තදබදය වැඩිවී, ඉන්ධන සකසුරුවම අඩු වී, විමෝචන වැඩි වී තිබේ. ප්‍රවාහන අංශයට අවශ්‍ය සියලුම ඉන්ධන ආනයනය කරනු ලැබේ. ශ්‍රී ලංකාව යුරෝ 4 විමෝචන ප්‍රමිතීන් සම්මත කරගෙන විමෝචන පරීක්ෂා සිදුකිරීම අඛණ්ඩව සිදුකර ඇතත්, දැනට ධාවනයේ ඇති අකාර්යක්ෂම වාහන සංඛ්‍යාව සැලකියයුතු ලෙස විශාල බැවින් එය වැඩි හරිතාගාර වායු විමෝචන සඳහා හේතු වී ඇත.

නාගරික ප්‍රදේශවල පෞද්ගලික වාහන භාවිතය තිරසර නොවූ අන්දමින් වැඩිවීම හේතුවෙන් රථවාහන තදබදය, මාර්ග අනතුරු සහ වායු දූෂණය ඉහළ ගොස් ඇති අතර, ඒ නිසා ආර්ථිකය, පරිසරයට හා සමාජයට සැලකියයුතු අහිතකර බලපෑමක් එල්ල කර ඇත. දුම්රිය හෝ ජලමාර්ග ආශ්‍රිත ප්‍රවාහනය වෙනුවට මහාමාර්ගවල ගමනාගමනය මතම යැපීම සමස්ථ බලශක්ති පරිභෝජනය හා වායු දූෂණය ඉහළ නංවයි, එසේම පරිසරය මත වෙනත් අහිතකර බලපෑම් එල්ල කරයි. අතීතයේ දී ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ප්‍රමුඛ පෙළේ භූමිකාවක් නිරූපණය කළත් මගී ප්‍රවාහනය සහ භාණ්ඩ ප්‍රවාහනය සඳහා එමගින් ලබාදෙන දායකත්වය කාලයත් සමග අඩුවී තිබේ. මගීන් හා භාණ්ඩ මහා පරිමාණයෙන් ප්‍රවාහනයට යොදගත හැකි අඩු වියදම් ක්‍රමයක් ලෙස ක්‍රියා කිරීමෙන් නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල රථවාහන තදබදය සෑහෙන තරමකින් අඩුකිරීම සඳහා දායකවීමට ඇති විභවය ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව හඳුනාගෙන ඇත. අනෙක් අතට, නාගරික ප්‍රදේශවල මෝටර් රථවාහන නොවන ප්‍රවාහනය ඉතාමත් අඩු අතර ග්‍රාමීය ප්‍රදේශවල ද එය අඩුවෙමින් පවතියි. බස් රථ හෝ දුම්රිය කරා සෘජු ප්‍රවේශයක් නොමැති ප්‍රජාව සඳහා ත්‍රිරෝද රථ, පාසල් හා කාර්යාල ප්‍රවාහන සේවා වැන් රථ වැනි රථවාහන මගින් සැලකියයුතු සේවාවක් සපයනු ලබයි. අධිවේගී මාර්ග, වාහන ගාල්කර පොදු ප්‍රවාහන මාධ්‍යයක ගමන් කිරීම හෙවත් 'පාර්ක් ඇන්ඩ් රයිඩ්' පහසුකම්, බහුමාදිලි ප්‍රවාහන කේන්ද්‍රස්ථාන වැනි මෑත කාලීන යටිතල පහසුකම් සංවර්ධනය මඟින් පරිසරයට සහ ආර්ථිකයට ධනාත්මක ලෙස දායක වන අතර විමෝචනය අඩු කිරීමට අපේක්ෂා කෙරේ.

**ප්‍රවාහන අංශයේ අනාගත දැක්ම සහ හරිතාගාර වායු අඩුකරගැනීම සඳහා පවත්නා විභවය:** මෙතෙක් පැවති තත්ත්වය අනුවම ඉදිරියටත් කටයුතු සිදුවුවහොත් පොදු ප්‍රවාහන සේවා භාවිතය තවදුරටත් අඩුවනු ඇත. කෙසේනමුත්, යාවත්කාලීන කළ NDC හරහා දුම්රිය, බස් රථ ඇතුළු පොදු ප්‍රවාහන සේවය නැවතත් පණගැන්වෙනු ඇතැයි සහ දුම්රිය මාර්ග, මහාමාර්ග සහ ජල-පාදක ප්‍රවාහන ක්‍රම අතරේ මාරුවෙමින් ගමනාගමනයේ යෙදීමේ (inter modality) හැකියාව වැඩිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. සුරක්ෂිත, විශ්වසනීය, ප්‍රවේශවියහැකි, සහ සුවපහසු ප්‍රවාහන විධි සඳහා ආයෝජනය මගින් පෞද්ගලික ප්‍රවාහනයේ සිට පොදු ප්‍රවාහනය දක්වා මාරුවීමට දිරිදිය හැකි ය. පොදු ප්‍රවාහනය වැඩිවීමත් සමග රථවාහන තදබදය සහ ප්‍රමාදය අඩුවනු ඇත. NDC හරහා නියම කර ඇති පරිදි ප්‍රවාහන අංශයේ බලශක්ති කාර්යක්ෂමතාවය/ ඉන්ධන සකසුරුවම වැඩිදියුණුවීමෙන් දේශීය හා ගෝලීය වායු දූෂණය අඩුකිරීමට හා හරිතාගාර වායු විමෝචන අඩුකරගැනීමට දායකවන අතර, ඒ හරහා විදේශ විනිමය ඉතිරි කරදෙමින් ආර්ථිකයට දායක වන ජාතික ප්‍රමුඛතාවයක් ද වේ.

**ප්‍රවාහන අංශයේ යාවත්කාලීන කළ NDC:** දේශගුණ ක්‍රියාමාර්ග විනිවිදභාවය සඳහා වන මුලපිරීම (ICAT) යටතේ ප්‍රවාහන අංශයේ විවිධ අවම කිරීමේ විකල්පවල පිරිවැය අඩුකරගැනීම සම්බන්ධයෙන් මෙම අංශය විශ්ලේෂණය කර තිබේ. පවතින තත්ත්වය (BAU) හා සංසන්දනය කරන විට අනුව විමෝචන අඩුකරගැනීම සඳහා වූ ක්‍රියාකාරකම් සැලකිය යුතු ප්‍රමාණයක් ඇති බව මේ ඇගැයීමෙන් හඳුනාගත් එම ක්‍රියාමාර්ග සාක්ෂාත් කරගැනීමට නම් ශ්‍රී ලංකාවට සැලකිය යුතු මූල්‍ය සහයක් අවශ්‍ය වේ. මේ වැඩසටහන යටතේ ම ශ්‍රී ලංකාව සඳහා විස්තීර්ණ මැනීම, වාර්තාකරණය හා සත්‍යාපනය (MRV) පද්ධතියක් ද ක්‍රියාත්මක වේ. 'ශීඝ්‍ර බස්රථ ප්‍රවාහන සංකල්පය (BRT) සම්බන්ධ ජාතිකව උචිත අවමකරගැනීමේ ක්‍රියාමාර්ග (NAMA) සඳහා මූලික ශක්‍යතා ඇගයුමක් 2015/2016 කාලයේදී සිදු කරන ලදි. මේ සඳහා විස්තීර්ණ ශක්‍යතා අධ්‍යයනයක් සම්පූර්ණ කිරීම සහ එය ක්‍රියාත්මක කිරීම පිණිස බාහිර සහාය අපේක්ෂා කරනු ලැබේ. 2016 දී සන්නිවේදනය කළ NDC මෙම සාක්ෂි/ විශ්ලේෂණය සමගින් ශක්තිමත් කරමින්, ප්‍රවාහන ක්ෂේත්‍රයේ විමෝචන අඩුකරගැනීම සඳහා සහායවීමට පහත දැක්වෙන (4.4.2 වගුව) ක්‍රියාමාර්ග යෝජනා කරනු ලැබේ. 'අඩුකිරීම-මාරුකිරීම-වැඩිදියුණු කිරීම' යන සංකල්පය මත, එනම් ගමනාගමන අවශ්‍යතාවය අඩුකිරීම (හෝ මගහැරීම), වඩාත් පරිසර හිතකාමී ක්‍රමවේදවලට මාරුවීම සහ ප්‍රවාහනයේ හා වාහන තාක්ෂණයේ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම (පද්ධති කාර්යක්ෂමතාව, ගමනේ කාර්යක්ෂමතාව සහ වාහනයේ කාර්යක්ෂමතාව) යන සංකල්පය මත පාරිසරික වශයෙන් තිරසර ප්‍රවාහන පද්ධතියක් (EST) ගොඩනංවනු ලැබේ.

14 https://www.ntc.gov.lk/corporate/pdf/NTCEnglishReport2017.pdf

*4.4.2 වගුව: ප්‍රවාහන අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව*

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | | ඉලක්ක වර්ෂය |
|---|---|---|---|
| **NDC 1** | **ප්‍රවාහන අංශයේ පද්ධති සංවර්ධනය** | | **2021-2030** |
| | 1.1 | ප්‍රවාහනය සඳහා ඇති අවශ්‍යතාව මගහැරීම | 2021-2030 |
| | 1.2 | ගමන්කරන දුර ප්‍රමාණය හා කාලය අඩුකිරීම | 2021-2030 |
| | 1.3 | රථ ගමනාගමනය හා වර්ණ සංඥා කළමනාකරණය වැඩිදියුණු කිරීම | 2021-2030 |
| | 1.4 | වාහන ගාල්කිරීම කළමනාකරණය වැඩිදියුණු කිරීම | 2021-2030 |
| | 1.5 | සබුද්ධික ප්‍රවාහන කළමනාකරණය පද්ධති හඳුන්වාදීම | 2021-2030 |
| | 1.6 | මාර්ග නිර්මාණ ශිල්පය (මාර්ග සැලසුම, මාර්ග සංඥා, සංඥා දැක්වීම, සංඥා පුවරු යනාදිය) වැඩිදියුණු කිරීම | 2021-2030 |
| **NDC 2** | **පොදු මගී ප්‍රවාහනය ප්‍රවර්ධනය කිරීම** | | **2021-2030** |
| | 2.1 | විශ්වසනීයත්වය, දැරියහැකි බව, ප්‍රවේශ හැකියාව, ලබාගතහැකි බව, සුවපහසුව සහ සුරක්ෂිත බව සඳහා පොදු මහාමාර්ග ප්‍රවාහනය වැඩිදියුණු කිරීම | 2021-2030 |
| | 2.2 | විශ්වසනීයත්වය, දැරියහැකි බව, ප්‍රවේශ හැකියාව, ලබාගතහැකි බව, සුවපහසුව සහ සුරක්ෂිත බව සඳහා දුම්රිය ප්‍රවාහනය වැඩිදියුණු කිරීම | 2021-2030 |
| | 2.3 | ප්‍රවාහන මාධ්‍ය ඒකාබද්ධ කිරීම | 2021-2030 |
| | 2.4 | ගමන අවසානයේ සම්බන්ධකතාවය වැඩිදියුණු කිරීම | 2021-2030 |
| **NDC 3** | **භාණ්ඩ ප්‍රවාහනය වඩාත් කාර්යක්ෂම මාධ්‍යයකට මාරු කිරීම** | | **2021-2030** |
| | 3.1 | මහාමාර්ග ප්‍රවාහනයේ සිට නැවතත් දුම්රිය ප්‍රවාහනය දක්වා මාරුවීම | 2021-2030 |
| | 3.2 | පෙට්‍රෝලියම් නිෂ්පාදන නලමාර්ග ඔස්සේ ප්‍රවාහනය ප්‍රවර්ධනය කිරීම | 2021-2030 |
| | 3.3 | රට අභ්‍යන්තරයේ බහාලුම් මධ්‍යස්ථාන ඇතිකර දුම්රිය පාදක ප්‍රවාහන පද්ධතියක් හඳුන්වාදීම | 2021-2030 |
| **NDC 4** | **මගී ප්‍රවාහනය සඳහා ශීඝ්‍ර ප්‍රවාහන විධි සම්පාදනය** | | **2021-2030** |
| | 4.1 | සැහැල්ලු දුම්රිය මාර්ග ප්‍රවාහනය (Light Rail Transport) | 2021-2030 |
| **NDC 5** | **යාන්ත්‍රික නොවන ප්‍රවාහන මාධ්‍ය භාවිතය** | | **2021-2030** |
| | 5.1 | පාපැදි භාවිතය ප්‍රවර්ධනය කිරීම | 2021-2030 |
| | 5.2 | පදික මංපෙත් සඳහා ඇති පහසුකම් වැඩිදියුණු කිරීම | 2021-2030 |
| **NDC 6** | **බදු හඳුන්වාදීම** | | **2021-2030** |
| | 6.1 | දැනට පවතින, වාහන පදනම් කරගත් විමෝචන අය ක්‍රමය, වාහන වර්ගය, ඉන්ධන වර්ගය සහ විමෝචන පදනම් කරගත් සහ ගමන් කළ මුළු කිලෝමීටර ප්‍රමාණය පදනම් කරගත් ක්‍රමයකට මාරු කිරීම | 2021-2030 |
| | 6.2 | වාහන තදබදය ඉහළ කාලසීමා තුළ ප්‍රධාන නගරවල මංසංදි හා තදබදය වැඩි ප්‍රදේශවලට ඇතුළුවන තනි රථවාහන සීමාකිරීම සඳහා බදු ක්‍රමයක් හඳුන්වාදීම | 2021-2030 |
| | 6.3 | තම වාහන ගාල්කර පොදු ප්‍රවාහන මාධ්‍යයක ගමන් කිරීම හෙවත පාර්ක් ඇන්ඩ් රයිඩ් යටිතල පහසුකම් සමගින් කෝඩොන් පාදක කෝඩොන් මිල යාන්ත්‍රණයක් හඳුන්වාදීම | 2021-2030 |
| **NDC 7** | **රට අභ්‍යන්තරයේ ජල ප්‍රවාහන මාධ්‍ය හඳුන්වාදීම** | | **2021-2030** |
| | 7.1 | තෝරාගත් ඇළමාර්ග සඳහා ඩීසල් හෝ විදුලි සැපයුම් පද්ධතියෙන් විදුලිය භාවිතයෙන් ධාවනය වන බෝට්ටු සේවා හඳුන්වාදීම | 2021-2030 |
| **NDC 8** | **උප නාගරික ප්‍රදේශවල දුම්රිය ප්‍රවාහනය නවීකරණය සහ වඩාත් උසස් කිරීම** | | **2021-2030** |
| | 8.1 | විදුලිදුම්රිය ක්‍රියාත්මක කිරීම | 2021-2030 |
| | 8.2 | නව දුම්රිය මාර්ග ඇතිකිරීම සහ පවත්නා මාර්ග ජාලය තවත් ව්‍යාප්ත කිරීම | 2021-2030 |
| **NDC 9** | **විදුලි සහ හයිබ්‍රිඩ් වාහන ප්‍රවර්ධනය කිරීම** | | **2021-2030** |
| | 9.1 | විදුලි සහ හයිබ්‍රිඩ් වාහන සඳහා බදුසහන වැඩි වශයෙන් ලබාදීම | 2021-2030 |
| | 9.2 | වාහන ආරෝපණය කරන ස්ථාන, බැටරි මාරුකරන ස්ථාන සහ අළුත් බැටරි යෙදීමේ පහසුකම් වැනි උපකාරක යටිතල පහසුකම් සඳහා අවශ්‍යකරන පහසුකම් සැලසීම | 2021-2030 |
| | 9.3 | නව HS කේතයක් හඳුන්වා දී විදුලි සහ හයිබ්‍රිඩ් වාහන බැටරි සඳහා වන බදු හා තීරු බදු සහන ලබාදීම | 2021-2030 |

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | ඉලක්ක වර්ෂය |
|---|---|---|
| **NDC 10** | **වාහන සංචිතයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම** | **2021-2030** |
| | 10.1 පවතින වාහන සංචිතයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම | 2021-2030 |
| | 10.2 ඉන්ධන කාර්යක්ෂම වාහන ආනයනය කිරීම ප්‍රවර්ධනය | 2021-2030 |
| | 10.3 රියැදුරන්ගේ චර්යාමය වෙනස්කම් ඇති කිරීම සඳහා වැඩසටහන් හන්වාදීම | 2021-2030 |
| **NDC 11** | **මාර්ග යටිතලපහසුකම් සංවර්ධනය** | **2021-2030** |
| | 11.1 සචලතාව වැඩිදියුණු කිරීම සඳහා පළාත් සහ ග්‍රාමීය මාර්ග සංවර්ධනය | 2021-2030 |
| | 11.2 අධිවේගී මාර්ග ජාලය ව්‍යාප්ත කිරීම | |
| **NDC 12** | **සමුද්‍රීය අංශයේ හරිතාගාර වායු විමෝචනය අඩුකරගැනීම** | **2021-2030** |
| | 12.1 MARPOL සම්මුතියේ VI ඇමුණුම අපරානුමත කර එහි විධිවිධාන ශ්‍රී ලංකාවේ බලාත්මක කිරීම | 2021-2030 |
| | 12.2 සාක්ෂි මත පදනම් වූ තොරතුරු අනුව, නාවුක කටයුතුවලින් (වෙරළාශ්‍රිත හා වරාය) හරිතාගාර වායු විමෝචනයට ඇති කෙරෙන බලපෑම අධ්‍යයනය කිරීම සහ එම ගැටලු ආමන්ත්‍රණය සඳහා ක්‍රියාමාර්ග හඳුන්වාදීම | 2021-2030 |
| | 12.3 මුහුදු ප්‍රවාහනය ප්‍රවර්ධනය කිරීම | 2021-2030 |
| | 12.4 වෙරළබඩ නාවුක සහ ධීවර බෝට්ටු හා නෞකාවල බලශක්ති කාර්යක්ෂමතාව සහ ඉන්ධනවල ගුණාත්මකබව දියුණුකිරීම සඳහා ක්‍රියාමාර්ග හඳුන්වාදීම | 2021-2030 |
| **NDC 13** | **සාමාන්‍ය සබලකරන ක්‍රියාකාරකම්** | **2021-2030** |
| | 13.1 විදුලි වාහන, හා හයිබ්‍රිඩ් වාහන ඇතුව පාරිසරික වශයෙන් තිරසර වූ ප්‍රවාහන මාධ්‍ය ප්‍රවර්ධනයට නව ජාතික ප්‍රතිපත්තියක් හඳුන්වාදීම හෝ පවතින ප්‍රතිපත්තිවලට සංශෝධන සිදු කිරීම | 2021-2030 |
| | 13.2 ඉන්ධන පාදක කාබන් බද්දක් හඳුන්වාදීම | 2021-2030 |
| | 13.3 නාවුක ප්‍රතිපත්ති සම්පාදනයේදී දේශගුණ විපර්යාස ක්‍රියාමාර්ග ඇතුළත් කිරීම | 2021-2030 |

2021 සිට 2030 දක්වා කාලය තුළ, යාවත්කාලීන කළ හෘඝ ක්‍රියාත්මක කිරීම මගින් ප්‍රවාහන අංශයේ හරිතාගාර වායු විමෝචන මෙතෙක් පැවති තත්ත්වයට අනුව 4.0%කින් අඩුකරගැනීමට **(1.0% කොන්දේසි රහිතව සහ 3.0 % කොන්දේසි සහිතව)** හැකිවනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. එය එම කාලසීමාව සඳහා ඇස්තමේන්තු කළ කාබන් ඩයොක්සයිඩ් සහ එවැනි අනෙකුත් හරිතාගාර වායු මෙට්‍රික් ටොන් 1,337,000 ක් කොන්දේසි රහිතව ද මෙට්‍රික් ටොන් 4,011,000 ක් කොන්දේසි සහිතව ද (එකතුව මෙට්‍රික් ටොන් 5,348,000 කි) අවමකිරීමේ මට්ටමකට සමාන වේ (4.4.2 රූපය).




*4.4.2 රූපය: විමෝචන අඩුවීම ප්‍රක්ෂේපණය - ප්‍රවාහනය*

### 4.4.3 කර්මාන්ත අංශය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2016 දී පවත්වන ලද කර්මාන්ත සමීක්ෂණයෙන් ශ්‍රී ලංකා කාර්මික ආයතන 21,295 ක් ඇති බවත් ඉන් වැඩි කොටසක් නිෂ්පාදන අංශයට අයත්වන බවත් වාර්තා කර තිබේ.[15] 2018 මහබැංකු වාර්ෂික වාර්තාවට අනුව සේවා අංශයට (26.1%) පසුව මෙරට දළ දේශීය නිෂ්පාදිතයට දෙවන විශාලතම දායකත්වය ලබාදෙන්නේ කාර්මික නිෂ්පාදන අංශයෙන් (15.5%) වන අතර රටේ ශ්‍රම බලකායෙන් 30% මෙම අංශයේ සේවය කරනු ලැබේ. රෙදිපිළි, ඇඟළුම් හා තේ නිෂ්පාදනය එහි වඩාත්ම වඩාත් අපනයනය ඉලක්ක කරගත් උප-අංශ වේ.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2018 බලශක්ති සංතුලනය අනුව, කර්මාන්ත අංශයට අවශ්‍ය කරන බලශක්තිය ලබාගන්නේ ජෛව ස්කන්ධ (33%), පෙට්‍රෝලියම් තෙල් (34%), සහ විදුලිය (33%) වැනි මූලාශ්‍ර කිහිපයකිනි. තේ සහ රබර් කර්මාන්ත ශාලා, බේකරි, උළු සහ ගඩොල් කර්මාන්තය, සහ අනෙකුත් කුඩාපරිමාණ කර්මාන්ත සඳහා යොදාගන්නේ ජෛව ස්කන්ධ යි. අනෙකුත් කර්මාන්තවල බොයිලේරු, උදුන් සහ පෝරණු සඳහා ෆොසිල ඉන්ධන යොදාගනු ලැබේ. හරිතාගාර වායු සඳහා දායක වන ප්‍රධානතම කර්මාන්ත නම්, සිමෙන්ති නිෂ්පාදනය, ඉදිකිරීම් කර්මාන්තය සඳහා අළුහුණු නිෂ්පාදනය සහ හුණුගල් හා සෝඩා අළු භාවිතා කරන කර්මාන්ත වේ. කෙසේනමුත්, කාර්මික බලශක්ති පරිභෝජනයෙන් සිදුවන විමෝචනය සමගින් සංසන්දනය කරන විට, මෙම කාර්මික ක්‍රියාවලීන්ගෙන් උත්පාදනය වන්නේ සාපේක්ෂ වශයෙන් අඩු හරිතාගාර වායු ප්‍රමාණයකි.

**කර්මාන්ත අංශයේ අනාගත දැක්ම සහ හරිතාගාර වායු විමෝචනය අඩුකරගැනීමට ඇති විභවය:** ගෝලීය වශයෙන් තරඟකාරී, වැඩියෙන් අගය එකතු කළ, නව්‍ය, තාක්ෂණය හා දැනුම පාදක කරගත් කර්මාන්ත නිර්මාණය කිරීම කෙරෙහි ශ්‍රී ලංකා රජය අවධානය යොමුකර තිබේ. ඒවායෙන් හානිකර පාරිසරික බලපෑම් අවම නිසා, ආයෝජක විශ්වාසය වර්ධනය කළ හැකි අතර, ඉහළ අපනයන අදායම් හා තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීම සහතික කරයි. මෙම නව දිශානතිය පිළිබිඹු කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශය, කර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තියක් (NaPID) සහ එම ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස පස්-වාර්ෂික උපායමාර්ගික ක්‍රියාත්මක කිරීමේ සැලසුමක් සම්පාදනය කිරීමෙහි නිරත වී සිටියි.

මේ හා සමගාමීව කර්මාන්ත අමාත්‍යාංශය, පුනර්ජනනීය බලශක්තිය, බලශක්ති හා සම්පත් කාර්යක්ෂම තාක්ෂණය සහ යහ පිළිවෙත් යෙදවීම වේගවත් කිරීම සඳහා ප්‍රතිපත්තිමය, නියාමනමය, තාක්ෂණික හා මූල්‍ය යාන්ත්‍රණ සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම මගින් කමාන්ත අංශයේ NDC දියත් කිරීමට ඇති හැකියාව පිළිබඳව ගවේෂණය කරමින් සිටියි. එසේම සම්පත් කාර්යක්ෂමතාව, චක්‍රීය ආර්ථික සහ අනෙකුත් ජාත්‍යන්තර සංකල්ප පිළිගනිමින් ඒවා ඒකාබද්ධ කරගන්නා අතරම දේශගුණ විපර්යාස අවමකරගැනීමේ අභිලාෂ තවදුරටත් වැඩිදියුණු කිරීමට මෙම NDC (4.4.3 වගුව) හේතු වනු ඇත. කාර්මික ක්‍රියාවලි සහ නිෂ්පාදන පරිහරණය (IPPU) සම්බන්ධ ක්‍රියා පිළිබඳව විශ්වසනීය දත්ත මූලාශ්‍ර හා මාර්ග සීමිත වන බැවින් බලශක්තිය-පරිභෝජනය-හා-බැඳුනු විමෝචන මෙම NDC මගින් සෘජුවම හෝ වක්‍රාකාරයෙන් ආමන්ත්‍රණය කරන බව මෙහි දී සඳහන් කළ යුතුය.

*4.4.3 වගුව: කර්මාන්ත අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව*

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | ඉලක්ක වර්ෂය |
|---|---|---|
| **NDC 1** | **තිරසර ජෛවස්කන්ධ බලශක්තිය වෙත මාරුවීම අඛණ්ඩව සිදුකරගෙන යාම සහ තෝරාගත් කාර්මික උප-අංශවල (තේ, රබර්, ඇඟළුම්, හෝටල් හා සංචාරක, සහල් සැකසුම්) පරිශීලකයින්ගේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම** | **2021-2030** |
| | 1.1 කාර්මික උදුන්, වාෂ්ප බොයිලේරු සහ උණුජල පද්ධති බවට පරිවර්තනය කිරීම | 2021-2030 |
| | 1.2 යොදාගන්නා අමුද්‍රව්‍යවල ගුණාත්මකබව, මෙහෙයුම් හා නඩත්තු පිළිවෙත්, පද්ධතියේ සැලසුම සහ ස්වයංක්‍රියකරණය වැඩිදියුණු කිරීම මගින් ජෛවස්කන්ධ පරිශීලන කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම | 2021-2030 |
| | 1.3 කර්මාන්ත තුළ ජෛව ස්කන්ධ 'සම-ජනනය' හඳුන්වාදීම | 2021-2030 |
| | 1.4 රජයේ ආයතනවල තාප බලශක්ති අවශ්‍යතා සපුරාලීම සඳහා ෆොසිල ඉන්ධනවල සිට ජෛව ස්කන්ධ දක්වා මාරුවීම | 2021-2030 |
| **NDC 2** | **තෝරාගත් කර්මාන්ත උප-අංශවල සම්පත් කාර්යක්ෂම පිවිතුරු නිෂ්පාදනය (RECP) යොදාගැනීම වැඩිදියුණු කිරීම** | **2021-2030** |
| | 2.1 RECP සහ බලශක්ති විගණන පැවැත්වීම සහ කර්මාන්ත වර්ගීකරණය හා වැදගත්කම අනුව පාදම් මට්ටම් නිර්ණය කරගැනීම | 2021-2023 |
| | 2.2 අඩු කාබන් තාක්ෂණ හා ක්‍රියාවලි ඇතුළුව RECP පරිචයන් යොදාගැනීම | 2021-2030 |

15 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය (2018).

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | ඉලක්ක වර්ෂය |
|---|---|---|
| | 2.3 තෝරාගත් කර්මාන්ත උප-අංශවල ජල පරිහරණ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම | 2021-2030 |
| | 2.4 අධි-කාර්යක්ෂම මෝටර (HEM), විචල්‍ය සංඛ්‍යාත ධාවක (VFD), සහ කාර්යක්ෂම සිසිලන හා ශීතකරණ තාක්ෂණ වැනි බලශක්ති කාර්යක්ෂම උපකරණ හා තාක්ෂණ භාවිතය ප්‍රවර්ධනය කිරීම | 2021-2030 |
| **NDC 3** | **පරිසර හිතකාමී කාර්මික උද්‍යාන සහ ගම්මාන ඇතිකිරීම** | **2021-2030** |
| | 3.1 පවතින කාර්මික උද්‍යානවලට හැකිතාක් උපරිමයෙන් හරිත කාර්මික සංකල්ප ඒකාබද්ධ කිරීම තුළින් ඒවා පරිවර්තනයකට ලක් කිරීම | 2021-2030 |
| | 3.2 සියලුම නව කාර්මික උද්‍යාන පරිසර හිතකාමී කාර්මික උද්‍යාන වශයෙන් ඇතිකෙරෙන බව සහතික කරගැනීම සඳහා මාර්ගෝපදේශ ඇතුළුව ඒ සඳහා අදාළ ප්‍රතිපත්ති හා නියාමන රාමුව හඳුන්වාදීම | 2021-2023 |
| **NDC 4** | **තෝරාගත් කර්මාන්ත උප-අංශවලට සහ තෝරාගත් කාර්මික කලාපවලට චක්‍රීය ආර්ථික සංකල්පය හඳුන්වාදීම** | **2021-2030** |
| | 4.1 චක්‍රීය ආර්ථික සංකල්පය ක්‍රියාත්මක කළහැකි උප-අංශ හඳුනාගැනීම හා තීරණය කිරීම සඳහා සමීක්ෂණයක් පැවැත්වීම | 2021-2023 |
| | 4.2 සැපයුම්දාමය හරිතකරණය කිරීම සඳහා, තෝරාගත් උප අංශවලට ජීවනචක්‍ර ප්‍රවේශය හඳුන්වාදීම | 2021-2030 |
| | 4.3 තෝරාගත් කාර්මික උද්‍යානවල සහ කර්මාන්ත උප-අංශවල කාර්මික සහජීවන සංකල්පය ප්‍රගුණ කිරීම | 2021-2030 |
| | 4.4 තෝරාගත් කාර්මික උද්‍යානවල සහ කර්මාන්ත උප-අංශවල ශූන්‍ය අපද්‍රව්‍ය සංකල්පයේ නියමු ව්‍යාපෘතියක් ඇතිකිරීම | 2021-2025 |
| | 4.5 චක්‍රීය ආර්ථික සංකල්පය සඳහා වන ISO ප්‍රමිතීන් (ISO/ITC 323) පිළිගැනීම | 2021-2030 |
| | 4.6 චක්‍රීය ආර්ථික සංකල්පය අනුගමනය කිරීමට කර්මාන්තවල ධාරිතාව වර්ධනය කිරීම | 2021-2030 |
| **NDC 5** | **තෝරාගත් කාර්මික උද්‍යානවලට ත්‍රිත්ව-ජනන පහසුකම් හඳුන්වාදීම** | **2021-2030** |
| | 5.1 කාර්මික උද්‍යාන 10ක ත්‍රිත්ව-ජනන ශක්‍යතාවය සම්බන්ධයෙන් කඩිනම් ඇගැයීමක් සිදුකිරීම | 2021-2023 |
| | 5.2 නියමු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා ආයෝජන මණ්ඩලයේ කාර්මික උද්‍යානයක විස්තීර්ණ ඇගැයුමක් සිදුකිරීම | 2021-2022 |
| | 5.3 ව්‍යාපාර ආදර්ශයක් සහ අරමුදල් විකල්ප සංවර්ධනය කිරීම | 2021-2023 |
| | 5.4 නියමු ව්‍යාපෘතියක් වශයෙන් එක් ත්‍රිත්ව-ජනන කර්මාන්තශාලාවක් ඇතිකිරීම | 2021-2027 |
| | 5.5 නියමු ව්‍යාපෘතිය ලබන සාර්ථකත්වය මත, එය ආයෝජන මණ්ඩලයේ සහ අනෙකුත් කාර්මික උද්‍යානවලට ද අදාළ කරගත හැකි අනෙකුත් ස්ථානවලට ද ව්‍යාප්ත කිරීම | 2021-2030 |
| | 5.6 නව කාර්මික කලාපවලට ත්‍රිත්ව-ජනන පහසුකම් ඇතිකිරීමට ඉඩ සැලසෙන පරිදි ප්‍රතිපත්ති මෙවලම් හරහා ඊට විධිවිධාන සැලසීම | 2021-2030 |
| **NDC 6** | **සිමෙන්ති කර්මාන්තයේ ක්ලින්කර් නිෂ්පාදනයේ දී හරිතාගාර වායු නිෂ්පාදනය අඩුකිරීම සඳහා දිරිගැන්වීම් ලබාදීම** | **2021-2023** |
| | 6.1 ලොව වටා කර්මාන්තයේ ප්‍රමිතීන් හා ප්‍රවණතා අනුව යමින්, සිමෙන්ති නිෂ්පාදනය සඳහා ක්ලින්කර් වෙනුවට අළු සහ ඊට සමාන වෙනත් අමුද්‍රව්‍ය භාවිතය ඉහළ නැංවීමට හැකිවන ලෙස සිමෙන්ති නිෂ්පාදනය සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ (SLSI) ප්‍රමිතිවලට අවශ්‍ය සංශෝධන සිදුකිරීම. | 2021-2023 |
| **NDC 7** | **සාමාන්‍ය සබලකරන ක්‍රියාකාරකම්** | **2021-2023** |
| | 7.1 තෝරාගත් උප අංශවල කර්මාන්තවලට හරිතාගාර වායු විමෝචනය අඩුකිරීම අරමුණු කරගත් අදාළ ශීඝ්‍ර පද්ධති යොදාගැනීම සඳහා පහසුකම් සැලසීම | 2021-2023 |
| | 7.2 තිරසර තාක්ෂණය අත්පත් කරගැනීම සඳහා සුදුසු බදු දිරිගැන්වීම් හඳුන්වාදී ප්‍රවර්ධනය කිරීම | 2021-2023 |

| NDC අංශය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | ඉලක්ක වර්ෂය |
|---|---|---|
| | 7.3 ශ්‍රී ලංකා හරිත රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතියට ISO සහතික ලත් සමාගම්වලට ප්‍රවේශවීම සඳහා පහසුකම් සැලසීම | 2021-2023 |
| | 7.4 හරිත මූල්‍යකරණය සමගින් සම්බන්ධ කරමින් මූල්‍යකරණ ආයතන හරහා පරිවර්තනය සඳහා ආයෝජන සහ වාසිසහගත ණය පහසුකම් ලබාගැනීමට පහසුකම් සැලසීම | 2021-2023 |
| | 7.5 කාර්මික උද්‍යාන සහ තනි කර්මාන්ත පිහිටන ස්ථාන, චක්‍රීය ආර්ථිකය, කර්මාන්ත පරිසර විද්‍යාව, RECP, ඩිජිටල්කරණය යනාදී නව සංකල්ප ආමන්ත්‍රණය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් හඳුන්වාදීම | 2021-2023 |
| | 7.6 කර්මාන්තවල පරිහරණය සඳහා තිරසර ජෛව ස්කන්ධ පවතින බව සහතික කරගැනීම | 2021-2023 |
| | 7.7 ජාතික හරිත වාර්තාකරණ ක්‍රමය (NGRS) ප්‍රවර්ධනය කිරීම | 2021-2023 |

2021 සිට 2030 දක්වා කාලය සඳහා යාවත්කාලීන කළ NDC මගින් කර්මාන්ත අංශයේ හරිතාගාර වායු විමෝචන පවත්නා තත්ත්වයට අනුව **7%කින්** අඩුකරගැනීමට **(4% කොන්දේසි රහිතව සහ 3% කොන්දේසි සහිතව)** හැකිවනු ඇතැයි අපේක්ෂා කරයි. එය එම කාලසීමාව සඳහා ඇස්තමේන්තු කළ කාබන් ඩයොක්සයිඩ් සහ එවැනි අනෙකුත් හරිතාගාර වායු මෙට්‍රික් ටොන් 2,088,000ක් කොන්දේසි රහිතව ද මෙට්‍රික් ටොන් 1,482,000ක් කොන්දේසි සහිතව ද (එකතුව මෙට්‍රික් ටොන් 3,570,000කි) අවමකිරීමේ මට්ටමකට සමාන වේ (4.4.3 රූපය). එසේම, තවමත් ක්‍රමවත් වාර්තාකරණ/ ගිණුම්කරණ ක්‍රමයක් නොමැතිවීම හේතුවෙන් ගණන්ගැනීම දුෂ්කර වූ වෙනත් විවිධ මූලපිරීම් හරහා විමෝචන තවත් අඩුකිරීම සිදුවන බව මෙහිදී සඳහන් කළ යුතුය.




*4.4.3 රූපය: හරිතාගාර වායු විමෝචන අඩුවීම ප්‍රක්ෂේපණය - කර්මාන්ත*

### 4.4.5 අපද්‍රව්‍ය කළමනාකරණය

ශ්‍රී ලංකාවේ දිනකට නාගරික ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 9,000ක් පමණ (දිනකට ඒකපුද්ගල ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය කි.ග්‍රෑ. 0.41ක ප්‍රමාණයකට සමාන)[16] ජනනය කරන අතර, ඉන් මෙට්‍රික් ටොන් 3,500ක් (40%) බස්නාහිර පළාතෙන් ද ඉතිරිය අනෙක් පළාත් අටෙන් ද ජනනය කෙරේ. පළාත් පාලන ආයතන විසින් අපද්‍රව්‍ය එකතු කරන ප්‍රමාණය බස්නාහිර පළාතේ 55%ක් ද අනෙක් පළාත්වල 25%ක් ද වේ. ජනගහනයේ වර්ධනය, යටිතල පහසුකම් වේගෙන් සංවර්ධනය වීම, ශීඝ්‍ර නාගරීකරණය, කාර්මික සංවර්ධනය, ඒක පුද්ගල ආදායමේ වැඩිවීම හා ජීවන තත්ත්වයේ වර්ධනය, ජීවනරටාව වෙනස්වීම හා ආර්ථික තත්ත්ව නිසා, එළැඹෙන 2021-2030 දශකයේ මෙම ඝන අපද්‍රව්‍ය උත්පාදනය තවත් වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සියලු පාර්ශ්වකරුවන් පිළිගත් පොදු අරමුණක් වෙනුවෙන් කටයුතු කරන, ජාතික ක්‍රියාකාරී සැලසුමක අවශ්‍යතාවය මෙයින් පෙන්නු කරයි. දිවයින පුරාම අපද්‍රව්‍ය නිසි ආකාරයෙන් වෙන්කිරීම දුර්වල වීම හා අපද්‍රව්‍ය එකතු කිරීමේ යන්ත්‍රණ ප්‍රමාණවත් නොවීම සහ අපද්‍රව්‍ය කලමනාකරණය සඳහා ජනතාවගේ කැපවීම ප්‍රමාණවත් නොවීම, 3R මූලධර්ම යොදාගැනීම පිළිබඳව ඇති ප්‍රායෝගික දුෂ්කරතා වත්මන් අපද්‍රව්‍ය කළමනාකරණ පිළිවෙත් පදනම් වී ඇති ගැටලු කිහිපයක් වේ.

අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පරිසරය සම්බන්ධ ප්‍රතිපත්ති, උපායමාර්ග මාර්ගෝපදේශ ඇතුළත් වන නීතිමය සහ ආයතනික රාමුවක් ශ්‍රී ලංකාව සතු ය. අපද්‍රව්‍ය කළමණාකරණය සඳහා යොදාගන්නා තාක්ෂණය සහ ක්‍රමවේද හොඳින් පිළිගත් ඒවා වුවත් පවතින අපද්‍රව්‍ය කළමනාකරණ පිළිවෙත් වඩාත් අනාකූල කර ඒවා වැඩිදියුණු කිරීමට හැකි නව්‍ය තාක්ෂණය සහ උපායමාර්ග තවමත් හඳුන්වා දී නොමැත.

බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (WMAWP) 2019 සිට 2023 දක්වා කාලසීමාව තුළ බස්නාහිර පළාතේ නගරසභාවල ඝන අපද්‍රව්‍ය සඳහා ප්‍රතිකර්ම කිරීම සහ බැහැර කිරීම සඳහා ඉලක්ක සම්පාදනය කර ඇත. ඒ අනුව, අපද්‍රව්‍ය එළිමහනේ බැහැර කිරීම සැලකිය යුතු මට්ටමකින් අඩු වනු ඇති අතර, අදාළ එක් එක් පළාත්පාලන ආයතනයේ මහාපරිමාණ අපද්‍රව්‍ය බැහැරකිරීමේ ස්ථාන වශයෙන් ඇති ආවෘත ස්ථානවලට අපද්‍රව්‍ය එකතු කරනු ඇත. ඉන්පසු ඒවායින් සම්පත් නැවත ලබාගැනීමට පියවර ගැනීමෙන් පසුව එම අපද්‍රව්‍යවලින් බලශක්තිය නිපදවන ව්‍යාපෘති සඳහා ඒවා යොමු කරනු ඇත. දැනටමත්, දිනකට මෙට්‍රික් ටොන් 700ක් සහ දිනකට මෙට්‍රික් ටොන් 500ක් භාවිතා කරමින් අපද්‍රව්‍යවලින් බලශක්තිය උත්පාදනය සඳහා වූ ව්‍යාපෘති දෙකක් ඉදිකිරීමට පෞද්ගලික සමාගම් දෙකකට අවසරය ලබාදී තිබේ. මේ වනවිට ඉන් පළමු බලාගාරය ඉදිකිරීමට භාරදී තිබේ. WMAWP සැලසුමට සමගාමීව, මෙට්‍රික් ටොන් 100ක දෛනික ධාරිතාවයකින් මහාපරිමාණ කොම්පෝස්ට් කර්මාන්තශාලා තුනක් ක්‍රියාත්මක වේ. දැනට, පළාත්පාලන ආයතනවලින් එකතු කරන කසළ අතරින් ප්‍රතිචක්‍රීකරණය කරනු ලබන්නේ 2%ක් පමණි. අවිධිමත් අංශයෙන් මීට වඩා ඉහළ ප්‍රමාණයක් ප්‍රතිචක්‍රීකරණය කරන බව සලකනු ලැබේ. බොහෝ පළාත්වල දිනකට මෙට්‍රික් ටොන් 50ක ධාරිතාවය සහිත කොම්පෝස්ට් නිෂ්පාදන පහසුකම් ඇතිකිරීමට පළාත්පාලන හා පළාත්සභා අමාත්‍යාංශය සැලසුම් කර තිබේ.

**අපද්‍රව්‍ය අංශයේ අනාගත දැක්ම සහ හරිතාගාර වායු විමෝචන අඩුකරගැනීමට ඇති විභවය:** මෑතදී අනුමත වූ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියෙන් (2019) ප්‍රමුඛතාවය ලබා දී ඇති අරමුණු වන්නේ අපද්‍රව්‍ය ජනනය මගහරවාගැනීම සහ අඩුකරගැනීමයි. කළමනාකරණයේ මීළඟ මට්ටම යටතේ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය හා පරිසර හිතකාමී අන්දමින් අපද්‍රව්‍ය බැහැර කරන අනෙකුත් ආකාර; මගහරවාගත නොහැකි අපද්‍රව්‍ය හැකිතාක් දුරකට නැවත පරිහරණය; අපද්‍රව්‍යවල අන්තරායකර අමුද්‍රව්‍ය ඇතුළත්වීම හැකිතාක් දුරකට අඩුකරගැනීම; සහ පාරිසරික වශයෙන් යහපත් අවශේෂ කසළ ප්‍රතිකර්ම හා බැහැරකිරීමේ කටයුතු සිදුකිරීම යන ඒවා නිර්දේශ කර ඇත. එමගින් අවධාරණය කරනු ලබන්නේ කසළ වැඩියෙන් ජනනය වන සමාජ-සංස්කෘතික ක්‍රමයක සිට ඒවා නැවත පරිහරණය කිරීම හා පරිභෝජනය අඩු කිරීම සඳහා වැඩියෙන් යොමු වීමෙන් කසළ බැහැර කිරීම අවම වූ සුසමාදර්ශයකට මාරුවීමයි.

අනෙකුත් ක්‍රියාමාර්ග ද සමගින්, මහජනයා තුළ අධ්‍යාපනය හරහා දැනුම්වත්භාවය වැඩිකිරීම සහ ආකල්පමය වෙනසක් ඇතිකිරීම තිරසර අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වේ. විවෘත කසළ බැහැර කිරීම වැළැක්වීමට හා කසළ උත්පාදනය අධෛර්යමත් කරන ආර්ථික/ මූල්‍ය අනුබලයන් සඳහා දිගුකාලීන විසඳුමක් අවශ්‍යව ඇත. මෙම NDC (4.4.4 වගුව) මගින් අපද්‍රව්‍ය කළමනාකරණයට හා තිරසර නිෂ්පාදනය හා පරිභෝජනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තියේ පැහැදිලිව සඳහන් වන චක්‍රිය ආර්ථික සංකල්ප පිළිගනිමින් ගන්නා අතර දේශගුණ විපර්යාස අවමකරගැනීම ඉහළ නංවනු ඇත.

16 මෙය පදනම් වී ඇත්තේ අදාළ විශේෂඥයින්ගේ විනිශ්චය සහ අතීතයේ සිදු කළ විවිධ අධ්‍යයනයන් මත ය

*4.4.4 වගුව: අපද්‍රව්‍ය අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව*

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | | ඉලක්ක වර්ෂය |
|---|---|---|---|
| **NDC 1** | **නාගරික ඝන අපද්‍රව්‍ය ජනනය වන මූලාශ්‍ර සියල්ලේම චක්‍රිය ආර්ථික පිළිවෙත් වැඩිදියුණු කිරීම** | | **2021-2030** |
| | 1.1 | වර්ධනයවීම 10%කින් අඩුකිරීම හා කර්මාන්තවල ඝන අපද්‍රව්‍ය සහ අපවහන ජනනයේ වර්ධනය අඩුකරගැනීම හරහා නාගරික ඝන අපද්‍රව්‍ය ජනනය වැළැක්වීම, මගහැරීම හෝ අඩුකිරීම | 2021-2030 |
| | 1.2 | නාගරික ඝන අපද්‍රව්‍ය මූලාශ්‍රයේදීම වර්ගීකරණයකිරීම වැඩිදියුණු කිරීම සහ වෙන්කරන වර්ග සංඛ්‍යාව වැඩිකිරීම | 2021-2025 |
| | 1.3 | නාගරික ඝන අපද්‍රව්‍ය එකතුකිරීමේ හා ප්‍රවාහනය කිරීමේ පද්ධතිය වැඩිදියුණු කිරීම (ජනනය පදනම් කරගෙන බස්නාහිර පළාතේ 75%ක් සහ අනෙක් පළාත්වල 60%ක්) | 2021-2030 |
| | 1.4 | එකතු කිරීමේ පදනම මත අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කරන ප්‍රමාණය බස්නාහිර පළාතේ 7% දක්වා සහ අනෙක් පළාත්වල 5% දක්වා ඉහළ නැංවීම | 2021-2030 |
| | 1.5 | අධික අපද්‍රව්‍ය ප්‍රමාණයක් ජනනය වන නිෂ්පාදන පාලනය කිරීම සඳහා නියාමන රාමුවක් ක්‍රියාත්මක කිරීම | 2021-2023 |
| **NDC 2** | **ජෛවහායනයට ලක්වන අපද්‍රව්‍ය ජීවවිද්‍යාත්මක ප්‍රතිකාර ඇසුරින් කළමනාකරණය** | | **2021-2030** |
| | 2.1 | බස්නාහිර සහ අනෙකුත් පළාත්වල එකතු කෙරෙන කොම්පෝස්ට් කළහැකි අපද්‍රව්‍යවලින් 30%ක ප්‍රමාණයක් කොම්පෝස්ට් කිරීම දක්වා මට්ටම ඉහළනංවා ගැනීම | 2021-2030 |
| | 2.2 | තෝරාගත් පළාත්පාලන ආයතනවල මධ්‍යම සහ ජාලගත කළ මලාපවහන පද්ධතිවල දියර අපද්‍රව්‍ය සඳහා අපජලය ප්‍රතිකාරක පහසුකම්, මලද්‍රව්‍ය ප්‍රතිකාරක පහසුකම් වැනි ප්‍රතිකාරක ක්‍රම යොදගැනීම, කාර්මික අපජලය ප්‍රතිකාරක ක්‍රමවේද වෙත යොමුකිරීම සහ නිසි ලෙස බැහැරකිරීම වැඩිදියුණු කිරීම, පෝෂක රොන්බොර (feed sludge) පහසුකම් සහිත පළාත්පාලන ආයතන වෙත සහය ලබාදීම, ප්‍රතිකාර කළ අපජලය භාවිතය සඳහා විකල්ප ක්‍රම සුදනම් කිරීම, දැනට පවතින ප්‍රතිකාරක මධ්‍යස්ථානවලට නව ප්‍රතිකාරක තාක්ෂණය හඳුන්වාදීමෙන් ඒවායේ ශක්‍යතාවය වැඩිදියුණු කිරීම, කාර්මික රොන්බොර (industrial sludge) සඳහා ප්‍රතිකාරක පහසුකම් වැඩිදියුණු කිරීම, දියර අපද්‍රව්‍ය සඳහා ප්‍රමාණය පදනම් කරගත් මිල ගණන් ක්‍රමයක් හඳුන්වාදීම වැනි ක්‍රම යොදගැනීම | 2021-2030 |
| | 2.3 | කොම්පෝස්ට් කිරීම ප්‍රායෝගික නොවන ස්ථානවල ජීවවායු තාක්ෂණය යොදගැනීම | 2021-2030 |
| **NDC 3** | **ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි සහ වෙනත් ක්‍රමවලින් කළමනාකරණය කළ නොහැකි අපද්‍රව්‍ය භාවිතයෙන් බලශක්තිය ලබාගැනීම හඳුන්වාදීම** | | **2021-2030** |
| | 3.1 | ස්ථාපිතකිරීම සඳහා දැනටමත් එකඟ වී ඇති අපද්‍රව්‍යවලින් බලශක්තිය උත්පාදනය කරන බලාගාර දෙක පිහිටුවීම | 2021-2028 |
| | 3.2 | අපද්‍රව්‍යවලින් බලශක්තිය නිපදවීමේ අරමුණ පැහැදිලිව නිර්වචනය කිරීමට හා වරණීය පෝෂක අයක්‍රම (preferential trade-in tariffs) ක්‍රමයෙන් ඉවත් කිරීම සැලසුම් කිරීම සඳහාත් ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීම | 2021-2023 |
| | 3.3 | අපද්‍රව්‍යවලින් බලශක්තිය නිපදවන බලාගාර අලුතින් ඇතිකිරීම නියාමනය | 2021-2025 |
| | 3.4 | වෙනත් තාප ප්‍රතිකාරක තාක්ෂණ හඳුන්වාදීම | 2021-2025 |
| **NDC 4** | **අවශේෂ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා වන සනීපාරක්ෂිත කසළ බිම් පිරවුම් භාවිතා කිරීම, දැනට පවතින 5% සිට 100% දක්වා බර පදනම මත වැඩිකිරීම** | | **2021-2030** |
| | 4.1 | සනීපාරක්ෂිත බිම් පිරවුම් පිහිටන ස්ථාන සහ ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්ති හා නියාමන ක්‍රියාත්මක කිරීම | 2021-2023 |
| | 4.2 | දැනට කසළ බැහැර කරන ස්ථාන පුනරුත්ථාපනය කිරීම | 2021-2030 |
| | 4.3 | කසල බැහැර කරන බිම් පිරවුම්වලින් වායු ලබාගැනීම හඳුන්වාදීම | 2021-2030 |
| **NDC 5** | **සාමාන්‍ය සබලකාරක ක්‍රියාකාරකම්** | | **2021-2030** |
| | 5.1 | NDC ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරන නීති යාවත්කාලීන කිරීම හෝ හඳුන්වාදීම | 2021-2023 |

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | ඉලක්ක වර්ෂය |
|---|---|---|
| | 5.2 ජනනය අධීක්ෂණය කළ හැකි සොයාබැලීමේ පද්ධතියක් (tracking system) සහිතව අපද්‍රව්‍ය ජනනය පුරෝකථනය කිරීම සඳහා වන යන්ත්‍රණයක් හඳුන්වාදීම | 2021-2023 |
| | 5.3 ගෘහ මට්ටමින් අපද්‍රව්‍ය වර්ගීකරණයකර භාරදීම අනිවාර්ය කරන නීති හඳුන්වාදීම | 2021-2023 |
| | 5.4 තිරසර පරිභෝජන රටා සඳහා දිරිගන්වන හා ඒවා ප්‍රවර්ධනය කරන වෙළඳපොළ-පාදක සහ වෙළඳපොළ-පාදක නොවූ මෙවලම් (MBI) හඳුන්වාදීමට උචිත පරිදි නීති රාමුවක් හා මෙවලම් හඳුන්වාදීම හෝ සංශෝධනය කිරීම | 2021-2030 |
| | 5.5 මිශ්‍ර අපද්‍රව්‍ය ජනනය කරන්නන් සඳහා 'දූෂකයා ගෙවීමේ මූලධර්මය' ක්‍රියාත්මක කිරීම | 2021-2025 |
| | 5.6 අපද්‍රව්‍ය ජනනය කරන තැනැත්තන්ගේ මෙන්ම අපද්‍රව්‍ය කළමනාකරණය කරන කාර්ය මණ්ඩලවල චර්යාමය වෙනස්කම් ඇතිකිරීම සඳහා දැනුම්වත්භාවය වර්ධනය කිරීමේ හා ධාරිතාවය වර්ධනය කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 2021-2030 |
| | 5.7 අපද්‍රව්‍ය අංශයේ NDC මූල්‍යකරණය සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්ව ඇතිකරගැනීමට පහසුකම් සැලසීම | 2021-2030 |

2021 සිට 2030 දක්වා කාලසීමාව තුළ මෙම යාවත්කාලීන කළ NDC ක්‍රියාත්මක කිරීම මගින් අපද්‍රව්‍ය අංශයේ හරිතාගාර වායු විමෝචන පවත්නා තත්ත්වයට සාපේක්ෂව **11%කින් (8.5% කොන්දේසි රහිතව සහ 2.5% කොන්දේසි සහිතව)** අඩුකරගැනීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කරයි. එය එම කාලසීමාව සඳහා ඇස්තමේන්තු කළ කාබන් ඩයොක්සයිඩ් සහ එවැනි අනෙකුත් හරිතාගාර වායු මෙට්‍රික් ටොන් 1,969,000කින් කොන්දේසි රහිතව ද මෙට්‍රික් ටොන් 580,000ක් කොන්දේසි සහිතව ද (එකතුව මෙට්‍රික් ටොන් 2,549,000කි) අවමකිරීමේ මට්ටමකට සමාන වේ (4.4.4 රූපය).




*4.4.4 රූපය: හරිතාගාර වායු විමෝචනය අඩුවීම ප්‍රක්ෂේපණය - අපද්‍රව්‍ය*

### 4.4.2 වනාන්තර අංශය

ශ්‍රී ලංකාවේ වන ආවරණය (2015 දී මෙය භූමි ප්‍රමාණයෙන් 29.15%කි) ඝන වනාන්තර, විවෘත වනාන්තර, තෘණභූමි සහ කඩොලාන ඇතුළත් වේ.[17] මෙම වනාන්තරවල ස්වාභාවික වෘක්ෂලතා ශ්‍රී ලංකාවේ දේශගුණ කලාප තුන වන තෙත්, වියළි හා අන්තර්මධ්‍ය යන කලාපවලට අනුරූපවන විවිධත්වයක් හා ව්‍යාප්තියක් පෙන්නුම් කරයි. තවද, වනාන්තර ස්වභාවයක් ගන්නා ගෙවතු හා කුළුබඩු, රබර්, දැව ආදිය වැවූ වතුයාය යනාදිය සෑහෙන ප්‍රමාණයක් පවතින අතර ඒවායින් ද කාබන් ප්‍රතිලාභ ලැබේ. ඒකකයකට පවතින ජෛව විවිධත්වය සහ තුරුලතා ආවරණය අධික ගෙවතු විශාල ප්‍රමාණයක් පැවතීම හේතුවෙන් ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ සුවිශේෂී ස්ථානයක් ගනියි. කෙසේනමුත්, කාලය ගතවීමත් සමග මෙම වන ආවරණය අඩු වී තිබේ. කෘෂිකර්මය සහ වැවිලි කර්මාන්තය සඳහා ද, මෑතකාලයේ විශාල යටිතල පහසුකම් ව්‍යාපෘති (වේළි, මාර්ග, මානව ජනාවාස යනාදී) සඳහා ඉඩ ලබාගැනීමට ද ඇතැම් වන ආවරණ එළිපෙහෙළි කර ඇත.

ස්වාභාවික වනාන්තර පවත්වාගෙන යාම/ ආරක්ෂා කරගැනීම සම්බන්ධයෙන් පවතින ප්‍රධානතම ගැටලු අතරට වනවිනාශය, ඉඩම් හායනය සහ පාංශු ඛාදනය, නීති විරෝධී ලෙස ගස් කැපීම, වනසතුන් දඩයම හා පතල් කැණීම, වන ගිනි, සහ වෙරළබඩ වනාන්තර හායනය ඇතුළත් වේ. මින් ඇතිවන පාරිසරික බලපෑමට අමතරව, ශ්‍රී ලංකාවේ වනවිනාශය හේතුවෙන් නායයාම්, පස හායනය, ගංවතුර, ජෛව විවිධත්වය හා ඔවුන්ගේ වාසභූමි අහිමිවීම, පරිසර දූෂණය යනාදිය සිදුවීමට හේතු වී තිබේ. එය, ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයේ පැවැත්ම සඳහා වන ප්‍රධානතම තර්ජනයයි.

**වනාන්තර අංශයේ අනාගත දැක්ම සහ කාබන් තිරකිරීමට ඇති විභවය:** වන ආවරණය ආරක්ෂා කිරීම සඳහා නෛතික මෙවලම්, ප්‍රතිපත්ති හා උපායමාර්ග සහ වැඩසටහන් විශාල සංඛ්‍යාවක් පවතී. වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත (1993), 2009 අංක 65 දරන වනාන්තර (සංශෝධන) පනත, 2009 සංශෝධිත 1907 වනාන්තර ආඥාපනත (1907 අංක 16), ශ්‍රී ලංකාවේ වන ක්ෂේත්‍ර මහ සැලැස්ම 1995-2020, ජාතික පරිසර පනත, ශ්‍රී ලංකාවේ ඉඩම් හායනය මැඩපැවැත්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරී වැඩසටහන 2015-2024, ජාතික ජෛව විවිධත්ව උපායමාර්ගික ක්‍රියාකාරී සැලසුම 2016-2022, පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය, වනාන්තර සංරක්ෂණ හා සංවර්ධන සැලසුම, තිරසර ඉඩම් කළමනාකරණ වැඩසටහන, වන විනාශයෙන් හා වන හායනයෙන් සිදුවන විමෝචන අඩුකිරීමේ ආයෝජන රාමුව හා ක්‍රියාකාරී සැලසුම (REDD+ Investment Framework and Action Plan) මේවා අතරින් වඩාත් මෑතකාලීන ඒවා වේ.

රජයේ වත්මන් ප්‍රතිපත්ති රාමුව තිරසර වන කළමනාකරණයක් සඳහා පුළුල් මාර්ගෝපදේශ සහ උපදෙස් ලබාදෙයි. එමගින්, 'ශුද්ධ කාබන් ශුන්‍ය රටක්' (Net Carbon Zero Country) ඇතිකිරීමට සහ 2025 වනවිට ජාතික වන ආවරණය 30% දක්වා වැඩිදියුණු කිරීමට බලාපොරොත්තු වෙයි. සුදුසු ඉඩම් හඳුනාගෙන නැවත වන වගා කිරීම, හරිත ආවරණය නැවත ඇතිකිරීම හා වැඩිදියුණුව, මුඩුබිම් හා අතහැර දැමූ ඉඩම් කෘෂිකර්මය හා වන වගාව සඳහා නැවතත් යථාතත්ත්වයට පත් කිරීම, නාගරික වනාන්තර, හරිත මංපෙත්, හරිත පියැසි හා කෘෂිවනවගා පද්ධති ඇතිකිරීම, නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල උද්‍යාන ඇතිකිරීම, අධිවේගී මහාමාර්ග දෙපස හා කාර්මික පරිශ්‍ර තුළ ශාක සිටුවීම තුළින් නාගරික වෘක්ෂලතා සංවර්ධනය පිළිබඳ එහි අවධාරණය කර තිබේ.

වනාන්තර අනුහුරුවීම සහ ආපදා හානි අවම කිරීම පිළිබඳ අතිවිශාල සම-ප්‍රතිලාභ තිබේ. ජලපෝෂක ප්‍රදේශ ආරක්ෂා කරන වනාන්තර මගින් ගංගාවේ පහළ ප්‍රදේශවලට ජලය ලැබෙන බව සහතික කරයි. වනාන්තර බොහෝ ග්‍රාමීය ප්‍රජාවනට ආහාර සහ ඉන්ධන සපයන අතර, ජෛව-ස්කන්ධ පාදක පුනර්ජනනීය බලශක්තිය පවතින බව සහතික කරදෙයි. නායයෑම්, බෑවුම්වල අස්ථායිබව, ගංවතුර පාලනය, වෙරළ ඛාදනය වැනි බොහෝ ස්වාභාවික ආපදා සම්බන්ධව සිමෙන්ති හා වානේ මගින් සකසන ව්‍යුහ වෙනුවට පරිසරය පාදක කරගත් විසඳුම් යෝජනා කෙරේ. වෙරළ හායනයෙන් ප්‍රජාව ආරක්ෂා කරදීමට කඩොලාන වනාන්තරවලට හැකිවී ඇති බවට හා දැඩි බෑවුම්වල පිහිටා ඇති වනාන්තර නායයෑම් වලක්වා ඇති බවට ශ්‍රී ලංකාව උදාහරණ සපයා දී ඇත. කෘෂි වන වගා පද්ධති තුළ සාම්ප්‍රදායික ශාක සහ ආහාර භෝග වැවීම ප්‍රත්‍යස්ථතාව සඳහා (නියගයට ඔරොත්තුදීම), ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීම සඳහා (ඉහළ පෝෂණයක් සහිත පලතුරු/ ආහාර ලැබීම සඳහා) සහ සතුන් හා මිනිසුන් අතර ගැටුම් මැඩපැවැත්වීම සඳහා හේතු වේ.

පහත දැක්වෙන යාවත්කාලීන කළ NDC (4.4.5 වගුව) මගින් කාබන් තිරකිරීමේ ධාරිතාවය (carbon sequestration capacity) කෙරෙහි අවධානය යොමුකරන නමුත්, ඒ තුළ අන්තර්ගත වන්නේ පවත්නා වනාන්තර සංරක්ෂණය, හායනය වූ වනාන්තර ප්‍රතිස්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීම සහ නව වනවගා ඇතිකිරීම හරහා ස්වාභාවික වන ආවරණය හා එහි ගුණාත්මකබව වැඩිදියුණු කිරීමයි. උපයෝගීතා වනාන්තර සහ වාණිජ වනාන්තර වැඩිදියුණු කිරීම සඳහා පෞද්ගලික අංශය සම්බන්ධ කරගැනීම තවත් විකල්පයක් වේ.

17 https://redd.unfccc.int/files/sri_lanka___s_forest_reference_level_submission_to_the_unfccc-06jan2017.pdf

*4.4.5 වගුව: වනාන්තර අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව*

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | ඉලක්ක වර්ෂය |
|---|---|---|
| **NDC 1** | **2030 වනවිට ශ්‍රී ලංකාවේ වන ආවරණය[18] 32%[19] දක්වා වර්ධනය කිරීම** | **2021-2030** |
| | 1.1 නැවත වනවගාවට/ වනවගාවට ඉඩම් හඳුනාගැනීම | 2021-2022 |
| | 1.2 තිරසර කළමනාකරණයක් සිදුවන බව සහතික කරගැනීමට ස්වාභාවික වනාන්තර සඳහා වන කළමනාකරණ සැලසුම් සම්පාදනය | 2021-2025 |
| | 1.3 වන ප්‍රතිස්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (කඩොලාන ඇතුළුව වනාන්තර නොවන ඉඩම් හෙක්ටාර 18,000+ ප්‍රමාණයක් නැවත වනවගාවට/ වනවගාවට යොදවනු ඇත) | 2021-2030 |
| **NDC 2** | **ස්වාභාවික වනාන්තර සහ වතුයායවල කඳන් පරිමාවේ (growing stock) ගුණාත්මකබව වැඩිදියුණු කිරීම** | **2021-2030** |
| | 2.1 හායනය වූ වනාන්තරවල කඳන් පරිමාවේ ගුණාත්මකබව වැඩිදියුණු කිරීම (හෙක්. 200,000) | 2021-2030 |
| | 2.2 රජයේ ඉඩම් හෙක්ටාර 78,000ක වනාන්තර වැවිලිවල ගුණාත්මකබව වැඩිදියුණු කිරීම | 2021-2030 |
| | 2.3 'ප්‍රාදේශීය වැවිලි සමාගම්වල' වනාන්තර ඉඩම්වල ගුණාත්මකබව වැඩිදියුණු කිරීම | 2021-2030 |
| **NDC 3** | **ප්‍රධාන ගංගා සහ එල්ලංගා පද්ධතිවල ජලපෝෂක ප්‍රදේශ ශක්තිමත් කිරීම** | **2021-2030** |
| | 3.1 ජලපෝෂක ප්‍රදේශ/ ගංගා ද්‍රෝණිවල බහු උපද්‍රව හඳුනාගැනීම සහ ප්‍රමුඛතා හඳුනාගැනීම | 2021-2022 |
| | 3.2 රුක් රෝපණය මගින් ප්‍රධාන ගංගා 10ක පහළ ජලපෝෂක ප්‍රදේශවල ආරක්ෂාව ශක්තිමත් කිරීම | 2021-2030 |
| | 3.3 රුක් රෝපණය මගින් වතුයාය හරහා ගලාබසින ජලමාර්ගවල ඉහළ ජලපෝෂක ප්‍රදේශවල ආරක්ෂාව ශක්තිමත් කිරීම | 2021-2030 |
| | 3.4 රුක් රෝපණය මගින් එල්ලංගා පද්ධති සහ හුදකලා වැව්වල ජලපෝෂක ප්‍රදේශවල ආරක්ෂාව ශක්තිමත් කිරීම | 2021-2030 |
| | 3.5 පහළ කැලණි ගංගා ද්‍රෝණියේ 'දේශගුණ ප්‍රත්‍යස්ථ බහු-අවධි වැඩසටහන්කරන ප්‍රවේශය' ව්‍යාපෘතිය අඛණ්ඩව ඉදිරියට ක්‍රියාත්මක කිරීම | 2021-2025 |
| **NDC 4** | **'වනාන්තරවලින් බැහැර පිහිටන වෘක්ෂ' (TROF) වැඩිදියුණු කිරීම ඉහළ නැංවීම** | **2021-2030** |
| | 4.1 TROF සඳහා සහාය දෙන ප්‍රතිපත්ති මෙවලම් සහ රෙගුලාසි සම්මත කරගැනීම (නාගරික වනවගාව, මාර්ග දෙපස, ආගමික පරිශ්‍ර තුළ, පාසල් හා අනෙකුත් රජයේ ඉඩම්වල, ගෙවතුවල රුක් රෝපණය) | 2021-2023 |
| | 4.2 එවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් සහ යාන්ත්‍රණයක් ඇති කිරීම | 2021-2024 |
| | 4.3 TROF සඳහා කාබන් තිර කළ තැන්පත් තක්සේරු සිදුකිරීම | 2021-2025 |
| | 4.4 TROF වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 2021-2030 |
| **NDC 5** | **සාමාන්‍ය සබලකරන ක්‍රියාකාරකම්** | **2021-2023** |
| | 5.1 වනාන්තර NDC සඳහා MRV පද්ධතියක් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම | 2021-2025 |

වනාන්තර අංශයේ යාවත්කාලීන කළ NDC ක්‍රියාත්මක කිරීම ඔස්සේ, 2021-2030 කාලසීමාව තුළ, පවතින තත්ත්වයට සාපේක්ෂව කාබන් තිරකරන ධාරිතාවය **7%කින්** වැඩිකරගැනීමට **(2% කොන්දේසි රහිතව සහ 5%ක් කොන්දේසි සහිතව)** හේතුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙය, එම කාලසීමාව තුළ ඇස්තමේන්තුගත කාබන් ඩයොක්සයිඩ් හා ඊට සමාන අනෙක් හරිතාගාර වායු මෙට්‍රික් ටොන් 705,000ක් කොන්දේසි රහිතව ද මෙට්‍රික් ටොන් 1,652,000ක් කොන්දේසි සහිතව ද (එකතුව මෙ.ටො. 2,357,000) තිරකිරීමට සමාන වේ (4.4.5 රූපය).

18 ලෝක අහාර හා කෘෂිකර්ම සංවිධානයයේ (FAO) නිර්වචනය අනුව, කඩොලාන ඇතුළුව වන වගා, ස්වභාවික වනාන්තර

19 වන වගා, ස්වභාවික වනාන්තර ඇසුරෙන් 30.8ක් ද ඉතිරිය වනාන්තරවලින් බැහැර රුක් රෝපණයෙන්ද සාක්ෂාත් කරගැනීමට අපේක්ෂිතය




*4.4.5 රූපය: කාබන් තිරකිරීමේ ධාරිතාවයේ ප්‍රක්ෂේපණ - වනාන්තර අංශය)*

### 4.4.1 කෘෂිකර්ම අංශය

මෙරට දළ දේශීය නිෂ්පාදිතයෙන් 8%කට පමණ කෘෂිකර්මය දායකවන අතර අපනයන ආදායමෙන් 21%ක් පමණ ලැබෙන්නේ එමගිනි.[20] අද වන විට රටේ ශ්‍රම බලකායෙන් 30%කට පමණ රැකියා සපයන්නේ මෙම අංශයෙනි. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය ප්‍රධාන වශයෙන් ම ආහාර භෝග වගාව සහ වැවිලි කර්මාන්තයෙන් (ප්‍රධාන ලෙසම තේ, රබර් සහ පොල්) සමන්විත වේ. ආහාර භෝග වගාව වැඩි වශයෙන් ම සමන්විත වන්නේ හෙක්ටාරයකට වඩා අඩු භූමි ප්‍රමාණවල වගාකරන කුඩා ගොවීන්ගෙන් ය. වැඩිවන වැටුප් හා පුහුණු ශ්‍රමයේ හිඟකම හමුවේ පරිමාණානුකූල ඵල ලබාගැනීමට නොහැකිවීම සහ යාන්ත්‍රිකකරණයට යොමුවීමේ දුෂ්කරතා ඇතිකිරීමට මෙය හේතු වී තිබේ. තවද, වැසිජලයෙන් පෝෂිත කෘෂිකර්මය මත වැඩියෙන් යැපීම, ඉහළ වටිනාකමකින් යුත් අලෙවිකළ හැකි නිෂ්පාදන ඇතුළත් කරගැනීම සඳහා විවිධාංගීකරණය නොකිරීම, නිෂ්පාදන පිරිවැය ඉහළවීම/ ලාභදායීත්වය අඩුවීම, තාක්ෂණය යොදාගැනීම අඩු මට්ටමක පැවතීම සහ වෙළඳපොළ තත්ත්වවල අඩුපාඩු පැවතීම, තොරතුරු බෙදාහැරීම දුර්වලවීම සහ අගය එකතුකිරීම දුර්වලවීම මෙහි ලා ඇති ප්‍රධානතම බාධක වේ.

2019 දී පශුසම්පත් අංශයෙන් දළ දේශීය නිෂ්පාදිතයට ලබා දුන් දායකත්වය 1%ක් පමණ විය. එහි ප්‍රධානතම කොටස වන ගවපාලනය යටතේ 2019 දී සතුන් මිලියන 1.4කගෙන් කිරි ලීටර මිලියන 447ක් නිපදවූ අතර, එය ජාතික කිරි අවශ්‍යතාවයෙන් 38%කට සමාන විය. කෙසේනමුත්, ප්‍රමිතියෙන් අඩු අභිජනනය හා ඵලදායිතාවය අඩුවීම, තාක්ෂණය යොදාගැනීම අඩුවීම, සතුන්ට තෘණ භූමි අඩුවීම සහ සත්ත්ව ආහාරවල පිරිවැය ඉහළවීම වැනි සාධක මගින් සත්ත්වපාලන අංශය අවහිරතාවලට මුහුණ දෙයි. ඵලදායී නොවන, හීලෑ නොවූ ගව ගහනය, සත්ව ආහාර ලබාදීමේ පද්ධතිවල ඇති අඩුපාඩු, සත්ව සුභසාධනයේ දුර්වලතා මෙම අංශයෙන් හරිතාගාර වායු විමෝචන සඳහා සැලකිය යුතු ලෙස දායක වී තිබේ.

**කෘෂිකර්ම අංශයේ අනාගත දැක්ම සහ හරිතාගාර වායු විමෝචන අඩුකරගැනීමට ඇති විභවය:** රජයේ වත්මන් ප්‍රතිපත්ති රාමුවතුළ තිරසර කෘෂිකර්මය සහ පරිසර හිතකාමී ගොවිතැන සඳහා පුළුල් මාර්ගෝපදේශ හා උපදේශ ලබාදී ඇත. නූතන සහ දියුණු තාක්ෂණය, සකසුරුවම් ජල පරිහරණය, පුනර්ජනනීය බලශක්තිය භාවිතය, නිෂ්පාදන නවෝත්පාදනය, අගය එකතුකිරීම හා ක්‍රියාවලි වැඩිදියුණු කිරීම, දියුණු කළ පසු අස්වනු හැසිරවීම, ඇසුරුම්කරණය, ප්‍රවාහනය, තේරීම හා බෙදාහැරීම හරහා අතිරික්ත නිෂ්පාදන කළමනාකරණය පිළිබඳව එහි අවධාරණය කර තිබේ. පශුසම්පත් සංවර්ධනය සඳහා ආයෝජන සිදුකිරීමෙන් කිරි නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිතවීම අරමුණු කර තිබේ. ප්‍රධාන උපායමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කිරීම තුළින් කෘෂිකර්ම අංශයේ හරිතාගාර වායු විමෝචන අඩුකරගැනීමට අපේක්ෂා කෙරේ. එවැනි එක් ක්‍රියාමාර්ගයක් නම් ජලය අධිකව පරිභෝජනය කරන වී ගොවිතැනේ සිට අපනයනය කෙරෙහි වැඩියෙන් යොමු වූ ඉහළ වටිනාකම් සහිත භෝග කරා භෝග නිෂ්පාදනය විවිධාංගීකරණයයි. භෝග නාස්තිය අඩුකිරීම සඳහා අගය එකතුකිරීම සහ නවීන කෘෂිකාර්මික අගය දාමයන්ට කුඩා ගොවීන් වඩාත් හොඳින් ඒකාබද්ධ කිරීම තවත් ක්‍රියාමාර්ගයකි. එසේම, මෙම අංශයේ වඩාත් පිවිතුරු නිෂ්පාදනයක් සඳහා භෝග සහ පශුපාලනය යන අංශ දෙකෙහි ම තාක්ෂණය වැඩිදියුණු කිරීම, නූතන කෘෂිකාර්මික පිළිවෙත් සහ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රම භාවිතය යන උපායමාර්ග වැදගත් වන බව සලකනු ලැබේ. දැනට සම්පාදනය වෙමින් පවතින ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය, වසවිසෙන් තොර ආහාරවලින් ඵලදායී මෙන්ම ස්වයංපෝෂිත ආර්ථිකයක් සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත.

*4.4.6 වගුව: කෘෂිකර්ම අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව*

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | ඉලක්ක වර්ෂය |
|---|---|---|
| **NDC 1** | **පලතුරු සහ එළවළුවල පසු අස්වනු හානිය අඩුකිරීම සහ ඒවාට අගය එකතු කිරීම** | **2021-2030** |
| | 1.1 වගා කළමනාකරණය සැලසුම් කිරීම | 2021-2030 |
| | 1.2 පසු අස්වනු කළමනාකරණය වැඩිදියුණු කිරීම | 2021-2030 |
| | 1.3 අතිරික්ත නිෂ්පාදනය කළමනාකරණය | 2021-2030 |
| | 1.4 නිෂ්පාදන නවෝත්පාදනය | 2021-2030 |
| | 1.5 පසු අස්වනු කළමනාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය | 2021-2030 |
| | 1.6 ප්‍රතිපත්ති සහ අනෙකුත් උපකාරක මෙවලම් හඳුන්වාදීම | 2021-2030 |
| **NDC 2** | **භෝග ඵලදායීතාවය වර්ධනය කිරීම** | **2021-2030** |
| | 2.1 ඵලදායීතාවය වැඩිදියුණු කිරීමට ඉහළ විභවයක් සහිත භෝග හඳුනාගැනීම | 2021-2030 |
| | 2.2 ආහාර භෝගවල ඵලදායීතාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහන් තුළ අනිවාර්ය අවශ්‍යතාවයක් ලෙස යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කිරීම | 2021-2030 |
| | 2.3 වී ගොවිතැන් අංශයේ ඉඩම්-භාවිතා කිරීමේ ඵලදායිතාවය (හෙක්ටාරයකට ලැබෙන වී අස්වැන්න) කොන්දේසි රහිතව 10%කින් සහ කොන්දේසි සහිතව 5%කින් වැඩිකිරීම. | 2021-2030 |
| | 2.4 පොහොර භාවිතයේ ඵලදායීතාව කොන්දේසි රහිතව 10%කින් සහ කොන්දේසි සහිතව 5%කින් වැඩිකිරීම. | 2021-2030 |

20 https://www.cbsl.gov.lk/en/statistics/statistical-tables/external-sector

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | ඉලක්ක වර්ෂය |
|---|---|---|
| | 2.5 ජල භාවිතයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම | 2021-2030 |
| | 2.6 සුනිශ්චිත කෘෂිකර්මාන්තය (precision agriculture) ප්‍රවර්ධනය කිරීම | 2021-2030 |
| **NDC 3** | **භෝග වගාව/ අගය එකතුකිරීම සඳහා පුනර්ජනනීය බලශක්තිය භාවිතය වැඩිදියුණු කිරීම** | **2021-2030** |
| | 3.1 කෘෂිකාර්මික පිළිවෙත් සඳහා සූර්ය PV සහ සුළං බලශක්තිය (හෝ ඒ දෙකෙහි මිශ්‍රණයක්) යොදාගැනීම | 2021-2030 |
| | 3.2 ෆොසිල ඉන්ධන භාවිතයෙන් බලගැන්වෙන පොම්ප වෙනුවට විදුලිබල පද්ධතියෙන් විදුලිය ලබාගැනීම ප්‍රවර්ධනය | 2021-2030 |
| | 3.3 අවදානම් ප්‍රදේශවල කෘෂිකර්මය සඳහා පුනර්ජනනීය බලශක්තියෙන් බලගැන්වෙන කුඩා විදුලිපද්ධති ඇතිකිරීම (නියමු ව්‍යාපෘතියක් ලෙස) | 2021-2030 |
| | 3.4 වාරි ඇළමාර්ගවල කුඩා පරිමාණ ජලවිදුලි උත්පාදන විභවය ගවේෂණය කර සංවර්ධනය කිරීම | 2021-2030 |
| **NDC 4** | **ගවපට්ටිය, පට්ටියේ සෞඛ්‍ය, සත්ව ආහාර කළමනාකරණය සහ සතුන්ගේ පහසුව හා සුබසාධනය වර්ධනය කිරීමෙන් කිරි අංශයේ ඵලදායිතාවය වැඩිදියුණු කිරීම (2030 වනවිට එළදෙනකගෙන් දිනකට ලබාගන්නා කිරි ඵලදාව 40%ක වර්ධනයක් ඇතිකරගැනීම සහ කොන්දේසි සහිත පදනමින් එය දිනකට 55% දක්වා තවදුරටත් වර්ධනය කිරීම. ගව පට්ටියේ කිරි දොවාගත හැකි ඵලදායී එළදෙනුන් සංඛ්‍යාව කොන්දේසි සහිත පදනමින් 40% දක්වා වැඩිකිරීම)** | **2021-2030** |
| **NDC 5** | **පශුපාලනයට යොදාගැනෙන ඒකමාශයික සතුන්ගේ ජානමය, සත්ත්වාහාර කාර්යක්ෂමතාව, සත්ව සෞඛ්‍යය, පහසුව හා සුබසාධනය වර්ධනය තුළින් ඔවුන්ගේ නිෂ්පාදනය වැඩිදියුණු කිරීම** | **2021-2030** |
| **NDC 6** | **පශුපාලන කටයුතු සඳහා පුනර්ජනනීය බලශක්තිය යොදාගැනීම** | **2021-2023** |
| | **උදා - කිරි ගබඩා පහසුකම් වැඩිදියුණු කිරීමට සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ශීතකරණ භාවිතය, කිරි නිෂ්පාදනයේදී සූර්ය බලයෙන් සිසිල්කරණය වන සිසිලන භාවිතය, සූර්ය බලශක්තිය භාවිත කරන කිරි එකතු කිරීමට, සිසිලන මධ්‍යස්ථාන, ගොවිපොළ මෙහෙයුම් සහ සැකසුම්ත මහාපරිමාණ ගොවිපොළ, කිරි සැකසුම් පොළ සහ සත්ව ඝාතකාගාරවලට ජීවවායු නිපදවීම හඳුන්වා දීම** | |

යාවත්කාලීන කළ NDC 2021 සිට 2030 දක්වා කාලය තුළ ක්‍රියාත්මක කිරීම තුළින්, 2030 වනවිට කෘෂිකර්ම සහ පශුසම්පත් අංශයේ හරිතාගාර වායු විමෝචන මෙතෙක් පැවති තත්වයට වඩා 7%කින් **(කොන්දේසි රහිත 4% සහ කොන්දේසි සහිත 3%)** අඩුවනු ඇතැයි, එනම් කොන්දේසි රහිතව[21] $CO2_e$ මෙට්‍රික් ටොන් 2,477,400ක සහ කොන්දේසි සහිතව $CO2_e$ මෙට්‍රික් ටොන් 1,858,000 (එකතුව $CO2_e$ මෙට්‍රික් ටොන් 4,335,400) ක දේශගුණ විපර්යාස අවමකිරීමේ ඇස්තමේන්තු කළ මට්ටමකට සමාන වෙතැයි අපේක්ෂා කෙරේ (4.4.6 රූපය).




*4.4.6 රූපය: හරිතාගාර වායු විමෝචන අඩුවීම ප්‍රක්ෂේපණය - කෘෂිකර්මය හා පශුසම්පත්*

21 ශ්‍රී ලංකාව සඳහා විශේෂිත විමෝචන සාධක නොමැති බැවින් මෙම විශ්ලේෂණය කෘෂිකර්ම සහ පශුසම්පත් ක්ෂේත්‍රය සඳහා ලබාදී ඇති IPCC2006 ප්‍රමිතිගත විමෝචන සාධක මත පදනම් කරගෙන ඇති අතර එතුළින් මෙරටේ පසුබිම නිවැරදි ලෙස නියෝජනය නොවීමට ඉඩ ඇත. අවශ්‍ය කරන නිවැරදි කිරීමක් වෙතොත් ඉදිරියේදී සිදුකරන සන්නිවේදනවලදී එය උචිත පරිදි සිදුකරනු ඇත.

# 5 පරිච්ඡේදය

## අනුහුරුවීමේ ජාතිකව නිර්ණය කළ දායකත්ව

දේශගුණ විපර්යාස නිසා ශ්‍රී ලංකාව ලක් විය හැකි අවදානම මනාව ලේඛනගත වූ කරුණක්[22] වන අතර, ජාතික සන්නිවේදන හරහා මෙය UNFCCC වෙත ඉදිරිපත් කර තිබේ. දේශගුණ විපර්යාස පාරාමිතීන් වෙත ශ්‍රී ලංකාව නිරාවරණයවීම වැඩි වී තිබීම මෑතකදී සිදුකළ අවදානම් විශ්ලේෂණවලින් තහවුරු වී තිබේ. මෝසම් රටාවේ, වර්ෂාපතන තිව්‍රතාවයේ හා නියගකාලයේ දැනටමත් නිරීක්ෂණය කළ හැකි වෙනස්වීම්, උෂ්ණත්වය ඉහළයාම හා දැඩි උණුසුම, දේශගුණ උපද්‍රවවලට නිරාවරණය වැඩිවීම සහ මුහුදු මට්ටම ඉහළ නැගීම වැනි තත්ත්වයන් තවදුරටත් උග්‍ර කරවමින් වර්ෂාපතන ව්‍යාප්තියේ දීර්ඝ කාලීන වෙනස්කම් හා පාරිසරික මායිම් වෙනස්වීම් ඇතිවෙමින් පවතින බව මෙම අධ්‍යයනවලින් පෙන්වා දෙයි. මෙම වෙනස්කම්වලින් බරපතළ ලෙස බලපෑමට ලක් වූ අංශ වන්නේ කෘෂිකර්මය, ධීවර කර්මාන්තය, පශුසම්පත්, ජලය, ජෛව විවිධත්වය, වෙරළබඩ හා සමුද්‍ර, සෞඛ්‍ය, නාගරික සැලසුම්කරණය හා මානව ජනාවාස සහ සංචාරක හා විනෝදස්වාද කර්මාන්තයයි. ඒ ඒ අවදානම් අංශයට අදාළව ජාතික ආයතනවල විද්වතුන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් විසින් හඳුනාගත් අනුහුරුවීමේ ප්‍රමුඛතා ක්‍රියාමාර්ග මෙම NDC මගින් ඉදිරිපත් කර තිබේ.

දේශගුණ විපර්යාස ආර්ථික වර්ධනයට බරපතළ තර්ජනයක් එල්ල කරන අතර සංවර්ධනයෙන් ලබන ඵල දුර්වල කරවයි. දේශගුණ විපර්යාස සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සඳහා වන දීර්ඝකාලීන ප්‍රතිපත්තිමය ඉලක්කය[23] නම්, දේශගුණ විපර්යාසවලින් ඇතිවන අහිතකර බලපෑම්වලින් රට ආරක්ෂා කරගන්නා බව තහවුරු කරගැනීමයි. මෙහිදී අරමුණු කර ඇත්තේ ඉහත කී අංශ අතරින් බොහොමයක ජීවනෝපායයන් රඳා පවතින්නා වූ ස්වාභාවික සම්පත් මූලය ආරක්ෂා කරගන්නා අතරම, අඛණ්ඩ ආර්ථික වර්ධනයක් පවත්වාගෙන යාමටත් ඉහළ මානව සංවර්ධනයක් පවත්වාගෙන යාමටත් උපකාරී වන අන්දමින් තිරසර සංවර්ධනය සඳහා පහසුකම් සැලසීමයි.

විවිධ අංශ නවයක අනුහුරුවීමේ ප්‍රමුඛතා පහත සඳහන්වන අතර ඒවා ඵලදායී අන්දමින් ක්‍රියාත්මක කිරීමට සම්පූර්ණ කළ යුතු පොදු අවශ්‍යතා තිබේ. තීරණ ගැනීමේදී යොදාගැනීම සඳහා එක් එක් ක්ෂේත්‍රයට විශේෂිත අවදානම පිළිබඳ තොරතුරු සහ ඇගයුම් හා දේශීය ආකෘතික මෙවලම් විශාල වශයෙන් නොමැත. අවදානම පිළිබඳ දැනුවත් නිවැරදි ආයෝජන සිදුකිරීම සඳහා බොහෝ අංශවලට අදාළව ප්‍රාදේශීය මට්ටමින්, සමුච්චිත නොකළ දත්ත තිබීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ මුහුදු මට්ටම ඉහළ නැඟීම සම්බන්ධයෙන් නිවැරදි ලෙස පුරෝකථනය කිරීම සඳහා පවතින දත්තවල නිරවද්‍යතාව මේ සඳහා උදහරණයකි. ආංශික උපායමාර්ග සකසාගැනීම (උදා: සංචාරක කර්මාන්තය) සහ අවකාශයීය සංවර්ධනය (උදා: නාගරික මධ්‍යස්ථාන) අවදානම් තක්සේරු දැනට සිදුකර නොමැති බැවින් ඒවා සිදුකිරීම ප්‍රමුඛ අනුහුරුවීමේ ක්‍රියාකාරකමක් වශයෙන් සඳහන් කර ඇත. එසේම, පළාත්, ගංගා ද්‍රෝණි හෝ ප්‍රාදේශික මට්ටමින් තීරණ ගැනීමට හැකියාව ලබාදීම පිණිස උප-ජාතික මට්ටමෙන් අවදානම් සහ අවදානමට ලක් විය හැකි බව පිළිබඳව ලබාගත හැකි දත්ත දැනට විශාල වශයෙන් නොමැත.




අනුහුරුවීමේ ක්‍රියාමාර්ග මගින් දේශගුණ විපර්යාස නිසා අවදානම ලක් විය හැකි බව අඩු කරන අතර ජීවිත, දේපළ, යහපැවැත්ම සහ ප්‍රධාන ආර්ථික අංශවලට ඇති අවදානම කළමනාකරණය කරයි. ශ්‍රී ලංකාවේ අනුහුරුවීමේ NDC සැලසුම් කර ඇත්තේ දේශගුණ විපර්යාසවලින් අවදානමට ලක් විය හැකි බව අවම කිරීම සඳහා මට්ටම් දෙකකට මැදිහත් වීම සඳහා ය. පළමුවෙන්ම, දේශගුණ විපර්යාස සඳහා යම් යම් අංශවල හෝ භූගෝලීය සංවේදීතාව අඩු කරන ක්‍රියා සැලසුම් කිරීමෙන් ද දෙවනුව, (5.1 රූපයෙන් පෙන්වා ඇති අන්දමට) අවදානම් සහිත අංශවලට විශේෂිත වූ තාක්ෂණික, ආයතනික හා තොරතුරු පදනම් කරගත් මැදිහත්වීම් තුළින් ද අනුහුරුවීමේ හැකියාවන් වැඩි කිරීම ඔස්සේ මෙය සිදුවේ.

මෙම කොටසේ විස්තර කර ඇති ආංශික භෞතික ශ්‍රී ලංකාවේ නොපමාව ඉටුකරගත යුතු අනුහුරුවීමේ අවශ්‍යතාවයන් සඳහා සහාය වන අතර, අවදානම් පිළිබඳ තොරතුරු පහළ මට්ටම් කරා ගෙනයාම, දේශගුණ දත්ත, සැලසුම්කරණ සහ ප්‍රමුඛතා සම්පාදන මෙවලම්, සහ වඩාත් හොඳ තාක්ෂණය හා නොපමාව අනුහුරුවීමේ කටයුතු සිදුකිරීම පිණිස මූල්‍යකරණය සඳහා වර්ධනය වෙමින් ඇති අවශ්‍යතා පිළිබිඹු වන අන්දමින් 2016 සිදුකළ මුල් NDC වඩාත් වැඩිදියුණු කර දක්වා තිබේ.

*5.1 රූපය: අනුහුරුවීමේ ක්‍රියාකාරකම්වලට ඇති දේශගුණ බලපෑම්, අනුහුරුවීමේ ධාරිතා සහ අවදානම[24]*

22 ගෝලීය දේශගුණ විපර්යාස දර්ශකය 2020 | Germanwatch e.V.

23 ගෝලීය දේශගුණ විපර්යාස ප්‍රතිපත්තිය (2012)

24 මූලාශ්‍රය: Stéphane Isoard, Torsten Grothmann and Marc Zebisch, Paper presented at the Workshop ‘Climate Change Impacts and Adaptation in the European Alps: Focus Water’, “Climate change impacts, vulnerability and adaptation: Theory and Concepts”, 2008 at UBA Vienna

මෙම අනුහුරුවීමේ ප්‍රමුඛතා තුළට ස්ත්‍රීපුරුෂ සමාජභාවය සහ සමාජ ආරක්ෂණය මුඛ්‍යධාරාගත කිරීම වැදගත් උපායමාර්ග යකි. එබැවින්, අවදානම් තක්සේරු සහ ආංශික සැලසුම්වලට කාන්තාවන්ගේ, ළමයින්ගේ, ආබාධ සහිත පුද්ගලයින්ගේ සහ වැඩිහිටියන්ගේ විශේෂිත අවශ්‍යතා, අවදානම සහ ධාරිතා ඒකාබද්ධ කළයුතු බව නිර්දේශ කෙරේ. එක් එක් අංශය තුළ කාන්තාවන්ට සහ පුරුෂයින්ට ඇති වෙනස් අවශ්‍යතා පිළිබඳව සැලකිල්ල යොමුකරමින් දැනුම, අනුහුරුවීම සඳහා සබලකාරී තත්ත්වයන් නිර්මාණය කරදෙන අන්දමින් තාක්ෂණය, මූල්‍ය ආදිය කරා ප්‍රවේශය වැඩිදියුණු කිරීම සඳහා විධික්‍රම නිර්දේශ කරනු ඇත. වඩාත් වැඩියෙන් කාන්තාවන් සම්බන්ධකරගැනීම සහ ඔවුන්ගේ දයකත්වය ලබාගැනීම උදෙසා, පුරුෂයින් සහ කාන්තාවන් යන දෙපාර්ශවයේම ධාරිතා වර්ධනය, තාක්ෂණික සහ විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, සහ ගණිත (STEM) අධ්‍යාපනය වැඩිදියුණු කිරීම, ප්‍රාදේශීය මට්ටමෙන් ලක් විය හැකි අවදානම විශ්ලේෂණය සඳහා වැඩියෙන් අරමුදල් යොමුකිරීම ආදිය ඔස්සේ ස්ත්‍රීපුරුෂ සමාජභාවයට විශේෂිත කුසලතා සහ ධාරිතා භාවිතා කිරීමට ඉඩ සැලසෙනු ඇත.

අනුහුරුවීමේ NDC කාන්තාවන්ගේ දයකත්වය සඳහා හැකියාව ලබාදෙන බව මෙන්ම ප්‍රතිලාභ සඳහා සම ප්‍රවේශ අවස්ථා ලබාදෙන බව සහතික කරගැනීම සඳහා ස්ත්‍රීපුරුෂ සමාජභාවී පුහුණු සඳහා ආයෝජනය කිරීමට, කාන්තාවන් අතර ව්‍යවසායකත්ව කුසලතා වැඩියෙන් ප්‍රවර්ධනය කිරීමට, සහ ඔවුන්ගේ සහභාගීත්වයට උපකාර කරන තාක්ෂණය හා මූල්‍ය කරා කාන්තාවන්ට ප්‍රවේශය ලබාදීමට කටයුතු කළයුතු වේ. නව තාක්ෂණයන්ගෙන් ද, දේශගුණ සුහුරු නිෂ්පාදන හා ජල කළමනාකරණ පිළිවෙත්වලින් ද, වඩාත් හොඳ කෘෂිකාර්මික ඵලදායීතාව, ආහාර සුරක්ෂිතතාව හා ආදායම්, වඩාත් හොඳ සම්පත් කළමනාකරණ කාර්යක්ෂමතාව (ජලය, ඉඩම්, ආහාර සැකසුම හා සංරක්ෂණය) යනාදිය ඇතුළත් වන ප්‍රතිලාභවලින් ද පුරුෂයින්ට සහ කාන්තාවන්ට සමානව ඵල නෙලාගැනීමට ස්ත්‍රීපුරුෂ සමාජභාව ප්‍රතිචාරී NDC මගින් ඉඩ සලසනු ඇත. 7.1 කොටසේ විස්තර කර ඇති පරිදි, වර්ෂ දහයක් සඳහා NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම් සම්පාදනය කිරීමේ ක්‍රියාවලියේ කොටසක් වශයෙන් එක් එක් අංශ විසින් සවිස්තරාත්මක ස්ත්‍රී පුරුෂ සමාජභාව විශ්ලේෂණයක් සිදුකළයුතු යැයි නිර්දේශ කෙරේ.

කෘෂිකර්මය සහ ආහාර සුරක්ෂිතතාවය, ජලය සහ වන වගාව වැනි ප්‍රධාන අංශවල ප්‍රත්‍යස්ථතාවය ගොඩනැගීම සඳහා බෝග වර්ග, වගා ක්‍රම, ජල කළමනාකරණය, ආහාර සැකසීම සහ සංරක්ෂණය පිළිබඳ සාම්ප්‍රදායික දැනුම වැදගත් වනු ඇත. ආහාර සුරක්ෂිතතාවය, ප්‍රවේශය, පෝෂණය දියුණු කිරීම, ජෛව විවිධත්ව ප්‍රතිඵල වැඩි දියුණු කිරීම සහ වනාන්තරයෙන් බැහැර තුරුලතා (ගෙවතු, මාර්ගාසන්නයේ, මායිම් වැටවල් ආදිය) සඳහා දේශීය විකල්ප ලබා දීම සඳහා සාම්ප්‍රදායිකව භාවිතා කරන නමුත් වාණිජමය වශයෙන් නොසලකා හරින ලද ශාක හා සත්ත්ව විශේෂ ඵලදායී ලෙස භාවිතා කළ හැකිය. එබඳු දැනුම් ගබඩාවන් වශයෙන් කාන්තාවන් ප්‍රධාන භූමිකාවක් ඉටු කරන අතර එම තොරතුරු සමඟ පෝෂණය, ආහාර සංරක්ෂණය සහ ආහාර ගබඩා වැඩි දියුණු කිරීම සඳහා ඔවුන් බළමුළු ගැන්විය හැකිය.

දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය (UNFCCC) මගින් දේශගුණ විපර්යාස හේතුවෙන් සිදුවන ජන සංචලන තුනක් හඳුනා ගනියි, ඒවානම් අවතැන්වීම, සංක්‍රමණය සහ සැලසුම්ගත නැවත පදිංචි කිරීමයි. ස්ථිරව හෝ කාලයකට පමණක් සිදුවන සංක්‍රමණ සහ දිගින් දිගටම දේශගුණ ආපදාවලට නිරාවරණය වූ ග්‍රාමීය ජනතාව ලක්ව ඇති ඉහළ ගිය අවදානම අතර පැහැදිලි අන්තර්සබඳතා ඇත. මෙම ප්‍රශ්නය කෙතරම් බරපතළ වන්නේද, එහි ග්‍රාමීය සහ නාගරික යන දුගී ජනතා දෙකොටසටම ඉහළ ගිය අවදානම හේතුවෙන් ඇති අභියෝග කවරේද, සහ උග්‍ර වූ දේශගුණ අර්බුදය හේතුවෙන් තමන්ගේ නිවහනෙන් සහ ජීවනෝපායයෙන් මුලිනුපුටා දැමීමට ලක් වූ අවතැන්වූවන්ගේ අයිතිවාසිකම් කවරේද යන්න හඳුනාගැනීම සඳහා සංක්‍රමණ යන සංසිද්ධිය අධ්‍යයනය කිරීම ඉතාමත් වැදගත් වේ. මේ සම්බන්ධයෙන් සාක්ෂි මත පදනම් වූ මැදිහත්වීම් සිදුකිරීම සඳහා දේශගුණ සංක්‍රමණ පිළිබඳව දත්ත සහ තොරතුරු පැවතීම වැඩිවීම අත්‍යාවශ්‍ය වේ. අනුහුරුවීමේ අංශවල, විශේෂයෙන්ම කෘෂිකර්මය, සෞඛ්‍යය සහ නාගරික ජනවාස යන අංශවලට සංක්‍රමණ සම්බන්ධ විශ්ලේෂණ ඇතුළත් කළ යුතු වේ.

ප්‍රකාශිත අනුහුරුවීමේ ප්‍රමුඛතා ඔස්සේ හරිතාගාර වායු විමෝචන අඩුකිරීම සඳහා දයකත්වය ලබාදෙන්නා වූ අංශ කිහිපයක් ම තිබේ. නාගරික සැලසුම්කරණ හා මානව ජනාවාස අංශයේ (තිරසර හා හරිත ගොඩනැගිලි සැලසුම, හා ශාක ආවරණය වැඩිකිරීම) ජල අංශයේ (බලශක්ති කාර්යක්ෂමතාව හා පොම්ප කිරීම අඩුවීම) සහ සංචාරක කර්මාන්ත අංශයේ (බලශක්ති කාර්යක්ෂමතාව හා හරිත ගොඩනැගිලි) මෙවැනි අඩුකිරීම් අපේක්ෂා කෙරේ.

අනුහුරුවීම සඳහා වන මූල්‍යකරණ අවශ්‍යතා විශාල වන අතර, රාජ්‍ය ආයෝජන හරහා පමණක් එය දැරිය නොහැකිය. ගතවූ වර්ෂ ඇතුළත ශ්‍රී ලංකාව දේශගුණ අරමුදල්වලින්, ද්වීපාර්ශ්වීය සහ බහුපාර්ශ්වීය ආයතනවලින් ආදී ක්‍රමවේද හරහා දේශගුණ මූල්‍ය කරා ප්‍රවේශ වී තිබේ. කෙසේනමුත් මෙය, අනුහුරුවීම සඳහා රටේ පවතින ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් වී නොමැත. අනුහුරුවීමේ අංශයේ ප්‍රත්‍යස්ථතාවය ගොඩනැගීම සඳහා මූල්‍ය අවශ්‍යතා දැක්වීම ජාතික අනුහුරුවීමේ සැලසුම (NAP) සහ NDC පිරිවැය අභ්‍යාස තුළින් ඉදිරියේදී දැක්වීමට අපේක්ෂා කෙරේ.

## 5.1 ආංශික අනුහුරුවීමේ ජාතිකව නිර්ණය කළ දායකත්ව

### 5.1.1 කෘෂිකර්ම අංශය

කෘෂිකර්මයෙන් දළ දේශීය නිෂ්පාදිතයට ලැබෙන දයකත්වය ක්‍රමයෙන් සංකෝචනය වී ඇතත් එය තවදුරටත් ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ආර්ථික ක්‍රියාකාරකම වශයෙන් පවතියි. රටේ ජනතාව අතරින් මිලියන 2ක් පමණ, එනම් රටේ ශ්‍රම බලකායෙන් 30%කගේ සේවා නියුක්තිය මෙම අංශයේ වන අතර, ග්‍රාමීය දිස්ත්‍රික්කවල ජනගහනයෙන් අඩකට වැඩි ප්‍රමාණයකගේ ජීවනෝපාය සහ ආදයම් ලබාදෙන්නේ මෙම අංශයෙනි. කෘෂිකර්මය සඳහා ඉඩම් පරිහරණය හෙක්ටාර මිලියන 2.2ක් පමණ වන අතර, එය රටේ සමස්ථ භූමි ප්‍රමාණයෙන් 35%කට සමාන වේ. මෙම ඉඩම්වලින් විශාල ප්‍රමාණයක් කුඩාගොවීන්ට හිමි අතර, වාර්ෂික භෝග නිෂ්පාදනයේ විශාලතම කොටසට දයකත්වය ලබාදෙන්නේ ඔවුන්ය. වතුවගාව (තේ, රබර්, පොල්, කුළුබඩු, කෝපි) රටේ තෙත්/අතරමැදි කලාපවලට සීමා වී ඇති අතර රටේ අපනයන ආදායමට සැලකිය යුතු ලෙස දායක වේ.

කෘෂිකාර්මික ආනයන පාලනය කරමින් 2020 නිකුත් කළ නව රෙගුලාසිවලින් නැවතත් ප්‍රකාශිත වී ඇති පරිදි, හැකිතාක් භෝග සංඛ්‍යාවකින් ස්වයංපෝෂිත තත්ත්වයට ළඟාවීම අරමුණු කරගනිමින්, ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය කෘෂිකාර්මික ව්‍යාප්තිය සහ ඵලදායීතාවය අනුමත කරයි. රජයේ දැක්ම[25] ඔස්සේ නව තාක්ෂණය, අගය එකතුකිරීම හා කාර්යක්ෂම ගබඩාකරණය හා ප්‍රවාහනය, රසායනික යෙදවුම් ප්‍රමාණය අඩුකරගැනීම, වඩාත් තිරසර කෘෂිකර්මය ආකෘති ප්‍රවර්ධනය කිරීම, ආහාර ආනයන වියදම් අඩුකරගැනීම සහ කෘෂිකර්මයේ අපනයන ආදයම වැඩිකරගැනීම කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දී තිබේ. සියලු අංශ ආවරණය කරනු ලබන සාර්ව කෘෂිකර්ම ප්‍රතිපත්තියක් (OAP) හරහා භෝග, පශුපාලනය, රට තුළ ධීවර කර්මාන්තය, කෘෂි පිරිසැකසුම්, සහ වාරිමාර්ග, ගොවිජනසේවා සංවර්ධනය වැනි අනුබද්ධ සේවා සහ පරිසරය යනාදී කෘෂිකර්ම අංශයේ සියලුම ආයතන ආවරණය කෙරෙතැයි අපේක්ෂා කෙරේ. මෙම නව ප්‍රතිපත්තියට දැනට යාවත්කාලීන කෙරෙමින් පවතින ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය (2007), ජාතික කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්තිය (2012), ජාතික පශුසම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය (2007), සහ ජාතික ධීවර හා ජලජ සම්පත් ප්‍රතිපත්තියේ (2018) රට අභ්‍යන්තරයේ ධීවර කර්මාන්තය සම්බන්ධ කොටස් ඇතුළත්වනු ඇත.

**කෘෂිකර්ම අංශයේ දේශගුණ අවදනම්:** ශ්‍රී ලංකාවේ කෘෂිකර්මයට දේශගුණ විපර්යාසවලින් ඇතිකෙරෙන බලපෑම සැලකිය යුතු තරම් සවිස්තරාත්මකව අධ්‍යයනයට සහ වාර්තා කිරීමට ලක්ව තිබේ. උෂ්ණත්වය ඉහළයාම සහ ඉහළ වාෂ්පීකරණ අනුපාත රටේ ප්‍රධාන භෝගය වන වී සඳහා බලපානු ඇතැයි අපේක්ෂා කෙරේ. 1974 න් පසු ගත වූ 30 වසරක කාලසීමාවක් තුළ වියළි කාල පරිච්ඡේද 283ක් වාර්තා වී ඇති බව සංඛ්‍යාලේඛනවලින් පෙනේ. කඩින් කඩ හා අවාරයට ඇදහැලෙන වර්ෂාව සහ මෝසම් අවිනිශ්චිත වීම කෘෂිකර්මයට (ගංවතුර සහ නියගය යන දෙකම වී ඇතුළු භෝගවලට බලපෑම් එල්ල කරයි), ජීවනෝපායන්ට සහ ග්‍රාමීය සුළුගොවීන්ගේ සමාජ-ආර්ථික තත්ත්වයට බරපතළ ලෙස බලපෑම් එල්ල කරමින් වාරිමාර්ග සඳහා රජය විසින් සිදුකළ ඇතැම් ආයෝජනවල බලපෑම ද අඩු කරයි. තවද, උෂ්ණත්වයේ විෂමතා (විශේෂයෙන්ම ශීතල රාත්‍රීන් නොමැතිවීම), උඩරට එළවළු වැනි ඉහළ වටිනාකමකින් යුත් භෝග කෙරෙහි බලපායි. දීර්ඝ කාලයක් පවතින වියළි කාලසීමා හේතුවෙන් තේ සහ පොල් වගා බලපෑමට ලක්වන අතර අධික වර්ෂාපතනයෙන් රබර් වගාව බලපෑමට ලක් වේ. වැවිලි කර්මාන්තය පවතින ප්‍රදේශවල දීර්ඝ කාලයක් තිස්සේ පැවති වියළි කාලගුණය හේතුවෙන් 2020 දී තේ ඵලදායිතවය වසර 25ක් තුළ ලැබුණු අඩුම මට්ටම කරා පහත ගියේය. වැසි නොවැටීම සහ මනුෂ්‍ය ක්‍රියාකාරකම් එක් වූ කල, වන ගිනි ඇතිවන අතර, එමගින් ගංගා සහ ජල මූලාශ්‍ර වියැළී යාම වඩාත් වේගවත් කරයි. මුහුදු මට්ටම ඉහළ නැගීමෙන් ඇතිවන ලවණතාවය වෙරළබඩ කෘෂිකර්මයට බලපෑම් එල්ල කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. UNFCCC[26] වෙත සිදුකළ තෙවන ජාතික සන්නිවේදනයෙහි, දැනට ගොවීන් අතර ප්‍රවර්ධනය කෙරෙමින් පවතින කුරුඳු සහ ගම්මිරිස් වැනි භෝග මත ඇතිකෙරෙන දේශගුණ අවදානම සම්බන්ධයෙන් තවදුරටත් පර්යේෂණ කිරීම අවශ්‍ය බව අවධාරණය කරයි.

**කෘෂිකර්ම අංශයේ අනුහුරුවීම:** දේශගුණ විපර්යාස සම්බන්ධයෙන් සැලකිල්ල යොමුකළ යුතු කරුණු මුඛ්‍යධාරාගත කිරීම, දේශගුණ අවදනමට ලක් විය හැකිබව ආමන්ත්‍රණය කිරීමට භෝග ප්‍රභේද වැඩිදියුණු කිරීම, තිරසර ඉඩම් සහ ජල කළමනාකරණය, සහ දේශගුණ අවසානම කළමනාකරණය සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති වැඩිදියුණු කිරීම ඇතුළු NDC හයක් යටතේ (5.1.1 වගුව) කෘෂිකර්මාන්ත අංශයේ ප්‍රත්‍යස්ථතාවය ගොඩනැංවීම සංවිධානය කර තිබේ. පසු අස්වනු හානි අඩුකරගැනීම ඔස්සේ හරිතාගාර වායු අඩුකරගැනීමට දයකවීම, නිෂ්පාදනයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම, සහ කෘෂිකර්ම අංශයේ නිෂ්පාදන ක්‍රියාවලීන් සඳහා පුනර්ජනනීය බලශක්ති භාවිතයට යොමුවීම වැනි ක්‍රියාමාර්ග කෘෂිකර්ම අංශයේ අවම කිරීමේ NDC වශයෙන් ඉදිරිපත් කර තිබේ.

25 සෞභාග්‍යයේ දැක්ම, මුදල් අමාත්‍යාංශය, 2019

26 UNFCCC වෙත සිදුකරන තෙවන ජාතික සන්නිවේදනය, දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය, 2021.

*5.1.1 වගුව: කෘෂිකර්ම අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව*

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | ඉලක්ක වර්ෂය |
|---|---|---|
| NDC 1 | **ශ්‍රී ලංකාවේ කෘෂිකර්මයට මුඛ්‍යධාරාගත කිරීම සඳහා සලකනු ලබන දේශගුණ විපර්යාස සම්බන්ධ කරුණු** | **2022** |
| | 1.1 දේශගුණ සුහුරු කෘෂිකර්මය පිළිබඳ ජාතික මාර්ගෝපදේශ (National Guidelines on Climate Smart Agriculture (CSA)) සම්පාදනය කර ඒවා ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම | 2021 |
| | 1.2 දේශගුණ විපර්යාස ප්‍රත්‍යස්ථතාව ගොඩනැංවීමේ සංකල්පය ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම යහපිළිවෙත්වලට (Sri Lanka Good Agriculture Practices (SL GAP)) හඳුන්වාදීම | 2021 |
| | 1.3 දේශගුණ අවදානම සහිත ප්‍රදේශවල භෝග-පශුපාලනය ඒකාබද්ධ වූ උචිත ගොවිතැන් ක්‍රම ප්‍රවර්ධනය කිරීම | 2022 |
| | 1.4 අගය එකතු කිරීම සහිත කුඩා පරිමාණ නිෂ්පාදන පද්ධතීන් වශයෙන් ගෙවතු වගාව ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා වෙළඳපොළ කරා මාර්ග ඇතිකිරීම | 2022 |
| NDC 2 | **දේශගුණ විපර්යාස සඳහා වැඩිම අවදානමක් ඇති ප්‍රදේශ/ දිස්ත්‍රික්ක/ භෝග සඳහා ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය (IPM) සහ ඒකාබද්ධ ශාක සහ පෝෂණ පද්ධති (IPNS) ප්‍රවර්ධනය කිරීම** | **2025** |
| | 2.1 දේශගුණ විපර්යාස හේතුවෙන් පළිබෝධ/ රෝග, වල් පැළෑටි සහ වනසත්ත්ව ප්‍රහාර නැවත ඇතිවීමට සහ ඇතිවීමට අවදානමක් පවත්නා ප්‍රමුඛතා ප්‍රදේශ හඳුනාගැනීම | 2021 |
| | 2.2 එම ප්‍රමුඛතා ප්‍රදේශ සඳහා උචිත IPM සහ IPNS වැඩසටහන් සංවර්ධනය කර හඳුන්වාදීම | 2022 |
| | 2.3 දේශගුණ විපර්යාස සඳහා වැඩි අවදානමක් ඇති ප්‍රදේශවල නිපදවන SLGAP සහතිකලත් නිෂ්පාදන ප්‍රමාණය 25%කින් වැඩිකිරීම | 2025 |
| NDC 3 | **දේශගුණ විපර්යාස සඳහා වඩාත්ම අවදානමට ලක්ව ඇති කෘෂිකාර්මික භෝග ඉලක්ක කරමින්, ජෛව සහ ජෛව නොවන ආතතීන්ට ප්‍රතිරෝධක/ඔරොත්තු දෙන භෝග ප්‍රභේද සංවර්ධනය/ හඳුන්වාදීම** | **2030** |
| | 3.1 උණුසුමට ඔරොත්තු දෙන ප්‍රභේද සංවර්ධනය, හඳුන්වාදීම/ප්‍රවර්ධනය කිරීම. | 2030 |
| | 3.2 නියගයට ඔරොත්තු දෙන ප්‍රභේද සංවර්ධනය, හඳුන්වාදීම/ප්‍රවර්ධනය කිරීම. | 2030 |
| | 3.3 පසේ අධික තෙතමනයට/ගංවතුරට ඔරොත්තු දෙන ප්‍රභේද සංවර්ධනය, හඳුන්වාදීම/ප්‍රවර්ධනය කිරීම . | 2030 |
| | 3.4 ලවණතාවයට ඔරොත්තු දෙන ප්‍රභේද සංවර්ධනය, හඳුන්වාදීම/ප්‍රවර්ධනය කිරීම . | 2030 |
| | 3.5 පළිබෝධ සඳහා/රෝගවලට ඔරොත්තු දෙන ප්‍රභේද සංවර්ධනය හා ප්‍රවර්ධනය කිරීම | 2030 |
| | 3.6 ආන්තික දේශගුණ තත්ත්වවලට ඔරොත්තු දෙන සත්ව ආහාර ප්‍රභේද සංවර්ධනය, හඳුන්වාදීම/ප්‍රවර්ධනය කිරීම . | 2030 |
| NDC 4 | **වර්තමානයේ සහ අනාගතයේ ඇතිවියහැකි දේශගුණික තත්ත්ව සමගින් ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප (AERs) සිතියම නැවත සලකා බැලීම සහ දේශගුණ විපර්යාස නිසා ලක්ව ඇති අවදානම අඩුකරගැනීම සඳහා විවිධ කලාපවලට උචිත භෝග වර්ග නිර්දේශ කිරීම** | **2030** |
| | 4.1 දේශගුණ විපර්යාස නිසා වඩාත්ම අවදානමකට ලක් විය හැකි AER ආවරණය කිරීම සඳහා කෘෂි-කාලගුණ විද්‍යා ජාලය පුළුල් කිරීම | 2025 |
| | 4.2 දේශගුණ විපර්යාස නිසා වඩාත්ම අවදානමකට ලක් විය හැකි AER ආවරණය කරමින් සඳහා පසේ තෙතමනය සම්බන්ධයෙන් අධ්‍යයන සිදුකිරීම | 2028 |
| | 4.3 යම් යම් නිශ්චිත භෝග වර්ග ඒවා සඳහා නිර්දේශ කිරීම පිණිස, දේශගුණ විපර්යාස නිසා වඩාත්ම අවදානමට ලක් විය හැකි AER උප කලාප වශයෙන් නැවතත් බෙදීම | 2030 |

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | ඉලක්ක වර්ෂය |
|---|---|---|
| **NDC 5** | **අපේක්ෂිත දේශගුණ අවදානම බරපතළ ප්‍රදේශවල තිරසර ලෙස ඉඩම් භාවිතය සහ ජල කළමනාකරණ පිළිවෙත් වැඩිදියුණු කිරීම** | **2030** |
| | 5.1 ඉලක්කගත ප්‍රදේශයෙන් 50%ක් 2025 වන විටත්, 100%ක් 2030 වන විටත් ආවරණය කෙරෙන පරිදි යෙදවුම් කාර්යක්ෂම ගොවිතැන් ක්‍රමවේද/පද්ධති ප්‍රවර්ධනය කිරීම | 2030 |
| | 5.2 ඉලක්කගත ප්‍රදේශයෙන් 75%ක් ආවරණය වන පරිදි ගොවිතැන සඳහා වැසි ජලය රැස්කිරීම ප්‍රවර්ධනය කිරීම | 2025 |
| | 5.3 ඉලක්කගත ප්‍රදේශයෙන් 25%ක ප්‍රමාණයක වැසිජල කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම | 2025 |
| | 5.4 යෙදවුම් කාර්යක්ෂම සහ දේශගුණ විපර්යාසවලට ඔරොත්තු දෙන ප්‍රභේද මගින් ඉලක්කගත ප්‍රදේශයෙන් 50%ක භෝග විවිධාංගීකරණය ප්‍රවර්ධනය කිරීම | 2030 |
| | 5.5 සමස්ථ ඉලක්කගත ප්‍රදේශයම ආවරණය වන සේ කුඩා වැව් එල්ලංගා පද්ධති සහ තනි වැව් ප්‍රතිසංස්කරණය (NDC 7 ජල අංශයට සම්බන්ධ වේ) | 2030 |
| | 5.6 ඉලක්කගත ප්‍රදේශයෙන් 50%ක පස සංරක්ෂණ ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය සහ යොදගැනීම | 2028 |
| **NDC 6** | **දේශගුණ විපර්යාස අවදානම අඩුකිරීම සඳහා, වැඩිදියුණු කළ පූර්ව අනතුරු හැඟවීමේ සහ අවදානමට ලක් විය හැකි කළමණාකරණය කිරීමේ යාන්ත්‍රණ හඳුන්වාදීම** | **2025** |
| | 6.1 මහ සහ යල කන්න සඳහා දේශගුණ පුරෝකථන වැඩිදියුණු කිරීම | 2023 |
| | 6.2 කෘෂිකර්මයේ නියුතු ගොවීන්ට සහ ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන්ට සරළ අන්දමින්, සහ නිසි කලට සන්නිවේදන ලබාදීම ප්‍රවර්ධනය කිරීම | 2025 |
| | 6.3 කෘෂිකර්මයේ අවදානම් කළමනාකරණය සහ අවදානම් පැවරුම් යාන්ත්‍රණ ශක්තිමත් කිරීම | 2025 |
| | 6.4 දේශගුණ උපද්‍රව සහ පළිබෝධ හා රෝග අවදානම් පිළිබඳ පූර්ව අනතුරුහඟවන පද්ධති/උපදේශන ශක්තිමත් කිරීම | 2025 |
| | 6.5 පසු අස්වනු හානි අඩුකරගැනීම සඳහා දේශගුණය සම්බන්ධ භෝග පුරෝකථනය හඳුන්වාදීම | 2025 |
| | 6.6 දේශගුණ අවදානම් කළමනාකරණය සඳහා ආරක්ෂිත කෘෂිකර්මාන්තය සහ අනෙකුත් තාක්ෂණ ප්‍රවර්ධනය කිරීම | 2025 |

### 5.1.2 ධීවර අංශය

ශ්‍රී ලංකාවේ ධීවර අංශයට සමුද්‍රීය, වෙරළබඩ, මිරිදිය ධීවර කටයුතු සහ ජලජීවී වගාව ඇතුළත් වේ. සමුද්‍රීය ධීවර කර්මාන්තයෙන් වර්ග කි.මී. 517,000ක මුහුදු ප්‍රමාණයක් ආවරණය වන අතර වෙරළබඩ සහ මිරිදිය ධීවර කර්මාන්තය සඳහා කලපු, ගං මෝය, වැව්, සහ ගංගා ප්‍රදේශ හෙක්ටාර 489,000ක් භාවිතා කරනු ලැබේ.[27] සමස්ථ මත්ස්‍ය අස්වැන්නෙන් 80%ක් සඳහා දායකත්වය ලබාදෙන්නේ සාගර සහ වෙරළබඩ ධීවර කර්මාන්තයෙන් වන අතර ඉන් සෘජු සහ වක්‍ර සේවා නියුක්ති අවස්ථා මිලියන 2.4ක් ලබාදෙයි. එමෙන්ම, රටේ සත්ත්ව ප්‍රෝටීන් පරිභෝජනයෙන් 70%ක් ම සඳහා දායක වන්නේ ද මෙම අංශයයි. ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙන් දළ වශයෙන් 1.2%ක් සඳහා ධීවර කර්මාන්තය දායක වේ.[28] නව තාක්ෂණය, අගය එකතු කිරීම සහ ජලජ සම්පත් සංවර්ධනය ඔස්සේ මෙම අංශය සංවර්ධනය කිරීම සඳහා සෑහෙන විභවයක් පවතියි. 2018 ජාතික ධීවර සහ ජලජ සම්පත් ප්‍රතිපත්තිය සහ 2016 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත හා සංශෝධන යටතේ පනවන ලද රෙගුලාසි ඇසුරින් ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය සහ ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව (DFAR) මෙම අංශයේ සංවර්ධනය සඳහා මගපෙන්වීමෙහි මූලිකත්වය ගනියි.

ජාතික ප්‍රතිපත්ති රාමුවේ[29] ධීවර අංශය සඳහා වන අරමුණු වශයෙන් ජනතාවට පෝෂණය ලබාදීම, ආහාර සුරක්ෂිතතාවය, විදේශ විනිමය ඉපයීම, ජීවනෝපාය සහ රැකියා අවස්ථා, දරිද්‍රතාවය තුරන් කිරීම, සහ ජාතික හා ග්‍රාමීය ආර්ථිකයන් වෙත විශාල දායකත්වයක් ලබාදීම යන අරමුණු දක්වා තිබේ.

වර්තමානයේදී, තිරසර නොවන ධීවර පිළිවෙත්, ඇතැම් මත්ස්‍ය විශේෂ අධික ලෙස ඇල්ලීම, නීති විරෝධී දඩයම් කිරීම, ගංගාවලින් සිදුවන ගොඩබිම්-පාදක දූෂණය, කසළ බැහැර කිරීම සහ වෙරළබඩ ප්‍රදේශවල වාසස්ථාන විනාශ කිරීම (කඩොලාන හා කොරල් පර) ධීවර සම්පත්වලට ඇති ප්‍රධාන තර්ජන වේ.

**ධීවර අංශයේ දේශගුණ අවදානම:** සාගරය උණුසුම්වීම සහ ආම්ලීකරණය දැනටමත් ගෝලීය ධීවර කර්මාන්තයට බලපෑම් එල්ල කරමින් සිටියි. අනාගතයේදී උණුසුම වැඩිවීමත් සමගින් මෙම අවදානම තවත් උග්‍ර වනු ඇත. සමුද්‍රීය පරිසර පද්ධතියේ සිදුවන දීර්ඝකාලීන වෙනස්කම් සත්ත්ව විශේෂවල ව්‍යාප්තිය සඳහා බලපානු ඇත. වාණිජ වශයෙන් වැදගත්වන මත්ස්‍ය විශේෂවලට අභිජනන ස්ථාන සපයන කඩොලාන සහ මුහුදු තෘණ පරිසර පද්ධති දේශගුණ විපර්යාස හේතුවෙන් වෙනස්වනු ඇත. වෙරළබඩ ප්‍රදේශවල තෙත්බිම් අහිමි වී යාම, කලපු සහ ගං මෝයවල ලවණතාවයේ වෙනස්කම්, මත්ස්‍යයින් සහ බෙල්ලන්ට වඩාත් වැඩියෙන් බලපෑම් එල්ල කරනු ඇත. සාගරයේ ආම්ලිකතාවය වැඩිවීම බෙල්ලන්, කකුළුවන්, පොකිරිස්සන්,සහ කොරල්වලට තමන්ගේ කැල්සියම් කාබනේට් කවච ගොඩනගා ගැනීම වඩාත් දුෂ්කර කරවනු ඇති අතර, ඉන් එම විශේෂවල තොගය අඩුවනු ඇත. සාගර උණුසුම සෙල්සියස් අංශක 1.5ට වඩා වැඩියෙන් ඉහළ ගියහොත් වෙරළබඩ ජීවනෝපාය සහ ධීවර කර්මාන්තය ආශ්‍රිත කර්මාන්තවලට වඩාත් වැඩි අවදානමක් එල්ල වනු ඇත (IPCC 2019).[30] ශ්‍රී ලංකාවේ වයඹදිග වෙරළබඩ සිදුවන ඉස්සන් ගොවිතැන වඩාත්ම අවදානමකට ලක් වන බව මෑතකදී කරන ලද අධ්‍යයනයකින් සොයාගන්නා ලදි.[31] උෂ්ණත්වයේ වෙනස්වීම්, නියග, වර්ෂාපතනය, මිරිදිය පරිසර පද්ධතීන්හි ගැලීම් සහ ගංවතුර හේතුවෙන් රට අභ්‍යන්තරයේ මිරිදිය ධීවර කර්මාන්තය තර්ජනවලට මුහුණ දෙයි. ප්‍රක්ෂේපණය කර ඇති පරිදි ඊසානදිග මෝසම් වැසි අඩුවීම සමගින්, මිරිදිය ධීවර කටයුතු සඳහා වන අවදානම තවදුරටත් උග්‍ර වනු ඇත.

දෙවනුව, කුණාටු ඇතිවීම සහ අධික සුළං/ සුළිසුළං වැනි ස්වාභාවික විපත් වැඩිවීම ගල්පරවලට හානි පමුණුවනු ඇති අතර එමගින් වෙරළ ඛාදනය හා මිරිදිය හා මිරිදිය ජල මූලාශ්‍රවල ලවණතාව වැඩි වේ. දේශගුණ ආපදා ඇතිවන වාරගණන ඉහළ යෑම මෙන්ම මුහුදු මට්ටම ඉහළ යාමේ තර්ජනය හේතුවෙන් කුඩා පරිමාණ ධීවරයින් සහ ඔවුන්ගේ ප්‍රජාවන්ගේ දේපළ හා භෞතික යටිතල පහසුකම් ද බලපෑමට ලක්වනු ඇත.

**ධීවර අංශයේ අනුහුරුවීම්:** ධීවර කර්මාන්තය කළමනාකරණය සඳහා පරිසර පද්ධති-පාදක ප්‍රවේශ යොදගැනීම, ආහාර සුරක්ෂිතතාවය වැඩිදියුණු කරගැනීම සඳහා ජලජීවීවගාව සහ වගාකිරීම පදනම් වූ ධීවර කටයුතු ව්‍යාප්තිය, අහිතකර දේශගුණ තත්ත්වවලට ඔරොත්තු දියහැකි මත්ස්‍ය විශේෂ ජලජ සම්පත් සඳහා අභිජනනය කිරීම, මුහුදේ දී ආරක්ෂාව වැඩිදියුණු කිරීම, දේශගුණ අවදානම් කළමනාකරණය සඳහා වඩාත් හොඳ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති ඇතිකිරීම, ජීවනෝපාය විවිධාංගීකරණය, සහ දේශගුණ විපර්යාස හේතුවෙන් ධීවර කර්මාන්තය මත ඇතිවන බලපෑම ඉලක්ක කර පර්යේෂණ සිදුකිරීම ඇතුළු කරුණු NDC හතක් යටතේ (5.1.2 වගුව) අනුහුරුවීමේ ක්‍රියාමාර්ග වශයෙන් සංවිධානය කර තිබේ.

27 ධීවර සංඛ්‍යාලේඛන 2019, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, 2019.

28 වාර්ෂික වාර්තාව 2019, ශ්‍රී ලංකා මහ බැංකුව, 2019.

29 සෞභාග්‍යයේ දැක්ම, මුදල් අමාත්‍යාංශය, 2019

30 IPCC website, https://www.ipcc.ch/reports/

31 ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස පිළිබඳ තෙවන ජාතික සන්නිවේදනය, දේශගුණික විපර්යාස පිළිබඳ ලේකම් කාර්යාලය, 2021.

*5.1.2 වගුව: ධීවර අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව*

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | ඉලක්ක වර්ෂය |
|---|---|---|
| **NDC 1** | **ඉහළ දේශගුණ අවදානමක් සහිත ප්‍රදේශවල ප්‍රත්‍යස්ථතාව වැඩිදියුණු කිරීම සඳහා ධීවර කළමනාකරණය සඳහා පරිසර පද්ධති-පාදක ප්‍රවේශය (EAFM) යොදාගැනීම** | **2030** |
| | 1.1 ධීවර සහ ජලජ සම්පත් පනතෙන් ප්‍රකාශයට පත් කර ඇති, දැනට පවතින ධීවර කළමනාකරණ ප්‍රදේශවලට EAFM ඒකාබද්ධ කිරීම | 2022 |
| | 1.2 ප්‍රමුඛතා ප්‍රදේශ හඳුනාගැනීම සහ පාරිසරික මූලධර්ම පදනම් කරගනිමින් ධීවර කළමනාකරණ ඒකක නිශ්චය කිරීම | 2022 |
| | 1.3 EAFM සැලසුම් 5ක් සංවර්ධනය කිරීම | 2025 |
| | 1.4 EAFM සැළසුම් 5 ක්‍රියාත්මක කිරීම | 2030 |
| **NDC 2** | **දේශගුණ විපර්යාස සම්බන්ධ ආහාර සුරක්ෂිතතා ගැටලු ආමන්ත්‍රණය කිරීම සඳහා ජලජීවී වගාව හා වගා පාදක ධීවර කර්මාන්තය ව්‍යාප්ත කිරීම** | **2025** |
| | 2.1 මත්ස්‍ය වගා-පාදක ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා මත්ස්‍ය ඇඟිලිලන් තොග වර්ධනය කරගැනීමට සුදුසු වැඩසටහනක් ප්‍රවර්ධනය කිරීම | 2025 |
| | 2.2 වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර මත්ස්‍යයින් ජලාශවලින් නිදහස්වීම වලක්වාගැනීම සඳහා, ගංවතුර තත්ත්වයෙන් නිතර බලපෑමට ලක්වන බහුවාර්ෂික ජලාශ 50ක් සඳහා මත්ස්‍ය බාධක උපකරණ යෙදීම | 2022 |
| | 2.3 වෙනස්වන දේශගුණයට ඔරොත්තු දෙන මත්ස්‍ය විශේෂ වගාව ප්‍රවර්ධනය කිරීම | 2025 |
| **NDC 3** | **දේශගුණ විපර්යාසවලට ඔරොත්තුදෙන, වාණිජ වැදගත්කමකින් යුත් ජලජ සම්පත් අභිජනනය කිරීම** | **2025** |
| | 3.1 දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවූ වෙනස්වීම් මගින් සාමාන්‍ය බිජුදැමීමට බලපෑම් එල්ල වූ මත්ස්‍ය විශේෂ කෘතිමව අභිජනනය සඳහා මත්ස්‍ය ශුක්‍රාණු රැස්කර තැබීමට දඹුල්ලේ පිහිටා ඇති NAQDA අධිශීත පරිරක්ෂණ මධ්‍යස්ථානය පුළුල් කිරීම | 2025 |
| | 3.2 ගෘහස්ථ අභිජනන පහසුකම් සහිත මත්ස්‍ය අභිජනන ඒකක පිහිටුවීම සහ තෝරාගත් විශේෂ අභිජනනය සඳහා උචිත පරිදි උෂ්ණත්වය සහ ලවණතාවය පාලනය කළහැකි අන්දමින් ඒවායෙහි ඉදිකිරීම් සැලසුම් කිරීම. | 2025 |
| **NDC 4** | **දේශගුණ විපර්යාසවලට (මුහුදු මට්ටම ඉහළ නැගීමට සහ වර්ෂාපතන වෙනස්වීම්වලට) දැඩි ලෙස අවදානමට ලක් විය හැකි කලපු 30ක ධීවර සහ ජලජ සම්පත් නිෂ්පාදන හැකියාව වර්ධනය කිරීම** | **2030** |
| | 4.1 අවදානමට ලක් විය හැකි කලපු හඳුනාගෙන (2022 වන විට) කලපු 30ක් සඳහා කලපු පැතිකඩ සකස් කිරීම. | 2026 |
| | 4.2 කලපු 30 ක ඉසුලුම් ධාරිතාව තක්සේරු කිරීම. | 2026 |
| | 4.3 කලපු 10 ක් සම-කළමනාකරණ ධීවර කළමනාකරණ ප්‍රදේශ (FMAs) ලෙස ප්‍රකාශයට පත් කිරීම සහ කළමනාකරණය කිරීම. | 2030 |
| | 4.4 කලපු 10 ක ජල දූෂණය අවම කිරීම | 2030 |
| | 4.4 තෝරාගත් කලපුවල දේශගුණ විපර්යාසවලට ඔරොත්තු දෙන, ඉහළ වටිනාකමකින් යුත්, ආහාරයට ගන්නා වර්ගයේ මත්ස්‍යයින් වගාව ප්‍රවර්ධනය කිරීම | |
| **NDC 5** | **දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන ආන්තික තත්ත්වවල දී මුහුදේ දී ආරක්ෂාව වැඩිදියුණු කිරීම** | **2025** |
| | 5.1 මුහුදේ දී ආරක්ෂාව වැඩි කිරීම සඳහා අදාළ පියවර ප්‍රවර්ධනය කිරීම. | 2022 |
| | 5.2 ධීවරයින් සඳහා (කුඩා බෝට්ටු සහ සාම්ප්‍රදායික අත්කම් ඇතුළුව) රක්ෂණ යෝජනා ක්‍රම සහ ඵලදායී පූර්ව අනතුරු ඇඟවීමේ සම්ප්‍රේෂණ පද්ධති හඳුන්වා දීම. | 2025 |
| | 5.3 මුහුදේ ආරක්ෂාව සහතික කිරීම සඳහා චන්ද්‍රිකා පාදක කරගත් යාත්‍රා අධීක්ෂණ පද්ධතියක් ඇතුළුව කාර්යක්ෂම කාලගුණ තොරතුරු කළමනාකරණ හා සන්නිවේදන පද්ධතියක් ඇති කිරීම. | 2025 |

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | ඉලක්ක වර්ෂය |
|---|---|---|
| **NDC 6** | **දේශගුණ විපර්යාස සඳහා ප්‍රත්‍යස්ථතාව ගොඩනැංවීම පිණිස ධීවර ජනතාවගේ ජීවනෝපාය විවිධාංගීකරණය** | **2025** |
| | 6.1 අවදානමට ලක්විය හැකි ධීවරයින්ගේ ණය සඳහා ප්‍රවේශය දියුණු කිරීම සහ ජීවනෝපාය විවිධාංගීකරණය සඳහා පුහුණු කිරීම | 2023 |
| | 6.2 අඩු වූ අස්වැන්න පාලනය සඳහා ඉහළ වටිනාකමක් සහිත වෙළඳපොළ සොයාගැනීමට සහාය වීම. | 2024 |
| | 6.3 ධීවර කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන (මාළු තෙල්, මාළු සෝස් සහ අනෙකුත් අගය එකතු කළ නිෂ්පාදන) විවිධාංගීකරණය කිරීමෙන් අගය එකතු කිරීමට පහසුකම් සැපයීම. | 2025 |
| **NDC 7** | **දේශගුණික විපර්යාසවලට ප්‍රත්‍යස්ථතාව ගොඩනැංවීම ඉලක්ක කර ගනිමින් ධීවර හා ජලජ සම්පත් පර්යේෂණ පැවැත්වීම** | **2030** |
| | 7.1 ධීවර හා ජලජ සම්පත් කෙරෙහි ඇතිවන දේශගුණික බලපෑම් තක්සේරු කිරීම | 2025 |
| | 7.2 විරංජන සිදුවීම් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් ලබා දීම සඳහා කොරල්පර නිරීක්ෂණ පද්ධති සංවර්ධනය කිරීම. | 2025 |
| | 7.3 සාගර ආම්ලිකකරණයේ බලපෑම් සඳහා ධීවර කර්මාන්තයේ අනුහුරුවීමේ ක්‍රියාමාර්ග හඳුනා ගැනීම | 2025 |
| | 7.4 කොරල් කීටයන්ගේ උපස්ථර අවම වන ස්ථානවල දී කෘතිම පර ස්ථාපනය කිරීම. | 2025 |
| | 7.5 හඳුනාගත් ප්‍රදේශවල මත්ස්‍ය එකතු කිරීමේ උපකරණ යෙදවීම. | 2030 |
| | 7.6 වෙනස්වන දේශගුණයක් තුළ අස්වැන්න හා ඵලදායිතාව පහත වැටීමට ප්‍රතිචාර වශයෙන්, ඉන්ධන කාර්යක්ෂම තාක්ෂණයන් හඳුන්වා දීමෙන් හා ප්‍රවර්ධනය කිරීමෙන් ධීවර හා ජලජීවී වගාවේ ප්‍රාග්ධනය, ක්‍රියාකාරිත්වය සහ අනෙකුත් වියදම් අඩු කිරීම. | 2025 |

### 5.1.3 පශුසම්පත් අංශය

පශුසම්පත් අංශය ආහාර සුරක්ෂිතතාවය සහ කෘෂිකර්මයේ සංවර්ධනයට ප්‍රමුඛ දායකත්වය ලබාදෙන අතර දරිද්‍රතාවය තුරන් කිරීමට ද දායක වන අංශයකි. පොදුවේ කුඩා පරිමාණයෙන් ක්‍රියාත්මක පශුපාලනය ග්‍රාමීය ජීවනෝපාය සහායක් හා අතිරේක ආදායමක් ලෙස සලකනු ලබයි. ග්‍රාමීය ප්‍රදේශවල පවතින අතිරික්ත ශ්‍රමය, ඌනඋපයෝජිත කෘෂිකර්මාන්ත අතුරු නිෂ්පාදන සහ ආන්තික ඉඩම් එමගින් භාවිතා කරනු ලබයි. පසුගිය වර්ෂවල සුළු වර්ධනයක් පෙන්නුම් කර ඇති පශුසම්පත් අංශය දළ ජාතික නිෂ්පාදිතයට ලබා දෙන්නේ 1%ක පමණ දායකත්වයකි.[32] ගව පාලනය ඉන් විශාලතම කොටස වන අතර 2019 දී සතුන් මිලියන 1.4ක් රටේ ජාතික කිරි අවශ්‍යතාවයෙන් 38%ක් නිපදවා තිබේ. කුකුළු මස් (2019 දී මෙට්‍රික් ටොන් 225,000ක්) සහ බිත්තර (2019 දී බිලියන 2ක්) නිපදවන්නා වූ කුකුළු ගොවිපොළ මෙම අංශයේ දෙවන ප්‍රධානතම උප අංශයයි.[33] කෙසේනමුත්, අඩු ඵලදායීතාවය හේතුවෙන් කුකුළු මස් සහ බිත්තර නිෂ්පාදනයේ නිෂ්පාදන වියදම් ඉහළ ගොස් තිබේ. මෑත වර්ෂවලදී හරක්මස් නිෂ්පාදනය පහත වැටෙමින් පවතින අතර ඌරුමස් සහ එළුමස් නිෂ්පාදනය වර්ධනය වී තිබේ.

කිරි නිෂ්පාදනය, දැනට පවතින 40% මට්ටමේ සිට ස්වයංපෝෂිතභාවය දක්වා වැඩිදියුණු කිරීමට, සතුන් සඳහා ගුණාත්මකබවින් ඉහළ තෘණ සංවර්ධනය කිරීමට, සහ අපනයන වෙළඳපොළ සඳහා කුකුළු ආදී සතුන් නිපැයුම වැඩිදියුණු කිරීමට රජය යෝජනා කරයි. ජාතික පශුසම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය (2017) සහ පශුසම්පත් මහ සැලසුම - ස්වයංපෝෂිතභාවය කරා පශු සම්පත සංවර්ධනය කිරීම සඳහා වන ක්‍රමෝපාය (2011) මගින් මෙම අංශයේ ප්‍රධාන ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශකත්වය සපයනු ලැබේ. කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් ආයතන ද සමගින්, සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ පශුසම්පත් අංශය සංවර්ධනය කිරීමේ පෙරමුණ ගනියි. ශ්‍රී ලංකාව සඳහා වන ජාතික පශුසම්පත් අභිජනන ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සහ ක්‍රමෝපාය 2010, පශුසම්පත් අභිජනනය සඳහා ප්‍රධාන වශයෙන් මාර්ගෝපදේශ ලබාදෙයි. දැනට ඇතිකිරීම සඳහා මුලපුරා ඇති, සියලු අංශ ආවරණය කරන සාර්ව කෘෂිකර්ම ප්‍රතිපත්තිය (OAP) මගින් භෝග, පශුසම්පත්, රට අභ්‍යන්තර ධීවර කර්මාන්තය, කෘෂි-සැකසුම, සහ වාරිමාර්ග, ගොවිජන සේවා සංවර්ධනය සහ පරිසරය වැනි අනුබද්ධිත සේවාවන් ද ආවරණය කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**පශුසම්පත් අංශයේ දේශගුණ අවදානම:** උෂ්ණත්වය සෙල්සියස් අංශක 2කින් පමණ ඉහළ ගියහොත් ලෝකයේ පශුසම්පත සඳහා වන තෘණ භූමි ප්‍රමාණයෙන් 10%ක් පමණ අහිමිවනු ඇතැයි ඇස්තමේන්තු කර තිබේ.[34] ශ්‍රී ලංකාවේ, කිරි, කුකුළු පාලනය, සහ ඌරුකොටු වැනි සත්ත්ව නිෂ්පාදන උප අංශවලට උෂ්ණත්ව ආතතියෙන් සහ ගංවතුර හා නියගය වැනි දේශගුණය හා සම්බන්ධ ආපදා මගින් ඇතිවන බලපෑම අධ්‍යයනය කර තිබේ. වැඩිවන උෂ්ණත්වය සහ ඒ සමගින් බැඳුනු ජලය හිඟවීම පශුසම්පත් අංශයට ඇති වඩාත්ම ප්‍රබල තර්ජනය වේ. උෂ්ණත්වය ඉහළ යෑමෙන් වැඩි වශයෙන් තර්ජනයට සහ බලපෑමට ලක්ව ඇත්තේ කිරි කර්මාන්තයයි. සෞම්‍ය කලාපීය සත්ත්ව ප්‍රභේද යොදාගනිමින් වියළි කලාපයේ කෙරෙන කිරි ගොවිතැන වැඩිවීම උෂ්ණත්වය සහ ආර්ද්‍රතාවය ඉහළයෑම සඳහා ඇති වන අවදානම තවත් වැඩිකරවයි. රටේ වියළි කලාපයේ බොහෝ ප්‍රදේශවල උෂ්ණත්ව-ආර්ද්‍රතා දර්ශකය (THI) 2030 වනවිට ඒකක 72 ඉක්මවනු ඇතැයි පුරෝකථනය කර තිබේ. සෞම්‍ය කලාපීය සතුන් දිගින් දිගටම යොදාගතහොත් උෂ්ණත්ව ආතතිය මෙම කර්මාන්තයට අහිතකර ලෙස බලපානු ඇත. ක්ෂණික ගංවතුර හේතුවෙන් (වයඹ, බස්නාහිර සහ දකුණු පළාත්වල) සහ දීර්ඝ කාලයක් පවතින නියගය හේතුවෙන් විශේෂයෙන්ම වියළි කලාපයේ (උතුරු, වයඹ, සහ නැගෙනහිර පළාත්වල) යම් තර්ජනයක් පවතියි.

**පශුසම්පත් අංශයේ අනුහුරුවීම්:** රෝමන්ථයින්ගේ සත්ත්වපාලන පිළිවෙත්වල සහ ඌරු සහ කුකුළු ගොවිපල කළමනාකරණයේ දේශගුණ ප්‍රත්‍යස්ථතාවය වර්ධනය සහ පශුසම්පත් පිළිවෙත් දේශගුණ විපර්යාසවලට අනුහුරුකිරීම සඳහා සමස්ථ අංශයේ ම පර්යේෂණ හා සංවර්ධන කටයුතු, පුහුණු හා ධාරිතා වර්ධනය සිදුකිරීම ආවරණය කරන්නා වූ NDC තුනක් යටතේ (5.1.3 වගුව) පශුසම්පත් අංශයේ අනුහුරුවීමේ ප්‍රමුඛතා ඉදිරිපත් කර තිබේ. පශුසම්පත් අංශයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමෙන් හා පුනර්ජනනීය බලශක්තිය භාවිතයෙන් හරිතාගාර වායු විමෝචන අඩු කිරීමට දක්වන දායකත්වය කෘෂිකර්ම අංශයේ අවමකිරීමේ NDC වල ඇතුළත් වේ.

32 වාර්ෂික වාර්තාව 2019, ශ්‍රී ලංකා මහ බැංකුව, 2019.

33 පශුසම්පත් සංඛ්‍යාන ප්‍රකාශනය 2019, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, 2019.

34 IPCC fjí wvúh, https://www.ipcc.ch/reports/

*5.1.3 වගුව: සත්ව පාලන අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව*

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | ඉලක්ක වර්ෂය |
|---|---|---|
| **NDC 1** | **රෝමන්ථයින් (වමාරා කන සතුන්) මත දේශගුණ විපර්යාසවලින් ඇතිවන බලපෑම් ආමන්ත්‍රණය කිරීම සඳහා අනුහුරුවීමේ ක්‍රියාමාර්ග හඳුන්වාදීම** | **2025** |
| | 1.1 උචිත අනුහුරුවීමේ ක්‍රියාමාර්ග, තාක්ෂණික නවෝත්පාදන සහ උෂ්ණත්ව ආතති කළමනාකරණය ඇතුළු ප්‍රත්‍යස්ථ ගොවිතැන් ක්‍රම හඳුනාගෙන ප්‍රවර්ධනය කිරීම | 2022 |
| | 1.2 මධ්‍යම සහ මහා පරිමාන ගොවිපොළ සඳහා වැසිජලය එකතුකිරීමේ පොකුණු ඒකාබද්ධ කරගැනීම ප්‍රවර්ධනය කිරීම | 2023 |
| | 1.3 ආන්තික දේශගුණ සිදුවීම් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් සඳහා ප්‍රතිචාර දැක්වීමට සත්ත්ව ආහාර සැපයුම් පද්ධති වෙනස්කිරීම සහ භෝගමය සත්ත්වාහාර සංරක්ෂණය වැනි අනුහුරුවීමේ ක්‍රියාමාර්ග හඳුන්වාදීම | 2023 |
| | 1.4 ඉහළ ඵලදාවක් සහිත සහ දේශගුණයට අනුහුරු වියහැකි නව භෝගමය සත්ත්වාහාර සහ සත්ත්වාහාර සම්පත් හඳුන්වාදීම/සංවර්ධනය | 2025 |
| | 1.5 නව/ඉස්මතු වෙමින් පවතින දේශගුණය සම්බන්ධ රෝගාබාධ හඳුනාගැනීමටත් ඒවාට ප්‍රතිචාර දැක්වීමටත් පශුවෛද්‍යවරුන් විසින් අඛණ්ඩව අධීක්ෂණය/ආවේක්ෂණය වැඩිදියුණු කිරීම | 2022 |
| **NDC 2** | **කුකුළු පාලනයේ සහ ඌරු කොටුවල දේශගුණ විපර්යාසවලට එරෙහි ප්‍රත්‍යස්ථතාවය වර්ධනය කිරීම සඳහා තාක්ෂණික නවෝත්පාදන සහ මැදිහත්වීම් හඳුන්වාදීම** | **2025** |
| | 2.1 තාප ආතතිය වැළැක්වීම සඳහා දේශගුණ ප්‍රත්‍යස්ථ නිවාස හා කළමනාකරණ පිළිවෙත් අනුගමනය කිරීමට කුඩා පරිමාණ ක්‍රියාකරුවන්ට පහසුකම් සැපයීම. | 2023 |
| | 2.2 කුකුළන් සහ ඌරන් අතර නව/නැවත ඉස්මතු වෙමින් පවතින දේශගුණය සම්බන්ධ රෝගාබාධ හඳුනාගැනීමටත් ඒවාට ප්‍රතිචාර දැක්වීමටත් පශුවෛද්‍යවරුන් විසින් අඛණ්ඩව අධීක්ෂණය/ආවේක්ෂණය වැඩිදියුණු කිරීම | 2023 |
| | 2.3 ආන්තික දේශගුණ සිදුවීම් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් සඳහා ප්‍රතිචාර දැක්වීමට සත්ත්ව ආහාර සැපයුම් පද්ධති වෙනස්කිරීම, සත්ත්වාහාර සංරක්ෂණය හා පවත්නා සත්ත්වාහාර කළමනාකරණය වැනි පවත්නා අනුහුරුවීමේ පියවර වඩාත් පුළුල් ලෙස ප්‍රවර්ධනය කිරීම. | 2025 |
| **NDC 3** | **දේශගුණ විපර්යාසවලට අනුහුරුවීම සඳහා පර්යේෂණ, අධ්‍යාපන, දැනුවත්භාවය සහ ධාරිතා වර්ධනය වැඩිදියුණු කිරීම** | **2030** |
| | 3.1 පශුසම්පත් අංශයේ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සංවේදීතාව සැලකිල්ලට ගනිමින් අනුහුරුවීමේ පියවර ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණය හා දැනුම පැවරුම | 2022 |
| | 3.2 පශුසම්පත් කටයුතුවලදී දේශගුණ ප්‍රත්‍යස්ථතාවය පිළිබඳ දැනුවත් කිරීමේ සහ අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම. | 2025 |
| | 3.3 NDC 1 සහ 2 හි සාකච්ඡා කර ඇති ප්‍රත්‍යස්ථතාවය ගොඩනැංවීමේ ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය කිරීම සඳහා පශුසම්පත් අංශයේ සියලුම ආයතනවල ධාරිතා වර්ධනය කිරීම | 2030 |
| | 3.4 දේශගුණික අන්තරාය සහ වෙනස්කම්වලට අනුහුරුවීමට සහාය වීම සඳහා අන්තරාය කළමනාකරණයට සහ මූල්‍යකරණයට ප්‍රවේශය. | 2025 |
| | 3.5 පශුවෛද්‍ය හා සත්ත්ව නිෂ්පාදන ආශ්‍රිත උපාධි වැඩසටහන් සහිත විශ්වවිද්‍යාලවල සහ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් පවත්වන පුහුණුවල විෂය මාලාව, දේශගුණ අවදානම ආමන්ත්‍රණය සඳහා සමාලෝචනය කර සංශෝධනය කිරීම. | 2021 |
| | 3.6 පශුසම්පත් කළමනාකරණයේ දී, දේශගුණ ප්‍රත්‍යස්ථ අභිජනන/ ප්‍රභේද සහ නව තාක්ෂණයන් හඳුනා ගැනීම සඳහා පර්යේෂණ හා සංවර්ධනය වැඩි දියුණු කිරීම. | 2022 |

### 5.1.6 ජල අංශය

පානීය ජලය, වාරි ජලය, සහ අනෙකුත් කටයුතු සඳහා (පරිසරය, කර්මාන්ත, ධීවර කර්මාන්තය, ජලවිදුලිය යනාදි) සඳහා යොදගන්නා ජලය යනාදී විවිධ කාර්යයන් සඳහා යොදගන්නා ජල සම්පත මෙහිදී ජල අංශය යන්නෙන් ආවරණය වේ. අවිනිශ්චිත කාලගුණ රටා සහ ජලය සඳහා ඇති ඉල්ලුම වැඩිවීම සමගින් ජල සුරක්ෂිතතාවය ශ්‍රී ලංකාවේ බරපතළ සැලකිල්ලක් දැක්වියයුතු කරුණක් වී ඇත. සියලුම උප අංශයන්හි වැඩිදියුණු කළ ජල කළමනාකරණ උපායමාර්ග න් නොපමාව ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය ඉන් අවධාරණය කරයි. මහවැලි ජල සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීමේ වැඩසටහන, දේශගුණ ප්‍රත්‍යස්ථතාව වැඩිදියුණු කිරීමේ වැඩසටහන, දේශගුණ ප්‍රත්‍යස්ථ ඒකාබද්ධ ජල කළමනාකරණ වැඩසටහන, අවදනම සහිත ගංගා ද්‍රෝණිවල දියබෙත්ම ප්‍රදේශවල සහ නකල්ස් කඳුවැටිය පාමුළ පහළ ගං ප්‍රදේශයේ වාසය කරන ප්‍රජාවන්ගේ දේශගුණ ප්‍රත්‍යස්ථබව ශක්තිමත් කිරීම සහ සුරකිමු ගංගා වැඩසටහන යන රජයේ මුලපිරීම්, තවත් වෑයම් අතරේ ම රටේ ජල සුරක්ෂිතතාවය ආමන්ත්‍රණය සඳහා කටයුතු කරන සුවිශේෂී ප්‍රයත්න කිහිපයක් වේ.

එකිනෙකා හා තරඟවදින ජල පරිශීලකයින්ට වඩාත් හොඳින් ජල සම්පත් වෙන්කර දෙන අතරම ජල සුරක්ෂිතතාවය වැඩිදියුණු කරගත හැකි, ඒකාබද්ධ ගංගාද්‍රෝණි කළමනාකරණය (IRBM) පිළිබඳව දැනට ජල බලධාරීන් සලකාබලමින් සිටිනු ලැබේ. එබැවින් පෙර NDCවල (2016 NDC) ගෘහස්ථ ජලය සම්බන්ධයෙන් ('ජල අංශය' යන නමින්) සාකච්ඡාවට ගත් මෙම ජල අංශයේ අනුහුරුවීමේ NDC හා වාරිමාර්ග අංශයේ NDC ද එකතු කර තිබේ. කර්මාන්ත, ජලවිදුලිය, ධීවර කර්මාන්තය, සහ බලශක්තිය යනාදී ජලය යොදගන්නා අනෙකුත් අංශ ඒ ඒ ආංශික NDC යටතේ ආවරණය කර ඇත. ජල කළමනාකරණයේ පාරිසරික පැතිකඩ, ජෛව විවිධත්ව භෘහ යටතේ අර්ධ වශයෙන් ආවරණය කර තිබේ. තවද, ජල පරිහරණ කාර්යක්ෂමතාවය සහ කෘෂිකාර්මික ජල කළමනාකරණය වැනි තවත් අමතර ක්‍රියාමාර්ග කෘෂිකර්ම අංශයේ අනුහුරුවීමේ NDC යටතේ නියෝජනය කර තිබේ.

සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති රාමුවේ[35] නල ජලය ලබාදෙන ජල සැපයුම් යෝජනා ක්‍රම හරහා සියලුදෙනාට පානීය ජලය ලබාදීම පිළිබඳව අවධාරණය කර ඇත. එසේම, වාරි ජල භාවිතයේ කාර්යක්ෂමතාවය සහ පුනර්ජනනීය බලශක්ති භාවිතය පිළිබඳව ද එහි අවධාරණය කර තිබේ. ජල සම්පත් සංවර්ධනය, සංරක්ෂණය සහ කළමනාකරණය සඳහා වන ජාතික ප්‍රතිපත්ති, උපායමාර්ග සහ ආයතනික රාමු කෙටුම්පත සම්බන්ධයෙන් අවසාන තීරණවලට එළැඹුණු පසුව මෙම අංශයට මාර්ගෝපදේශකත්වය ලබාදෙන ප්‍රධාන මූලධර්මය එය වනු ඇත. තවද, සාර්ව කෘෂිකර්ම ප්‍රතිපත්තියක් (OAP) සම්පාදනය කිරීම සඳහා දැනට ඇති අනෙක් මුලපිරීමෙන් ද වාරි ජලය පරිහරණය සහ එහි කාර්යක්ෂමතාවය සම්බන්ධයෙන් විශේෂිත මාර්ගෝපදේශ ලබාදෙනු ඇත. 2019-2025 සහ ඉන් ඔබ්බට වාරි සහ ජල සම්පත් අංශ දේශගුණ විපර්යාසවලට අනුහුරුකිරීම සඳහා වන උපායමාර්ගික ක්‍රියාකාරී සැලසුමෙන් මෙම අංශය සඳහා අනුහුරුවීමේ ක්‍රියාමාර්ග සපයාදෙයි.

**දේශගුණ විපර්යාසවලින් බලපෑම නිසා මෙම අංශයට ඇතිවන අවදනම්:** ජල අංශයට සම්බන්ධ ප්‍රධානතම අවදනම් සාධක දේශගුණ විපර්යාසවල බලපෑම තවදුරටත් උග්‍ර කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. එවිට, පවතින ජලය පරිශීලකයින් අතරේ වෙන්කරදීම තවදුරටත් අභියෝගාත්මක වනු ඇත. දේශගුණ විපර්යාසවල බලපෑමට ලක්වන ජලය සම්බන්ධ අවදනම් අතර, ගුණාත්මකබව අතින් සහ ප්‍රමාණාත්මකව ජලය හිඟවීම, ලවණ එකතුවීම සහ ගංවතුර, නියග හා මුහුදු මට්ටම ඉහළ නැගීම හේතුවෙන් උද්ගතවන ආන්තික සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස ජලය බෙදහැරීමේ ව්‍යුහවලට හානි සිදුවීම ඇතුළත් වේ. උෂ්ණත්වය ඉහළයාම සහ වර්ෂාපතනයේ ඇතිවන විචල්‍යතා සමගින්, විශේෂයෙන්ම පළමු අන්තර්-මෝසම සඳහා පුරෝකථනය කර ඇති අහිතකර විෂමතාවය සමගින් මේ තත්වය තවදුරටත් උග්‍රවනු ඇතැයි අපේක්ෂා කෙරේ. වැඩි වාරගණනක් සිදුවන දැඩි වර්ෂාපතන ඇදහැලීම් සමගින් කැළණි, නිල්වලා සහ වලවේ ගංගාද්‍රෝණි පානීය ජල අංශයෙන් ගංවතුර සඳහා අවදනම්පාත්‍ර වේ.

ලවණතාවය යනු වෙරළබඩ ප්‍රදේශ මුළුල්ලේ ම පවතින ගැටලුවක් වන අතර භූගත ජලය සඳහා වන ඉල්ලුම දැඩි සේ ඉහළ ගොස් ඇති ප්‍රදේශවල (බස්නාහිර පළාත, වයඹ පළාත සහ නැගෙනහිර පළාත) මෙය විශේෂයෙන් ප්‍රශ්නයක් වී තිබේ. ගංවතුර සහ නියඟ හේතුවෙන් සනීපාරක්ෂාව සඳහා ජලය නොමැතිවීම ද යම් යම් දිස්ත්‍රික්කවල සෑහෙන බරපතළ සෞඛ්‍ය අවදනමක් වශයෙන් හඳුනාගෙන තිබේ. වයඹ සහ උතුරුමැද පළාත්වල සුළු හා මහා පරිමාණ වාරි යෝජනාක්‍රම විශාල සංඛ්‍යාවක් පවතින අතර ඉන් ඇතැම් ඒවා මීට වසර දහසකටත් පෙර ඉදිකළ ඒවා ය. දීර්ඝ කාලයක් පවතින නියගය සහ වර්ෂාපතන රටාව වෙනස්වීම මෙම වැව් ජාලයේ ජලය ගබඩාකිරීමට තර්ජනයක් වී තිබේ. ස්ථානික උෂ්ණත්වය ඉහළ මට්ටමක පවතින විට මෙම ජලකඳන්වල මතුපිටින් වාෂ්පීකරණ-උත්ස්වේදනය වඩාත් වැඩියෙන් සිදු වේ. භූමියේ ආවරණයට බාධාවීමත් සමගින් ජලාශවල රොන්මඩ එකතුවීම හේතුවෙන් ඒවායේ ගැඹුර අඩුවන අතර වාෂ්පීකරණයෙන් ජලය අඩුවීම ඉන් තවත් උග්‍ර කෙරේ. මේ අතර, අනපේක්ෂිත ලෙස පතනය වන දැඩි වර්ෂාව හේතුවෙන් වේලි, දියවාන්, ඇළ මාර්ග සහ සොරොව් වැනි වාරි ව්‍යුහවලට හානි සිදුවේ. ගතවූ දශකය තුළ වියළි කලාපයේ විශාල ගංවතුර සිදුවීම් බොහොමයක් සිදුවී ඇති අතර ඒ හේතුවෙන් වාරි ව්‍යුහවලට දැඩි හානි සිදුවීමත් වැව් පත්ලේ රොන්මඩ වැඩි වශයෙන් තැන්පත්වීමත් ඇතිව තිබේ.

35 ජාතික සංවර්ධන රාමුව. මුදල් අමාත්‍යාංශය, 2019

**ජල අංශයේ අනුහුරුවීම්:** ඉහත සැකෙවින් විස්තර කළ අන්දමට, ජල අංශයේ දේශගුණ විපර්යාසවලට අනුහුරුවීම් ගෘහස්ත ජල පරිහරණය සහ වාරි ජල පරිහරණය යන ප්‍රධාන උප අංශ දෙකක් යටතේ සංවිධානය කර තිබේ. දේශගුණ විපර්යාසවලට අනුවර්තනය වීමට ජල අංශයට ප්‍රතිපත්තිමය සහාය මූලිකව සපයනු ලබන්නේ ශ්‍රී ලංකාවේ ගංගාද්‍රෝණි 15 ක ඒකාබද්ධ ගංගාද්‍රෝණි කළමනාකරණ (IRBM) ප්‍රවේශය අනුගමනය කිරීම හරහාය. එහිදී ප්‍රමුඛතාවය ලබාදී ඇති ගංගාද්‍රෝණි නම් කැළණි ගඟ, අත්තනගලු ඔය, ගිං ගඟ, නිල්වලා ගඟ, මල්වතු ඔය, දැදුරු ඔය, මා ඔය, ගල් ඔය, කලා ඔය, මහවැලි ගඟ, මුන්දෙණි ආරු, කළු ගඟ, මී ඔය, යාං ඔය, සහ කිරිඳි ඔය වේ.

මේ අංශයේ හෘක දහයක් වේ (5.1.4 වගුව). සියලු අංශ ආවරණය වන හෘක එකක් මගින් IRBM ආවරණය කරන අතර, භූගත ජලය අධීක්ෂණය, දේශගුණ ප්‍රත්‍යස්ථ ජල සම්පාදන යෝජනාක්‍රම, අපජලය පරිහරණය කිරීම ප්‍රවර්ධනය, ජලය ඇතුළුවන ස්ථානයේ දී ජලයේ ලවණතාවය කළමනාකරණය කරගැනීම, දේශගුණ විපර්යාස සඳහා අනුහුරුවීමට ධාරිතා වර්ධනය ඇතුළුව ගෘහස්ථ ජල පරිහරණය පිළිබඳව NDC පහක් ද වාරි පද්ධති ප්‍රතිසංස්කරණය, පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම, විකල්ප ජල ප්‍රභවයන් හඳුන්වාදීම, වාරි කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම, සහ ගංගා පිටාර ගැලීම සම්බන්ධයෙන් පූර්වදැනුම්දීම් සිදුකිරීම ඇතුළුව වාරි ජලය සම්බන්ධ NDC හතරක් ද වේ.

*5.1.4 වගුව: ජල අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව*

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | | ඉලක්ක වර්ෂය |
|---|---|---|---|
| | **සමස්ථ ජල අංශයම ආවරණය වන IRBM** | | |
| **NDC 1** | **ප්‍රමුඛතාවය ලබාදුන් ගංගාද්‍රෝණි 15ක ඒකාබද්ධ ගංගා ද්‍රෝණි කළමනාකරණ ප්‍රවේශය (IRBM) අනුගමනය කිරීම** | | **2030** |
| | 1.1 | ශ්‍රී ලංකාවේ ගංගා ද්‍රෝණි 15 ක, සමස්ථ ගංගා ද්‍රෝණියේ අවදානමට ලක් විය හැකිබව, අවදානම සහ ධාරිතා තක්සේරු කිරීම. | 2025 |
| | 1.2 | ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ ගංගා ද්‍රෝණි කළමනාකරණ සැලසුම්කරණ මූලපිරීම් සඳහා දේශගුණ විපර්යාස අනුහුරුවීම ඇතුළත් කිරීම | 2023 |
| | 1.3 | තෝරාගත් ගංගා ද්‍රෝණි 15 සඳහා ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණ සැලසුම් සකස් කිරීම. | 2030 |
| | 1.4 | වැදගත්ම ගංගා ද්‍රෝණි අවම වශයෙන් පහක් සඳහා ඒකාබද්ධ ගංගා ද්‍රෝණි කළමනාකරණ (IRBM) සැලසුම් (2025 වන විට) සකස් කර ක්‍රියාත්මක කිරීම. (යාන් ඔය, මී ඔය, මල්වතු ඔය, ගිං ගඟ සහ නිල්වලා ගඟ යන ද්‍රෝණි පහක් හඳුනාගෙන ඇත) | 2030 |
| | 1.5 | ප්‍රමුඛතා ද්‍රෝණි පහක ජල ප්‍රවාහ සහ අවසාදිත ප්‍රමාණ නිරීක්ෂණ පද්ධති ස්ථාපිත කිරීම. | 2025 |
| | 1.6 | තෝරාගත් ගංගා ද්‍රෝණිවල අතිරික්ත ජලය අන්තර්-ගංගාද්‍රෝණි හැරවුම හරහා වෙනත් ප්‍රදේශවල ගබඩා පහසුකම් වෙත යොමු කිරීම | 2030 |
| | 1.7 | දේශගුණික ප්‍රත්‍යස්ථතාව වැඩි දියුණු කිරීම සඳහා පරිසර පද්ධති ප්‍රතිස්ථාපනය, රුක් රෝපණය, කුඩා පොකුණු, බාධක වේලි වැනි සුදුසු ක්‍රියාමාර්ග භාවිත කරමින් ජල පෝෂක ප්‍රදේශවල ජලය රඳවා තබා ගැනීම/නැවත ආරෝපණය කිරීම වැඩි දියුණු කිරීම. | 2025 |
| | 1.8 | දේශගුණ අවදානම ආමන්ත්‍රණය කරන සැලසුම් පහ ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම. | 2030 |
| | 1.9 | ඉතිරි වී ඇති දේශගුණ ඇතුළත් ගංගාද්‍රෝණි සංවර්ධන සැලසුම් 10 ක්‍රියාත්මක කිරීම සඳහා සූදානම් වීම.<br>කලා ඔය, මා ඔය, ගල් ඔය, දැදුරු ඔය, මහවැලි ගඟ, මුන්දෙනි ආරු, කළු ගඟ, කැලනි ගඟ, අත්තනගලු ඔය සහ කිරිඳි ඔය යන ද්‍රෝණි 10 ක් හඳුනාගෙන ඇත. | 2030 |
| | **ගෘහස්ත ජල සැපයුම් උප අංශය** | | |
| **NDC 2** | **උතුරු, උතුරුමැද සහ වයඹ පළාත්වල සහ පානීය ජලය සම්බන්ධයෙන් නියගයේ අවදානමට ලක්ව ඇති අනෙකුත් ප්‍රදේශවල භූගත සහ භූතල ජල මට්ටම් අධීක්ෂණය** | | **2030** |
| | 2.1 | ප්‍රමුඛතා ප්‍රදේශවල නව පානීය ජල ව්‍යාපෘති සඳහා අවදානම් තක්සේරු කිරීම් සහ හදිසි අවස්ථා සැලසුම් සිදුකිරීම | 2025 |
| | 2.2 | සැපයුම හිඟ වන ප්‍රදේශවල ජල සැපයුම වැඩි දියුණු කිරීම සඳහා නව ජල ප්‍රභවයන් සහ විකල්ප (එනම් වැසි ජලය එක්රැස් කිරීම සහ උප පෘෂ්ඨ ජලය) සෙවීම | 2025 |

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | ඉලක්ක වර්ෂය |
|---|---|---|
| | 2.3 අවදානමට වැඩි නැඹුරුවක් සහිත දිස්ත්‍රික්කවල තාවකාලික ගැඹුරු ළිං ස්ථාපිත කිරීමෙන් නියඟ බලපෑම අවම කිරීම. | 2025 |
| | 2.4 ජල හිඟ ප්‍රදේශවල සුදුසු භූගත ජලය නැවත ආරෝපණය කිරීමේ පද්ධති හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම. | 2024 |
| | 2.5 අවශ්‍ය ගුණාත්මකභාවය හා ජල ප්‍රමාණය සහිත ජල සුරක්ෂිතතාව සෑමවිටකම පවතින බව සහතික කිරීම. | 2025 |
| | 2.6 අවම වශයෙන් ගංගා ද්‍රෝණි තුනක භූගත ජලය තිරසර අන්දමින් නිස්සාරණය කිරීමේ මට්ටම් ස්ථාපිත කිරීම (2025 වන විට) සහ තවත් ගංගා ද්‍රෝණි තුනක් දක්වා එම ආවරණය පුළුල් කිරීම. | 2030 |
| **NDC 3** | **දේශගුණ ප්‍රත්‍යස්ථ ජල සැපයුම් යෝජනාක්‍රම ප්‍රවර්ධනය කිරීම** | **2025** |
| | 3.1 ජල අංශයේ ආයතන සමග සහයෝගීතාවයෙන්, ප්‍රධාන ජල ප්‍රභවයන්හි ජලයේ ගුණාත්මක බව තත් කාලයේ (real time) මැනීම සඳහා නව තාක්ෂණය ස්ථාපිත කිරීම | 2024 |
| | 3.2 ගංවතුර, නියඟ සහ ලවණ ජලය මුසුවීමේ සඳහා අවදනමක් ඇති සියලුම ජල සම්පාදන යෝජනාක්‍රම සඳහා ගංවතුර, නියඟ, ලවණ මුසුවීම් සහිත කාලයේදී සුරක්ෂිත පානීය ජලය සැපයිය හැකි යන්ත්‍රණ ඇතිකිරීම | 2024 |
| | 3.3 දේශගුණය හා කාලගුණය සම්බන්ධ ආපදා සහ සෞඛ්‍ය හදිසි අවස්ථා සඳහා කලට වේලාවට ආපදා ප්‍රතිචාර දැක්වීමට, පූර්ව අනතුරු ඇඟවීම් සිදුකිරීමට ආයතන අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම. | 2025 |
| | 3.4 අවදානම් ප්‍රදේශවල ජලපෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා පරිසර පද්ධති සේවා සඳහා ගෙවීම (PES) වැනි නව්‍ය ප්‍රවේශ යොදාගැනීම | 2025 |
| | 3.5 අනෙකුත් පානීය ජල ප්‍රභවයන් ප්‍රමාණවත් නොවන, වඩාත් අවදානමක් ඇති ප්‍රදේශවල ජලයේ ලවණ ඉවත්කිරීමේ හෝ වැසි ජලය රැස් කිරීමේ මධ්‍යස්ථාන ඇතිකිරීම | 2024 |
| | 3.6 සියලුම ජල සැපයුම් යෝජනාක්‍රමවල ජල සංරක්ෂණය/ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ගයක් වශයෙන් ආදායම් නොලැබෙන ජල මට්ටම (NRW) අඩු කරගැනීම | 2025 |
| **NDC 4** | **පිරියම් කළ ජලය සඳහා ඇති ඉල්ලුම අඩුකරගැනීම සඳහා ගෙවතු, සනීපාරක්ෂාව, ඉදිකිරීම් සහ අනෙකුත් කාර්යයන් සඳහා අපජලය භාවිතා කිරීම ප්‍රවර්ධනය** | **2026** |
| | 4.1 පිරියම් කළ ජලය භාවිතය අධෛර්යමත් කිරීම සඳහා ජාතික මට්ටමින් ප්‍රතිපත්තිමය මුලපිරීමක් ලෙස කර්මාන්ත, කාර්මික උද්‍යාන සහ මහල් නිවාස ගොඩනැගිලිවල නියමු මට්ටමින් පියවර ගැනීම | 2024 |
| | 4.2 විවිධ කටයුතු සඳහා ජල සංරක්ෂණය/ නැවත භාවිතා කිරීම/ ප්‍රතිචක්‍රීකරණය කිරීම පිළිබඳ වඩාත් සුදුසු යාන්ත්‍රණ ප්‍රවර්ධනය කිරීම. | 2025 |
| | 4.3 කාර්මික උද්‍යාන යටතට ඇතුළත්වන ප්‍රදේශ ඇතුළුව නව කාර්මික ඉදිකිරීම්වලදී අපජලය නැවත භාවිතය හඳුන්වාදෙන නව අතුරුප්‍රඥප්ති සහ ගොඩනැගිලි නීති හඳුන්වාදීම | 2026 |
| | 4.4 ඉහත කරුණ ප්‍රවර්ධනය සඳහා වෙළඳපල යාන්ත්‍රණ හඳුන්වා දීම. | 2026 |
| | 4.5 අපජල කළමනාකරණයේ පෞද්ගලික හා සමාජීය ප්‍රතිලාභ පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම. | 2022 |
| **NDC 5** | **දේශගුණ විපර්යාසවලින් බලපෑමට පත් වෙමින් නියං කාලයේදී ගඟ අභ්‍යන්තරයට ලවණ ජලය ඇතුළුවන තත්වයක් සහිත ගංගා 03ක ලවණ බාධක ඇතිකිරීම**<br>(කැළණි ගඟ, කළු ගඟ, සහ මල්වතු ඔය) | **2030** |
| | 5.1 ලවණ බාධක වශයෙන් (තාක්ෂණික සහ මූල්‍ය කරුණු අනුව) එක් එක් ස්ථානයට වඩාත්ම උචිත විසඳුම් හඳුනාගැනීම | 2023 |
| | 5.2 හඳුනාගත් එම සෑම ප්‍රධාන ගංගාවකම ලවණ බාධක ඇතිකිරීම | 2025 |
| | 5.3 ලවණ ජලය මුසුවීමේ ගැටලුව සහිත ප්‍රදේශවල භූගත ජලය නිස්සාරණය කළමනාකරණය තක්සේරු කිරීම සහ ඒ සඳහා නියාමන යන්ත්‍රණයක් ඇතිකිරීම | 2027 |
| | 5.4 විශේෂයෙන් නියඟ කාලවලදී පානීය ජල ප්‍රභවයන් වෙත ලවණ ජලය ඇතුළු වීම අධීක්ෂණය හා වාර්තා කරගැනීම | 2030 |

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | ඉලක්ක වර්ෂය |
|---|---|---|
| | 5.5 ලවණ මුසුවීම සම්බන්ධයෙන් අවශ්‍ය කාලවලදී පූර්ව අනතුරු ඇඟවීම සඳහා සහ ලවණ මුසු ජලය පිටාර කිරීම සඳහා වුවමනාකරන ජලය වෙන්කරදීමට ප්‍රමුඛතාවය ලබාදීම සඳහා අන්තර්-ආයතන සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම | 2030 |
| **NDC 6** | **දේශගුණ විපර්යාස සඳහා ප්‍රත්‍යස්ථතාව ගොඩනංවාගැනීම සම්බන්ධයෙන් ජල අංශයේ කාර්යමණ්ඩලයේ ධාරිතා වර්ධනය සහ මහජනයා අතර දැනුවත්භාවය වර්ධනය කිරීම** | **2030** |
| | 6.1 ජල අංශයේ ආයතනවල සහ කාර්යමණ්ඩලයේ දේශගුණ ප්‍රත්‍යස්ථතාව ගොඩනැංවීම සම්බන්ධයෙන් ඇති ධාරිතා අවශ්‍යතා තක්සේරු කිරීම | 2022 |
| | 6.2 ප්‍රජා ජල සැපයුම් යෝජනාක්‍රමවල NDC ද ඇතුළුව මෙම අංශයේ NDC ඵලදායී අන්දමින් ක්‍රියාත්මක කිරීම සඳහා එක් එක් ආයතනයේ ධාරිතා ගොඩනැංවීම සඳහා සැලසුම් සම්පාදනය කිරීම | 2024 |
| | 6.3 ජල සුරක්ෂිතතාවය සඳහා දේශගුණ ප්‍රත්‍යස්ථතාවය ගොඩනැංවීමක් වශයෙන් ජලය තිරසර අන්දමින් භාවිතා කිරීම පිළිබඳ මහජනයා දැනුවත්කිරීමේ සහ චර්යාමය වෙනසක් ඇතිකිරීමේ ව්‍යාපාර ක්‍රියාත්මක කිරීම | 2025 |
| | 6.4 ජල සම්පත සම්බන්ධ දේශගුණ ප්‍රත්‍යස්ථතාවය ආමන්ත්‍රණය කිරීමට ප්‍රජාවන්හි සහ ප්‍රජා මූලික සංවිධානවල ධාරිතාවය වර්ධනය කිරීම | 2022 |
| | 6.5 ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණය සහ දේශගුණ විපර්යාස සඳහා වඩාත්ම අවදානම් ප්‍රදේශවල ජල පරිශීලකයන් අතරේ 3R ප්‍රවර්ධනය කිරීම | 2030 |
| | 6.6 දේශගුණ විපර්යාස අවදානම පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කරගත් ජල අංශයේ තාක්ෂණික ශිල්පීන්/ ජලනල කාර්මිකයින්ට පපිළිගැනීමක් ලබාදීම | 2022 |
| | 6.7 පානීය ජලය නිස්සාරණයේ, සම්ප්‍රේෂණයේ සහ බෙදහැරීමේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම හරහා සැපයුම් පාර්ශව කළමනාකරණය | 2022 |
| | **වාරි ජල උප අංශය** | |
| **NDC 7** | **කෘෂිකර්ම අංශයේ දේශගුණ ප්‍රත්‍යස්ථතාවය වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ විශාල/ මධ්‍යම පරිමාණ වැව් 25ක් සහ සුළු වාරි පද්ධතීන් 300ක් ද, වාරි ඇලමාර්ග කි.මී. 200ක් ද ප්‍රතිස්ථාපනය, පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම** | **2030** |
| | 7.1 ප්‍රතිස්ථාපනයෙන් ලැබෙන ඵලදායීතා වාසි කෙරෙහි ද අවධානය යොමු කරමින්, දේශගුණ විපර්යාස සම්බන්ධයෙන් බරපතළ තත්වයක් පවතින ප්‍රදේශවල පුනරුත්ථාපනය කළ හැකි, අතහැර දැමූ වැව් (කුඩා වැව් එල්ලංගා පද්ධති ද ඇතුළුව) සහ ඇළ මාර්ග ප්‍රමුඛතා අනුපිළිවෙලට සකස් කිරීම | 2021 |
| | 7.2 එම ප්‍රතිස්ථාපන ප්‍රමුඛතා සඳහා අවශ්‍ය කරන පිරිවැය ඇස්තමේන්තු හා ක්‍රියාත්මක කරන අන්දම හා ජාතික ධාරිතාවය සහ අන්තර්ජාතික ආධාර සමග සූදනම් කිරීම | 2021 |
| | 7.3 වගකිව යුතු නියෝජිතායතන සමගින් (DAD, PDoI, DoI, MASL සහ විශේෂ ව්‍යාපෘති) කලින් කලට ඇතිකරගන්නා (වසර 2කට වරක්) ඉලක්ක ඇතිව, වැව් 50ක් සහ ඇළමාර්ග කි.මී. 100ක් ප්‍රතිසංස්කරණය කිරීම | 2030 |
| | 7.4 විශාල/මධ්‍යම පරිමාණ වැව් 25ක් සහ සුළු වාරි පද්ධති 50ක් ආවරණය වන සේ දේශගුණ විපර්යාස ප්‍රත්‍යස්ථබව වැඩිදියුණු කිරීමට වාරි වැව් සතු ශක්‍යතාවය වැඩිදියුණු කිරීම | 2030 |
| **NDC 8** | **ගෘහස්ත සහ අනුපූරක වාරිමාර්ග සඳහා දේශගුණ විපර්යාස ප්‍රත්‍යස්ථතාවය ගොඩනැංවීමේ මැදිහත්වීමක් වශයෙන් විකල්ප ජල මූලාශ්‍ර හඳුන්වාදීම හෝ ප්‍රවර්ධනය** | **2030** |
| | 8.1 දේශගුණ ප්‍රත්‍යස්ථතාවය ගොඩනැංවීම සඳහා වාරි කටයුතුවලට විකල්ප ජල මූලාශ්‍ර භාවිතය සහ භූගත ජලය නැවතත් ආරෝපණය සඳහා ශක්‍යතා අධ්‍යයන සිදුකිරීම | 2024 |
| | 8.2 දේශගුණ ප්‍රත්‍යස්ථතාවය ගොඩනැංවීමේ මැදිහත්වීමක් වශයෙන්, භූගත ජල ප්‍රභවයන්ගෙන් සහය ලබාදිය යුතු (නළ ළිං, ගැඹුරු ළිං හරහා), ප්‍රමුඛතාවයෙන් වැඩි ගෘහස්ත ජල සැපයුම් සහ පරිපූරක වාරිමාර්ග ඇගැයුම් කිරීම සහ හඳුනාගැනීම | 2023 |
| | 8.3 ලබාගැනීමට ඇති ජලය සහ සුරක්ෂිතව නිස්සාරණය කළහැකි ජල මට්ටම් අනුව වාරි කටයුතු සඳහා වගා ළිං හරහා භූගත ජලය ලබාදීම නියාමනය කිරීම | 2030 |

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | ඉලක්ක වර්ෂය |
|---|---|---|
| **NDC 9** | **වාරිමාර්ග යෝජනාක්‍රම 40ක ජල කළමනාකරණය වැඩිදියුණු කිරීම** | **2025** |
| | 9.1 වාරි ජලය සැපයෙන ඉඩම් හෙක්ටාර ප්‍රමාණය අවම වශයෙන් 45,000ක් ආවරණය කිරීම සඳහා වාරිමාර්ගවල ජල පරිහරණ කාර්යක්ෂමතාවය 10%කින් වැඩිකරගැනීම | 2025 |
| | 9.2 ක්ෂුද්‍ර වාරි පද්ධති (ඉසින) සහ ජල පරිභෝජනය අඩු භෝගවර්ග වැනි ජලය ඉතිරිකරගත හැකි යෙදවුම් හඳුන්වාදීම | 2025 |
| | 9.3 ජලය ඉතිරිකරගත හැකි යෙදවුම් සම්බන්ධයෙන් ගොවීන් පුහුණු කිරීම සහ දැනුවත් කිරීම | 2025 |
| | 9.4 වඩාත් හොඳින් ජල බෙදදීමේ යන්ත්‍රණ හරහා ගොවි සංවිධාන අතර කාර්යක්ෂමව ජලය බෙදදීම හඳුන්වාදීම | 2025 |
| | 9.5 නව වාරි තාක්ෂණය භාවිතා කිරීම සඳහා වෙළඳපොළ පදනම් කරගත් මෙවලම් ප්‍රවර්ධනය කිරීම (ජල සහනාධාර යෝජනාක්‍රම සහ බදු සහන) | 2025 |
| **NDC 10** | **ප්‍රමුඛතා ගංගාද්‍රෝණි පහළ ඇතිවිය හැකි ක්ෂණික ගංවතුර තත්ත්වයන් සඳහා ගංගා පිටාරගැලීම් අවමකිරීමේ ක්‍රියාමාර්ග සහ පූර්ව අනතුරු ඇඟවීම් පද්ධති ඇගැයුම් කිරීම (නියමු පදනමින් කැළණි ගඟ, අත්තනගලු ඔය, කළු ගඟ, කිරිඳි ඔය, සහ මල්වතු ඔය ආවරණය කෙරේ)** | **2030** |
| | 10.1 ප්‍රමුඛතා ගංගාද්‍රෝණි පහේ ගංගා සහ ජලාශ මානක සවිකිරීම සහ වර්ෂාපතන දත්ත හා ගංගා ප්‍රවාහ දත්ත එකතුකිරීම | 2025 |
| | 10.2 සියලුම ප්‍රමුඛතා ගංගාද්‍රෝණි සඳහා ඩිජිටල් උන්නතාංශ සිතියම් සුදානම් කිරීම සහ ස්වයංක්‍රිය පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති ඇතිකිරීම | 2025 |
| | 10.3 අළුතින් ඇතිකළ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිවලට සම්බන්ධ තාක්ෂණික යෙදුම් සහ තොරතුරු බෙදාහැරීම සම්බන්ධයෙන් ධාරිතා වර්ධන වැඩසටහන් පැවැත්වීම | 2025 |
| | 10.4 දේශගුණ විපර්යාසවල බලපෑමෙන් ඇතිවන අවදානම් සඳහා මුහුණදීමට ගංවතුරේ හානි අවම කිරීමේ ව්‍යූහ හඳුන්වාදීම | 2030 |

### 5.1.5 ජෛව විවිධත්ව අංශය

ශ්‍රී ලංකාව ලෝකයේ ඇති ජෛව විවිධත්වයෙන් අනූන/උණුසුම් ස්ථානයකි (biodiversity hotspot). ජීවී විශේෂවල විවිධත්වය, ව්‍යාප්තිය සහ ස්වාභාවික පරිණාමය දේශගුණ සහ ක්ෂුද්‍ර දේශගුණ වාසභූමි මත රඳා පවතින අතර, තෙත් කලාපයේ හෝ රටේ නිරිතදිග ප්‍රදේශයේ බහුලවම සංකේන්ද්‍රණය වී තිබේ. සාර්ව පාරිසරික පාරාමිතීන්ගේ ඇතිවන වෙනස්වීම්, විශේෂයෙන්ම, වර්ෂාපතනය, ආර්ද්‍රතාවය, උෂ්ණත්වය සහ ව්‍යා අගය යනාදියේ වෙනස්වීම්, හේතුවෙන් යම් යම් විශේෂිත වාසභූමි/ක්ෂුද්‍ර දේශගුණ තත්ත්ව මත රඳා පවතින ශාක හා සත්ත්ව විශේෂවලට ව්‍යාප්තියට හා පැවැත්මට සැලකියයුතු තර්ජනයක් එල්ල කිරීමට හේතුවන අතර ආක්‍රමණකාරී විශේෂවලින් සංවේදී වාසස්ථානවලට ඇතිවන තර්ජන වැඩි කරවයි. UNFCCC වෙත ශ්‍රී ලංකාව ඉදිරිපත් කළ තෙවන ජාතික සන්නිවේදනයේ විස්තර කර ඇති දුර්ලභ, ආවේණික විශේෂ සම්බන්ධයෙන් සිදුකළ අධ්‍යයන, 2016-2022 ජාතික ජෛව විවිධත්ව උපායමාර්ගික සැලසුම, සහ දේශගුණ විපර්යාසවලට අනුහුරුවීම සඳහා වන තාක්ෂණික අවශ්‍යතා ඇගැයුම මගින් පෙන්වා දෙන අන්දමට මෙම වාසභූමි පරාස ක්‍රමයෙන් කුඩාවනු ඇති අතර උෂ්ණත්වය ඉහළ ගොස් වර්ෂාපතනය වඩ වඩාත් අස්ථිර වන විට ශාක, කෘමීන්, උරගයින් සහ උභයජීවීන්ට එය බලපානු ඇත.

හායනය වූ පරිසර පද්ධති ප්‍රතිස්ථාපනය හා පුනරුත්ථාපනය හරහා ස්වාභාවික පරිසර පද්ධති සංරක්ෂණය හා සංචාරක කර්මාන්තය, අධ්‍යාපනය සහ සංස්කෘතියය යන අංශ තුළට ජෛව විවිධත්වය සංරක්ෂණය සැලසුම්සහගත සහ ක්‍රමවත් අන්දමින් ඒකාබද්ධ කරන බව සඳහන් කරමින් මෙරට ජාතික ප්‍රතිපත්ති රාමුව මගින් ජෛව විවිධත්වය වෙත ඇති කැපවීම අවධාරණය කර තිබේ. තවද, ආර්ථිකයට ශක්තියක් දීම සඳහා, ජෛව විවිධත්වය කිරීමට ද ඉන් යෝජනා කෙරේ. ජෛව විවිධත්වය සංරක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රතිපත්ති පවතියි. ඒවායින් ප්‍රධාන ප්‍රතිපත්ති අතරට 1995 ජාතික වන ප්‍රතිපත්තිය, 2000 ජාතික වනජීවී ප්‍රතිපත්තිය, 2003 ජාතික පාරිසරික ප්‍රතිපත්තිය, ආක්‍රමණික ආගන්තුක ජීවී විශේෂ සම්බන්ධයෙන් වන ජාතික ප්‍රතිපත්තිය (IAS) ක්‍රමෝපාය සහ ක්‍රියාකාරී සැලසුම 2016 ඇතුළත් වේ. පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ලේකම් කාර්යාලයේ නායකත්වය යටතේ ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සංරක්ෂණය සඳහා වන සමස්ථ ක්‍රමෝපාය වන්නේ, 2016-2022 ජාතික ජෛව විවිධත්ව උපායමාර්ගික ක්‍රියාකාරී සැලසුමයි. රජයේ ආයතන වශයෙන් ජෛව විවිධත්වය සංරක්ෂණයේ නායකත්වය ගන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (DWC) සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව (FD) සමගින් වනජීවී සහ වන සංරක්ෂණ අමාත්‍යාංශය යි. 2009 සංශෝධිත අංක 22 දරන වනසත්ත්ව සහ වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත සහ 2009 සංශෝධිත අංක 65 දරන වන සංරක්ෂණ ආඥාපනත ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව බලකරන ප්‍රධාන නීති වේ.

**ජෛව විවිධත්ව අංශයේ දේශගුණ අවදනම්:** දේශගුණ විපර්යාස හේතුවෙන් පාරිසරික කලාපවල පිහිටීම වෙනස්වන බව මෑතකාලීන අධ්‍යයනවලින්[36] පෙන්නුම් කෙරේ. අවදනමට ලක් විය හැකි ජීවී විශේෂ සහ වාසභූමි හඳුනාගැනීම සඳහා විශ්වසනීය දත්ත හිඟවීම මත, පුරෝකථනය කර ඇති දේශගුණික කලාපවල පිහිටීම වෙනස්වීම සමග ඇතිවිය හැකි බලපෑම් කෙරෙහි ශ්‍රී ලංකාවේ NDC මගින් අවධානය යොමුකර තිබේ. ශාක හා සත්ත්ව විශේෂ සහ වාසභූමි මෙම පුරෝකථනය කළ වෙනස්වීම්වලට වඩාත් ප්‍රත්‍යස්ථ කරවන අන්දමින් මෙම වෙනස්වීම් හඳුනාගෙන කළමනාකරණය කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගනු නොලැබුවහොත්, මෙම වෙනස්වීම් හේතුවෙන් ශාක හා සත්ත්ව විශේෂවල වෙනස්වීම් ඇතිවීමට බොහෝදුරට ඉඩ ඇති අතර, ශ්‍රී ලංකාවේ සමස්ත ජෛව විවිධත්වය මත සෘණාත්මක බලපෑමක් ඇතිකිරීමට ද ඉඩ ඇත. වාසභූමි නැවතත් යථා තත්ත්වයට පත් කිරීම මගින් කාබන් තිරකරීම් වැඩිදියුණු කිරීමට ඉඩ ඇති අතර, එමගින් දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන වෙනස්වීම් මැඩපැවැත්වීමට ශ්‍රී ලංකාවේ ජාතික දායකත්වය සඳහා ඉන් අමතර වාසියක් ලැබෙනු ඇත. එවැනි ක්‍රියාමාර්ග ඔස්සේ ශ්‍රී ලංකාව දේශගුණ විපර්යාසවලට වඩාත් ප්‍රත්‍යස්ථ කරවන අතර, ජාතික ජෛව විවිධත්ව උපායමාර්ගික ක්‍රියාමාර්ග සැලසුමේ නිර්වචනය කර ඇති සංරක්ෂණ ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා වක්‍රාකාරයෙන් දයක වනු ඇත.

**ජෛව විවිධත්ව අංශයේ අනුහුරුවීම්:** දේශගුණ සංවේදී ප්‍රදේශ කළමනාකරණය සහ ආරක්ෂිත ප්‍රදේශ තුළ හා ඉන් පිටත හායනයට ලක් වූ ප්‍රදේශ ප්‍රතිස්ථාපනය කිරීම, දේශගුණය හේතුවෙන් ඇතිවන වෙනස්කම් අනුව ජීවී විශේෂවල සංක්‍රමණය සඳහා සම්බන්ධතාවය වැඩිකිරීම, ආරක්ෂිත ප්‍රදේශ පද්ධතියක් හරහා ජෛව විවිධත්වයේ ප්‍රත්‍යස්ථබව ගොඩනැංවීමට ආරක්ෂිත ප්‍රදේශ පුළුල් කිරීම, ශාක සහ සත්ත්ව විශේෂවල විතැන් සංරක්ෂණය (ex-situ conservation) ශක්තිමත් කිරීම සහ ආක්‍රමණික ආගන්තුක විශේෂ (IAS) ඵලදායී අන්දමින් කළමනාකරණය කරගැනීම යන ක්‍රියාමාර්ග ආවරණය වන NDC අංශ පහක් යටතේ (5.1.5 වගුව) ජෛව විවිධත්වය සඳහා ප්‍රත්‍යස්ථබව ගොඩනැංවීමේ ක්‍රියාමාර්ග ඉදිරිපත් කර තිබේ.

36 ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස අවදනම: ආංශික අවදනම් පැතිකඩ. MoE/ADB, 2020

*5.1.5 වගුව: ජෛව විවිධත්ව අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව*

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | ඉලක්ක වර්ෂය |
|---|---|---|
| **NDC 1** | **දේශගුණ විපර්යාස නිසා දැඩි අවදානමකට ලක්ව ඇති වාසභූමි සංරක්ෂණය සඳහා ආරක්ෂිත ප්‍රදේශ (PAs) ජාලය තුළ සහ ඉන් පිටත දේශගුණ සංවේදී ප්‍රදේශ කළමනාකරණ සහ හායනය වූ ප්‍රදේශ ප්‍රතිස්ථාපනය කිරීම** | **2030** |
| | 1.1 පවතින සිතියම් ඇසුරින් දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන වෙනස්වීම්වලින් වඩාත් අවදානමට ලක්ව ඇති වාසභූමි හඳුනාගැනීම සහ ආරක්ෂිත ප්‍රදේශ තුළ සහ ඉන් පිටත ප්‍රතිස්ථාපනය කළයුතු හෝ පුනරුත්ථාපනය කළයුතු ප්‍රමුඛතා ස්ථාන සම්බන්ධයෙන් දේශගුණ විපර්යාස සඳහා ප්‍රතිචාර දක්වන්නා වූ අනුහුරුවීමේ ක්‍රියාමාර්ග ගැනීම. | 2022 |
| | 1.2 ප්‍රත්‍යස්ථතාව වැඩිදියුණු කිරීම සඳහා ඉහත සඳහන් ප්‍රමුඛතා ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමේදී අවධානය යොමුකළයුතු කඩොලාන, මුහුදු තෘණභූමි, මීදුම බාධක ප්‍රදේශ, විල්ලු ආදිය ඇතුළත් භෞමික, තෙත් බිම්, වෙරළබඩ හා සාගර ප්‍රදේශ සඳහා සිතියම් සුදනම් කිරීම | 2022 |
| | 1.3 දේශගුණ විපර්යාසවලින් අතිශයින් අවදානමට ලක්ව ඇති ශාක සහ සත්ත්ව විශේෂ හඳුනාගැනීම. | 2023 |
| | 1.4 ඉහත 1.1. සහ 1.3 හි හඳුනාගත්, වඩාත් අවදානමට ලක්ව ඇති ජීවී විශේෂ සම්බන්ධයෙන් පර්යේෂණ සහ අධ්‍යයන සිදුකිරීමට දිරිගැන්වීම. | 2030 |
| | 1.5 දේශගුණය හේතුවෙන් විශේෂයන් සහ වාසභූමිවල ඇතිවන වෙනස්වීම් හඳුනාග ැනීම සඳහා දේශගුණ සංවේදී ප්‍රදේශවල දීර්ඝ-කාලීන අධීක්ෂණ ස්ථාන සහ යාන්ත්‍රණ ඇතිකිරීම. | 2025 |
| | 1.6 ඉහත හඳුනාගත් වෙරළබඩ සහ සමුද්‍රීය වාසභූමි ඇතුළුව, හායනය වූ භෞමික සහ තෙත්බිම් ප්‍රදේශවලින් අවම වශයෙන් 25%ක් වත් වත්මන් භූමි ප්‍රදේශය මත පදනම් වෙමින්, ජෛව විවිධත්ව වටිනාකම, පරිසර පද්ධති වටිනාකම, සහ දේශගුණ වෙනස්වීම නිසා පත්ව ඇති අවදානම අනුව ප්‍රමුඛතා අනුපිළිවෙලින්, ප්‍රතිස්ථාපනය කිරීම | 2030 |
| | 1.7 මීදුම් බාධක කලාපවල ස්වභාවික පරිසර පද්ධතිය අවම වශයෙන් 25%ක් වත් ප්‍රතිස්ථාපනය කිරීම. | 2030 |
| **NDC 2** | **වර්තමාන පුරෝකථනවලට අනුව, දේශගුණය හේතුවෙන් ඇතිවන වෙනස්වීම්වලට ලක්වනු ඇති කලාපවල භූදර්ශන ප්‍රවේශයන් භාවිතා කිරීමෙන් ඒවායේ සම්බන්ධකතාවය වර්ධනය කිරීම** | **2030** |
| | 2.1 දේශගුණ සංවේදී ප්‍රදේශවල පිහිටා ඇති ගංගා ද්‍රෝණි භාවිතා කරමින්, භූදර්ශන මට්ටමින් සම්බන්ධකතා පිවිසුම් හඳුනා ගැනීම සඳහා (ඉහත 1.2 පදනම් කරගත්) ශක්‍යතා ඇගයුමක් සිදුකිරීම | 2023 |
| | 2.2 ඉහත සඳහන් කළ ශක්‍යතා ඇගයුම පදනම් කරගනිමින්, ඉන් හඳුනාගත් භූමි ප්‍රදේශයෙන් අවම වශයෙන් 25%ක් වත් ආවරණය වන සේ, වනපිවිසුම් ලෙස ක්‍රියාත්මක විය හැකි දේශගුණ අවදානමට ලක්ව ඇති ගංගාශ්‍රිත ප්‍රදේශ සහ ගංගා අතර ප්‍රදේශ ප්‍රතිස්ථාපනය කිරීම | 2027 |
| | 2.3 ජෛව විවිධත්ව වනපිවිසුම් වශයෙන් ක්‍රියාකිරීම සඳහා එවැනි වනපිවිසුම්වල සඵලත්වය අධීක්ෂණය කිරීම සහ සචලතාවය වැඩිදියුණු කිරීම සඳහා අනුහුරුවීමේ වෙනස්කම් සිදුකිරීම | 2030 |
| **NDC 3** | **දේශගුණ විපර්යාස සඳහා අවරෝධකය වශයෙන් ක්‍රියාකිරීමට ආරක්ෂිත ප්‍රදේශ (PA) ජාලයට ඇති හැකියාව වැඩිදියුණු කිරීම සඳහා ඒ භූමි ප්‍රමාණය ව්‍යාප්ත කිරීම.** | **2030** |
| | 3.1 දේශගුණ සංවේදී ප්‍රදේශ තුළ ඇති පාරිසරිකව/පරිසර විද්‍යාත්මකව සංවේදී, දැනට පවතින ආරක්ෂිත ප්‍රදේශ සමගින් ඒකාබද්ධ කළහැකි ප්‍රදේශ (1.2 පදනම් කරගනිමින්) හඳුනාගැනීම | 2023 |
| | 3.2 එසේ හඳුනාගත් ප්‍රදේශ, දැනට පවතින ආරක්ෂිත ප්‍රදේශ සමගින් ඒකාබද්ධ කිරීම/බලවරමිලත් ආයතන යටතේ නව ආරක්ෂිත ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීම | 2030 |

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | ඉලක්ක වර්ෂය |
|---|---|---|
| **NDC 4** | **දේශගුණ අවදානමට ලක්ව ඇති තක්සෝන (taxa) සහ කලාප ආවරණය කරන විතැන් (ex-situ) සංරක්ෂණය කිරීමේ වැඩසටහන් ශක්තිමත් කිරීම** | **2030** |
| | 4.1 දේශගුණ අවදානමට ලක්ව ඇති ප්‍රදේශවල තුරුලතා විතැන් සංරක්ෂණය කරන ස්ථාන (උද්භිදඋද්‍යාන සහ වෘක්ෂෝද්‍යාන) අවම වශයෙන් දෙකක් වත් වසර පහක් තුළ ඇතිකිරීම | 2025 |
| | 4.2 දේශගුණ අවදානම්පාත්‍ර ප්‍රදේශවල සත්ත්ව වර්ග විතැන් සංරක්ෂණය කරන ස්ථාන (විතැන් සංරක්ෂණ මධ්‍යස්ථාන) අවම වශයෙන් දෙකක් වත් වසර පහක් තුළ ඇතිකිරීම | 2025 |
| | 4.3 දේශගුණ සංවේදී හෝ තර්ජනයට ලක් වූ ශාක සහ සතුන් පරිස්ථාපනය/නැවත හඳුන්වාදීම සඳහා සහායවන යාන්ත්‍රණයක් ඇති කිරීම | 2027 |
| | 4.4 විතැන් සංරක්ෂණ මධ්‍යස්ථාන සඳහා නව පශුවෛද්‍ය/වසංගත අධ්‍යයන ඒකක තුනක් හඳුන්වාදීම | 2030 |
| | 4.5 ජාතික කෞතුකාගාරයෙහි, ජාතික උද්භිද උද්‍යානවල සහ පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ (PGRC) ජාන බැංකු සංවර්ධනය කිරීම | 2030 |
| **NDC 5** | **වාසිදායක දේශගුණ තත්ත්වයන් සමග ආක්‍රමණශීලී ආගන්තුක විශේෂ (IAS) පැතිරයාම එලදායී අන්දමින් කළමනාකරණය කිරීම** | **2030** |
| | 5.1 පරාස ව්‍යාප්තියක් සිදුවීමට ඉඩ ඇති ඒ මොනවාද යන්න සහ දේශගුණ විපර්යාස හා මානව ක්‍රියාකාරකම් මගින් පරාස ව්‍යාප්තියක් සඳහා පහසුකම් සැලසෙනු ඇත්තේ කුමන IAS හට ද යන්න හඳුනාගැනීම සඳහා දැනට පවතින IAS ව්‍යාප්ති සිතියම් මත පදනම් වී ලේඛන ඇගැයීමක් සිදු කිරීම | 2022 |
| | 5.2 දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවිය හැකි ජෛව විද්‍යාත්මක ආක්‍රමණවලට ඔරොත්තුදීම සඳහා පරිසර පද්ධතීන්ගේ ප්‍රත්‍යස්ථතාව වැඩිදියුණු කිරීමට, 5.1 හි හඳුනාගත් වැදගත් අංශවල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 2030 |

### 5.1.3 වෙරළබඩ සහ සමුද්‍ර අංශය

ශ්‍රී ලංකාවට කිලෝමීටර 1,620ක වෙරළ තීරයක් සහ වර්ග කි.මී.517,000ක පුළුල් විශේෂ ආර්ථික කලාපයක් හිමි ය. ජාතික මත්ස්‍ය අස්වැන්නෙන් 80%කට වැඩි ප්‍රමාණයක් සමුද්‍රීය සහ වෙරළබඩ ධීවර කර්මාන්තයෙන් ලැබෙන අතර,[37] සෘජුවම හෝ වක්‍රාකාරයෙන් ධීවර කර්මාන්තයේ නියැළෙන බොහෝදෙනෙකුගේ ජීවනෝපාය සඳහා ඉන් සහය ලැබෙයි. වෙරළ රේඛාවේ සිට රට අභ්‍යන්තරයට කි.මී. 50ක් තරම් දුරට වෙරළ කලාපය පවතින අතර රටේ ජනගහණයෙන් 25%ක් වාසය කරන මෙම කලාපය රටේ සමස්ථ භූමි ප්‍රමාණයෙන් දළ වශයෙන් 23%කි. රටේ කර්මාන්තවලින් සෑහෙන කොටසකට සහ සංචාරක කර්මාන්තයේ ආයතන පිහිටා ඇත්තේ මෙම වෙරළබඩ කලාපයේය.[38] වෙරළබඩ කලාපයෙන් දළ දේශීය නිෂ්පාදිතයට දළ වශයෙන් 40%ක පමණ දායකත්වයක් ලබාදෙයි. වෙරළබඩ සංචාරක කර්මාන්තයට ගැඹුරු මුහුදේ මත්ස්‍යයින් අල්ලන ක්‍රීඩා, සාගර ක්ෂීරපායීන් නැරඹීම, යාත්‍රා කිරීම, විවිධාකාරයේ කිමිදුම් කටයුතු, බෝට්ටු පැදවීම සහ විවිධ විනෝදස්වාද ක්‍රීඩා, හිරුරැස් නෑම, සහ නොගැඹුරු කොරල් පර සහිත මුහුදේ කැස්බෑවන් නැරඹීම ඇතුළත් වේ. සමස්ථ සංචාරක අංශයේ ආදායමින් 60%කට ආසන්න ප්‍රමාණයක් නියෝජනය කරන වෙරළබඩ සංචාරක කර්මාන්තය අගය එකතුකළ නිපැයුම් පරාසයක්ම ලබාදෙන බව ඇස්තමේන්තු කර ඇත.[39]

වර්තමාන ජාතික ප්‍රතිපත්ති රාමුවෙහි,[40] වෙරළ සංරක්ෂණය කිරීම සහ දූෂණය වැලැක්වීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් නීල-හරිත ආර්ථික සංකල්පය යටතේ සාගර සම්පත එළදායී අන්දමින් යොදාගැනීම පිළිබඳව අවධාරණය කර තිබේ. 2016 වෙරළබඩ කලාප කළමනාකරණ සැලසුමේ ශ්‍රී ලංකාවේ වර්තමාන වෙරළ කලාප කළමනාකරණය සඳහා වන රාමුව සහ මාර්ගෝපදේශ මූලධර්ම දක්වා තිබේ. 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනත සහ සංශෝධන/වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ රෙගුලාසි, 2008 අංක 35 දරන සමුද්‍රීය දූෂණය වැලැක්වීමේ පනත සහ සංශෝධන, සහ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ රෙගුලාසි ද, 2016 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත හා එහි ඇතුළත් රෙගුලාසි ද මෙහිදී වැදගත් නීතිමය විධිවිධාන වේ. ශ්‍රී ලංකාව දැනට එක්සත් ජාතීන්ගේ සාගර නීතිය පිළිබඳ සම්මුතිය යටතේ තවත් අමතර මුහුදු පත්ළ ප්‍රදේශයක් සඳහා හිමිකම් කියාපෑමේ ක්‍රියාවලියේ නිරතවෙමින් සිටින අතර මේ පිළිබඳව තවමත් තීරණයක් නැතත්, එය ශ්‍රී ලංකාවට අනාගතයේදී වඩාත් වැඩි ආර්ථික අවස්ථා ළඟාකර දෙනු ඇත.

**වෙරළබඩ සහ සමුද්‍රීය අංශයේ දේශගුණ බලපෑම්:** දේශගුණ විපර්යාසත් සමග මුහුදු මට්ටම ඉහළ යාම සහ වෙරළාශ්‍රිත ආපදා වැඩිවීම හා සම්බන්ධ බලපෑම් ඇතිවනු ඇතැයි පුරෝකථනය කර තිබේ. දූපත් රාජ්‍යවල වෙරළබඩ ප්‍රදේශවල භූගත ජලයේ ලවණතාවය වෙනස්වීම, ගංවතුර වැඩිවීම හා යටිතල පහසුකම්වලට හානිවීම සිදුවනු ඇති බවට ඉහළ විශ්වසනීයතාවයකින් යුතුව පුරෝකථනය කර තිබේ.[41] වෙරළබඩ කුණාටු සහ සැඩපහර යටිතල පහසුකම්වලට හානි සිදුකිරීමටත් බරපතළ ලෙස හායනයටත් හේතු විය හැකිය. මේ අංශයේ සිදුකළ සවිස්තරාත්මක අවදානම් ඇගැයුමකින්[42] වියහැකි අනාගත අවදානම් මට්ටම හා අවදානමට ලක්ව ඇති ප්‍රදේශ සහ වෙරළබඩ ප්‍රදේශයේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම්වලට ඇතිවන බලපෑම පිළිබඳ අධ්‍යයනය කරන ලදි. සංචාරක කර්මාන්තය, වෙරළබඩ කුඹුරු, පානීය ජලය සහ කළපුවල ධීවර කටයුතු මෙහිදී වැඩි වශයෙන් තර්ජනයට ලක් වේ. දේශගුණ විපර්යාසත් සමග මුහුදු මට්ටමේ ඉහළ යෑම වඩා බරපතළ වන විට ඇතිවන වෙරළ ඛාදනය හා ලවණතාවය නිසා වෙරළබඩ ප්‍රදේශවලින් ඈතට ප්‍රජාව සංක්‍රමණය විය හැකිය.

1998 එල් නිනෝ තත්වය අවස්ථාවේ දී මුහුදේ උෂ්ණත්වය ඉහළයෑමෙන් (සාමාන්‍ය මට්ටමට වඩා සෙල්සියස් අංශක 3-5) කොරල්පර විනාශ විය; වැලිපර සමුද්‍රීය අභයභූමිය (95%); හික්කඩුව සමුද්‍රීය අභයභූමිය (90%); වැලිගම (60%); සහ රූමස්සල (80%).[43] ඉහළ යන උෂ්ණත්වය සහ මුහුදු මට්ටම කඩොලාන සහිත අන්තර්-උදම් කලාපවලට සහ අනෙකුත් වෙරළබඩ ශාකවලට බලපානු ඇති අතර එම පරිසර පද්ධතිවලින් (කුණාටු සහ සැඩපහරට එරෙහිව) ලබදුන් ආරක්ෂාව ද වෙරළේ ප්‍රත්‍යස්ථතාවද ඉන් දුර්වල වනු ඇත.

**වෙරළබඩ සහ සමුද්‍රීය අංශයේ අනුහුරුවීම්:** වෙරළබඩ සහ සමුද්‍රීය අංශයේ අනුහුරුවීම් ප්‍රමුඛතා NDC හතරක් යටතේ සකස් කර ඇති අතර (5.1.6 වගුව) ඒවායින් ප්‍රධාන වශයෙන් ම දේශගුණ විපර්යාස සහ විචල්‍යතාව සඳහා ප්‍රතිචාර දැක්වීම සහ එය අධීක්ෂණය සඳහා තාක්ෂණික කුසලතා සහ පද්ධතීන් සංවර්ධනය ආවරණය කරයි. මුහුදු මට්ටමේ ඉහළ යෑම නිවැරදිව මනින පද්ධති ඇති කිරීම, අවදානම සහ අවදානම් සිතියම් යාවත්කාලීන කිරීම, වෙරළ සීමාව කළමනාකරණයට ගන්නා ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම සහ අවදානමට ලක්ව ඇති වෙරළබඩ ප්‍රදේශවල ස්වාභාවික වටිනාකමකින් යුත් සුවිශේෂී ස්ථාන සංරක්ෂණය මීට ඇතුළත් වේ. කඩොලාන ප්‍රතිස්ථාපනය කිරීම වැනි වෙරළ රේඛාව

37 ධීවර සංඛ්‍යාලේඛන 2019, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, 2019.

38 සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, 2018, ශ්‍රී ලංකාවේ සමුද්‍රීය පාරිසරික ආරක්ෂාව සඳහා වන ප්‍රතිපත්ති, උපායමාර්ග සහ ජාතික ක්‍රියාකාරී සැලැස්ම.

39 ලෝක බැංකුව, 2017. ශ්‍රී ලංකාව: වෙරළබඩ ස්වාභාවික ධනය, පරිසර හා ස්වාභාවික සම්පත් කළමනාකරණය ගෝලීය පරිචය, දකුණු ආසියානු කලාප මාලාව

40 සෞභාග්‍යයේ දැක්ම, මුදල් අමාත්‍යාංශය, 2019

41 දේශගුණික විපර්යාස 2014: සංස්ලේෂණ වාර්තාව, දේශගුණික විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය, 2014.

42 තෙවන UNFCCC ජාතික සන්නිවේදනය, දේශගුණික විපර්යාස ලේකම් කාර්යාලය, පරිසර අමාත්‍යාංශය, 2021.

43 ඉන්දියානු සාගරයේ කොරල් පර විනාශය පිළිබඳ 1998 කොරල් විරංජනයෙන් පසු ශ්‍රී ලංකාවේ කොරල් පරවල තත්වය (CORDIO): තත්ව වාර්තාව 2005. රාජසූරිය, ඒ. 2005.

කළමනාකරණය සඳහා වන සුමට විසඳුම්වලින් වනාන්තර අංශය යටතේ සම-ප්‍රතිලාභ ද ලැබෙන අතර ජෛව විවිධත්ව අංශයේ අනුහුරුවීමේ ප්‍රතිලාභ සඳහා ද දායක වේ.

*5.1.6 වගුව: වෙරළබඩ සහ සමුද්‍රීය අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව*

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | ඉලක්ක වර්ෂය |
|---|---|---|
| **NDC 1** | **මුහුදු මට්ටම ඉහළ යාම නිවැරදිව පුරෝකථනය කිරීමේ පද්ධතියක් ශ්‍රී ලංකාව සඳහා ස්ථාපිත කිරීම** | **2025** |
| | 1.1 ඓතිහාසික උදම් මට්ටම් දත්ත යොදගනිමින්, අවශ්‍යකරන දත්තසමුදාය සකසා ගැනීම | 2023 |
| | 1.2 වර්තමාන මධ්‍යන්‍ය මුහුදු මට්ටම (MSL) මැන වාර්තා කරගැනීම සහ මුහුදු මට්ටම ඉහළයාමේ (SLR) මිනුම් ඇගැයුම් කිරීම සහ ප්‍රකාශනය | 2025 |
| | 1.3 දැනට මුහුදු මට්ටම මැනීම සඳහා වන මැනුම් ස්ථානවලට අමතරව ශ්‍රී ලංකාවේ වෙරළතීරය ආවරණය වන සේ මිනුම් ස්ථාන ඇතිකළහැකි ස්ථාන හඳුනාගැනීම සහ ඒවා ස්ථාපිත කිරීම | 2023 |
| | 1.4 ගෝලීය යහපිළිවෙත් භාවිතා කරමින් ශ්‍රී ලංකාවට අදාළව SLR පුරෝකථන ඇස්තමේන්තු කිරීම | 2025 |
| **NDC 2** | **ශ්‍රී ලංකාවේ වෙරළබඩ තීරය සඳහා යාවත්කාලීන කළ අවදානමට ලක් විය හැකි බව සහ අවදානම් පිළිබඳ සිතියම් සුදනම් කිරීම** | **2026** |
| | 2.1 මුහුදු මට්ටම ඉහළයාම පිළිබඳ පුරෝකථන අනුව වෙරළබඩ ප්‍රදේශ ආවරණය වන අන්දමින් ජලගැල්ම සිතියම් යාවත්කාලීන කිරීම | 2023 |
| | 2.2 මුහුදු මට්ටම ඉහළයාමෙන් අවදානමට ලක්වන ප්‍රදේශ හඳුනාගැනීම | 2024 |
| | 2.3 වෙරළබඩ කලාපය සඳහා මී. 0.5 සමෝච්ච රේඛා අන්තර ඇතිව SLR බලපෑම් සහිත අවදානම් සිතියම් සුදනම් කිරීම සහ සුදුසු ක්‍රියාමාර්ග ගැනීම | 2025 |
| | 2.4 ඉහත 2.3 සිදුකරන සොයාගැනීම්, වෙරළබඩ සංවර්ධනයට පවතින බාධක යාවත්කාලීන කිරීමට යොදගැනීම | 2026 |
| **NDC 3** | **මුහුදු මට්ටම ඉහළ යාම නිසා වඩාත් අවදානමක් ඇති ප්‍රදේශවල වෙරළ ඛාදනය වැලැක්වීම සඳහා දැඩි සහ සුමට විසඳුම් සම්මිශ්‍රණයක් භාවිත කරමින් බලපෑමට ලක්වූ වෙරළ තීරය ආවරණය කිරීමට ප්‍රශස්ත වෙරළතීර කළමනාකරණ කටයුතු/ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම** | **2030** |
| | 3.1 මුහුදු රළ මිනුම් සහ අවසාදිත පරිවහන අධ්‍යයනය ඇතුළුව අවශ්‍යකරන දීර්ඝකාලීන දත්ත එකතුකිරීම සඳහා වැඩසටහන් ආරම්භ කිරීම | 2022 |
| | 3.2 ඛාදන කළමනාකරණ සැලසුම යාවත්කාලීන කිරීම | 2026 |
| | 3.3 වෙරළ ඛාදනය අධීක්ෂණය සඳහා (විශ්වවිද්‍යාල සහ අනෙකුත් පර්යේෂණ ආයතන සමග සහයෝගීතාවයෙන්) වැඩසටහන් ඇතිකිරීම සහ වෙරළ ඛාදන නැඹුරුතා හා තත්ත්වය, අවසාදිත ශේෂ පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණ සහ අවසාදිත ප්‍රභව පිළිබඳ ඇගැයුම, ඛාදනය හේතුවෙන් නිවාසවලට, ඉඩම් පරිහරණයට සහ වැදගත් වාසභූමිවලට ඇතිවන තර්ජනය, අගාධමිතික සහ ජලවිද්‍යාමය කොන්දේසි සම්බන්ධ තොරතුරු එකතු කිරීම. | 2030 |
| | 3.4 හෙක්ටාර 1000ක කඩොලාන ඇතුළු වෙරළබඩ පරිසර පද්ධති ප්‍රතිස්ථාපනය (මෙම ක්‍රියාමාර්ගය ජෛව විවිධත්ව අංශයේ NDC 1 හි 1.6 ක්‍රියාමාර්ගය හා සම්බන්ධ ය) | 2030 |
| **NDC 4** | **දේශගුණ විපර්යාසවල බලපෑම් සම්බන්ධයෙන් ප්‍රත්‍යස්ථතාව ගොඩනැංවීම සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබාදිය යුතු වෙරළබඩ සහ සමුද්‍රීය ස්වාභාවික ප්‍රදේශ හඳුනාගෙන ප්‍රකාශයට පත් කිරීම** | **2027** |
| | 4.1 ඉහළ ප්‍රමුඛතාවයෙන් යුත් ස්වභාවික ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට සුදුසු නිර්ණායක ලැයිස්තුවක් සුදනම් කර ඒවා සපුරාලන ස්ථාන ලැයිස්තුවක් සුදනම් කිරීම | 2025 |
| | 4.2 එම ඉහළ ප්‍රමුඛතාවයෙන් යුත් ස්වාභාවික ප්‍රදේශ අවශ්‍ය පරිදි ගැසට් නිවේදන හරහා ප්‍රකාශයට පත් කිරීම | 2027 |

### 5.1.5 සෞඛ්‍ය අංශය

ඇලෝපතික/බටහිර වෛද්‍ය විද්‍යාව ආයුර්වේද, සිද්ධ, යුනානි සහ හෝමියෝපති වැනි සාම්ප්‍රදායික ප්‍රතිකාර ක්‍රම සමගින් එක් කරන්නා වූ බහුවිධ සෞඛ්‍යසේවා පද්ධතියක් ශ්‍රී ලංකාවේ පවතියි. කෙසේනමුත්, සෞඛ්‍ය අංශයේ සිදුකළ ආයෝජන සහ වැඩිදියුණුකිරීම් බහුතරයක් මගින් බටහිර වෛද්‍ය ක්‍රමවේදය ව්‍යාප්තවීම සඳහා හේතු වී ඇති අතර සියලුම පුරවැසියන්ට නොමිලයේ සෞඛ්‍ය සේවාවන් ලබාගැනීමට හැකි වී තිබේ. නිදහසින් පසු අනුගමනය කළ උසස් සමාජ ප්‍රතිපත්ති හේතුවෙන් නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ජාතික සෞඛ්‍ය පද්ධතිය සැලකිය යුතු දියුණුවකින් යුක්තය. 2019 දී රටේ ජාතික සෞඛ්‍ය පද්ධතිය රජයේ රෝහල් 603කින් (සෑම පුද්ගලයින් 1000ක් සඳහාම ඇඳන් 3.6) සමන්විත වන අතර සෑම පුද්ගලයින් 1,203කටම එක් සුදුසුකම් ලත් වෛද්‍යවරයකු බැගින් ද සෑම පුද්ගලයින් 570ක් සඳහා එක් හෙද නිලධාරියකු බැගින් ද විය. තවද, ඇඳන් 4,485 සහ සුදුසුකම් ලත් ආයුර්වේද වෛද්‍යවරුන් 1,759ක් සහිත රජයේ ආයුර්වේද රෝහල් 105ක් පවතියි.[44] සෞඛ්‍යයට අදාළ සහස්‍ර සංවර්ධන අභිමථාර්ථ (MDG) සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව හොඳ කාර්යසාධනයක් පෙන්නුම් කළ අතර, මනාව ස්ථාපිත වූ සෞඛ්‍ය සේවා පද්ධතිය ඇසුරින්, 2015 වර්ෂය සඳහා නියම කළ ළමා මර්ත්‍යතාව, මාතෘ මර්ත්‍යතාව, ප්‍රජනන සෞඛ්‍ය, සහ මැලේරියා තුරන් කිරීමේ ඉලක්ක සපුරාගැනීමට ශ්‍රී ලංකාවට හැකි විය. ශ්‍රී ලංකාවේ ළදරු මර්ත්‍යතාවය සජීවී උපත් 100ක් සඳහා 7ක් වන අතර මාතෘ මර්ත්‍යතාව සජීවී උපත් 100,000ක් සඳහා 35ක් වේ. කෙසේනමුත්, ශ්‍රී ලංකාවේ ළමයින් සහ කාන්තාවන් අතර මන්දපෝෂණය හේතුවක් පැහැදිලි කළ නොහැකි ලෙස ඉහළ අගයක් ගන්නා අතර ඩෙංගු සහ මී උණ වැනි රෝග වාහකයින්ගෙන් බෝවන ලෙඩරෝග හේතුවෙන් වාර්ෂිකව ජීවිත බොහෝ ගණනක් මරණයට බිලි වේ. ගර්භණීභාවයේ මුල් සති 12 තුළ හෝ ඊට පෙර මවගේ ශරීර ස්කන්ධ දර්ශකය (BMI) පහළ අගයක් ගැනීම (15%), අළුත උපන් බිළිඳුන්ගේ උපත් බර අඩුවීම (12%කට ආසන්න ප්‍රමාණයක), ළදරුවන්ගේ (6.4%), අවුරුදු 1-2 අතර දරුවන්ගේ (12%), අවුරුදු 2-5 අතර දරුවන්ගේ (19%) බර අඩුවීම සැලකිල්ල යොමුකළයුතු ප්‍රධාන කරුණු වශයෙන් දැක්විය හැකිය.[45] ආහාර සුරක්ෂිතතාවය දේශගුණ විපර්යාස නිසා අවදානමට ලක්ව ඇති බැවින්, සෞඛ්‍ය අංශයේ සැලකිල්ල යොමුකළයුතු මෙම කරුණු කෙරෙහි අවධානය යොමුකිරීම තවදුරටත් අභියෝගයක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ජාතික ප්‍රතිපත්ති රාමුවෙන්, රටේ ජනතාවගේ සෞඛ්‍ය සම්පන්නබව අතිශයින්ම වැදගත්කොට සලකා ඇත. ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය පදනම් කරගනිමින් සියළු පුරවැසියන්ට සෞඛ්‍ය සේවාවන් ලබාදෙනු ඇති බව සඳහන් කරමින් එය තවදුරටත් විස්තර කර තිබේ. 2016-2025 ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියේ සහ 2016-2025 ජාතික සෞඛ්‍ය අංශයේ මහ සැලසුමේ මාර්ගෝපදේශකත්වය යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශය ක්‍රියාත්මක වේ.

**සෞඛ්‍ය අංශයේ දේශගුණ විපර්යාස බලපෑම්:** ගෝලීය සාමාන්‍ය උෂ්ණත්වයේ ඇතිවන ඕනෑම වැඩිවීමකින් මනුෂ්‍යයාගේ සෞඛ්‍යයට අහිතකර ප්‍රතිවිපාක ඇතිවන බව ප්‍රක්ෂේපණය කර තිබේ. උෂ්ණත්වය සම්බන්ධ ලෙඩරෝග සහ මර්ත්‍යතාවය, ඕසෝන් අඩුවීම සම්බන්ධ මර්ත්‍යතාව, සහ වාහකයින්ගෙන් බෝවන රෝග වැඩිවීමට ඇති අවදානම සංඛ්‍යාත්මකව සහ පැතිරීම අතින් වැඩිවීම යන සියල්ල සිදුවනු ඇතැයි සැලකිය යුතු විශ්වාසයකින් යුතුව පුරෝකථනය කර තිබේ. ගෝලීය සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 2කින් ඉහළ යෑමෙන් මන්දපෝෂණය සහ ජලයෙන් හා වාහකයින්ගෙන් බෝවන රෝග සැලකියයුතු මට්ටමකින් ඉහළ යනු ඇත.[46] දේශගුණ විපර්යාස හේතුවෙන් සෞඛ්‍ය අංශයේ වර්ධනය වනු ඇති ප්‍රධාන අවදානම් සාධක නම් අධික උෂ්ණත්වය හා බැඳුණු උෂ්ණත්ව ආතතිය, වාහකයින්ගෙන් බෝවන රෝග පරාසයන් (ඩෙංගු/බරවා) මුහුදු මට්ටමෙන් වඩාත් උස් ස්ථාන කරා සහ අනෙකුත් ප්‍රදේශ කරා සංක්‍රමණයවීම හෝ දැනට පාලනය කරගෙන ඇති (මැලේරියාව වැනි) වාහකයින්ගෙන් බෝවන රෝග නැවත මතුවීම, නිදන්ගත වකුගඩු රෝගය, උන සන්නිපාතය වැනි ජලයෙන් බෝවන රෝග, දේශගුණ විපර්යාස හේතුවෙන් ගංවතුර/නියගය/ජලයේ ගුණාත්මකබව දුර්වලවීම වැනි ආපදා ඇතිවන වාරගණන සහ ඒවායේ තීව්‍රතාවය වැඩිවීම නිසා ඇතිවන සෞඛය අවදානම් අතර වේ. පවතින පෝෂණ ගැටලු දේශගුණ විපර්යාස හේතුවෙන් තවත් උග්‍ර වියහැකි අතර දිගින් දිගටම ආපදාවලට නිරාවරණයවීමෙන් මනා පෝෂණයක් නොලැබීමටත් ආහාර සුරක්ෂිතතාවය නොමැතිකමින් නිදන්ගත මන්දපෝෂණය ඇතිවීමටත් ඉඩ වැඩි වේ. වායු දූෂ්‍යකාරක, ඉහළ උෂ්ණත්වය සහ ආර්ද්‍රතාවය හේතුවෙන් ශ්වසන ආබාධ තවත් උග්‍රවීමට හැකි ය.

**සෞඛ්‍ය අංශයේ අනුහුරුවීම:** සෞඛ්‍ය අංශයේ අනුහුරුවීමේ ඉලක්ක, ප්‍රතිපත්ති මට්ටමේ මුලපිරීම් ආවරණය කරමින් NDC හයක් යටතේ ඉදිරිපත් කර ඇති අතර (5.1.7 වගුව), ඉලක්කගත දේශගුණ ප්‍රත්‍යස්ථතා ක්‍රියාමාර්ග මුඛ්‍යප්‍රවාහගත කිරීම, දේශගුණ බලපෑම් හේතුවෙන් ඇතිවන සෞඛ්‍ය සහ රෝග තත්ත්වයන් කළමනාකරණය කිරීම සඳහා ධාරිතාවය වර්ධනය කිරීම, වායු දූෂණයෙන් ඇතිවන සෞඛ්‍ය බලපෑම් ආමන්ත්‍රණය කිරීම, සහ දේශගුණ බලපෑම් හේතුවෙන් ඇතිවන ආපදාවලින් ලෙඩරෝග සහ මර්ත්‍යතාව අඩුකරගැනීම ඊට ඇතුළත් වේ.

44 2019 වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව, 2019ග

45 සෞඛ්‍ය හා පෝෂණ අමාත්‍යාංශයේ පවුල් සෞඛ්‍ය කාර්යාංශ වෙබ් අඩවිය, https://fhb.health.gov.lk/index.php/en/statistics

46 IPCC වෙබ් අඩවියල https://www.ipcc.ch/reports/

*5.1.7 වගුව: සෞඛ්‍ය අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව*

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | ඉලක්ක වර්ෂය |
|---|---|---|
| **NDC 1** | **සෞඛ්‍ය අංශයේ දේශගුණ ප්‍රත්‍යස්ථතාවය වැඩිදියුණු කිරීම සඳහා වන ප්‍රතිපත්ති මුලපිරීම් ප්‍රවර්ධනය කිරීම සහ සම්බන්ධ සෑම අංශයකටම ඒකාබද්ධ කිරීම** | **2030** |
| | 1.1 ශ්‍රී ලංකාව සඳහා උණුසුම්-සෞඛ්‍ය ක්‍රියාකාරී සැලසුම (HHAP) සංවර්ධනය (2021) සහ ක්‍රියාත්මක කිරීම | 2030 |
| | 1.2 සෞඛ්‍යය, පරිසරය සහ දේශගුණ විපර්යාස සඳහා වන ජාතික ක්‍රමෝපායික සැලසුම (NHSPEC) සංවර්ධනය (2021) සහ ක්‍රියාත්මක කිරීම | 2030 |
| | 1.3 හරිත සහ සෞඛ්‍ය සම්පන්න රෝහල් (Green and Healthy Hospitals) ඇතිකිරීම සඳහා වන මාර්ගෝපදේශ සහ ප්‍රමිති සංවර්ධනය (2021) සහ ක්‍රියාත්මක කිරීම | 2030 |
| | 1.4 වායු දූෂණයෙන් ඇතිවන ලෙඩරෝග අඩුකරගැනීමට සෞඛ්‍ය ක්‍රියාකාරී සැලසුම සූදානම් කර (2022) ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම | 2030 |
| **NDC 2** | **දේශගුණ විපර්යාසවල සෘජු බලපෑමෙන් ඇතිවන බෝ නොවන රෝග සහ සෞඛ්‍ය තත්ත්වයන් කළමනාකරණය සඳහා ධාරිතාවය වැඩිදියුණු කිරීම** | **2024** |
| | 2.1 දේශගුණ විපර්යාස හේතුවෙන් උග්‍ර වනු ඇතැයි අපේක්ෂා කරන රෝග සහ සෞඛ්‍ය තත්ත්ව හඳුනා ගැනීම. | 2021 |
| | 2.2 සායනික හා වැළැක්වීමේ මාර්ගෝපදේශ ඇතුළුව ප්‍රමුඛතා රෝග සහ සෞඛ්‍ය තත්ත්ව සඳහා කළමනාකරණ මාර්ගෝපදේශ සකස් කිරීම. | 2024 |
| | 2.3 දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන රෝග හා සෞඛ්‍ය තත්ත්වවලට පිළියම් යෙදීම සඳහා මහජන සෞඛ්‍ය ධාරිතා වර්ධනය කිරීම. | 2024 |
| | 2.4 අවදානම් සහිත කාණ්ඩ/අවදානමට ලක්විය හැකි කණ්ඩායම් (වයස්ගත පුද්ගලයින්, පාසල් ළමුන්, අවදනමකට ලක්විය හැකි ශ්‍රමික කණ්ඩායම් සහ වෙනත් අවදානමට ලක්විය හැකි කාණ්ඩ) හඳුනා ගැනීම සහ දේශගුණ විපර්යාසයන් හේතුවෙන් ඇති වන හානි කළමනාකරණය කිරීමට මාර්ග සිතියමක් සකස් කිරීම. | 2024 |
| | 2.5 දේශගුණ විපර්යාස සහ සෞඛ්‍යමය බලපෑම් පිළිබඳ සාක්ෂි ජනනය කිරීම පිළිබඳ පර්යේෂණ ධාරිතාව ශක්තිමත් කිරීම. | 2022 |
| **NDC 3** | **දේශගුණ විපර්යාස හේතුවෙන් ඌනපෝෂණය හා මන්දපෝෂණය තවදුරටත් උග්‍රවීම කළමනාකරණය කරගැනීම** | **2023** |
| | 3.1 පෝෂණය හා සම්බන්ධ සෞඛ්‍ය ගැටලු අවම කිරීම සඳහා ආහාර සුලබතාව පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් ලබා ගැනීමට සහ විශ්ලේෂණය කිරීමට යාන්ත්‍රණයක් සකස් කිරීම. | 2023 |
| | 3.2 ආහාර අනාරක්ෂිතභාවයට ගොදුරු විය හැකි බවට හඳුනාගෙන ඇති සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (MOH) ප්‍රදේශවල දරිද්‍රතා රේඛාවට පහළින් සිටින පවුල්, වැඩිහිටියන්, ආබාධිත පුද්ගලයින් කිරි දෙන මව්වරුන් සහ කුඩා දරුවන් ඇතුළු අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ආවරණය කිරීම සඳහා සමාජ සුභසාධන ක්‍රම ශක්තිමත් කිරීම. | 2022 |
| | 3.3. පෝෂණය හා සම්බන්ධ ගැටලු හඳුනාගැනීමට සහ මැදිහත් වීමට මහජන සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීම. | 2023 |
| **NDC 4** | **වාහකයින්ගෙන් සහ මීයන්ගෙන් බෝවන, දේශගුණ සංවේදී රෝග (ඩෙංගු, මැලේරියාව, බරවා, ලිෂ්මේනියාව හා මී උණ) සම්බන්ධයෙන් ආවේක්ෂණය සහ කළමනාකරණය ශක්තිමත් කිරීම** | **2024** |
| | 4.1 වාහකයින්ගෙන් බෝවන රෝග නිරීක්ෂණ පද්ධතිය ඉහත රෝග සඳහා ශක්තිමත් කිරීම. | 2022 |
| | 4.2 වර්ෂාපතනය/ උෂ්ණත්ව පුරෝකථනය මත පදනම්ව, එක් එක් දේශගුණික සංවේදී වාහකයින්ගෙන් බෝවන රෝග සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාස (MOH) මට්ටමින් පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති සංවර්ධනය කිරීම. | 2023 |
| | 4.3 බෝවන රෝග වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා ඵලදායී මැදිහත් වීමක් මගින් මහජන සෞඛ්‍ය පද්ධතිය, පළාත් පාලන ආයතන සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ ධාරිතා වර්ධනය හරහා වසංගත ව්‍යාප්ත වීම වැළැක්වීම | 2024 |

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | ඉලක්ක වර්ෂය |
|---|---|---|
| | 4.4 රෝග ව්‍යාප්තිය සිදුවනු ඇතැයි පුරෝකථනය කරන ලද කාලවලදී, වාහකයින්ගෙන් බෝවන රෝග පාලනය පිළිබඳ මහජන සෞඛ්‍ය අවදානම් සන්නිවේදනය ශක්තිමත් කිරීම | 2024 |
| | 4.5 මහජන සෞඛ්‍ය, පළාත් පාලන ආයතන සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධීකරණය සඳහා නිරීක්ෂණ පද්ධතියට අන්තර් ආංශික සම්බන්ධීකරණය හා තොරතුරු පද්ධතිය සම්බන්ධ කිරීම. | 2024 |
| **NDC 5** | **ආන්තික කාලගුණික/දේශගුණික සිදුවීම් (ගංවතුර, නියඟය, නායයෑම් සහ දේශගුණ විපර්යාස සම්බන්ධ අනෙකුත් සිදුවීම්) හේතුවෙන් ඇතිවන රෝගාබාධ හා මර්තයතාව කිරීම** | **2023** |
| | 5.1 සිදුවිය හැකි ආන්තික සිදුවීම් හෝ වර්ෂාපතන විචලයතා පිළිබඳව කාලෝචිත හා නිවැරදි පූර්ව අනතුරු ඇඟවීම් සෞඛ්‍ය අංශයට ලැබීම සහ බෙදා හැරීම ශක්තිමත් කිරීම සහ ඒවා ජාතික, කලාපීය, MOH සහ ගම් මට්ටමේ මැදිහත්වීම් සමඟ සම්බන්ධ කිරීම. | 2022 |
| | 5.2 දේශගුණික විපර්යාස හේතුවෙන් ඇතිවන උපද්‍රව ඇතුළුව, සෞඛ්‍ය අංශය සඳහා වන සියලු උපද්‍රව සඳහා අවදානම් තක්සේරු කිරීම. | 2022 |
| | 5.3 රෝග නිවාරණ හා වැළැක්වීමේ අංශයන්හි දේශගුණ විපර්යාස ඇතුළු සියලු උපද්‍රව සඳහා ජාතික, උප ජාතික, MOH සහ ගම් මට්ටමින් වන සෞඛ්‍ය සූදානම වැඩි දියුණු කිරීම. | 2023 |
| | 5.4. දේශගුණික විපර්යාසවල සෞඛ්‍යමය බලපෑම් පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම සහ ආසන්න ආපදා අවදානම්වලට පිළියම් යෙදිය යුතු ආකාරය පිළිබඳ සාම්ප්‍රදායික, විද්‍යුත් හා සමාජ මාධ්‍ය හරහා සැලසුම් කර ප්‍රචාරය කිරීම. | 2023 |

### 5.1.8 නාගරික සැලසුම්කරණ සහ මානව ජනාවාස අංශය

ශ්‍රී ලංකාවේ නාගරික ජනගහනය 18.7% වන අතර 2030 වනවිට එය 21% දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.[47] ඉහත වර්ගීකරණය සිදුකර ඇත්තේ නගරසභා සහ මහනගරසභා යටතේ ආවරණය වන ප්‍රදේශ පමණක් නාගරික ප්‍රදේශ වශයෙන් සලකන, දැනට පවතින නිර්වචනය පදනම් කරගෙනය. සැබෑ නාගරික ජනගහනය ඊට වඩා ඉහළ බව සැලකේ. රටපුරා නාගරීකරණය ව්‍යාප්ත වන බව පැහැදිලිව පෙනෙන්නට ඇති අතර ඒ නිසා සේවා සඳහා ඉල්ලුම ඉහළ යාම, තදබදය වැඩිවීම, ආපදා සම්බන්ධ බලපෑම්, සෞඛ්‍ය අවදානම්, අනුචිත නිවාස, නාගරික තාප කලාප සහ නාගරික දුගී ජනතාවගේ ජීවන තත්ත්වය පහළ පැවතීම වැනි බොහෝ ගැටලුවලට තුඩු දී තිබේ.

සෑම ප්‍රදේශයකටම සමානව සේවා සහ යටිතල පහසුකම් සපයාදීම තුළින් නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශ අතර පරතරය නැතිකිරීම පිළිබඳව රජයේ නව ප්‍රතිපත්ති ප්‍රකාශයේ අවධාරණය කර තිබේ.[48] නිර්-නාගරීකකරණය (de-urbanization) සඳහා 'කෘෂි කාර්මීකරණය' (agro-industrialization) සංකල්පය ඇතිකිරීමට යෝජනා කර ඇති අතර, රජය යටිතල පහසුකම් හා සේවාවල ඇති වෙනස යා කිරීමට ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කරයි. මේ අංශයේ ප්‍රතිපත්ති සම්පාදනය කරන්නේ නිවාස සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයයි. ජාතික භෞතික සැලසුම්කරණ ප්‍රතිපත්තිය සහ ජාතික භෞතික සැලසුම 2017-2030 මගින් අවකාශයීය සැලසුම්කරණය සඳහා පොදු රාමුවක් සහ මාර්ගෝපදේශ සපයාදෙයි. 2007 අංක 36 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ සැලසුම්කරණ සහ ගොඩනැගිලි රෙගුලාසි හරහා නාගරික සැලසුම්කරණය සඳහා නාගරික සංවර්ධනය අධිකාරියට බලවරම් ලබා දී තිබේ.

**නාගරික අංශයේ දේශගුණ විපර්යාසඃ** දේශගුණ තර්ජන තවදුරටත් උග්‍රවනවිට, කෘෂිකර්මාන්තය මත යැපෙන ප්‍රජාව අතර බැහැරට සංක්‍රමණයවීම තවදුරටත් වැඩිවනු ඇති අතර, ලෝකයේ නගර තවදුරටත් වේගයෙන් වැඩෙනු ඇත. නාගරික කේන්ද්‍රස්ථානවල සැලසුම් නොකළ, අඩුවියදම්, සහ බොහෝ අවදානමට ලක් විය හැකි ජනාවාස ව්‍යාප්තවීමට මෙය හේතුවිය හැකිය.[49]

මානව ජනාවාසවලට දේශගුණ විපර්යාසවලින් ඇතිවන පැහැදිලි සහ හඳුනාගතහැකි තර්ජන දෙකක් ඇත. උෂ්ණත්වය වැඩිවීමත් සමගින් රටපුරා නාගරික/අර්ධ නාගරික ප්‍රදේශවල වාසයට නුසුදුසු තත්ත්වයන් නිර්මාණය කරනු ඇත. නාගරික උණුසුම් කලාප, නගරවල තාප ප්‍රවාහවල බලපෑම තවත් වැඩි කරනු ඇත. දහවල සහ රාත්‍රියේ උෂ්ණත්වය වැඩිවීමත් සමග සිසිලනය සඳහා භාවිතාකරණ බලශක්ති ප්‍රමාණය මත බලපෑමක් ඇතිවනු ඇත. වියළි කලාපයේ, ඉහළ උෂ්ණත්වය, ඉහළ වාෂ්පීකරණ අනුපාතය සහ වඩාත් දීර්ඝ වියළි කාලසීමා ඇතිවීමත් සමගින් ජල හිඟය උග්‍ර වනු ඇත. නුවරඑළිය සහ බදුල්ල වැනි ඉහළ ජලාධාරවල පිහිටා ඇති නගරවල ද නියගය හේතුවෙන් ඇතිවූ ජල හිඟය දකින්නට හැකි ය. තෙත් කලාපයේ ව්‍යාප්ත වෙමින් පවතින විශාල නාගරික ප්‍රදේශ ද, නගරයේ ව්‍යාප්තිය සමගින් ඇතිවන ඉල්ලුම වැඩිවනවිට මේ හා සමාන අභියෝගවලට මුහුණ දෙනු ඇත.

මානව ජනාවාස මුහුණ දෙන, දේශගුණය හා බැඳුනු දෙවන අවදානම නම්, ගංවතුර, නියගය සහ නායයෑම් වැනි කාලගුණය සම්බන්ධ ආපදා සිදුවන වාරගණන වැඩිවීමයි.[50] තෙත් කළාපයේ වර්ෂාපතන විෂමතා නිසා ගංවතුර අවදානම සහිත රටේ නිරිතදිග පිහිටා ඇති නගරවල ගංවතුර අවදානම තවත් වැඩිවනු ඇතැයි දැනටමත් පෙන්නුම් කරයි. කඳුකරයේ වතු කම්කරුවන්ගේ නිවාස නායයෑමේ අවදානමට විශේෂයෙන් ලක්ව ඇති අතර නිවාසවල තත්ත්වය බෙහෙවින් දුර්වලවීම හෝ ඔවුන්ගේ ආර්ථික තත්ත්වය දුර්වලවීම හේතුවෙන් ඔවුන් වඩාත් ඉහළ අවදානනමක පසුවේ. ශ්‍රී ලංකාවේ වෙරළබඩ කලාපය, විශේෂයෙන් බස්නාහිර/දකුණු පලාත්, බෙහෙවින් ජනාකීර්ණ ය. දේශගුණ විපර්යාස හා බැඳුනු අනෙකුත් ගැටලු අතර, වෙරළබඩ ප්‍රදේශවල පානීය ජල යෝජනාක්‍රම මුහුදු මට්ටම ඉහළයෑමට සහ ලවණතාවය මුසුවීම නිසා ඉහළ අවදානමකට ලක් වීම දැක්විය හැකිය.

**නාගරික සැලසුම්කරණ සහ මානව ජනාවාස අංශයේ අනුහුරුවීම්:** මෙහි ලා NDC හතරක් යටතේ (5.1.8 වගුව) අනුහුරුවීමේ ක්‍රියාමාර්ග සංවිධානය කර තිබේ. සැලසුම් වැඩිදියුණු කිරීමට ඇති අවශ්‍යතාවය, ආපදා අවදානම් අඩුකිරීම සහ අනාගත දේශගුණ අවදානම් ඒකාබද්ධ කිරීම, ඉදිකළ් පරිසරයන්හි දේශගුණ ප්‍රත්‍යස්ථතාව වැඩිදියුණු කිරීම සහ සෙමෙන් ඇතිවන දේශගුණ විපර්යාස සිදුවීම්වල බලපෑම අවමකිරීම ඒවායින් පිළිබිඹු වේ.

47 UN HABITAT, 2020, ලෝක නගර වාර්තාව 2020: තිරසාර නාගරීකරණයේ වටිනාකම

48 සෞභාග්‍යයේ දැක්ම, මුදල් අමාත්‍යාංශය, 2019

49 IPCC fjí wvúh, https://www.ipcc.ch/reports/

50 පරිසර අමාත්‍යාංශය, ශ්‍රී ලංකාවේ තුන්වන ජාතික සන්නිවේදනය, 2021

*5.1.8 වගුව: නාගරික සැලසුම් සහ මානව ජනාවාස අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව*

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | ඉලක්ක වර්ෂය |
|---|---|---|
| **NDC 1** | **ජාතික, උප ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ භෞතික සැලසුම් තුළට දේශගුණ විපර්යාස සඳහා අනුහුරු වීමේ ක්‍රියා මාර්ග මුඛ්‍යප්‍රවාහගත කිරීම හරහා මානව ජනාවාසවල සහ යටිතල පහසුකම්වල ප්‍රත්‍යස්ථතාව වැඩි දියුණු කිරීම** | **2025** |
| | 1.1 බොහෝ වර්තමාන දේශගුණ විපර්යාස අවදානම් සහ අන්තරාය සෑම මට්ටමකදීම භෞතික සැලසුම් තුළට ඒකාබද්ධ කිරීම | 2022 |
| | 1.2 දේශගුණ අවදානම් සහ අන්තරාය සම්බන්ධයෙන් ජාතික භෞතික සැලසුමේ (NPP) නිර්දේශ සැලකිල්ලට ගනිමින් උප ජාතික මට්ටමේ සහ ප්‍රාදේශීය මට්ටමේ සැලසුම් සම්පාදනය කිරීම | 2025 |
| | 1.3 සියලුම නාගරික යටිතල පහසුකම් ව්‍යාපෘති සහ වැඩසටහන්වලදී NPP සහ නාගරික සංවර්ධන අධිකාරී විසින් නිර්දේශිත මාර්ගෝපදේශ අනුගමනය කිරීම | 2022 |
| | 1.4 දේශගුණ ප්‍රත්‍යස්ථතාව ගොඩනැංවීම සඳහා ආපදා අවදානම් ඒකාබද්ධ කළ නාගරික කලාප වෙන්කිරීම, වන උද්‍යාන, භූගත ජලය වැඩිකිරීම, වායු පැසේජ/ සුළං කොරිඩෝ, තෙත්බිම් බුද්ධිමත් ලෙස පරිහරණය සහ මාර්ග දෙපස රුක් රෝපණය වැනි අනුහුරු වීමේ ක්‍රියා මාර්ග හඳුන්වාදීම | 2023 |
| | 1.5 දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලයෙන් සකස් කරන ලද දේශගුණ විපර්යාස සඳහා ප්‍රත්‍යස්ථ මානව ජනාවාස සහ යටිතල පහසුකම් සඳහා වන මාර්ගෝපදේශය ඒකාබද්ධ කිරීම සහ ඊට අනුකූලව කටයුතු කිරීම | 2022 |
| **NDC 2** | **දේශගුණ විපර්යාසයට ලක්වීමට ඉහළ අවදනමක් ඇති ප්‍රදේශවල ආපද අවදනම් අඩුකිරීමේ යාන්ත්‍රණ සහ නාගරික සහ මානව ජනාවාස සැලසුම්කරණය/ ක්‍රියාත්මක කිරීම ඒකාබද්ධ කිරීම** | **2025** |
| | 2.1 නාගරික සහ මානව ජනාවාස සැලසුම් සඳහා දේශගුණ විපර්යාසවලින් බලපෑමට ලක් වූ ආපද අවදනම් කළමනාකරණය (DRM) සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම | 2022 |
| | 2.2 අපධාව පද්ධති/කානු පද්ධති සහ ගංවතුර කෙරෙහි නිසි අවධානය ලබාදෙමින් යටිතලපහසුකම් සැලසුම්කිරීම සහ නඩත්තු කිරීම | 2024 |
| | 2.3 කඳුකර ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේදී බෑවුම්වල ස්ථායිතාවය සහ පස සංරක්ෂණය ඊට ඒකාබද්ධ කිරීම | 2023 |
| | 2.4 මානව ජනාවාසවලට සහ යටිතලපහසුකම්වලට ඇති නායයෑම්/ගංවතුර අවදනම තක්සේරු කිරීම සහ අධි අවදනම් ප්‍රදේශවල අවදනමට ලක් විය හැකිබව අඩුකිරීමට ක්‍රියාමාර්ග ගැනීම | 2025 |
| | 2.5 මානව ජනාවාසලවලට ඇති නියග අවදනම් තක්සේරු කිරීම සහ අධි අවදනම් ප්‍රදේශවල අවදනම අඩුකිරීමට ක්‍රියාමාර්ග ගැනීම | 2025 |
| **NDC 3** | **දේශගුණ ප්‍රත්‍යස්ථ නිර්මිත පරිසර ඇතිකිරීම** | **2030** |
| | 3.1 අදාළවන පාර්ශ්වකාර ආයතන විසින් ක්‍රියාත්මක කරන, නිර්මිත පරිසර උපායමාර්ගවලට දේශගුණ අවදනම් ප්‍රක්ෂේපණ ඒකාබද්ධ කිරීම | 2022 |
| | 3.2 මතුවෙමින් පවතින දේශගුණ අවදනම් ආමන්ත්‍රණය කිරීම සඳහා දේශගුණ ප්‍රත්‍යස්ථ සැලසුම් ක්‍රමෝපායන් සමාලෝචනය සහ යාවත්කාලීන කිරීම | 2022 |
| | 3.3 දැනට පවතින මානව ජනාවාස සැලසුම්, ඉහත 3.2 හි දේශගුණ ප්‍රත්‍යස්ථ ක්‍රමෝපායයන් ඒකාබද්ධ කරමින් සංශෝධනය සහ ගැසට් කිරීම | 2023 |
| | 3.4 දේශගුණ විපර්යාසයෙන් දැඩි ලෙස අවදනමට ලක්ව ඇති ප්‍රදේශවල නිර්මිත පරිසර නිර්මාණය කිරීම වැලැක්වීම සඳහා, දැනට පවතින නීති සහ රෙගුලාසි සමාලෝචනය, යාවත්කාලීන කිරීම සහ බලාත්මක කිරීම | 2025 |
| | 3.5 ගෘහ නිර්මාණශිල්පය සහ ඉංජිනේරු විෂයමාලාවලට තිරසර නිර්මිත පරිසර ඇතුළත් කිරීම | 2024 |
| | 3.6 අධික දේශගුණ අවදනමක් සහිත පුද්ගලයින් සිටින ප්‍රදේශවලට ගැලපෙන තට්ටු නිවාස විසඳුම් ප්‍රවර්ධනය කිරීම | 2030 |
| **NDC 4** | **වෙරළබඩ ජනාවාසවලට සහ යටිතල පහසුකම්වලට සෙමෙන් ඇතිවන සිදුවීම් (මුහුදු මට්ටම ඉහළ යාම) හරහා ඇතිව වන බලපෑම අවම කිරීම** | **2030** |
| | 4.1 අනාගතයේ මුහුදු මට්ටම ඉහළයාම පිළිබඳව සැලකිලිමත් වෙමින් වෙරලබඩ ජනාවාස සහ ඒ හා බැඳුණු යටිතල පහසුකම් සැලසුම් කිරීම් | 2025 |
| | 4.2 නාගරික ජන ඝනත්වය ඉහළයාම රට අභ්‍යන්තරයට දෙසට යොමුකිරීම සඳහා පහසුකම් සැලසීමට මුහුදු මට්ටම ඉහළ යාමෙන් ආරක්ෂිත ප්‍රදේශ වෙන් කර හඳුනාගැනීම | 2030 |
| | 4.3 දැනට පවතින යටිතල පහසුකම් සහ ජනාවාස සඳහා අවදානම් කළමනාකරණ සැලසුම් සුදානම් කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම | 2025 |

### 5.1.9 සංචාරක සහ විනෝදස්වාද අංශය

2019 දී ශ්‍රී ලංකාවට තෙවන විශාලතම විදේශ විනිමය ප්‍රමාණය ගෙන ආවේ සංචාරක කර්මාන්ත අංශයෙනි. මෙම අංශයෙන් රටට උපයාදෙන විදේශ විනිමය දයකත්වය 2014 දී ඇ. ඩො. බිලියන 2.4 සිට 2018 දී ඇ.ඩො. බිලියන 4.3 දක්වා දෙගුණයකට ආසන්න ප්‍රමාණයකින් වැඩි වී තිබේ. මේ කාලය තුළ සංචාරකයින් සංඛ්‍යාව මිලියන 1.5 සිට මිලියන 2.3 දක්වා වර්ධනය වී තිබේ. ඍජුව පුද්ගලයින් 250,000ක් ද වක්‍රාකාරයෙන් මිලියන 2ක් දක්වාද පුද්ගලයින් සංඛ්‍යාවක් මේ අංශයේ සේවයේ නියුක්තව ඇතැයි ශ්‍රී ලංකාවේ සංචාරක සංවර්ධන අධිකාරිය ඇස්තමේන්තු කර තිබේ.[51] 2019 පාස්කු ඉරිදා ප්‍රහාරය හේතුවෙන් සහ COVID-19 වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය බරපතළ පසුබෑමකට සඳහා මුහුණ දුන්නේය. සංචරණය හා බැඳුනු ව්‍යාපාර/යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීම සහ සංචාරක කර්මාන්තය රටේ ඉහළම විදේශ විනිමය උපයන්නා බවට පත් කිරීමට රජය සතු දැක්ම මෙම වත්මන් අර්බුදයෙන් මිදී හිස එසවීමට මෙම කර්මාන්තයට උපකාරී වනු ඇත. කෙසේනමුත්, COVID-19 තත්ත්වයෙන් පසු සංචාරක කර්මාන්තය තුළ, උෂ්ණත්වය ඉහළ යෑම වීම, මුහුදු මට්ටම ඉහළ යාම සහ ස්වාභාවික ආපදා වැඩිවීම වැනි දේශගුණ අවදනම් කෙරෙහි අවධානය යොමුකළ යුතු වේ.

වර්තමාන ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ විදේශ විනිමය උපයාගැනීම සඳහා සංචාරක කර්මාන්තය ඉතා වැදගත් සේවා අංශයක් ලෙස හඳුනාගෙන ඇති අතර, එම අංශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 10 ක වාර්ෂික විදේශ විනිමය ඉපැයීම් අපේක්ෂා කෙරේ. වර්ධනය වන සෞඛ්‍ය සංචාරක උප අංශයට සහ ප්‍රජා පාදක සංචාරක ව්‍යාපාරයට පහසුකම් සැලසීමේ හැකියාව එහි තවදුරටත් අවධාරණය කරයි. ජාත්‍යන්තර සංචාරක වෙළෙඳපොළ තුළ ශ්‍රී ලංකාවේ උපායමාර්ගික ස්ථානගත කිරීම සපයනු ලබන්නේ සංචරණ උපායමාර්ගික සැලැස්ම 2017-2020 (දැනට යාවත්කාලීන වෙමින් පවතී) සහ සංවර්ධනය වෙමින් පවතින නව සංචාරක ප්‍රතිපත්තිය මගිනි. ශ්‍රී ලංකාවේ මීළඟ පස් අවුරුදු සංචරණ උපායමාර්ගික සැලැස්ම හා ප්‍රතිපත්ති රාමුවෙහි යථා තත්ත්වයට පත් කිරීම සඳහා වන ජනතාව පළමුවට ශ්‍රී ලංකාවේ වඩාත් ප්‍රත්‍යස්ථ සංචරණ අංශයක් ගොඩනැගීම (Putting People First: Building a More Resilient Tourism Sector in Sri Lanka) මාර්ග සිතියමේ දක්වා ඇති මාර්ගෝපදේශ සහ සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සම්පාදිත සංචාරක කර්මාන්ත උපායමාර්ගික ක්‍රියාකාරී සැලසුම (2020-2022) ඇතුළත් වේ.

**සංචාරක කර්මාන්තයේ දේශගුණ අවදනම්:** ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම දැනටමත් සංචාරක ව්‍යාපාරයට බලපා ඇති අතර, 1.5°C ට වඩා අඩු උෂ්ණත්වය වැඩිවීමක අවදානම යටතේ පවා හිරු හා වෙරළ මත පදනම් වන ඍතුමය සංචාරක ව්‍යාපාරයට බලපෑම් ඇති කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආන්තික උණුසුම් තත්ත්ව, කුණාටු, මුහුදු වෙරළ අහිමිවීම සහ කොරල්පර සම්පත් පිරිහීම හේතුවෙන් නිවර්තන සහ උප නිවර්තන කලාපීය ප්‍රදේශවල සංචාරක කටයුතු සඳහා ඇති අවදානම ඉහළ යනු ඇත.[52]

ශ්‍රී ලංකාවේ සංචාරක ගමනාන්තවලින් බහුතරයක් (ආසන්න වශයෙන් 60%) මුහුදු මට්ටමේ සිට මීටර 2 ට වඩා අඩු උන්නතාංශයක් ඇති වෙරළබඩ ප්‍රදේශවල පිහිටා ඇත. මීට අමතරව, සංචාරක කර්මාන්තය රඳා පවතින ස්වාභාවික සම්පත් පදනමට - එනම් අභ්‍යන්තර ජලාශ, ගංගා, කඳු, වනාන්තර, කොරල් පර ඇතුළු සාගර ජෛව විවිධත්වයට - දේශගුණික විපර්යාසවල බලපෑම සැලකිය යුතු වන අතර හා දැනටමත් දැකගත හැකි වේ. දිගු නියඟය වනජීවී උද්‍යාන සහ වන රක්ෂිතවල සංචාරය කිරීමට බලපානු ඇත. මේ අතර ඉහළ උෂ්ණත්වය සහ තාප ආතතිය හේතුවෙන් මෙම අංශයේ අවදානමට ලක් විය හැකිබව තවදුරටත් ඉහළ යා හැකිය. තවද, වියළි ගමනාන්තවල (උතුරු, වයඹ සහ නැගෙනහිර පළාත්) සංචාරක ආයතන සඳහා ජල අවශ්‍යතා සපුරාලීම වඩ වඩාත් අභියෝගාත්මක වනු ඇත. ගංවතුර (කළුතර, රත්නපුර, කෑගල්ල, මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්ක) සහ නායයෑම් (නුවරඑළිය, රත්නපුර, මහනුවර, මාතලේ, බදුල්ල දිස්ත්‍රික්ක) වැනි ආපදාවන්ට එරෙහිව සංචාරක ආයතනවලට ඉහළ රක්ෂණ පිරිවැයක් දැරීමට සිදුවේ. එබැවින්, මෙම අංශය සඳහා වන NDC මගින් අපේක්ෂිත වෙනස්කම්වලට මෙම අංශයේ ප්‍රත්‍යස්ථතාව ගොඩනැගීම පිළිබඳව අවධානය යොමු කරයි.

**සංචාරක අංශයේ අනුහුරුවීම්:** තිරසර සංචාරක පිළිවෙත්, ආංශික අවදනම අඩුකිරීම සහ හරිත ගොඩනැගිලි සංකල්පය යටතේ අංශයේ ප්‍රත්‍යස්ථතාව ගොඩනැංවීම යන NDC තුන ආවරණය වන සේ (5.1.9 වගුව) සංචාරක අංශයේ අනුහුරුවීමේ ඉලක්ක ඉදිරිපත් කර තිබේ. සංචාරක කර්මාන්තය සඳහා NDC සඳහා හරිත ගොඩනැගිලි සංකල්පය, බලශක්ති කාර්යක්ෂමතාව හා භූදර්ශනය සම්බන්ධ ක්‍රියාකාරකම් ඉලක්ක ඇතුළත් වන අතර, එමගින් හරිතාගාර වායු විමෝචන අඩුකරගැනීමෙන් අවමකිරීමේ සම-ප්‍රතිලාභ සඳහා මෙම අංශයෙන් ලබාදෙන අතර, ඒවා 4වන පරිච්ඡේදයේ NDC වල අවමකිරීමේ කොටසේ සලකා බලා නැත.

51 වාර්ෂික සංඛ්‍යාලේඛන වාර්තාව, 2019, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, 2019.

52 IPCC වෙබ් අඩවිය, https://www.ipcc.ch/reports/

*5.1.9 වගුව: සංචාරක අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව*

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | ඉලක්ක වර්ෂය |
|---|---|---|
| **NDC 1** | **වැඩිවශයෙන් දේශගුණික විපර්යාසවලට ලක්විය හැකි ගමනාන්තවල තිරසර සංචාරක පිළිවෙත් සහ අවදානම් සූදානම වැඩි දියුණු කිරීම තුළින් ප්‍රත්‍යස්ථතාව ගොඩනැංවීම** | **2025** |
| | 1.1 ධාරිතා අධ්‍යයන සිදුකිරීම සහ සංචාරක පහසුකම් හඳුනාගැනීම ඔස්සේ, දේශගුණ විපර්යාස නිසා අවදානමට ලක්ව ඇති ප්‍රදේශවල සංචාරක කර්මාන්තයට දේශගුණ විපර්යාසවලින් ඇතිවන බලපෑම අධ්‍යයනය කිරීම | 2022 |
| | 1.2 ඉහත කී ප්‍රදේශවල අනුහුරුවීමේ ක්‍රියාමාර්ග හඳුනාගැනීම සහ ප්‍රවර්ධනය කිරීම | |
| | 1.3 අවදානමට ලක්ව ඇති හඳුනාගත් ගමනාන්ත වෙනුවට විකල්ප වශයෙන් විවිධාංගීකරණය කළ සංචාරක ආකර්ෂණ සහ නිෂ්පාදන (උදා: සංස්කෘතිකමය, ත්‍රාසජනක, ජීවන රටා, උත්සව සහ සමුද්‍රීය සංචාරක කර්මාන්ත) වෙනුවෙන් උද්දේශනය කිරීම | 2025 |
| | 1.4 විවිධ පාර්ශ්වකරුවන්ට අදාළ වන තිරසර සංචාරක පිළිවෙත් සඳහා මාර්ගෝපදේශ/ මූලධර්ම ඇතුළත් කිරීම | 2025 |
| | 1.5 ගෝලීය තිරසර සංචරණ සභාව (GSTC) සමග සහයෝග යෙන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) විසින් ජාතික තිරසර සංචරණ සහතිකකරණ යෝජනාක්‍රමය යටතේ සහතික ලත් ආයතන සහ ගමනාන්ත සංඛ්‍යාව වැඩිකිරීම | 2025 |
| **NDC 2** | **සංචාරක කර්මාන්තයට බලපාන, දේශගුණ විපර්යාසවලින් ඇතිවන ආපදා සම්බන්ධ අවදානම අඩුකරගැනීමේ සහ අවදානම් පැවරීමේ යාන්ත්‍රණ හඳුන්වාදීම** | **2025** |
| | 2.1 වඩාත් අවදානමට ලක්ව ඇති සංචාරක ගමනාන්තවල පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති ශක්තිමත් කිරීම සහ ධාරිතා වර්ධනය කිරීම | 2024 |
| | 2.2 වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව (CCD) හා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය (MEPA) සමග එක්ව, අතිශය වැදගත් ප්‍රදේශවල වෙරළ පුනරුත්ථාපනය සහ ආරක්ෂණය සඳහා ක්‍රියාමාර්ග ගැනීම | 2025 |
| | 2.3 වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවල නාගරික සංවර්ධන අධිකාරිය සහ SLTDA සමග, සියලුම අවදානමට ලක්ව ඇති වෙරළබඩ ප්‍රදේශ ආවරණය වන අන්දමින් වෙරළබඩ සංචාරක කර්මාන්ත කලාපීය සැලසුම් සම්පාදනය ව්‍යාප්ත කිරීම | 2025 |
| | 2.4 සංචාරක කර්මාන්තයේ අවදානම් කළමනාකරණය සඳහා දේශගුණ ඇතුළත් රක්ෂණ යෝජනාක්‍රම සම්පාදනය කිරීම | 2025 |
| **NDC 3** | **සියලුම නව ඉදිකිරීම් සහ නැවත සකස්කිරීම් සඳහා හරිත ගොඩනැගිලි සැලසුම් හඳුන්වාදීම හරහා සංචාරක කර්මාන්තයේ දේශගුණ ප්‍රත්‍යස්ථතාව ප්‍රවර්ධනය කිරීම** | **2024** |
| | 3.1 දේශගුණ විපර්යාස සහ පාරිසරික පැතිකඩ ඇතුළත් කරගැනීම සඳහා, දැනට සංචාරක කර්මාන්තය සඳහා පවතින හරිත ගොඩනැගිලි මාර්ගෝපදේශ (GBG) සමාලෝචනය සහ යාවත්කාලීන කිරීම | 2022 |
| | 3.2 සංචාරක කර්මාන්තය සඳහාම විශේෂිත GBG නීත්‍යානුකූල කිරීම | 2023 |
| | 3.3 සංචාරක කර්මාන්තයේ සිදුකෙරෙන සියලුම නව ඉදිකිරීම් සහ නැවත සකස්කිරීම් සඳහා ඉහත කී මාර්ගෝපදේශ බලාත්මක කිරීම | 2024 |
| | 3.4 සංචාරක කර්මාන්තය සම්බන්ධ ගොඩනැගිලි සැලසුම්කිරීමට වගකියන ගෘහනිර්මාණ ශිල්පීන්ට සහ ඉංජිනේරුවන්ට සංචාරක කර්මාන්තයේ දී හරිත ගොඩනැගිලි නීති සංග්‍රහ අනුගමනය කිරීම සඳහා ඔවුන්ගේ වෘත්තීමය සංගම් හරහා පවත්වන වැඩසටහන් සඳහා මුලපිරීම | 2022 |
| | 3.5 අදාළ පළාත්පාලන ආයතනවල සැලසුම්කරණ කමිටු අතරේ මෙම සංචාරක කර්මාන්තය සඳහා වන හරිත ගොඩනැගිලි නීති සංග්‍රහය බෙදාහැරීම | 2023 |

# 6 පරිච්ඡේදය

## අලාභ සහ හානි ජාතිකව නිර්ණය කළ දායකත්ව

### හැඳින්වීම

දේශගුණය සම්බන්ධ උපද්‍රව ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධනයට සැලකිය යුතු තර්ජනයක් එල්ල කරයි. 2017 වසරේ ආන්තික කාලගුණික සිදුවීම්වලින් වැඩියෙන් ම බලපෑමට ලක් වූ රටවල් අතරින් දෙවැනි ස්ථානය ශ්‍රී ලංකාවට හිමිවන බවත්, 2018 වසරේ වඩාත්ම බලපෑමට ලක්වූ රටවල් 10 අතරට ශ්‍රී ලංකාව අයත්වන බවත් 2019 ගෝලීය දේශගුණ අවදානම් දර්ශක වාර්තාවේ (Global Climate Risk Index Report) දක්වා ඇත.[53] 2011 සහ 2016 ඇති වූ බරපතළ නියගය සහ 2011, 2014, 2016, හා 2017 වසරවල ඇති වූ දැඩි ගංවතුර තත්ත්ව වැනි මහාපරිමාණ ආපදා සිදුවීම් ගණනාවක් ම මෑතකාලයේ දී ඇති වී තිබේ. 2016 හා 2017 වර්ෂවල දිගින් දිගටම පැවති නියගය හා ගංවතුර හේතුවෙන් වී ගොවිතැනේ කන්න දෙකකට ම බාධා වූ අතර රජයේ ඇස්තමේන්තු අනුව පුද්ගලයින් මිලියන 2ක් පමණ ඉන් බලපෑමට පත් වී රටේ ආර්ථික වර්ධනය අවහිර කිරීමටත් ආහාර මිල උද්ධමනයක් ඇතිවීමටත් හේතු වී තිබේ.[54] 2016 මැයි මාසයේ ගංවතුර සහ නායයෑම්වලින් සිදු වූ හානි සහ අලාභ ප්‍රමාණය ඇ. ඩොලර් මිලියන 473 ඉක්මවන අතර, 2017 මැයි මාසයේ එය ඇ. ඩොලර් මිලියන 368ක් වූ බව ඇස්තමේන්තු කර තිබේ. ඒ සඳහා වූ ප්‍රතිසංස්කරණ අවශ්‍යතාවය පිළිවෙලින් ඇ. ඩොලර් මිලියන 960ක් සහ ඇ. ඩොලර් මිලියන 790ක් වූ බව ඇස්තමේන්තු කර තිබේ.[55] 2017 දී රජයේ අසම්භාව්‍ය වගකීම් ප්‍රමාණය රුපියල් බිලියන 23.8 (ඇ. ඩොලර් මිලියන 149) හෝ රජයේ මුළු වියදමෙන් දළ වශයෙන් 1%ක් විය.[56] ගංවතුර ඇතිවන වාර ගණන සහ එහි බරපතළකම වැඩිවන නැඹුරුතාවයක් පවතින බව ඓතිහාසික දත්තවලින් පෙන්නුම් කෙරේ. තවද, මුහුදු මට්ටම ඉහළ යාම, ජලයට ලවණ මිශ්‍රවීම, කාන්තාරනය වැනි සෙමෙන් ඇතිවන, එහෙත් පානීය ජලය නොමැතිවීම, කෘෂිකර්මාන්තය හා ආහාර නිෂ්පාදනය අහිමිවීම, ජෛව විවිධත්වය සහ වාසභූමි අහිමිවීම වැනි බරපතළ ප්‍රතිවිපාක සඳහා මග පෑදිය හැකි දේශගුණ උපද්‍රව මැඩපැවැත්වීමට ද ශ්‍රී ලංකාව කටයුතු කළයුතුව තිබේ.

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සියයට 87ක් වාසය කරන්නේ මධ්‍යම හෝ බරපතළ උණුසුම් ස්ථානවල බව දකුණු ආසියාවේ උණුසුම් ස්ථාන (South Asia's Hotspots)[57] පිළිබඳව ලෝක බැංකුව සිදුකළ අධ්‍යයනයෙන් ඇස්තමේන්තු කර තිබේ. 2000 සිට 2015 දක්වා කාලය තුළ ආන්තික කාලගුණික සිදුවීම් 64ක් සිදුව තිබෙන බව වාර්තා වේ. 2050 වන විට, දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවියහැකි බලපෑම වාර්ෂික දළ දේශීය නිෂ්පාදිතයෙන් දළ වශයෙන් සියයට 1.2ක් අහිමිවීමක් වනු ඇතැයි පුරෝකථනය කර තිබේ. දේශගුණය හා සම්බන්ධ ආපදා හේතුවෙන් රජය සෑම වසරකම ඇ. ඩොලර් මිලියන 380ක අලාභයකට මුහුණ දෙනු ඇතැයි ඇස්තමේන්තු කර තිබේ. සුළිසුළං හෝ බරපතළ ගංවතුර වැනි ආපදා නිතර ඇතිවුවහොත් මෙය මීට වඩා බොහෝ වැඩි වනු ඇත. තවද, සෑම වසර සියයකටම වරක් ශ්‍රී ලංකාව මුහුණ දෙන නිවාස/මහාමාර්ග හානි සහ ස්වාභාවික ආපදා සම්බන්ධ සහන අවශ්‍යතා ප්‍රමාණය රු. බිලියන 237 (ඇ. ඩොලර් බිලියන 1.8) බව ඇස්තමේන්තු කර තිබේ. මෙය, දළ දේශීය නිෂ්පාදිතයෙන් 2.4%කට සමාන වන අතර රජයේ සමස්ථ වියදමෙන් 14.2%ක් වන බව 2013 මුළු ඇස්තමේන්තුගත වියදම් අගයයන් අනුව පෙනී යයි.[58] ජීවනෝපාය අහිමිවීම හා සම්බන්ධ දීර්ඝකාලීන අලාභ, දුගීබව මත ඇතිකෙරෙන බලපෑම, සමාජ ආරක්ෂාව මත බලපෑම, සෞඛ්‍යය, අධ්‍යාපනය, ස්ත්‍රීපුරුෂ සමාජභාවය හා අනෙකුත් සමාජ ගැටලුවලට ඉන් ඇතිවන බලපෑම මෙම ඇස්තමේන්තුවලට ඇතුළත් වී නොමැත. ස්වාභාවික සම්පත්, දියබෙත්ම, සංස්කෘතිකමය ස්මාරක, සංචාරයට සුප්‍රකට ස්ථාන/වෙරළ යනාදිය හායනය වීම ද මෙම ගණනය කිරීම්වලට ඇතුළත් කරගෙන නොමැත.

### 2020 අලාභ සහ හානි සංශෝධන

NDC සංශෝධන ක්‍රියාවලිය යනු ආපදාවලින් ඇතිවන අලාභ සහ හානි මහගරවාගැනීම, අවම කරගැනීම සහ ආමන්ත්‍රණය කිරීම ජාතික වශයෙන් කෙතරම් අදාළ වන්නේද යන කරුණ ගැන අවධානය යොමුකරන්නට හැකි අවස්ථාවක් වේ. මෙම සංශෝධන, ආපදාවලින් සිදුවන අලාභ සහ හානි සම්බන්ධයෙන් වන මෑතකාලීන කාර්යයන් වටා නිර්මාණය කර ඇති අතර, ඊට පහත ඒවා ඇතුළත් වේ:

---

53 ජර්මන් වොච්, 2019 ගෝලීය දේශගුණ අවදානම් දර්ශකය, ජර්මන් වොච්, 2020 ගෝලීය දේශගුණ අවදානම් දර්ශකය

54 ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ශ්‍රී ලංකාව: දීර්ඝ කළ අරමුදල් පහසුකම් සහ කාර්යසාධක නිර්ණායක වෙනස්කිරීම සඳහා වන ඉල්ලීම යටතේ තෙවන සමාලෝචනය. වොෂින්ටන් ඩීසී. 2018. උපුටා දැක්වීම: ආසියානු සංවර්ධන බැංකුව, ශ්‍රී ලංකාවේ ආපදා අවදානම් මූල්‍යකරණය සඳහා බලදායී පරිසරය, ADB Country Diagnostics Assessment February 2019

55 ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය, ශ්‍රී ලංකාවේ ගංවතුර හා නායයෑම් සම්බන්ධයෙන් වන පශ්චාත් ආපදා යථාතත්වයට පැමිණීමේ සැලසුම 2017

56 ලෝක බැංකුව, ස්වභාවික ආපදාවලින් ශ්‍රී ලංකාවට ඇති අසම්භාව්‍ය බැරකම්, 2018

57 ලෝක බැංකුව, දකුණු ආසියාවේ උණුසුම් ස්ථාන: උෂ්ණත්වය සහ වර්ෂාපතන වෙනස්කම් ජීවන තත්ත්වය මත ඇතිකරන බලපෑම. දකුණු ආසියාවේ සංවර්ධනය වැදගත් වේ.

58 ලෝක බැංකුව, Fiscal disaster risk assessment and risk financing options (2016) http://documents.worldbank.org/curated/en/430141467229470955/Fiscal-disaster-risk-assessment-and-risk-financing-options

- ආපදා තොරතුරු කළමනාකරණ පද්ධතිය - DesInventar දත්තපදනමේ 1974 පටන් ඇති වූ ස්වාභාවික සහ මිනිසා විසින් නිර්මිත ආපදා මගින් සිදුවූ අලාභ පිළිබඳ ඓතිහාසික තොරතුරු ඇතුළත්ය. ලෝක බැංකුවේ සහායෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් දැනට අංශ අනුව අලාභ සහ හානි වාර්තා කළ හැකි මාර්ගගත (online) පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා කටයුතු කෙරෙමින් පවතියි.
- ලෝක බැංකු සහායෙන් දැනට සිදුකෙරෙමින් පවතින දේශගුණ ප්‍රත්‍යස්ථ බහුඅදියර වැඩසටහන්කරණ ප්‍රවේශය (Climate Resilience Multiphase Programmatic Approach) වැනි ව්‍යාපෘතිර දැඩි බලපෑම් සහිත කාලගුණය, ගංවතුර සහ නායයෑම් පිළිබඳ පුරෝකථනය සහ පූර්ව අනතුරු ඇඟවීම; එම ජාල මනාව ක්‍රියාත්මක වන බවත් තොරතුරු භුවමාරු කරගෙන ක්‍රියාත්මක වියහැකි බවත් සහතික කිරීම සඳහා ජලවිද්‍යා සහ කාලගුණ විද්‍යා නිරීක්ෂණ ජාල යාවත්කාලීන කිරීම සහ ව්‍යාප්ත කිරීම යනාදිය මෙම ව්‍යාපෘතියේ කොටස් වේ.
- JICA සහායෙන් ක්‍රියාත්මක වන 'කාලගුණවිද්‍යාත්මක නිරීක්ෂණය කිරීම, කාලගුණ පුරෝකථනය කිරීම සහ ප්‍රචාරණය දියුණු කිරීමේ ව්‍යාපෘතිය' (Improving of Meteorological Observation, Weather Forecasting Dissemination Project) සඳහා 2014 දී මුලපුරනු ලැබුවේ ආන්තික කාලගුණික සංසිද්ධීන් (දැඩි වර්ෂාව, ප්‍රබල සුළං, අකුණුගැසීම් යනාදිය) සඳහා විශ්වසනීය නිරීක්ෂණ සහ පුරෝකථන ශිල්පක්‍රමයක් ගොඩනංවාගැනීමත් භාවිතාකරන්නන්ට හිතකාමී ආකාරයෙන් කාලගුණය පිළිබඳ තොරතුරු නිසි ලෙස ප්‍රචාරණයත් අරමුණු කරගෙන කාලගුණවිද්‍යා දෙපාර්තමේන්තුවට උපකරණ සහ පුහුණුව ලබාදීම පිණිස වේ.
- 2016, සහ 2017 ගංවතුර හා නායයෑම්වලින් පසුව සිදුකළ පශ්චාත් ආපදා අවශ්‍යතා ඇගැයුමෙන් සමාජ, ඵලදායීතා, යටිතලපහසුකම් යන අංශවල සිදුවූ අලාභ සහ හානි සහ සියලු අංශ විනිවිදයන ගැටලු සම්බන්ධයෙන් ඇතිවන බලපෑම ඇගැයුම් කරන ලදි. තවද, 2017 දී UNDP විසින්, පශ්චාත් ආපදා අවශ්‍යතා තක්සේරු (PDNA) ක්‍රමවේදයේ කොටසක් වශයෙන් අලාභ සහ හානි තක්සේරු සිදුකරන අන්දම පිළිබඳව සංවර්ධන අංශයේ වෘත්තිකයින්ට පුහුණුව ලබාදෙන ලදි.

ආපදා සම්බන්ධ අලාභ සහ හානි කළමනාකරණය සඳහා නිර්දේශිත ප්‍රවේශය වන්නේ දැනට පවතින ආපදා අවදානම් කළමනාකරණය සඳහා තාක්ෂණික ආයෝජන සහ මෙහෙයුම් රාමුව මත දේශගුණ සහ ආපදා අවදානම කළමනාකරණය සඳහා වන රාමුව (6.1 රූපය) වැනි සවිස්තරාත්මක ප්‍රවේශයකට යොමුවීමයි. දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන අවදානමේ සහ අනාගතයේ ඇතිවන අලාභ පූර්ණ පරාසයම අවබෝධ කරගැනීමට නම්, වඩාත් පුළුල් ක්‍රියාවලියක් සහ වඩාත් වැඩි දත්ත ප්‍රමාණයක් අවශ්‍ය වේ. කෙසේනමුත්, ශ්‍රී ලංකාව ස්වකීය වත්මන් හෘඝ (2021-2030), ආපදා අවදානම් අඩුකරගැනීමේ සෙන්ඩායි රාමුව (2015-2030) සහ වෝර්සෝ ජාත්‍යන්තර යාන්ත්‍රණය ක්‍රියාත්මක කරන්නා වූ ආයතනික සහ සම්බන්ධීකාරක යන්ත්‍රණ මත පදනම් වනු ඇත. දේශගුණ විපර්යාස මගින් උග්‍ර කරවනු ලැබූ ජල-කාලගුණ විද්‍යාත්මක ආපදා හා බැඳුණු අවදානම සහ නව උපදව සහ ආපදාවලට දයක වෙමින් දේශගුණ විපර්යාස මගින් බලපෑමට පත් ස්වාභාවික ක්‍රියාවලි පිළිබඳව විස්තීර්ණ අවබෝධයක් ලබාගැනීම, ශක්තිමත් දත්ත එකතුකිරීමේ හා වාර්තාකරණ පද්ධතියක්, පුරෝකථනය සහ පූර්ව අනතුරු ඇඟවීම සඳහා ධාරිතා, අවදානම පිළිබඳ දැනුවත් වී සිදුකරන ප්‍රාදේශීය සංවර්ධන සැලසුම්කරණ සහ ආයෝජන සඳහා දැනුම ලබාදෙන්නා වූත්, ඒවා සබලකරන්නාවූත්, අවදානම අවමකරණ සහ අවදානම පවරන යාන්ත්‍රණ මීට ඇතුළත් වේ. යාවත්කාලීන කළ අලාභ සහ හානි NDC 6.1 වගුවේ දක්වා තිබේ.

| 2වැනි ස්තම්භය | 3වැනි ස්තම්භය | 4වැනි ස්තම්භය | 5වැනි ස්තම්භය |
|---|---|---|---|
| **අවදානම අඩුකරගැනීම** | **සූදානම** | **මූල්‍ය ආරක්ෂාව** | **ප්‍රත්‍යස්ථ නැවත ඉදිකිරීම්** |
| ප්‍රතිපත්ති සහ ආයෝජන තුළ දේශගුණ අවදානම් කෙරෙහි වඩාත් වැඩි සැලකිල්ලක් දැක්වීමෙන් අලුතින් අවදානම් නිර්මාණයවීම මගහරවාග ැනීම සහ සමාජයේ අවදානම අඩුකරගැනීම | පුරෝකථන, කල්තියා අනතුරු ඇඟවීම් සහ හදිසි අවස්ථා සැලසුම් සංවර්ධනය කිරීම මගින් අර්බුදයක් කළමනාකරණය කරගැනීම සඳහා වැඩි ධාරිතාවය | මූල්‍ය ආරක්ෂණ ක්‍රමෝපාය හරහා රජයේ, පෞද්ගලික අංශයේ සහ කුටුම්භවල මූල්‍ය ප්‍රත්‍යස්ථතාව වැඩිදියුණු කිරීම | නැවත ඉදිකිරීම් සැලසුම්කරණය සඳහා සහය ලබාදීම හරහා වේගයෙන්, වඩාත් ප්‍රත්‍යස්ථ ලෙස නැවතත් යථාතත්වයට පත්වීම |

↑ ↑ ↑ ↑

**අවදානම් හඳුනාගැනීම**

ඇගැයුම සහ විශ්ලේෂණ සඳහා ධාරිතාවය වර්ධනය කිරීම ඔස්සේ වැඩිදියුණු වූ ආපදා සහ දේශගුණ අවදානම් හඳුනාගැනීම සහ අවබෝධ කරගැනීම

1 වැනි ස්තම්භය

*6.1 රූපය: දේශගුණ සහ ආපදා අවදානම කළමනාකරණය කරගැනීම සඳහා වන මෙහෙයුම් රාමුවක්* [59]

59 ලෝක බැංකුව, ප්‍රත්‍යස්ථතාව ගොඩනැංවීම: සංවර්ධනයට දේශගුණ සහ ආපදා අවදානම් ඒකාබද්ධ කිරීම. ලෝක බැංකු සමූහ අත්දැකීම්වලින් උගත් පාඩම්. 2013

*6.1 වගුව: අලාභ සහ හානි අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව*

| NDC අංකය | ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ ක්‍රියාමාර්ග | ඉලක්ක වර්ෂය |
|---|---|---|
| **NDC 1** | **හිඩැස් විශ්ලේෂණයක් (gap analysis) සිදුකිරීම:**<br>අලාභ සහ හානි, කාලගුණය හා දේශගුණය සම්බන්ධ ආන්තික සිදුවීම්, සෙමෙන් ඇතිවන (slow onset) ආපදු සහ දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන බව සලකන ස්වාභාවික ක්‍රියාවලි පිළිබඳව වර්තමානයේ පවතින තත්ත්වය සහ අවබෝධය කෙබඳුදැයි ඇගැයුම් කිරීම සඳහා හිදැස් විශ්ලේෂණයක් (gap analysis) සිදුකිරීම. මීට: | **2021-2023** |
| | 1) අලාභ සහ හානි පිළිබඳ දැනුවත්භාවය සහ ධාරිතාව; | |
| | 2) දත්ත එකතුකිරීම සහ විශ්ලේෂණය; | |
| | 3) ප්‍රතිපත්ති, ආයතනික කටයුතු සංවිධාන සහ බලවරම් සම්බන්ධ වනු ඇත. | |
| **NDC 2** | **දැනට පවතින කාලගුණ සහ දේශගුණ පුරෝකථන පද්ධතිය:** | **2021-2025** |
| | 1) පූර්ව අනතුරු ඇඟවීම සහ භාවිතා කරන්නන් සඳහා වන සේවා වැඩිදියුණු කිරීමට; | |
| | 2) කාලගුණය හා දේශගුණය සම්බන්ධ ආන්තික සිදුවීම්, සෙමෙන් ඇතිවන ආපදු සහ දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන බවක් සලකන ස්වභාවික ක්‍රියාවලි හා අදාළව අලාභ සහ හානි පුරෝකථනය සහ වාර්තා කිරීම සඳහා වන හැකියාව වැඩිදියුණු කිරීම; | |
| | 3) දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන බවක් කිවහැකි අලාභ සහ හානි තීරණය කිරීම | |
| **NDC 3** | **එක් එක් අංශයේ අලාභ සහ හානි වාර්තා කිරීමට දත්ත කළමනාකරණ පද්ධති වැඩිදියුණු කිරීම**<br>2015 පාදම් වර්ෂය ලෙස සලකමින් ආර්ථික සහ ආර්ථික නොවන අලාභ යන දෙකම තකසේරු කිරීම සහ ප්‍රමාණාත්මකව ගණනය කිරීම සහ සහ ආපදු හා දේශගුණ අවදානම් කළමනාකරණ උපායමාර්ග දැනුම්දීම හා ජාතික සංවර්ධන සැලසුම් ක්‍රියාවලියට ඒකාබද්ධ කිරීම | **2021-2025** |
| **NDC 4** | 'අලාභ සහ හානි සඳහා වන වෝර්සෝ ජාත්‍යන්තර යාන්ත්‍රණය' (Warsaw International Mechanism for Loss and Damage) සමගින් අනුකූල වන අන්දමින් (NDC 1 හි සඳහන් හිඩැස් විශ්ලේෂණය මත පදනම් වෙමින්) **අලාභ සහ හානි සඳහා සියලු අංශ ආවරණය කරන, ජාතික වශයෙන් උචිත වන, ක්‍රියාකාරී ආයතනික ව්‍යුහයක් ඇතිකිරීම**. අධීක්ෂණ කටයුතුවලට අමතරව බහුවිධ අංශවල ආයතන සමග සම්බන්ධීකරණය කිරීමට මෙම ආයතනික ව්‍යුහයට බලවරම් හිමිවනු ඇති අතර, ඊට මූල්‍ය සහ අයවැය අධිකාරය හිමිවනු ඇත. | **2021-2030** |
| **NDC 5** | 2005 ආපදු කළමනාකරණ පනත මත පදනම් වූ, එහෙත් කාලගුණය හා දේශගුණය සම්බන්ධ ආන්තික සිදුවීම්, සෙමෙන් ඇතිවන ආපදු, දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන බවක් සලකන ස්වාභාවික ක්‍රියාවලි සහ අනාගතයේ අපේක්ෂිත අලාභ හා හානි සමස්ථ පරාසයම ඇතුළත් කිරීමට හැකිවන පරිදි **පුළුල් කරන ලද විස්තීර්ණ අවදානම් කළමනාකරණ රාමුවක් සංවර්ධනය කිරීම**.<br><br>ජාතික සහ ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක අදාළ සියළුම ආංශික ආයතන කරන ආපදු කළමනාකරණ උපායමාර්ග/අනුහුරුවීමේ සැලසුම් මුඛ්‍යධාරාගත කිරීමට උපකාරී වනු ඇත. ඒ, | |
| | 1) අලාභ සහ හානි අඩුකරගැනීම සඳහා පදනමක් වශයෙන් | |
| | 2) සංවර්ධනයට කරන ආයෝජන අවදානම සඳහා සංවේදී බව සහතික කරගැනීමට හා අවදානම පැවරුම සඳහා උචිත යන්ත්‍රණ ඒකාබද්ධ කිරීම ඔස්සේ අවශේෂ අලාභ සහ හානි අයකරගැනීමත් සඳහා සබලකරනය කිරීම (සමාජ ආරක්ෂණය, අවදානම් රැඳවුම, රක්ෂණ, හදිසි අවස්ථා අරමුදල් වැනි විකල්ප) | 2021-2030 |

# 7 පරිච්ඡේදය

## තිරසර සංවර්ධන අරමුණු සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය ජාතිකව නිර්ණය කළ දායකත්ව සමඟ ඒකාබද්ධ කිරීම

යෝජිත දේශගුණ ක්‍රියාමාර්ග තිරසර සංවර්ධන අභිමථාර්ථ සහ ඒවායේ ඉලක්ක සමග කෙතරම් දුරකට ගැලපෙන්නේ ද යන්න වඩාත් සමීපව අධ්‍යයනය කිරීමටත්; දේශගුණ විපර්යාස අවම කිරීමේ සහ අනුහුරුවීමේ ප්‍රමුඛතාවල ස්ත්‍රීපුරුෂ සමාජභාව මානයන් විශ්ලේෂණය කිරීමටත් NDC සමාලෝචන ක්‍රියාවලියෙන් අවස්ථාව සැලසුනි.

පැරිස් ගිවිසුමෙන් ස්ත්‍රීපුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබලගැන්වීම ඉල්ලා සිටින අතර, ස්ත්‍රීපුරුෂ සමාජභාව ප්‍රතිචාරී ප්‍රවේශයන් අනුගමනය කරන්නට සාමාජික රටවල් උනන්දුකරවයි. NDC හි ස්ත්‍රීපුරුෂ සමාජභාව ක්‍රියාමාර්ග සැලසුමෙන් සියලුම දේශගුණ විපර්යාස ක්‍රියාවලී තුළ ස්ත්‍රීපුරුෂ සමාජභාවය මුඛ්‍යධාරාගත කළයුතු බව නිර්දේශ කරයි. එබැවින්, ශ්‍රී ලංකාවේ NDC සමාලෝචන ක්‍රියාවලිය තුළින් ද, පවතින විෂමතා අඩුකරගැනීමටත් දේශගුණ ක්‍රියාමාර්ග හරහා පුරුෂයින්ගේ සහ කාන්තාවන්ගේ ප්‍රශස්ත විභවය ළඟාකරගැනීමට හැකි ආකාර හඳුනාගැනීමටත් ජාතික සංවර්ධන සන්දර්භයකින් ස්ත්‍රීපුරුෂ සමාජභාවයේ විෂමතා විශ්ලේෂණය කරන්නට අවස්ථාවක් සැලසුනි. එසේම, දේශගුණ විපර්යාස අවමකිරීමේ හා අනුහුරුවීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේදී කාන්තාවන්ගේ දැනුමෙන් හා හැකියාවෙන්, විශේෂයෙන් ම ශ්‍රී ලංකාවේ උගත් හා සාක්ෂර කාන්තා ජනගහනයෙන් ප්‍රතිලාභ ලබාගැනීමට ද මෙම NDC හරහා මග සලසයි. තවද, ස්ත්‍රීපුරුෂ සමාජභාව ප්‍රතිචාරී අන්දමින් NDC සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීම ඔස්සේ දේශගුණ ක්‍රියාමාර්ග ස්ත්‍රීපුරුෂ සමාජභාව විෂමතා සඳහා දායක නොවන බවත් අළුතින් එවැනි විෂමතා නිර්මාණය නොකරන බවත්, එමගින් සිදුවන්නේ ජාතික ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතා අරමුණු සහ කැපවීම් සාක්ෂාත් කරගැනීමට දායකවීම වන බවත් සහතික කරගැනීමට හැකි වේ.

ශ්‍රී ලංකා රජය ස්ත්‍රීපුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබලගැන්වීම සඳහා වන ස්වකීය ප්‍රතිපත්ති කැපවීම් ව්‍යාප්ත කර තිබේ. 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති රාමුවෙන් කාන්තාවන් ආර්ථික සහ සමාජමය වශයෙන් සවිබලගැන්වීමට අපේක්ෂා කරන අතර, ආර්ථිකයට සහ සමාජයට කාන්තාවන්ගේ දායකත්වය පිළිගැනීමට ලක් කරන සහ සබලකරන ක්‍රමෝපායයන් එහි සඳහන් කර තිබේ. ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතාවය සම්බන්ධයෙන් වන මෙම ජාතික ප්‍රතිපත්ති කැපවීම් සඳහා සහය දියහැකි ආකාරයක් මෙම NDC හරහා ඇතිකර දෙනු ලැබේ. NDC සංශෝධන ක්‍රියාවලිය අතරතුර සිදුකළ විශ්ලේෂණයෙන්, එක් එක් අංශය තුළ NDC ක්‍රියාත්මක කිරීම සඳහා වන දසවර්ෂ සැලසුමට ස්ත්‍රීපුරුෂ සමාජභාවය ඒකාබද්ධ කළහැකි බහු-පියවර ප්‍රවේශයක් යෝජනා කරයි. අවශ්‍ය තැන්වල එම අංශයට ම විශේෂිත වූ ස්ත්‍රීපුරුෂ සමාජභාව විශ්ලේෂණ සිදුකිරීම, ස්ත්‍රීපුරුෂ සමාජභාව ප්‍රතිචාරී ක්‍රියාමාර්ග සම්පාදනය, NDC සැලසුම්කරණය හා අධීක්ෂණය සඳහා කාන්තාවන් සම්බන්ධ කරගැනීමට ධාරිතා වැඩිදියුණු කිරීම, සහ ස්ත්‍රීපුරුෂ සමාජභාව ප්‍රතිචාරී ක්‍රියාමාර්ග සඳහා අයවැය/ සම්පත් වෙන් කිරීම ඊට ඇතුළත් වේ (7.1 රූපය).

**ස්ත්‍රීපුරුෂ සමාජභාව ප්‍රතිචාරී ලෙස NDC ක්‍රියාත්මක කිරීම සඳහා වන ප්‍රවේශයක්**




*7.1 රූපය: ස්ත්‍රීපුරුෂ සමාජභාව ප්‍රතිචාරී ක්‍රියාත්මක කිරීමක් සඳහා වන ප්‍රවේශය*

## ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ තිරසර සංවර්ධන අභිමතාර්ථ (SDG) අතර ඇති අන්තර්සබඳතා

නියමිත කාලයටත් පෙරාතුව සහශ්‍ර සංවර්ධන අභිමථාර්ථ බොහොමයක් සාක්ෂාත් කරගන්නට ශ්‍රී ලංකාවට හැකි විය. 2015 දී ශ්‍රී ලංකාව නව ගෝලීය සංවර්ධන න්‍යායපත්‍රයට අත්සන් තබමින් එහි ඇතුළත් වී ඇති තිරසර සංවර්ධන අභිමතාර්ථ (SDG) 2030 වනවිට සාක්ෂාත් කරගැනීම සඳහා කැපවන ලදි.

2015 දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයට ඉදිරිපත් කරන ලද තිරසර සංවර්ධන අභිමතාර්ථ (2030 න්‍යායපත්‍රය) සම්බන්ධීකරණය සහ සාක්ෂාත් කරගැනීම පිණිස උපකාරීවීම සඳහා ශ්‍රී ලංකාව යාන්ත්‍රණ කිහිපයක්ම ඇති කර තිබේ. 2017 දී පාර්ලිමේන්තුව 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත සම්මත කරගත් අතර, විධායක ජනාධිපතිවරයාගේ ලේකම් විසින් සභාපතිත්වය දරන සහ ශාස්ත්‍රඥයින්, සිවිල් සමාජය සහ පළාත් සභා සාමාජිකත්වය දරන ඉහළ-මට්ටමේ තිරසර සංවර්ධන සභාවක් එමගින් පිහිටවන ලදි. තිරසර සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සහ උපායමාර්ග කෙටුම්පතක් ලෙස සකස්කර ඇති අතර, 2018 පැවති දත්ත සමගින් තිරසර සංවර්ධන දර්ශක සැසඳීමෙන් මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රගතිය මැනීමට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර තිබේ.[60] ශ්‍රී ලංකාව 2018 දී ඉහළ-මට්ටමේ ප්‍රතිපත්ති සංසදය වෙත ස්වේච්ඡාවෙන් ඉදිරිපත් කරන ජාතික සමාලෝචනයක් ඉදිරිපත් කරන ලදි. තිරසර සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සහ උපායමාර්ගයේ දේශගුණ විපර්යාස වටා නිර්මාණය වූ ප්‍රතිපත්ති ඉලක්ක කිහිපයක්ම ඇති අතර, දේශගුණය මගින් ඇතිවන උපද්‍රව සඳහා වඩාත් වැඩි ප්‍රත්‍යස්ථතාවක් ගොඩනගාගැනීම, සහ ජාතික ක්‍රමෝපාය, සැලසුම් හා වැඩසටහන්වලට දේශගුණ විපර්යාස ඒකාබද්ධ කරගැනීම ඊට ඇතුළත් වේ. එසේම, දේශගුණ මූල්‍යකරණය කරා ප්‍රවේශවීම, දැනුවත්භාවය වැඩිකිරීම සහ කාන්තාවන් හා ළමුන් වැනි අවදානමට ලක්වන කණ්ඩායම් වෙත වැඩි අවධානයක් යොමුකිරීම යනාදිය ප්‍රතිපත්ති ප්‍රමුඛතා වශයෙන් එහි දක්වා තිබේ.

ශ්‍රී ලංකාව විසින් තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම වේගවත් කළ හැක්කේ කුමන සාධකවලට ද යන්න පිළිබඳව 2018 සිදුකරන ලද අධ්‍යයනයකින් හෙළි වූ අන්දමට[61] වේගය වැඩිකිරීමට හේතුවන ප්‍රධානම සාධක දහය අතරට සංවර්ධන සැලසුම්කරණයේ දී ඊට දේශගුණ විපර්යාස ඒකාබද්ධ කිරීම ඇතුළත් වේ. ජාතික ප්‍රතිපත්ති, උපායමාර්ග සහ සැලසුම්කරණය (SDG ඉලක්ක 13.2) සඳහා දේශගුණ විපර්යාස ක්‍රියාමාර්ග ඒකාබද්ධ කිරීම ද, තිරසර ආහාර නිෂ්පාදන පද්ධති සහතික කිරීම හා ප්‍රත්‍යස්ථ කෘෂිකර්ම පිළිවෙත් ක්‍රියාත්මක කිරීම ද (SDG ඉලක්ක 2.4) ශ්‍රී ලංකාවේ සංවර්ධනය වඩාත් කඩිනම් කිරීම සඳහා වන වඩාත්ම වැදගත් සාධක දහය අතරට ඇතුළත් වන බව එම අධ්‍යයනයෙන් සොයාගන්නා ලදි.

NDC සංශෝධන ක්‍රියාවලිය අතරතුර, යෝජිත දේශගුණ ක්‍රියාමාර්ග තිරසාර සංවර්ධන අභිමතාර්ථ රාමුවේ අරමුණු 17 සහ ඉලක්ක 169 සමගින් කොතෙක් දුරකට ගැලපෙන්නේද යන්න සමාලෝචනය කරන ලදි. NDC හරහා යෝජිත අවමකිරීමේ ඉලක්ක, තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීමට අහිතකර අන්දමින් බලපානු ඇතිදැයි තීරණය කිරීම සඳහා ඒවා පිළිබඳව වඩාත් සවිස්තරාත්මක සමාලෝචනයක් සිදුකරන ලදි. මෙම විශ්ලේෂණය සඳහා SDG දේශගුණ ක්‍රියාමාර්ග සම්බන්ධක මෙවලම (SCAN-tool) භාවිතා කරන ලදි.[62] එම විශ්ලේෂණයෙන් අන්තර්සම්බන්ධතා 270 ඉක්මවන සංඛ්‍යාවක් හඳුනාගත් අතර, ඉන් බහුතරයක් තිරසර සංවර්ධන අභිමතාර්ථ සඳහා අනුපූරක වන සාධනීය අන්තර්ක්‍රියා බව හඳුනාගන්නා ලදි. SDG 7 (දැරියහැකි සහ පිවිතුරු බලශක්තිය), SDG 8 (සුනිසි වැඩ සහ ආර්ථික වර්ධනය), SDG 9 (කර්මාන්ත, නවෝත්පාදනය සහ යටිතලපහසුකම්), සහ 11 (තිරසර නගර සහ ප්‍රජාවන්) සමගින් ප්‍රබල ධනාත්මක අන්තර්සබඳතා පවතින බවත් SDG 1 (දරිද්‍රතාවය පිටුදැකීම) සහ 15 (ගොඩබිමෙහි ජීවිතය) සමගින් යම් යම් හිලවුකිරීම් හෝ මිශ්‍ර අන්තර්ක්‍රියා ඇති බවත් සොයාගන්නා ලදි. කෘෂිකර්ම අංශයේ NDC ක්‍රියාමාර්ගවලට, SDG 1 සහ SDG 15 හැරුණුවිට බොහෝ SDG සමගින් සහක්‍රියා හෝ අන්තර්සම්බන්ධතා පවතියි. ප්‍රවාහන අංශයේ ක්‍රියාමාර්ගවල SDG 6, 14 සහ 15 සඳහා යම් යම් හිලවුකිරීම් විය. කෙසේනමුත්, එම අංශයේ SDG සඳහා අනුපූරක වන ක්‍රියාකාරකම් විශාල සංඛ්‍යාවක් විය. බලශක්ති අංශයේ (විදුලිය) භෘත ක්‍රියාමාර්ගවලින් බොහෝ SDG සඳහා සැලකියයුතු දායකත්වයක් අපේක්ෂා කළහැකි වුවත් ඉන් SDG 1, 2, 3, 6 සහ 14 සමගින් හිලවුකිරීම් ඇතිවන බව නිරීක්ෂණය කරන ලදි. ඉන් පෙන්නුම් කෙරුනේ පුනර්ජනනීය බලශක්තිය ව්‍යාප්තවීම කෘෂිකර්මය සහ ජලය මත යම් බලපෑම් ඇතිකළ හැකි බවයි. ඍණාත්මක සහසම්බන්ධතා අවබෝධ කරගෙන, ක්‍රියාත්මක කරන අවධියේදීම ඒවාට අවශ්‍ය කරන සුරක්ෂණ යාන්ත්‍රණ ඇතිකිරීම වැදගත් වේ. කර්මාන්ත, වනාන්තර සහ අපද්‍රව්‍ය සම්බන්ධයෙන් වන භෘත ක්‍රියාමාර්ග ප්‍රධාන වශයෙන්ම SDG සමගින් සහක්‍රියාකාරක වේ.

60 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2018

61 ශ්‍රී ලංකාවේ SDG අන්තර්ක්‍රියා අවබෝධ කර ගැනීම: ජාල විශ්ලේෂණයේ මූලික ප්‍රතිඵල. Stockholm Environmental Institute and UNDP 2019 (unpublished)

62 https://ambitiontoaction.net/scan_tool/




*7.2 රූපය: ප්‍රධාන අංශ සහ ඒවායේ හානි අවමකරන ක්‍රියා සහ තිරසර සංවර්ධන අභිමතාර්ථ අතර ඇති අන්තර්ක්‍රියා සාරාංශය*

| වර්ණය | අන්තර්සම්බන්ධතාවය |
|---|---|
| 100% | ශක්තිමත් අන්තර් සම්බන්ධතා ඇත, සියලු ධනාත්මක අංශ SDG සඳහා අනුපූරක වේ |
| 75-99% | හිලවුකිරීම් කිහිපයක් ඇතත් ශක්තිමත් අන්තර්සම්බන්ධතා සහ සහක්‍රියා පවතින අතර ගූඪ වෙත සක්‍රියා දයකත්වයක් ලබාදෙයි |
| 50-75% | SDGs/SDG ඉලක්ක සඳහා මධ්‍යස්ථ දායකත්වයක් ලබාදෙයි |
| 25-49% | සහක්‍රියාවලට වැඩියෙන් හිලවුකිරීම් ඇත, ඇතැම් සෘණාත්මක බලපෑම් ඇත. |
| 0-24% | බොහෝ සෘණාත්මක බලපෑම් හෝ හිලවුකිරීම් ඇති අතර SDG ඉලක්ක මත අහිතකර බලපෑමක් ඇතිකිරීමට ඉඩ තිබේ. |
| | අන්තර් සම්බන්ධතාවයක් නොමැත |




*7.1 වගුව: ප්‍රධාන අංශ සහ ඒවායේ ක්‍රියාමාර්ග සහ තිරසර සංවර්ධන අභිමතාර්ථ අතර සම්බන්ධතා ප්‍රතිශත වශයෙන් දැක්වීම*

මෙම වගුවේ (පහත 7.1 වගුව බලන්න) අනුහුරුවීමේ NDC ඒවාට අනුරූප වන SDG ඉලක්ක සමගින් සවිස්තරාත්මක අන්දමින් ගලපා තිබේ. සෘජු ධනාත්මක සහසම්බන්ධතා සහ වියහැකි හිලවුකිරීම් ඉන් පෙන්නුම්කර තිබේ. පොදුවේ ගත් කල, සියලුම අනුහුරුවීමේ NDC, දේශගුණ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් වන 13 වැනි අරමුණ යටතේ අවදානමට ලක්විය හැකිබව අවබෝධ කරගැනීම සම්බන්ධයෙන් සහ ප්‍රත්‍යස්ථතාව වැඩිදියුණු කරගැනීම සම්බන්ධයෙන් වන අරමුණු සඳහා ප්‍රතිචාර දක්වයි. NDC ක්‍රියාමාර්ග සමගින් ධනාත්මක සහසම්බන්ධතාවයක් ඇති තවත් SDG ඉලක්කයක් වන්නේ ආන්තික කාලගුණ සිදුවීම් හේතුවෙන් ඇතිවන මරණ හා අලාභ අඩුකරගැනීම සහ අවදානමට ලක්ව ඇති පුද්ගලයින්ගේ ප්‍රත්‍යස්ථතාව වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් වන 1.5 ඉලක්කයයි. සාමාන්‍යයෙන්, ආංශික අනුහුරුවීමේ ක්‍රියාමාර්ග එම අදළ අංශයට විශේෂිත SDG යටතේ දක්වා ඇති ඉලක්ක සමගින් ගැලපෙයි. විශේෂයෙන් ම මෙය කෘෂිකර්මය, සෞඛ්‍යය, ජෛව විවිධත්වය, වෙරළ, ධීවර කර්මාන්තය, නාගරික ජනාවාස සහ ජලය සඳහා වන NDC තුළ ප්‍රබලව නිරීක්ෂණය කළ හැකිය. තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම හේතුවෙන් දේශගුණ අවදානම තවත් උග්‍ර කරවන හෝ දේශගුණ ක්‍රියාමාර්ග මත ඉන් බලපෑමක් ඇතිකරවන අංශ ද තිබේ. ආහාර සුරක්ෂිතතාවය, ආදයම්, ජලය හා සනීපාරක්ෂක පහසුකම්, නිවාස, බලශක්තිය හා කාර්මික වර්ධනය කෙරෙහි ප්‍රමුඛතාවය දෙමින් අඛණ්ඩව ආර්ථික වර්ධනය හා සංවර්ධනය පවත්වාගෙනයාම SDG හරහා අවධාරණය කෙරේ. මෙම සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීම තුළ දීර්ඝකාලීන ප්‍රත්‍යස්ථතාව, විශේෂයෙන්ම, පහසුවෙන් විනාශවිය හැකි පරිසර පද්ධතිවල (වෙරළබඩ, වනාන්තර සහ දියබෙත්ම) දීර්ඝකාලීන ප්‍රත්‍යස්ථතාව දුර්වල කිරීමටත්, අනාගතයේ දී තවතවත් ප්‍රජාවන් දේශගුණ උපද්‍රව වෙත නිරාවරණය කිරීමටත් ඉඩ තිබේ. එබැවින්, රටේ තිරසර සංවර්ධන ප්‍රතිපත්තිය මගින්, දේශගුණ ප්‍රත්‍යස්ථ හා අවදානම ඒකාබද්ධ කළ සංවර්ධන ආයෝජන සඳහා ඇති අවශ්‍යතාවය අවධාරණය කරයි.

*7.2 වගුව: තිරසර සංවර්ධන අභිමතාර්ථ සහ අනුහුරුවීමේ ජාතිකව නිර්ණය කළ දායකත්ව අතර සම්බන්ධතා*

| NDC අංශය | අදාළ SDGs (+) | |
|---|---|---|
| **සියලුම අනුහුරුවීමේ NDC** | 13 CLIMATE ACTION | 13.1/13.2/ 13.3 & 13b |
| **කෘෂිකර්මය** | 1 NO POVERTY; 2 ZERO HUNGER; 6 CLEAN WATER AND SANITATION | 1.5 2.4/2.5 6.4/6.5 |
| **ජෛව විවිධත්වය** | 14 LIFE BELOW WATER; 15 LIFE ON LAND | 14.2/ 14.5 15.1/15.2/15.3/15.4/15.5 and 15.8 |
| **වෙරළ** | 14 LIFE BELOW WATER; 11 SUSTAINABLE CITIES AND COMMUNITIES | 14.2/14b 11.9 |
| **ධීවර කර්මාන්තය** | 14 LIFE BELOW WATER | 14.2/14.4/ 14.5 |
| **සෞඛ්‍ය** | 3 GOOD HEALTH AND WELL-BEING; 2 ZERO HUNGER | 3.3/ 3.4/3.9 and 3d 2.2 |
| **පශුසම්පත්** | 2 ZERO HUNGER | 2.4 and 2a |
| **ජලය සහ වාරිමාර්ග** | 6 CLEAN WATER AND SANITATION | 6.1/6.3/6.4/6.5/ 6.6 & 6a/ 6b |
| **නාගරික** | 11 SUSTAINABLE CITIES AND COMMUNITIES | 11.3/11.5/11.6/11.9/11.10 |
| **සංචාරක කර්මාන්තය** | 8 DECENT WORK AND ECONOMIC GROWTH; 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE | 8.9 9.4 |

# 8 පරිච්ඡේදය

## ක්‍රියාත්මක කරන උපක්‍රමය

මෙම NDC වල ඇතුළත් දේශගුණ ක්‍රියාමාර්ග පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමට නම්, UNFCCC හි 4වැනි වගන්තිය සහ පැරිස් ගිවිසුමේ 9, 10 සහ 11 වගන්ති ප්‍රකාරව මූල්‍ය, තාක්ෂණ පැවරුම් සහ ධාරිතා වර්ධනය ශ්‍රී ලංකාවට අවශ්‍ය කරනු ඇත. 'පොදු එහෙත් එකිනෙකට වෙනස් වූ වගකීම් සහ ඒවායේ විශේෂිත ජාතික සහ කලාපීය සංවර්ධන ප්‍රමුඛතා, අරමුණු සහ වාතාවරණ' සැලකිල්ලට ගනිමින් දේශගුණ විපර්යාස ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමටත්, දේශගුණ විපර්යාස අවම කිරීමේ අභිලාෂයන් වර්ධනය කිරීමටත් සංවර්ධනය වෙමින් පවතින රටවලට උපකාරවීම පිළිබඳව මෙම වගන්තිවල සඳහන් කර තිබේ. 'සංවර්ධනය වන රාජ්‍ය පාර්ශවයන් වෙත වඩාත් වැඩි සහයක් ලබාදීම තුළින් ඔවුන්ගේ ගන්නා ක්‍රියාමාර්ග තුළ වඩාත් ඉහළ අභිලාෂයන් සඳහා ඉඩසැලසෙන බව පිළිගනිමින්, මෙම වගන්තිය ක්‍රියාත්මක කිරීම සඳහා, මෙහි 9, 10 සහ 11 වගන්ති හා අනුකූලව සංවර්ධනය වන රාජ්‍ය පාර්ශව වෙත උපකාර ලබාදෙනු ඇත' යනුවෙන් පැරිස් ගිවිසුමේ 4 වැනි වගන්තියේ 5 වැනි ඡේදයේ විශේෂයෙන් ම ප්‍රකාශ කර තිබේ.

මෙම ජාතිකව නිර්ණය කළ දායකත්ව තුළ ශ්‍රී ලංකාව වඩාත් වර්ධනය වූ දේශගුණ විපර්යාස අවමකිරීමේ අභිලාශයක් ඉදිරිපත් කරමින්, එම අභිලාෂය සාක්ෂාත් කරගැනීම සඳහා ජාත්‍යන්තර සහාය බලාපොරොත්තු වෙයි. ඒ අතර අනුහුරුවීම සහ අලාභ සහ හානි සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට වඩාත් කඩිනමින් සපුරාලියයුතු අවශ්‍යතා පවතියි. කෘෂිකර්මය, ආහාර නිෂ්පාදනය, පානය සහ වාරිමාර්ග සඳහා ජලය සහ වෙරළ ආරක්ෂාව සඳහා සිදුකරන අනුහුරුවීම් මීට ඇතුළත් වේ. බහුවිධ දේශගුණ උපද්‍රව සඳහා මුහුණ දෙන ශ්‍රී ලංකාව වැනි රටකට, වඩාත් වැඩිදියුණු කළ දේශගුණ පුරෝකථන, දේශගුණ අවදානම් සන්නිවේදනය හා පූර්ව අනතුරු ඇඟවීම සහ විස්තීර්ණ අවදානම් කළමනාකරණ රාමුවක් විශේෂයන් ම වැදගත් වේ.

දේශගුණ විපර්යාස අවමකිරීමේ ප්‍රධාන ඉලක්ක ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරන ප්‍රතිපත්තිමය සහාය, මූල්‍ය, තාක්ෂණය සහ ධාරිතා වර්ධනය පිළිබඳව පහත (8.1 වගුව) සැකෙවින් දක්වා තිබේ. වඩාත් පරිවර්තනීය තාක්ෂණයන් සහ අවමකරන ක්‍රියාවලී සඳහා බාහිර උපකාර අතිශයින්ම වැදගත් වන බව මෙයින් පෙන්නුම් කෙරේ. බලශක්තිය ගබඩාකරණය, ත්‍රිත්ව ජනන පද්ධති, නව පුනර්ජනනීය බලශක්තිය භාවිතයට ගැනීම, වැඩිදියුණු කළ ගොවිතැන්/පශුපාලන පිළිවෙත්, අපද්‍රව්‍ය/අපජලය කළමනාකරණය, පොදු ප්‍රවාහනය වැඩිදියුණු කිරීම, පරිසර හිතකාමී කාර්මික කලාප සංවර්ධනය වැනි ක්‍රියාමාර්ග මීට ඇතුළත් වේ.

**මූල්‍ය:** වඩාත් වැඩි අභිලාෂ සහිත ඉලක්ක කරා ළඟාවීම සඳහා මූල්‍ය පහසුව අතිශයින් ම වැදගත් සාධකයක් වේ. ජාතික සංවර්ධන ප්‍රමුඛතා සමඟින් අනුකූල යම් යම් දේශගුණ ක්‍රියාමාර්ග සඳහා සහායවනු පිණිස ශ්‍රී ලංකා රජයෙන් රාජ්‍ය මුදල් වෙන් කරනු ලැබේ. කෙසේනමුත්, ඉන් ඔබ්බට අභිලාෂයන් වර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවට බාහිර මූල්‍ය සහාය අවශ්‍ය වේ. දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම්වල අවදානමට අතිශයින් ලක්ව ඇති සංවර්ධනය වන රටක් වශයෙන්, මෙම ලේඛනයේ දක්වා ඇති ඉලක්ක කරා ළඟාවීමේ දී ශ්‍රී ලංකාවට අනුහුරුවීම සහ අඩු-කාබන් සංවර්ධනය සඳහා වැඩිදියුණු කළ මූල්‍ය සහායක් ලැබීම පූර්ව අවශ්‍යතාවයකි. NDC සමාලෝචන ක්‍රියාවලියේ කොටසක් වශයෙන් 2021 සිට 2030 දක්වා කාලසීමාව සඳහා වන අවම කිරීමේ ක්‍රියාමාර්ගවලට අදාළව කොන්දේසි සහිත සහ කොන්දේසි රහිත පිරිවැය ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමට පුළුල් විශ්ලේෂණයක් සහ අදහස් විමසීමක් දැනට සිදුකෙරෙමින් පවතියි.

ස්වකීය කොන්දේසි සහිත දායකත්වය සපුරාලීමට නම්, ශ්‍රී ලංකාව විසින් UNFCCC, පැරිස් ගිවිසුම සහ අඩු-කාබන් සංවර්ධනය සඳහා ඇති කරගත් ද්වීපාර්ශ්වීය එකඟතා හරහා සැලකියයුතු ප්‍රමාණයක දේශගුණ මූල්‍ය ප්‍රමාණයක් එක් රැස් කර මෙහෙයවිය යුතුව තිබේ. හරිත දේශගුණ අරමුදලේ (Green Climate Fund (GCF)) ආධාර සහිතව ක්‍රියාත්මක වන NAP සූදානම් ව්‍යාපෘතියේ සහාය ඇතිව, තාක්ෂණික සහ මූල්‍ය උපකාර සඳහා අනුහුරුවීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල පැහැදිලිව සකසාගනිමින්, ශ්‍රී ලංකාවේ ජාතික අනුහුරුවීමේ සැලසුම (NAP) යාවත්කාලීන කෙරෙනු ඇත.

**තාක්ෂණය:** ප්‍රත්‍යස්ථතාව ගොඩනංවාගැනීම සඳහා ශ්‍රී ලංකාවට නවමු අනුහුරුවීමේ තාක්ෂණයන් කරා ප්‍රවේශය අවශ්‍ය වේ; එසේම, සංවර්ධන ප්‍රතිඵල වැඩිදියුණු කරගන්නා අතරේම පොසිල ඉන්ධන යුගයෙන් මිදී ඉදිරියට ගමන්කිරීම සඳහා ශ්‍රී ලංකාවට හැකියාව ලබාදෙන අවම කිරීම-සම්බන්ධ තාක්ෂණ පැවරුම් අවශ්‍ය වේ. මෙහිදී, දේශගුණ සුහුරු කෘෂිකර්මාන්තය, නූතන ඵලදා කළමනාකරණ විධික්‍රම, දේශගුණ පුරෝකථන හා වේලාසනින් අනතුරු ඇඟවීම, ජලය ගෙනයෑම සහ වාරිමාර්ග, දේශගුණ සුහුරු නගර සහ සංචාරක යටිතල පහසුකම්, බලශක්ති උත්පාදනය (නව පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන්) හා බලශක්ති ගබඩාකරණ පහසුකම්, අඩු-කාබන් ප්‍රවාහනය හා නාගරික යටිතල පහසුකම්, වෙරළබඩ ප්‍රදේශවල ප්‍රත්‍යස්ථතාව වැඩිදියුණු කිරීම සහ නවීන කෘෂි-තාක්ෂණය සඳහා ප්‍රවේශය, ඒවා දැරියහැකි බව සහ තාක්ෂණ පරිමාණය/ සම්මිශ්‍රණය නිසි පමණට ලැබීමත් සමඟින් මෙම NDC සාක්ෂාත් කරගැනීමට හැකිවනු ඇත. NDC ක්‍රියාත්මක කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ සැලසුම් මඟින් NDC ඉලක්ක සඳහා තාක්ෂණය පවතින්නේද යනවග සහ ඒ සම්බන්ධයෙන් ඇති අවශ්‍යතා සැකෙවින් දක්වනු ඇත. ශ්‍රී ලංකාව වැනි අවදානමතට ලක්ව ඇති රටවලට අඩු-කාබන් සංවර්ධනය සහ ප්‍රත්‍යස්ථතාව ගොඩනැංවීම සාක්ෂාත් කරගැනීම සඳහා, ගැලපෙන, පිරිවැය-ඵලදායි, සහ නවීන තාක්ෂණය පවරාදීම අතිශයින්ම වැදගත් වේ.

**ධාරිතා වර්ධනය:** සංවර්ධනය වෙමින් පවතින රටවලට තමන්ගේ NDC වඩාත් හොඳින් ක්‍රියාත්මක කිරීමට සහ අධීක්ෂණය කිරීමට හැකිවන පරිද්දෙන් පැරිස් ගිවිසුමේ ධාරිතා වර්ධන විධිවිධාන සාර්ථකව ක්‍රියාත්මක කිරීම ඉතාම වැදගත් වේ. ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස අවම කිරීමේ සහ අනුහුරුවීමේ දයකත්ව පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමට නම්, අමතර තාක්ෂණ පැවරුම් සහ ධාරිතා වර්ධනය අවශ්‍ය වේ. එහිදී ඇතැම් ජාතික අවශ්‍යතා නම්:

NDC අත්පත් කරගැනීමට අවශ්‍ය සාමාන්‍ය ධාරිතා වර්ධන අවශ්‍යතා;

- විශේෂයෙන් සමස්ත සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ වාර්තා කිරීම සඳහා ආයතනික සංවර්ධනය සහ ශක්තිමත් කිරීම;
- අධ්‍යාපනය, පුහුණුව සහ පර්යේෂණ තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම;
- ජාලකරණය, හවුල්කාරිත්වයන් සහ අංශ අතර සහ ඉන් ඔබ්බට අත්දැකීම් හුවමාරු කර ගැනීම;
- තාක්ෂණික අවබෝධය සහ නව දැනුම වැඩි දියුණු කිරීම සඳහා අන්තර්ජාලය පාදක කරගත් මෙවලම්/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යෙදවුම්/මාර්ගගත පාඨමාලා.

*8.1 වගුව: අවමකිරීමේ සහ අනුහුරුවීමේ ක්‍රියාමාර්ග සඳහා නොපමාව සපුරාලිය යුතු ධාරිතාමය අවශ්‍යතා කිහිපයක්*

| අවමකිරීමේ ක්‍රියාමාර්ග සඳහා වන ධාරිතා අවශ්‍යතා | අනුහුරුවීමේ ක්‍රියාමාර්ග සඳහා වන ධාරිතා අවශ්‍යතා |
|---|---|
| කර්මාන්ත දැනුම සහ යොදගැනීම පිළිබඳ දැනුම අක්වෙරළ සුළං සම්පත් සංවර්ධනය, ස්මාර්ට් ජාතික විදුලි පද්ධතිය, ජනන ගබඩා ජල විදුලි තාක්ෂණය ඇතුළුව බලශක්ති ගබඩා කිරීම, ත්‍රි-ජනනය, LRT, BRT පද්ධති වැනි ප්‍රවාහන අංශයේ නවීන යටිතල පහසුකම් සංවර්ධනය, චක්‍රීය ආර්ථික පිළිවෙත්, පාරිසරික කර්මාන්ත උද්‍යාන සංකල්ප පිළිබඳ කාර්මික දැනුම සහ යෙදවුම් තිරසාර බව (D4S), ජීවන චක්‍ර ප්‍රවේශය (LCA), චක්‍රීය ආර්ථිකය සහ ඩිජිටල් ආර්ථිකය, නිරවද්‍ය කෘෂිකර්මය සහ යාන්ත්‍රිකකරණය, අගය එකතු කිරීම සහ නවීන ප්‍රතිචක්‍රීකරණ තාක්ෂණය, කොම්පෝස්ට් පොහොර සහ අපද්‍රව්‍ය තාප පිරියම් කිරීම (බලශක්ති ප්‍රතිසාධනය සඳහා පයිරොලයිසිස් තාක්ෂණය), බිම් පිරවුම් ගෑස් තාක්ෂණය සහ මධ්‍යගත අපජල පවිත්‍රකරණය යනාදිය. | දේශගුණ පුරෝකථන සහ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති සංවර්ධනය කිරීම, අවදානම් විශ්ලේෂණය සහ දේශගුණ ප්‍රත්‍යස්ථතාව සඳහා සංවර්ධන ආයෝජන උපයෝග කිරීම, දේශගුණ දත්ත එක්රැස් කිරීම සහ අනුහුරුවීමේ ක්‍රියා සඳහා අධීක්ෂණය කිරීම. |
| මූලික තක්සේරු කිරීම්, සහතික කිරීම් සහ සම්මත සැකසුම්: පරිසර සහතික කිරීමේ ක්‍රමය, අවම කාර්යසාධන හා බලශක්ති කාර්යක්ෂමතා ලේබල් කිරීමේ වැඩසටහන්, හරිත ගොඩනැගිලි සහ ගොඩනැගිලි කළමනාකරණ පද්ධතිය (BMS), මූලිකදත්ත තක්සේරු ඇතුළුව පරිසර-කාර්මික උද්‍යාන සඳහා විශේෂිත සැලසුම් කිරීම, ඉන්ධන කාර්යක්ෂමතා ලේබල් ප්‍රවාහන අංශයේ මූලික සැකසුම්, බොහෝ තාක්ෂණික යෙදවුම් එසෑඩ කිරීම | ආංශික දත්තසමුදාය ස්ථාපිත කිරීම, මූලික දත්ත නිර්ණය කිරීම, දේශගුණ තොරතුරු පද්ධති ගොඩනැගීම, දේශගුණය හේතුවෙන් පරිසර පද්ධතියේ ඇතිවන වෙනස්කම් හඳුනාගැනීම සඳහා දිගු කාලීන අධීක්ෂණ බිම් ස්ථාපිත කිරීම, දේශගුණ විපර්යාස හේතුවෙන් බලපෑමට ලක්වන රෝග සහ සෞඛ්‍ය තත්ත්ව විසඳීම සඳහා මහජන සෞඛ්‍ය පද්ධතියේ ධාරිතාව ගොඩනැගීම. |
| පර්යේෂණ හා සංවර්ධන කටයුතු සහ දැනුම් පැවරුම: වාහන ක්‍රියාකාරිත්වය සහ ඉන්ධන සකසුරුවම් ලේබල්කරණය, උපකරණවල බලශක්ති කාර්යක්ෂමතාවය පරීක්ෂා කිරීම, බලශක්තිය ගබඩා කිරීම (ජාතික විදුලි පද්ධතිය සහ පරිශීලක මට්ටමින්), පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම්, නිරවද්‍ය කෘෂිකර්මාන්තය, ගව පට්ටිවල සහ පශුසම්පත්වල ජානමය වැඩිදියුණු කිරීම | නව භෝග වර්ග පර්යේෂණ හා සංවර්ධනය, වැඩි දියුණු කළ ඵලදායිතාව සහ කෘෂි තාක්ෂණය, දේශගුණික තත්ත්වවලට ඔරොත්තු දෙන නාගරික හා වෙරළබඩ සංවර්ධනය, දේශගුණ උපද්‍රව සඳහා සොබාදහම පදනම් කරගත් විසඳුම්, ගොඩබිම හා මුහුදු ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම යනාදිය. |

ජාතික ආයතන සහ පෞද්ගලික අංශය හරහා දේශගුණ මූල්‍යකරණය වෙත ප්‍රවේශවීම සඳහා ද ධාරිතා වර්ධනය කළ යුතුව තිබේ. වඩාත් වැඩි ප්‍රත්‍යස්තතාවට මගපෑදෙන පරිදි, දේශගුණ අවදානම කළමනාකරණය සම්බන්ධයෙන් නවමු යෝජනා සංවර්ධනය කිරීමට පෞද්ගලික අංශයේ ධාරිතාවය වැඩිදියුණු කිරීම සහ දේශගුණ ක්‍රියාමාර්ග සැලසුම්කරණය, පිරිවැයකරණය, සමාලෝචනය සහ අධීක්ෂණය සඳහා ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවල ඇති හැකියාව වර්ධනය කිරීම අත්‍යාවශ්‍ය වේ. දේශගුණ විපර්යාස සම්බන්ධයෙන් දැනුම්වත්භාවය සහ සන්නිවේදනය; ව්‍යාපෘති තක්සේරුව, දත්ත එකතු කර බෙදාහැරීම, NDC සම්බන්ධ ප්‍රගතිය අධීක්ෂණය කිරීම හා ශ්‍රී ලංකාවට විශේෂිත තොරතුරු, දත්ත හා අවශ්‍යතා අර්ථසම්පන්න අන්දමින් ජාත්‍යන්තර සංසද වෙත සන්නිවේදනය සඳහා පහත සවිස්තරාත්මකව දක්වා ඇති පාලන ව්‍යුහය තුළ මූලික ධාරිතා වර්ධනය කිරීම කඩිනමින් ඉටුකළ යුතු අවශ්‍යතාවයකි.

දේශගුණ විපර්යාස අවම කිරීම, අනුහුරුවීම සහ අලාභ සහ හානි සම්බන්ධ ක්‍රියාමාර්ග ක්‍රියාවට නංවන සියලුම අංශවලට දත්ත උත්පාදනය හා දත්ත කළමනාකරණය සම්බන්ධයෙන් ධාරිතා වර්ධනය කරගැනීම අත්‍යවශ්‍ය වේ. ප්‍රමාණවත් තරම් උසස් තත්ත්වයේ සහ ප්‍රමිතිගත දත්ත නොමැතිවීම, සංවර්ධන සැලසුම් සම්පාදනය සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා පොදුවේ බාධා පමුණුවයි. මෑතකාලීන දේශගුණ සහ ආපදා සම්බන්ධ ඇගැයුම්වලින්[63] පෙන්වා ඇති අන්දමට, අලාභ සහ හානි, අවදානම සහ අනුහුරුවීමේ ධාරිතා, දේශගුණ පාරාමිතීන්ට ඇති සංවේදීතාවය යනාදිය තීරණය කිරීම සඳහා ප්‍රධාන දර්ශක සම්බන්ධයෙන් දත්ත නොමැති තත්වයක් පවතියි.

දේශගුණ විපර්යාස ක්‍රියාමාර්ග මැනීම, වාර්තාකරණය හා සත්‍යාපනය (Measuring, Reporting and Verification (MRV)) සඳහා සහ දේශගුණ විපර්යාස අවම කිරීම, අනුහුරුවීම, සහ අලාභ සහ හානි ක්ෂේත්‍රවල අධීක්ෂණය සහ ඇගයීම (Monitoring) Evaluation (M&E)) සඳහා සියලු අංශවල ධාරිතා වර්ධනයට සැලකියයුතු ඉඩක් පවතියි. නියම කරන ලද NDC මත පදනම් වෙමින් ඵලදායී සහ කාර්යක්ෂම අන්දමින් ක්‍රියාත්මක කිරීමේ සැලසුම් සපුරාලීම සඳහා මෙය අත්‍යවශ්‍ය වේ. ශක්තිමත් MRV පද්ධතියක් පැවතීම තුළ, ආයෝජකයින්ගේ විශ්වාසය වර්ධනය වන අතර සම්පත් එක් රැස්කර මෙහෙයවීමට ඇති අවස්ථා වැඩිදියුණු වේ. MRV/ M&E පද්ධතිවලට සහ සම්පත් ඒකරාශීකර මෙහෙයවීමට විශේෂිත වූ ඇතැම් ධාරිතා අවශ්‍යතා පහත පරිදි වේ:

- පවතින දත්ත සහ විශ්ලේෂණ මෙවලම් ඇසුරින් ප්‍රාදේශීය දේශගුණ අවදානම/ප්‍රත්‍යස්ථතා තක්සේරු සංවර්ධනය කිරීම;
- දැනට පවත්නා තත්ත්ව වෙනස් නොකර (business-as-usual (BAU)) සංවර්ධනය කටයුතු ඉදිරියට කරගෙන යාම සහ දේශගුණ විපර්යාසවල බලපෑම් හා ගැටලු අතර වෙනස වෙන්කර හඳුනාගැනීම
- ඇතැම් දේශගුණ විපර්යාස අවම කිරීමේ අංශය සහ අවම කිරීමේ ක්‍රියාමාර්ග සඳහා, BAU විමෝචන තත්ත්ව සහ හරිතාගාර වායු විමෝචන අඩුකරගතහැකි මාර්ග
- බලපෑම මැනීම සඳහා (කාලයත් සමගින් ඇතිවන වෙනස මැනීම සඳහා) දත්ත ලබාගතහැකිවීමට පහසුකම් සලසාදීම පිණිස ක්‍රියාමාර්ග යෙදීම

NDC සමාලෝචන ක්‍රියාවලිය තුළ සිදුකළ අදහස් විමසීම් මෙම එක් එක් අංශය තුළ දේශගුණ ක්‍රියාමාර්ග සඳහා අඛණ්ඩව සම්බන්ධවීම පිණිස උද්යෝගයක් ජනිත කරවා ඇත. ජාතික විද්වතුන් හා ඒ ඒ අංශවල විද්වතුන් සතුව තාක්ෂණික දැනුම පවතින බව හඳුනාගැනීම වැදගත්ය. දේශගුණ විපර්යාස මුඛ්‍යධාරාගත කිරීම සඳහා සිදුකරන ඕනෑම ධාරිතා වර්ධන කටයුත්තක් සහ ඵලදායී ලෙස තාක්ෂණය යොදාගැනීමක දී දේශීය අත්දැකීම්වලින් ඵල නෙලාගත යුතු බවත්, දේශගුණ විපර්යාස විශේෂඥයින් සහ ඒ ඒ අංශවල විෂය කරුණු විශේෂඥයින් අතර දැනුම සහ ඉගෙනුම් හුවමාරුව සඳහා පහසුකම් සැලසිය යුතු බවත් පිළිගැනීමට වැදගත් වේ. NDC සමාලෝචන ක්‍රියාවලිය ඔස්සේ ඇතිවූ උද්යෝගය තවදුරටත් වර්ධනය කරමින්, ආංශික සැලසුම් සහ උපායමාර්ග තුළට දේශගුණ විපර්යාස ක්‍රියාමාර්ග මුඛ්‍යධාරාගත කිරීම සඳහා මාර්ගෝපදේශකත්වය ලබාදීමේ හැකියාව ඒ ඒ අංශවල විශේෂඥයින් වෙත ලබාදීම වැදගත් වේ.

## ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණ

දේශගුණ විපර්යාසවලට මුහුණදීම සඳහා වන සූදානම ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකාව පියවර ගණනාවක් ම ගෙන තිබේ. ශ්‍රී ලංකා දේශගුණ විපර්යාස ප්‍රතිපත්තිය (2012) රටේ ප්‍රමුඛතාවයන් අනුව මෙම කටයුත්ත මෙහෙයවීම සඳහා සමස්තයම ආවරණය කෙරෙන රාමුවක් සපයා දෙයි. NDC ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය සඳහා උපකාරීවීම පිණිස සහ ආංශික සැලසුම් තුළට දේශගුණ විපර්යාස ක්‍රියාමාර්ග මුඛ්‍යධාරාගත කරනු පිණිස, ශ්‍රී ලංකාව 2016-2019 සූදානම් සැලසුම සකසන ලදි. ඉන්, NDC ක්‍රියාත්මක කිරීම සඳහා වන පූර්වාවශ්‍යතා හඳුනාගැනීම සහ සපුරාලීම අරමුණු කරගන්නා ලදි. එම සූදානම් සැලසුමෙන් ලද අත්දැකීම් මත පදනම් වෙමින් ඉදිරියට යන්නා වූ, පහත දැක්වෙන ආයතනික රාමුව හරහා, NDC ක්‍රියාත්මක කිරීමට සහ අධීක්ෂණයට සහාය ලබාදෙනු ඇත. NDC සඳහා වන ජාතික කේන්ද්‍රස්ථානය වශයෙන් පරිසර අමාත්‍යාංශය විසින් මෙම ආයතනික ව්‍යුහය සම්බන්ධීකරණය කරනු ඇත.

### 1) NDC ක්‍රියාත්මක කිරීම සඳහා වන ජාතික මෙහෙයුම් කමිටුව

NDC ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සඳහා, පරිසර අමාත්‍යාංශය සභාපතිත්වය දරන, අන්තර්-ආයතන ජාතික මෙහෙයුම් කමිටුවක් (National Steering Committee (NSC)) පිහිටුවීමට ශ්‍රී ලංකා රජය කටයුතු කරනු ඇත. මෙම ජාතික මෙහෙයුම් කමිටුවට ඒ ඒ NDC අංශය භාරව සිටින රේඛීය අමාත්‍යාංශවල ලේකම්වරුන් සම්බන්ධ වනු ඇත. තවද, මුදල් අමාත්‍යාංශය, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, තිරසර සංවර්ධනය සඳහා වන ජාතික සභාව යන ආයතනවල නියෝජනය සහ සමීප සම්බන්ධීකරණය සහිතව NSC ක්‍රියාත්මක වනු ඇත.

බහුවිධ ආයතන අතර සහයෝගීතාවය අවශ්‍ය කරන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් එම ආයතන අතර ප්‍රමාණවත් සහයෝගීතාවයක් ඇතිව, අරමුණු කළ පරිද්දෙන් ම NDC ක්‍රියාත්මක වන්නේද යනවග අධීක්ෂණය කිරීම සඳහා ජාතික මෙහෙයුම් කමිටුව වගකියනු ඇත. ඉහළම මට්ටමේදී ප්‍රතිපත්ති එකිනෙකට ගැලපෙන බව සහතික කරගැනීම, එකම

63 තෙවන ජාතික සන්නිවේදනය 2020; පශ්චාත් ආපදා අවශ්‍යතා ඇගයුම 2016

ප්‍රයත්න ආයතන කිහිපයකින් කිරීම වැලැක්වීම, ක්‍රියාත්මක කිරීමේදී ඉස්මතුවන බාධා සඳහා ප්‍රායෝගික විසඳුම් ලබාදීම, නිසිකලට සමස්ත ප්‍රගතිය සාක්ෂාත් කරගැනීම අධීක්ෂණය ද NSC විසින් තවදුරටත් කටයුතු කරනු ඇත. ජාතික සංවර්ධන දෘෂ්ටිකෝණයකින් බලන කල, දේශගුණ ක්‍රියාමාර්ග සහ, ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතාවය හා කාන්තාවන් සවිබලගැන්වීම ඇතුළු අනෙකුත් තිරසර සංවර්ධන අභිමතාර්ථ අතරේ සහක්‍රියා පිළිබඳව සහ සම-ප්‍රතිලාභ සංවර්ධනය කරගැනීම පිළිබඳව සලකාබැලීම වැදගත් වේ.[64] පැරිස් ගිවිසුම සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා සහ තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය කරන පූර්ව කොන්දේසි වශයෙන් මේවා හඳුනාගෙන තිබේ. එබැවින්, තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීමට දුෂ්කර තත්වයක් ඇතිකරන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ආරක්ෂණ ඇතිකෙරෙන බව සහතික කරගැනීමටත්, SDG ජාතික සභාව සමඟින් සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කරගෙන යාමටත් NSC විසින් ක්‍රියා කරනු ඇත.

### 2) පරිසර අමාත්‍යාංශය සහ දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය

UNFCCC සඳහා ජාතික කේන්ද්‍රස්ථානය වන්නේ පරිසර අමාත්‍යාංශයයි. මෙම අමාත්‍යාංශය යටතේ දේශගුණ විපර්යාස විෂය වෙනුවෙන්ම කටයුතු කිරීම සඳහා, 2008 දී දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය (CCS) පිහිටවන ලදි. මේ වනවිට සීසී මගින් දේශගුණ විපර්යාස අවමකිරීමේ හා අනුහුරුවීමේ ජාතික විද්වත් කමිටු (NECs) සහ දේශගුණ විපර්යාස සම්බන්ධයෙන් වන අන්තර්-ආයතන කමිටුවක් පිහිටවා තිබේ.

දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය පිහිටුවන ලද්දේ UNFCCC සහ දේශගුණ අරමුදල් (හරිත දේශගුණ අරමුදල සහ අනුවර්තන අරමුදල යනාදිය) සඳහා ජාතික කේන්ද්‍රස්ථානය ලෙස පරිසර අමාත්‍යාංශයේ කාර්යභාරයට සහාය වීම සඳහාය. එමගින් ජාතික හරිතාගාර වායු ඉන්වෙන්ටරිය සංවර්ධනය කිරීම, අනුහුරුවීමේ හා අවමකිරීමේ අංශ වෙත තාක්ෂණික හුවමාරුවට සහාය වීම, හරිතාගාර වායු අඩු කිරීමේ සහ ප්‍රත්‍යස්ථතාව වර්ධනය කිරීමේ ක්‍රියාමාර්ග, දේශගුණික දත්ත සහ දැනුම ගබඩා කිරීම සහ බෙදා හැරීම ක්‍රියාත්මක කිරීමට පහසුකම් සපයයි. දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය සම්මුතිය සහ පැරිස් ගිවිසුම වෙත නිරන්තර සන්නිවේදනයන් සම්පාදනය ද සිදුකරනු ලැබේ. මෙම ආයතනික ව්‍යුහය තුළ, දේශගුණික ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට සහ අධීක්ෂණයට සහාය වන පහසුකම් සපයන්නා, සම්බන්ධීකාරක සහ සන්නිවේදකයා ලෙස දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය ක්‍රියාකරනු ඇත.

64 එ.ජා. කාන්තාවෝ, ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතාවය සහ තිරසාර සංවර්ධනය සඳහා වන දේශගුණ ක්‍රියාමාර්ග අතරේ සම-ප්‍රතිලාභවලින් උපරිම වාසි ලබාගැනීම, දේශගුණ විපර්යාස ව්‍යාපෘති තුළ තීරණ ගැනීමේදී ස්ත්‍රීපුරුෂ සමාජභාවය සම්බන්ධයෙන් සැලකිල්ලට ගතයුතු කරුණු, 2016

**3) ආංශික සැලසුම්කරණ සහ අධීක්ෂණ කමිටු**

එක් එක් NDC අංශය සඳහා සැලසුම්කරණ සහ අධීක්ෂණ කමිටුව (PMC) බැගින් වනු ඇත. මෙම PMC සඳහා අදාළ දෙපාර්තමේන්තු සහ/හෝ ආයතන ප්‍රධානීන් ඇතුළත් වනු ඇත. ආංශික NDC ක්‍රියාත්මක කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ සැලසුම් සඳහා PMC මගින් සහය ලබාදෙනු ඇති අතර, 2021-2025/2030 කාලසීමාව ආවරණය වන පරිදි ඒ ඒ අංශය/රේඛීය අමාත්‍යාංශය සඳහා දැනට සම්පාදනය කෙරෙමින් පවතින සංවර්ධන සැලසුම් තුළට මෙම සැලසුම් පූර්ණ වශයෙන් ඒකාබද්ධ කෙරෙනු ඇත. ඒ ඒ අංශවල සැලසුම් රාමුවට දේශගුණ ක්‍රියාකාරකම් ඒකාබද්ධ කිරීම මගින් NDC සඳහා දේශීය/පොදුඅරමුදල් හෝ ජාත්‍යන්තර දායක ආධාර ලබාගැනීමට ප්‍රමුඛතාගත කරනු ඇත. ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් එක් එක් ආංශික සැලසුම්කරණ සහ අධීක්ෂණ කමිටුවේ සභාපතිත්වය දරනු ඇති අතර, රජයේ සහ පෞද්ගලික අංශයේ සහාය ඇතිව NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම් ක්‍රියාවට නැංවීමේ කාර්යභාරය සභාපතිවරයාට පැවරෙනු ඇත. NDC ක්‍රියාත්මක කිරීම සඳහා වන මූල්‍ය, තාක්ෂණික සහ ධාරිතා වර්ධන අවශ්‍යතා පිළිබඳව සවිස්තරාත්මක ඇගැයුමක් සිදුකිරීමට සහ එම අවශ්‍යතා NSC සහ CCS වෙත සන්නිවේදනය කෙරෙන බව සහතික කරගැනීමටත් එක් එක් අංශයේ සැලසුම්කරණ සහ අධීක්ෂණ කමිටුව විසින් කටයුතු කළයුතු වේ. ක්‍රියාත්මක කිරීමේ බාධක පිළිබඳ වාර්තා තබා ගැනීමටත්, තිරසර සංවර්ධනයට බාධා පැමිණිය හැකි දේශගුණික ක්‍රියාමාර්ග සඳහා ආරක්ෂණ විධිවිධාන පවතින බව සහතික කරගැනීමටත් මෙම ආංශික සැලසුම්කරන සහ අධීක්ෂණ කමිටුව විසින් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.




*8.1 රූපය: දේශගුණ ප්‍රතිචාරය සඳහා වන ආයතනික ව්‍යුහය*

# කෙටි යෙදුම්

| | |
|---|---|
| ADB- Asian Development Bank | ආසියානු සංවර්ධන බැංකුව |
| AER- Agro-Ecological Regions | කෘෂි පාරිසරික කලාප |
| BAU- Business as Usual Scenario | පවතින තත්ත්ව යටතේ |
| BMS – Building Managing System | ගොඩනැගිලි කළමනාකරණ පද්ධතිය |
| BRT- Bus Rapid Transit | ශීඝ්‍ර බස් රථ ප්‍රවාහන සංකල්පය |
| CCC- Climate Change Secretariat | දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය |
| CCD- Department of Coast Conservation and Coastal Resource Management | වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව |
| $CO_2$- Carbon dioxide | කාබන් ඩයොක්සයිඩ් |
| COP26- 26th Conference of Parties | 26 වැනි පාර්ශ්වකාර රැස්වීම |
| CSA – Climate-Smart Agriculture | දේශගුණ සුහුරු කෘෂිකර්මය |
| DAD – Department of Agrarian Development | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |
| DoI – Department of Irrigation | වාර්මාර්ග දෙපාර්තමේන්තුව |
| DRM- Disaster Risk Management | ආපදා අවදානම් කළමනාකරණය |
| DRR- Disaster Risk Reduction | ආපදා අවදානම අවම කිරීම |
| DSM- Demand Side Management | ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණය |
| DWC- Department of Wildlife Conservation | වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| EAFM- Ecosystem-based Approach to Fisheries Management | ධීවර කළමනාකරණය සඳහා පරිසර පද්ධති පාදක ප්‍රවේශය |
| EEI&C- Efficiency Improvement and Conservation Programme | බලශක්ති කාර්යක්‍ෂමතා වැඩි දියුණු කිරීමේ හා සංරක්‍ෂණය කිරීමේ වැඩසටහන |
| EST- Environmentally Sustainable Transport | තිරසාර ප්‍රවාහන පද්ධතිය |
| FD- Department of Forest Conservation | වන සම්පත් සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව |
| FMA- Fishery Management Areas | ධීවර කළමනාකරණ ප්‍රදේශ |
| GBG- Green Building Guidelines | හරිත ගොඩනැගිලි මාර්ගෝපදේශ |
| GCF- Green Climate Fund | හරිත ගොඩනැගිලි අරමුදල |
| GDP- Gross Domestic Production | දළ දේශීය නිෂ්පාදනය |
| GFDRR- Global Facility for Disaster Reduction and Recovery | ආපදා අවදානම් අවම කිරීම සහ ප්‍රතිසාධනය සඳහා ගෝලීය පහසුකම් |
| GHG- Greenhouse Gas | හරිතාගාර වායු |
| GSTC- Global Sustainable Tourism Council | ගෝලීය තිරසර සංචරණ සභාව |
| GWh- Gigawatt hours | ගිගාවොට් පැය |
| HEM- High-Efficiency Motors | අධිකාර්යක්ෂම මෝටර |
| HHAP- Heat – Health Action Plan | උණුසුම්-සෞඛ්‍ය ක්‍රියාකාරී සැලසුම |
| IAS- Invasive Alien Species | ආක්‍රමණශීලී ආගන්තුක විශේෂ |
| ICAT- Initiative for Climate Action Transparency | දේශගුණික ක්‍රියාමාර්ග විනිවිදභාවය සඳහා වන මුලපිරීම |
| ICT- Information Communication Technology | තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය |
| IP- Industrial Parks | කාර්මික උද්‍යාන |
| IPM- Integrated Pest Management | ඒකාබද්ද පළිබෝධ කළමනාකරණය |
| IPNS- Integrated Plant and Nutrition Systems | ඒකාබද්ධ ශාක සහ පෝෂණ පද්දති |
| IPPU- Industrial Process and Product Use | කාර්මික ක්‍රියාවලි සහ නිෂ්පාදන පරිහරණය |
| IRBM- Integrated River Basin Management | ඒකාබද්ධ ගංගාද්‍රෝණි කළමනාකරණය |
| ISO- International Organization for Standardization | ප්‍රමිතිකරණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය |
| L&D- Loss and Damage | අලාභ සහ හානි |
| LA- Local Authorities | පළාත් පාලන ආයතන |
| LCA-Life-cycle assessment | ජීවන චක්‍ර ප්‍රවේශය |
| LED- Light-emitting diode | ආලෝක විමෝචක ඩයෝඩය |

| | |
|---|---|
| LKR- Sri Lankan Rupee | ශ්‍රී ලාංකීය රුපියල් |
| LNG- Liquified Natural Gas | ද්‍රවීකරණය කරන ලද ස්වභාවික වායුව |
| LRT- Light rail transport | සැහැල්ලු දුම්රිය ප්‍රවාහනය |
| M&E- Monitoring and Evaluation | අධීක්ෂණය සහ ඇගයීම |
| MASL- Mahaweli Authority of Sri Lanka | මහවැලි අධිකාරිය |
| MC- Municipal Council | මහ නගර සභා |
| MDGs- Millennium Development Goals | සහස්‍ර සංවර්ධන ඉලක්ක |
| MoE- Ministry of Environment | පරිසර අමාත්‍යාංශය |
| MoH- Ministry of Health | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| MRV- Measuring, Reporting, and Verification | මැනීම, වාර්තා කිරීම සහ තහවුරු කිරීම |
| MSL- Mean Sea Level | මධ්‍යන්‍ය මුහුදු මට්ටම |
| MSW- Municipal Solid Waste | නාගරික ඝන අපද්‍රව්‍ය |
| MT- Metric Tons | මෙට්‍රික් ටොන් |
| MW- Megawatt | මෙගාවොට් |
| NAMA- Nationally Appropriate Mitigation Actions | ජාතිකව උචිත හරිතාගාර වායු විමෝචනය අවම කරගැනීමේ ක්‍රියාමාර්ග |
| NAP- National Adaptation Plan | ජාතික අනුහුරුවීමේ සැලැස්ම |
| NaPID- National Policy for Industrial Development | කර්මාන්ත සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය |
| NAQDA- National Aquaculture Development Authority | ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය |
| NCD- Non-Communicable Diseases | බෝ නොවන රෝග |
| NDC- Nationally Determined Contributions | ජාතිකව නිර්ණය කළ දායකත්ව |
| NEC- National Expert Committees | ජාතික විශේෂඥ කමිටු |
| NG- Natural Gas | ස්වභාවික වායුව |
| NGRS- National Green Reporting System | ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය |
| NHSPEC- National Strategic Plan for Health, Environment and Climate Change | සෞඛ්‍යය, පරිසරය සහ දේශගුණික විපර්යාස සඳහා වන ජාතික ක්‍රමෝපායික සැලැස්ම |
| NPP- National Physical Plan | ජාතික භෞතික සැලැස්ම |
| NRW- Non-revenue Water | ආදායම් නොවන ජල සැපයුම |
| NSC- National Steering Committee | ජාතික මෙහෙයුම් කමිටුව |
| OAP- Overarching Agriculture Policy | සාර්ව කෘෂිකර්ම ප්‍රතිපත්තිය |
| PA- Protected Areas | ආරක්ෂිත ප්‍රදේශ |
| PDNA- Post Disaster Needs Assessment | පශ්චාත් ආපදා අවශ්‍යතා තක්සේරුව |
| PDoL- Provincial Department of Irrigation | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| PES- Payment for Ecosystem | පරිසර පද්ධතිය සඳහා ගෙවීම |
| PMC- Planning and Monitoring Committee | සැලසුම් සහ අධීක්ෂණ කමිටුව |
| R&D- Research & Development | පර්යේෂණ සහ සංවර්ධන |
| RECP – Resource Efficient Cleaner Production | සම්පත් කාර්යක්ෂම පිවිතුරු නිෂ්පාදන |
| SDG- Sustainable Development Goals | තිරසාර සංවර්ධන අභිමතාර්ථ |
| SL GAP- Sri Lanka Good Agriculture Practices | ශ්‍රී ලංකා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් |
| SLR- Sri Lanka Railway | ශ්‍රී ලංකා දුම්රිය සේවය |
| SLTDA- Sri Lanka Tourism Development Authority | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය |
| SMART- Specific, Measurable, Achievable, Realistic, and Timely | විශේෂිත, මැනිය හැකි, අත් කරගත හැකි, යථාර්ථවාදී සහ කාලෝචිත |
| STEM- Science, technology, engineering, and mathematics | විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය |
| TC – Technical Committee | තාක්ෂණික කමිටුව |
| THI- Temperature Humidity Index | උෂ්ණත්ව ආර්ද්‍රතා දර්ශකය |
| TNC- Third National Communication | තෙවනි ජාතික සන්නිවේදනය |

| | |
|---|---|
| ToU- Time of Use | වේලාව අනුව අයකිරීම |
| TROF- Trees Outside Forests | වනාන්තරවලින් බැහැර පිහිටන වෘක්ෂ |
| UC- Urban Council | නගර සභාව |
| UDA- Urban Development Authority | නාගරික සංවර්ධන අධිකාරිය |
| UN- United Nations | එක්සත් ජාතීන්ගේ සංවිධානය |
| UNDP- United Nations Development Programme | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන |
| UNFCCC- United Nations Framework Convention on Climate Change | දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය |
| USD- U.S. Dollar | එක්සත් ජනපද ඩොලරය |
| VFD- Variable Frequency Drives | විචල්‍ය සංඛ්‍යාත ධාවක |
| WMAWP- Waste Management Authority of Western Province | බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය |
| WP- Western Province | බස්නාහිර පළාත |

**දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය**
පරිසර අමාත්‍යාංශය
සොබාදම් පියස, අංක 416/C/1,
රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල